74 වන කාණ්ඩය
9 වන කලාපය

බ්‍රහස්පතින්දා
1967 අගෝස්තු 31

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නාවලට වාචික පිළිතුරු [පි. 2297]

විසර්ජන කෙටුම්පත් පනත, 1967-68 [දහහත් වන වෙන් කළ දිනය] [පි. 2309] :

ඡේද 85-87, 98-102 සහ 145 කාරක සභාව විසින් සලකා බලන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 74
இல. 9

வியாழக்கிழமை
31 ஓகஸ்ட் 1967

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினுக்களுக்கு வாய்மூல விடைகள் [ப. 2297]

ஒதுக்கீட்டு மசோதா, 1967-68 [ஒதுக்கப்பட்ட பதினேழாம் நாள்] [ப. 2309] :
குழுவில் ஆராயப்பட்ட தலைப்புக்கள் 85–87 ; 98–102 ; 145

Volume 74
No. 9

Thursday
31st August 1967

PARLIAMENTARY DEBATES

(HANSARD)

HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Col. 2297]

APPROPRIATION BILL, 1967-68 [Seventeenth Allotted Day] [Col. 2309]:
Considered in Committee—Heads 85-87 ; 98-102 ; 145

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

House of Representatives

1967 අගෝස්තු 31 වන බ්‍රහස්පතින්දා

வியாழக்கிழமை, 31 ஓகஸ்ட் 1967

Thursday, 31st August 1967

පූ. භා. 9.30 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [එස්. ඩී. ෂර්ලි කොරයා මයා.] මූලාසනාරූඪ විය.

சபை மு. ப. 9.30 மணிக்குக் கூடியது. உப சபாநாயகர் அவர்கள் [திரு. எஸ். சீ. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

The House met at 9.30 A.M., MR. DEPUTY SPEAKER [MR. S. C. SHIRLEY COREA] *in the Chair.*

පෙත්සම්

மனுக்கள்

PETITIONS

එස්. ජේ. වී. චෙල්වනායගම් මයා. (කන්කසන්තුරෙයි)

(திரு. எஸ். ஜே. வீ. செல்வநாயகம்—காங்கேசன்துறை)

(Mr. S. J. V. Chelvanayakam—Kankesanturai)

I present a petition from Mr. P. A. Thambaiya of Dikwella in the District of Matara praying for pension under Section 20 (5) of the Minute on Pensions.

මහජන පෙත්සම් කරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදි.

பொதுமனுக் குழுவுக்குச் சாட்ட கட்டளையிடப்பட்டது.

Ordered to be referred to the Public Petitions Committee.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

வினாக்களுக்கு வாய்மூல விடைகள்

ORAL ANSWERS TO QUESTIONS

නියෝජ්‍ය කථානායකතුමා

(உப சபாநாயகர் அவர்கள்)

(Mr. Deputy Speaker)

Question No. 2.

ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)

(கௌரவ டட்ளி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரும்)

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

I want time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදි.

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

Question ordered to stand down.

දඹුල්ල කොට්ඨාශයේ ආරෝග්‍යශාලාවල නිලනොලත් පරීක්ෂකවරු

தம்புல்லத் தொகுதியிலுள்ள வைத்திய நிலையங்களுக்கு உத்தியோகப்பற்றற்ற பரிசோதகர்

UNOFFICIAL VISITORS TO HOSPITALS IN DAMBULLA ELECTORATE

3. ටී. බී. තෙන්නකෝන් මයා. (දඹුල්ල)

(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ளை)

(Mr. T .B. Tennekoon—Dambulla)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය:

(අ) ලංකාවේ ආරෝග්‍යශාලාවලට නිලනොලත් පරීක්ෂකවරු පත්කර සිටිත්ද? (ආ) එසේ නම්, ඔවුන් පත් කරන්නේ කවරෙකුගේ සහතික උඩද? (ඉ) දඹුලු මැතිවරණ කොටසේ දඹුල්ල, ගලේවෙල, මාදිපොල, නාලංද, නෝත් මාතලේ සහ මාතලේ දිස්ත්‍රික්ක රෝහලේ නිලනොලත් පරීක්ෂකවරුන් පත් කිරීම ගැන පළාතේ මන්ත්‍රීවරයාගෙන් විමසා තිබේද? (ඊ) එසේ නම්, ඔහු ඉදිරිපත් කළ අය පත්කර සිටිත්ද? (උ) නො එසේ නම්, මන්ද? (ඌ) දැනට පත්කර තිබෙන්නේ කවරෙකු අනුමත කළ අයවලුන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கையிலுள்ள வைத்திய நிலையங்களில் உத்தியோகப்பற்றற்ற பரிசோதகர்கள் நியமிக்கப்பட்டிருக்கிறார்களா? (ஆ) அவ்வா

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

தெனில், அவர்கள் யாருடைய சிபார்சின் மீது நியமிக்கப்படுகிறார்கள்? (இ) தம்புல்ல தேர்தல் தொகுதியிலுள்ள தம்புல்ல, கலேவெல, மாதிபொல, நாலந்த, மாத்தளை வடக்கு, மாத்தளை மாவட்ட வைத்திய நிலையங்களில் உத்தியோகப்பற்றற்ற பரிசோதகர்களை நியமிப்பதுபற்றி அப்பிரதேசத் தேர்தல் தொகுதி அங்கத்தினரிடம் விசாரிக்கப் பட்டதா? (ஈ) அவ்வாறெனில், அவரால் சிபார்சு செய்யப்பட்டவர்கள் நியமனம் பெற்றுள்ளனரா? (உ) அன்றேல், ஏன்? (ஊ) இப்போது நியமனம் பெற்றிருப்பவர்கள் யாரால் சிபார்சு செய்யப்பட்டனர்?

asked the Minister of Health: (*a*) Have unofficial visitors been appointed to the hospitals in Ceylon? (*b*) If so, on whose recommendation are they appointed? (*c*) Was the Member of Parliament for the area consulted regarding the appointment of unofficial visitors to the Dambulla, Galewela, Madipola, Nalanda, North Matale and Matale District hospitals in the Dambulla Electorate? (*d*) If so, were the persons recommended by him appointed? (*e*) If not, why? (*f*) On whose recommendation were the present appointments made?

වීමලා කන්නන්ගර මිය. (සෞඛ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திருமதி விமலா கன்னங்கர—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mrs. Wimala Kannangara—Parliamentary Secretary to the Minister of Health)

(අ) එසේය. ඇතැම් රෝහල්වලට පත් කිරීම සම්බන්ධයෙන් තවමත් සළකා බලා ගෙන යනු ලැබේ. (ආ) මවිසින් සළකා බලනු සඳහා නිල නොලත් රෝහල් පරීක්ෂකයින් වීමට සුදුසු පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් කැමැත්තේ අනු පිළිවෙලට ඉදිරිපත් කරන ලෙස මාගේ ස්ථිර ලේකම් තැන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා ඇත. (ඉ) එසේය. නිල නොලත් රෝහල් පරීක්ෂකවරුන් පත් නොකරන මාතෘ නිවාසයක් සමඟ මැදි බෙහෙත් හලක් වූ උතුරු මාතලේ හැර. (ඊ) පත් කිරීම හෝ පත් නොකිරීම හෝ මගේ අභිමතය අනුව කළ යුතු දෙයක් හෙයින්, ගරු මන්ත්‍රීතුමා නිර්දේශ කළ නම් සැලකිල්ලට භාජන වී පවතී. (උ) පැන නො නඟී. (ඌ) දැනට සිටින අය පත් කරන ලද්දේ දඹුල්ල රෝහල සඳහා මහනුවර දිසාවේ වැවිලිකරුවන්ගේ සංගමයේ නිර්දේශයද, මුළු දිස්ත්‍රික්කයටම සේවය සැලසෙන මාතලේ රෝහල සඳහා මහනුවර දිසාවේ වැවිලිකරුවන්ගේ සංගමය පාර්ලිමේන්තු මන්ත්‍රී පී. ජී. මුතුබණ්ඩා මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී ලීලාරත්න විජේසිංහ මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී ඇලික් අලුවිහාරේ මහතා යන අයගේ නිර්දේශයද සළකාගෙනය.

ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර)

(திரு. லெஸ்லி குணவர்தன—பாணந் துறை)

(Mr. Leslie Goonewardene—Panadura)

වැවිලිකරුවන්ගේ සංගමයේ නිර්දේශ අනුවද මේ ආණ්ඩුව පත්වීම් දෙන්නේ?

විමලා කන්නන්ගර මිය.

(திருமதி விமலா கன்னங்கர)

(Mrs. Wimala Kannangara)

සෑම සංගමයකම.

ටී. බී. තෙන්නකෝන් මයා.

(திரு. ரீ. பி. தென்னகோன்)

(Mr. T. B. Tennekoon)

අවුරුදු දෙකහමාරක් තිස්සේම මේ රෝහල්වලට පරීක්ෂකවරුන් පත් කිරීම ගැන සලකා බලන්නට බැරි වුණාද?

විමලා කන්නන්ගර මිය.

(திருமதி விமலா கன்னங்கர)

(Mrs. Wimala Kannangara)

ඊට පිළිතුරු දී තිබෙනවා. ගරු ඇමතිතුමා විසින් සලකා බලනු සඳහා නිල නොලත් රෝහල් පරීක්ෂකයින් වීමට සුදුසු පුද්ගලයින් දෙදෙනකුගේ නම් කැමැත්තේ අනුපිළිවෙළට ඉදිරිපත් කරන ලෙස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එතුමාගේ ස්ථිර ලේකම් තැන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා ඇතැයි පිළිතුරේ සඳහන් වෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)
Question No. 7.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
I require time to answer that Question too.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
விஞ்ஞை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)
Question No. 8.

ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමතිසහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්—ප්‍රවාහණ ඇමතිවෙනුවට)
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்—போக்குவரத்து அமைச்சர் சார்பாக)
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs—on behalf of the Minister of Communications)
The Answer has not been received from the Ministry, and I ask for time.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
விஞ்ஞை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

හක්මන මණ්ඩලයේ පාසල් : දිවා ආහාර කොන්ත්‍රාත්තුව

ஹக்மன பிரிவிலுள்ள பாடசாலைகள் : மதியபோசன ஒப்பந்தம்

SCHOOLS IN HAKMANA CIRCUIT : MIDDAY MEAL CONTRACT

1. ඩී. ඊ. තිලකරත්න මයා. (රත්ගම—එස්. හෙට්ටිගේ මයා.—හක්මන—වෙනුවට)
(திரு. டி. ஈ. திலகரத்ன—ரத்கம—திரு. எஸ். ஹெற்றிகே—ஹக்மன—சார்பாக)
(Mr. D. E. Tillekeratne—Ratgama—on behalf of Mr. S. Hettige—Hakmana)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (ආ) මාතර දිස්ත්‍රික්කයේ හක්මන මණ්ඩලයේ පහත සඳහන් පාසල් සඳහා පාසල් සිසුන්ගේ දිවා ආහාරය සපයන කොන්ත්‍රාත්කරුගේ නම සඳහන් කරනවාද? මාර/හක්මන මෙතෝදිස්ත විද්‍යාලය, මාර/හක්මන බුද්ධ ජයන්ති විද්‍යාලය, මාර/වේපොතඉර කන්ද විද්‍යාලය, මාර/වේපොතඉර විද්‍යාලය, මාර/කෝන්ගල මහා විද්‍යාලය, මාර/කෝන්ගල ප්‍රාථමික විද්‍යාලය, මාර/කැබිලියපොල දකුණ විද්‍යාලය, මාර/මුරුතාමුරය විද්‍යාලය (ආ) 1966 ඔක්තෝබර් මස සිට 1967 මැයි මස දක්වා එකී පාසල් පැවැත්වූ දිනයන්හි දිවා ආහාරය සැපයීමට අවශ්‍ය පිටි ප්‍රමාණය එකී කොන්ත්‍රාත්කරු වෙත නිකුත් කළ බව එතුමා දන්නවාද? (ඉ) එසේ නම් සෑම මාසයකම දින 8-10 ට වඩා දිවා ආහාරය නොසැපයූ බව දන්නවාද? (ඊ) අවශ්‍ය පිටි නිකුත් කර තිබියදීත් දිවා ආහාරය නොසැපයීමට හේතු මොනවාද? (උ) ඉතිරි පිටි තොගයන්ට කුමක්වීද යන්න සඳහන් කරනවාද? (ඌ) තව දුරටත් මෙම කොන්ත්‍රාත්කරුට මෙම කොන්ත්‍රාත්තුව කරගෙන යාමට ඉඩ දෙන්නේද? (එ) එසේනම්, ඒ මන්ද? (ඒ) මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධව පරීක්ෂණයක් පවත්වනවාද? (ඔ) නොඑසේ නම්, ඒ මන්ද?

කල්වි, කලාසාර අමෙච්සරෙක් කේට්ට විඤ: (அ) மாத்தறை மாவட்டத்திலுள்ள ஹக்மன பிரிவின் பின்வரும் பாடசாலை கூட்டு மாணவரின் மதியபோசனத்தைக் கொடுக்கும் ஒப்பந்தக்காரர் யார் என அவர் தெரிவிப்பாரா?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. ඊ. තිලකරත්න මයා.]

මාර/හක්මන මෙතඩිස්ත් කල්ලූරි, මාර/හක්මන බෞද්ධ ජයන්ති විද්‍යාලයය, මාර/වෙප්පතෙයිර මහළිර් විද්‍යාලයය, මාර/වෙප්ප තෙයිර විද්‍යාලයය, මාර/කොංගල මහා විද්‍යාලයය, මාර/කොංගල තොඩක්ක නිලප් පාඨශාලය, මාර/කෙක්කිලියාප්පොල තෙත්කු විද්‍යාලයය, මාර/මුරුත්තමූර්ය විද්‍යාලයය? (ආ) ඉව්වොප්පන්තකාරයාට 1966 ඔක්ටෝබරයිලිරුන්දු 1967 මේ වශර ඉප් පාඨශාලයියිලුළ්ළ මාණවර්කට්කුරිය මතිය භෝජනත්තිර්කුත් තේවෙයාන මා කොටුක්කප්පට්ටුළ්ළතෙ අවර් අරි වාරා? (ඉ) අංඟනමායින් මේර්කූරිය මාතම් ඔව්වොන්රිලුම් 8-10 නාට්කට්කු මේර්පට්ට නාට්කට්කු මතිය භෝජනම් වළංක්කප්පටවිල්ලෙ යෙන්පතෙ අවර් අරි වාරා? (ඊ) තේවෙයාන මා වළංක්කප්පට්ට පෝතිලුම් මතිය භෝජනම් වළංක්කප්පටා මෙක්කාන කාරණමෙන්න? (උ) එඤ්සියුළ්ළ මාවිර්කු එන්න නටන්තුළ්ළතෙන්පතෙක් කූරුවාරා? (ඌ) ඉව්වොප්පන්තකාරෙයෛ තොටර්න්තුම් ඉව්වොප්පන්තත්තෙ නටත්තුවතර්කු අනුමතික්ක එණ්ණියුළ්ළාරා? (එ) ආමෙනින්, ඒන්? (ඒ) ඉතුපර්රි අවර් විසාරණෛ නටත්තුවාරා? (ඔ) ඉල්ලෙයෙනිල්, ඒන්?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Will he state the name of the contractor who supplies the midday meal to the students of the following schools within the Hakmana circuit in the Matara District: මාර/Hakmana Methodist College, මාර/Hakmana Buddha Jayanthi Vidyalaya, මාර/Wepothaira Kanda Vidyalaya, මාර/Wepothaira Vidyalaya, මාර/Kongala Maha Vidyalaya, මාර/Kongala Primary School, මාර/Kebiliyapola South Vidyalaya, මාර/Muruthamuraya Vidyalaya? (*b*) Is he aware that the flour required to supply the midday meal to the above schools for all the days on which school was held during the period October 1966 to May 1967 was issued to the contractor? (*c*) If so, is he aware that in each month the midday meal was not supplied for more than 8-10 days? (*d*) What is the reason for the failure to supply the midday meal in spite of the necessary flour being issued? (*e*) Will he state what happened to the balance stocks of flour? (*f*) Does he propose to allow this contractor to hold the contract any further? (*g*) If so, why? (*h*) Will he hold an inquiry into this contract? (*i*) If not, why?

ගාමණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(*a*) Mr. D. M. Samarawickrema, Reeds Cafe, Hakmana. (*b*) Yes. (*c*) Yes. Inquiries are already being made by the Education Office, Matara. (*d*) Reasons cannot be stated at this moment as inquiries have not been completed. (*e*) The stock of CARE flour is with the baker. (*f*) A decision will be taken when these inquiries are completed. (*g*) As at (*f*). (*h*) An inquiry will be held. (*i*) Does not arise.

දෙහිඕවිට කොට්ඨාශයේ පාසල් සඳහා ඉඩම්

தெஹியோவிற்றத் தொகுதியில் பாடசாலைகளுக்குக் காணி

LAND FOR SCHOOLS IN DEHIOWITA ELECTORATE

4. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (ඩී. පී. ආර්. වීරසේකර මයා.—දෙහිඕවිට—වෙනුවට)

(திரு. லெஸ்லி குணவர்தன—திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—தெகியோவிற்ற—சார்பாக)

(Mr. Leslie Goonewardene—on behalf of Mr. D. P. R. Weerasekera—Dehiowita)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිතුමා ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දෙහිඕවිට ආසනයේ බස්නාගල මහා විදුහලට, කහනාවිට විදුහලට, නාවේල විදුහලට, දෙහිඕවිට විදුහලට සහ තවත් ඉඩම් අවශ්‍යව ඇති මෙතෙක් පවරා නොගත් නිසා ඉඩම් නොමැති විදුහල්වලට ඉඩම් අත්පත් කර ගැනීමට එතුමා ගන්නා ක්‍රියා මාර්ගයත් ඒම ඉඩම් අත්පත් කරගන්නා දිනයත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දන්වනවාද? (ආ) දෙහිඕවිට විදුහලටත්, කහනාවිට විදුහලටත්, බස්නාගල මහා විදුහලටත් පසුගිය වර්ෂයේ අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම් මෙතෙක් අත්පත් කර ගෙන අවසාන නැත්තේ මන්ද? (ඉ) එතුමා මේ ගැන ක්‍රියාකරන්නේ කවදාද? (ඊ) ගෙන ඇති ක්‍රියාමාර්ගය කුමක්ද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) தெகியோவிற்றத் தேர்தல் தொகுதியைச்சேர்ந்த பஸ்ணகல மகா வித்தியாலயத்துக்கும், கஹனவிட்ட வித்தியாலயத்துக்கும், நாவெல வித்தியாலயத்துக்கும், தெகியோவிற்ற வித்தியாலயத்துக்கும் காணி தேவைப்பட்டும், இதுவரை காணி பெற்றுக் கொடுக்கப்படாத ஏனைய வித்தியாலயங்களுக்கும் காணி பெற்றுக்கொடுக்க அவர் எடுக்கும் நடவடிக்கைகளையும், காணிகளைப் பெற்றுக் கொடுக்க விருக்கும் தேதியையும் அவர் தெரிவிப்பாரா? (ஆ) தெகியோவிற்ற வித்தியாலயத்துக்கும், கஹனவிட்ட வித்தியாலயத்திற்கும், பஸ்ணகல வித்தியாலயத்திற்குமாகச் சென்ற ஆண்டில் பெற்றுக்கொள்ளத் தீர்மானித்திருந்த காணிகளை இன்றைவரையும் பெற்றுக்கொள்ள முடியாமல் இருப்பதேன்? (இ) அவர் இவ்விடயம் சம்பந்தமாக எப்பொழுது நடவடிக்கை எடுப்பார்? (ஈ) இதுவரை எடுத்துள்ள நடவடிக்கை என்ன?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Since the lands required by the Basnagala Maha Vidyalaya, the Kahanavita Vidyalaya, the Nawela Vidyalaya, the Dehiowita Vidyalaya and other schools which are in need of land, in the Dehiowita Electorate, have not been acquired so far, will he state what action he proposes to take with a view to acquiring these lands and also the date on which such lands will be acquired? (*b*) Why has the acquisition of the lands proposed to be acquired last year for Dehiowita Vidyalaya, Kahanavita Vidyalaya, and Basnagala Maha Vidyalaya not been completed up to date? (*c*) When will he take action in regard to this matter? (*d*) What action has been taken so far?

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

(*a*) Action has been taken to acquire lands for certain schools, and it is proposed to take action with regard to other schools according to the availability of funds and the needs of the regions. It is not possible to say definitely the dates on which these lands will be acquired. The position regarding the acquisition of lands for Basnagala Maha Vidyalaya, Kahanawita Vidyalaya, Nawala Vidyalaya and Dehiowita Vidyalaya respectively is as follows: (i) Kg/Basnagala Maha Vidyalaya—Declaration under Section 5 of the Land Acquisition Act has been published. (ii) Kg/Kahanawita Vidyalaya—Declaration under Section 5 of the Land Acquisition Act has been published for the acquisition of a block of land ($\frac{1}{2}$ acre in extent) and the recommendation under Section 4 of the Act for the acquisition of the remaining block of land ($\frac{1}{2}$ acre in extent) has been forwarded to the Ministry of Land. (iii) Kg/Nawala Vidyalaya—has been included in the proposals for acquisition in the next financial year to be considered if funds permit. (iv) Kg/Dehiowita Vidyalaya—a request has been made to the Hon. Minister of Land, Irrigation and Power for the grant of immediate possession of these lands in terms of Section 38 (*a*) of the Land Acquisition Act. (*b*) As action has to be taken in terms of the provisions of the Land Acquisition Act. (*c*) Action is already being taken. (*d*) Does not arise in view of (*a*) above.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Question No. 5.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

Sir, this is not really a Question, in a way. It is difficult to answer a question like this because all the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

requirements of the electorate are indicated. It will take about a year or so—

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

The hon. Parliamentary Secretary's position is that he is unable to give an answer?

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

Yes, Sir. At least one year's time is needed.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදි.

විලුවෙ මற්றெරු தினத்துக்குச் சமர்ப்பிக்க ஆணையிடப்பட்டது.

Question ordered to stand down.

රණසින්කන්ද ආදියේ වැසියන්ට උස් බිම්

றசிண்கிந்த முதலான இடங்களில் வசிப்பவர்களுக்கு மேட்டுநிலம்

HIGHLAND FOR RESIDENTS OF RASINKANDA, ETC.

6. ලෙස්ලි ගුණවර්ධන මයා. (ඩී. පී. ආර්. වීරසේකර මයා. වෙනුවට)
(திரு. லெஸ்லி குணவர்தன—திரு. டீ. பீ. ஆர். வீரசேக்கர சார்பாக)
(Mr. Leslie Goonewardene—on behalf of Mr. D. P. R. Weerasekera)

සමාජ සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1967 ජූනි මාසයේ ඇති වූ ජලගැල්මට සහ නායයාමට අසුවූ දෙහිඕවිට ආසනයේ රණසින්කන්ද උඩහේන්කන්ද, දූරණියගල, දෙහිඕවිට කහනාවිට, යෝගම, අල්ගොඩ, දන්ගම්පල, හිඟුරලකන්ද, අම්බලන්පිටිය, තලපිටිය, පූකුරුවල, පනාවල, තැලුම්පිටිය, මානියන්ගම වාසීන්ට ජලයට යට නොවන හා නායයෑම්වලට අසු නොවන උස් බිම් ලබා දීමට එතුමා ඉඩම් ඇමතිතුමාත් සමග සාකච්ඡාකොට වැඩ පිළිවෙළක් යොදනවාද? (ආ) ඒ වැඩ පිළිවෙළ කුමක්ද? (ඉ) යොදන්නේ කවදාද? (ඊ) නොඑසේ නම්, ඒ මන්දැ?

சமூக சேவை அமைச்சரைக் கேட்ட விஞ: (அ) 1967 ஆம் ஆண்டு ஜூன் மாதம் வெள்ளமும் மண் சரிவுமேற்பட்ட, தெஹியோவிற்றத் தேர்தல் தொகுதியிலுள்ள இடங்களாகிய றசின்கிந்த, உடஹேன்கந்த, தொணியகல, தெஹியோவிற்ற, கஹனவிற்ற, யோகம, அல்கொட, தன்கம்பொல, ஹிங்குரலகந்த, அம்பலாம்பிட்டிய, தலப்பிட்டிய புக்குணுவல, பணவல, தலும்பிற்றிய, மானியன்கம ஆகியவற்றில் வசிப்பவர்களுக்கு, வெள்ளத்தாலும் மண்சரிவாலும் பாதிக்கப்படாத மேட்டு நிலங்களை வழங்குவதற்குரிய திட்டமொன்றை அவர் காணியமைச்சருடன் ஆலோசித்து வகுப்பாரா? (ஆ) அத்திட்டமென்ன? (இ) அது எப்பொழுது நடைமுறைப்படுத்தப்படும்? (ஈ) இல்லையெனில், ஏன்?

asked the Minister of Social Services: (*a*) Will he in consultation with the Minister of Land implement a scheme to provide highland which is not subject to floods and earthslips, for the residents of Rasinkanda, Udahenkanda, Deraniyagala, Dehiowita, Kahanavita, Yogama, Algoda, Dangampola, Hinguralakanda, Ambalanpitiya, Talapitiya, Pukuruwela, Panavala, Talumpitiya and Maniyangama in the Dehiowita Electorate where floods and earthslips occurred in June 1967? (*b*) What is the scheme? (*c*) When will it be implemented? (*d*) If not, why?

ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)
(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன—சமூக சேவை அமைச்சர்)
(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

(අ) ගංවතුරෙන් හා නාය යාමෙන් විපතට පත්වූ දෙහිඕවිට ප්‍රදේශයේ පවුල් නැවත පදිංචි කරවීම සඳහා සුදුසු වෙනත් ඉඩම් සම්බන්ධයෙන් කෑගල්ල දිසාපති විසින් මූලික පරීක්ෂණ පවත්වා අවසානය. (ආ) තවම අවසාන කොට නොමැත. (ඉ) දැන නොනගී. (ඊ) දැන නොනගී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

சபை அலுவல்

BUSINESS OF THE HOUSE

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

I move,

"That Monday, 4th September; and Tuesday, 5th September 1967; be Allotted Days for the consideration of the Appropriation Bill, 1967-68."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම

சபை அமர்வு

SITTINGS OF THE HOUSE

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

I move,

"That notwithstanding the provisions of Standing Order No. 74 (2), the hours of Sitting on Monday, 4th September; and Tuesday, 5th September 1967; shall be 9.30 A.M. to 12 Noon : 2 P.M. to 4 P.M. ; and 4.30 P.M. to 8.30 P.M.; and at 8.30 P.M. Mr. Speaker shall adjourn the House without Question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

විසර්ජන කෙටුම්පත් පනත, 1967-68

ஒதுக்கீட்டுச் சட்டமூலம், *1967-68*

APPROPRIATION BILL, 1967-68

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.

[ප්‍රගතිය අගෝස්තු 30]

[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப் பெற்றது. [தேர்ச்சி, 30 ஓகஸ்ட்].

[உப சபாநாயகர் அவர்கள் தலைமை தாங்கினார்கள்.]

Considered in Committee.—[*Progress 30th August.*]

[MR. DEPUTY SPEAKER *in the Chair.*]

—කාරක සභාව

—குழு

85 වන ශීර්ෂය.—ජනසතු සේවා අමාත්‍යවරයා

1. වන සම්මතය :—කාර්ය මණ්ඩල පොදු ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 8,76,205.

85 ஆம் தலைப்பு.—தேசியமயசேவை அமைச்சர்

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூ. 8,76,205

HEAD 85.—MINISTER OF NATIONALIZED SERVICES

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 876,205

ඉදිරිපත් කරන ලද සංශෝධනය.—[අගෝස්තු 30]

"වැය සම්මතය රු. 10කින් අඩු කල යුතුය."—[ලෙස්ලි ගුණවර්ධන මයා.]

பிரேரிக்கப்பட்ட திருத்தம் —[ஓகஸ்ட் 30] :

"வாக்குப்பணத்தில் ரூபா 10 குறைக்கப்படுமாக". —[திரு. லெஸ்லி குணவர்தன].

Amendment moved.—[*30th August*] :

"That the Vote be reduced by Rs. 10." [*Mr. Leslie Goonewardene*].

ප්‍රශ්නය යළින් සභාභිමුඛ කරන ලදී.

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

Question again proposed.

බී. වයි. තුඩාවේ මයා. (මාතර)

(திரு. பி. வை. துடாவ—மாத்தறை)

(Mr. B. Y. Tudawe—Matara)

ගරු සභාපතිතුමනි, විනාඩි දෙකකට වඩා ගන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මා සඳහන් කිරීමට බලාපොරොත්තු වන්නේ මෙයයි. ලංගම ජනසතු ව්‍යාපාරය ආරම්භ කරන අවස්ථාවේ ගොඩ නැගිලි රාශියකුත් රජයට පවරා ගත්තා. එසේ පවරා ගත් ගොඩනැගිලි ආපසු දෙන්නට බලාපොරොත්තුවක් තිබෙනවාය කියා අපට දැනගන්නට ලැබී තිබෙනවා. බී. ජේ. ප්‍රනාන්දු මහතාගෙන් පවරා ගත් බොරැල්ලේ තිබෙන ගොඩනැගිලි ආපසු දෙන්නට යනවා යයි රාවයක් තිබෙනවා. ජනසතු සේවා ඇමතිතුමා තුළ එවැනි අදහසක් තිබෙන්නවාදැයි දැනගන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩවෙ මයා.]

ඊළඟ ප්‍රශ්නය වැටුප් පිළිබඳවයි. ලංගම රියැදුරන්ට රුපියල් 239 ක පමණ වැටුපක් ඒ කාලයේ ගෙව්වා. එහෙත් අලුතින් බඳවා ගන්න රියැදුරන්ට ලැබෙන්නේ රුපියල් 180 ක වැටුපක්. එකම ආයතනයේ සමාන සේවයක් කරන අයගෙන් එක කොටසකට රුපියල් 239 ක වැටුපකුත් තවත් කොටසකට රුපියල් 180 ක වැටුපකුත් ගෙවීම සාධාරණ නැති නිසා රුපියල් 180 බැගින් ගෙවන අලුතෙන් පත් කළ රියැදුරන්ටත් රුපියල් 239 යේ වැටුප ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

තවත් කරුණක් තිබෙනවා. ජනසතු සේවය ආරම්භ කළ දිනයේ සිටම එහි කම් කරුවන්ට තිබුණු එක්තරා සහනයක් නැත්නම් අයිතිවාසිකමක් තමයි ලංගම බස් මධ්‍යස්ථානවල රැස්වීම් පැවැත්වීමට තිබුණු අයිතිය. මේ රජය බලයට පත්වූදා සිට ඔවුන්ට ඒ අයිතිවාසිකම නැති කර තිබෙනවා. දැන් ලංගම බස් මධ්‍යස්ථානවල වෘත්තීය සමිති රැස්වීම් පැවැත්වීමට කම් කරුවන්ට ඉඩ දෙන්නේ නැහැ. යම් හෙයකින් ඉඩ දුන්නත් එම රැස්වීම්වලදී ලංගමය විවේචනය නොකරන බවට කොන්දේසියක් ගන්නවා. ලංගම ප්‍රජාතන්ත්‍රවාදය ඒකයි. ඒ අනුව ලංගම දූෂණ එළිදරව් කිරීමට වෘත්තීය සමිතිවලට පුළුවන්කමක් නැහැ. ජනසතු සේවා හරි මහට යොමු කිරීමට නම් ඒවායේ තිබෙන දූෂණ එළිදරව් කිරීමේ අයිතිය වෘත්තීය සමිතිවලට තිබෙන්නට ඕනෑ. බණ්ඩාරනායක මහතා එම අයිතිවාසිකම ඔවුන්ට දුන්නේ ජනසතු සේවාවන් නියම මාර්ගයේ යෙදවීමටත් ඒවා කඩාකප්පල් කිරීමට ඉඩ නොතැබීමටත් බව කියන්නට කැමතියි. මේ රජය බලයට පැමිණියාට පසුව වෘත්තීය සමිතිවලට තිබුණු ඒ අයිතිවාසිකම නැති කර තිබෙනවා. ඒ නිසා එම වෘත්තීය අයිතිවාසිකම එම සේවකයින්ට ලබාදෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

මීට වඩා කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මා කථා කරන්නේ විනාඩි 2ක් පමණක් යයි කියමිනුයි මා කථාව පටන් ගත්තේ. ඒ පොරොන්දුව ඉටු කරමින් මගේ කථාව මෙයින් නතර කරනවා.

ජී. බී. විජයසුන්දර මයා. (කිරිඇල්ල)
(திரு. பீ. பி. விஜயசுந்தர—கிரியல்ல)
(Mr. P. B. Wijesundara—Kiriella)

ගරු සභාපතිතුමනි, ජනසතු සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡාවට භාජනය වන මේ කාරක සභා අවස්ථාවේදී ප්‍රථම යෙන්ම ජනසතු සේවා කටයුතු පිළිබඳ වැඩ බලන ගරු ඇමතිතුමාගෙන් මා එක කාරණයක් දැන ගන්න කැමතියි. සමහර විට ඒක සතුටුදායක ආරංචියක් වෙන්ට පුළුවනි. අද උදේ දිනපතා ප්‍රවෘත්ති පත්‍ර දෙකකම ශීර්ෂ පාඨ හැටියට පළ වී තිබුණ, ජනවාරි 8 වෙනිදා සිද්ධිය සම්බන්ධයෙන් වැඩ තහනම් කර සිටින ලංගම සේවකයින් සියලු දෙනාටම ආපසු වැඩ දෙන්ට යනවාය කියා. එම නිසා මේ සාකච්ඡාව අවසානයේදී වැඩ බලන ඇමතිතුමාගේ පිළිතුරු කථාවේදී ඒ ප්‍රවෘත්තියේ සත්‍ය-අසත්‍යතාව පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

ඊළඟට මතක් කරන්ට තිබෙන්නේ ලංගමය ධාවනය කරන බස් සංඛ්‍යාව පිළිබඳවයි. ලංගමයට කලින් බස් 3,300 ක් පමණ තිබුණු අතර පසුගිය අවුරුද්දේ තවත් බස් 756 ක් වැඩි කර තිබෙනව. මෙයින් $\frac{1}{4}$ක් තරම පාරවල නොව ගරාජවල තිබෙන බවයි අපට දැන ගන්ට තිබෙන්නේ. මේ ගැන සඳහන් කරන විට ආණ්ඩුව ප්‍රධාන වශයෙන්ම කියන්නේ එසේ සිදු වෙන්නෙ කඩාකප්පල්කාරී ව්‍යාපාරික සිංහලේ වැඩ නිසා බවයි. එවැනි ජනසම්මත වාදී ප්‍රගතිශීලී ව්‍යාපාරයක් කඩාකප්පල් කරන්ට ප්‍රගතිශීලී ජනතාව කවදාවත් උත්සාහ නොකරන බව මේ අවස්ථාවේදී මා වැඩබලන ගරු ඇමතිතුමාට මතක් කරන්ට කැමතියි. එවැනි කඩාකප්පල් කිරීමේ ව්‍යාපාරයක යෙදෙනව නම් යෙදෙන්නෙ ආණ්ඩුව විසින්ම ඒ සථානයට සම්බන්ධ කර ගත් පුද්ගලයන් බව මා මතක් කරනව. මන්ද? මේ ගමනාගමන සේවය ජනසතු ව්‍යාපාරයක් හැටියට පවත්වාගෙන යන්ට බැරිය, නැවතත් එය පෞද්ගලික අංශයට භාර දිය යුතුය, කියන මතය ඔවුන් දරනව. ඒ මතය තහවුරු කරන්න ඒ විධියේ කඩාකප්පල්කාරී වැඩවල ඔවුන් යෙදෙන නිසා කඩාකප්පල්කාරීන් ගැන සෝදිසි කරන්න විට තමන්ගේ පිටුපසින් සිට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිහියෙන් අනින පුද්ගලයින් ගැන විශේෂයෙන් සොයා බලන ලෙස මා මතක් කරනවා.

අද ලංගමය තුළ ලොකු කඩ ඇදිල්ලක් තිබෙනවා. ඒ කඩ ඇදීම මේ ව්‍යාපාරය කඩා කප්පල් වීමට තවත් හේතුවක් වී තිබෙනවා. එම නිසා තමන්ගේ සණ්ඩු දබර නිසා ඇතිවන වැරදිවලට ඒ සේවයේ නියුක්තව සිටින ප්‍රගතිශීලී ජනතාව වගකියන්ට සූදානම් නැති බව ගරු වැඩ බලන ඇමතිතුමාට මතක් කරන්ට කැමතියි.

ප්‍රූ. හා. 9.45

ලංකා ගමනාගමන මණ්ඩලය අනිකුත් සංස්ථාවලට වඩා වෙනස් වන්දි ක්‍රමයක් තමයි, අනුගමනය කරන්නෙ. ලංගමයේ වාහන වලින් සහ වෙනත් යන්ත්‍රෝපකරණ වලින් යම් යම් පුද්ගලයන්ට සිදු වන අනතුරු සම්බන්ධයෙන් කරන වන්දි ගෙවීම් සම්බන්ධයෙන් අප පමණක් නොව ප්‍රවෘත්ති පත්‍ර පවා විවේචන ඉදිරිපත් කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් ළඟදී "ඔබ්සර්වර්" පත්‍රයේ විශාල විවේචනයක් පළ වුණා. මාසයකට රුපියල් හාර-පන්දාහක ආදායමක් ලබන ධනපති පන්තියේ කෙනෙකුට බස් අනතුරකින් සිදු වූ තුවාලයකට රුපියල් 65,000 ක වන්දි මුදලක් ගෙවා තිබෙනවා. එහෙත් දරු පවුලක් නඩත්තු කරන අහිංසක පුද්ගලයකු ලංගමයේ වාහනයකින් අනතුරට පත් වී මිය ගිය අවස්ථාවක ඒ පුද්ගලයාගේ භාර්යාවට හා දරු පිරිසට වන්දි වශයෙන් ගෙවා තිබෙන්නේ රුපියල් 1,500 යි. මෙයින් පෙනී යනවා, වන්දි ගෙවීම්වල කොයිතරම් විෂමතාවක් තිබෙනවද කියා. එම නිසා ලංගමයේ නීතිඥ මණ්ඩලය ප්‍රමාණවත් නැත්නම් තවත් වැඩි කරගෙන පන්ති භේදයෙන් තොර වන්දි ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලෙස ඉල්ලා සිටිනවා. දුප්පත් කෙනෙකු අනතුරකට පත් වුණු විට ඒ පුද්ගලයා වෙනුවෙන් සෑහෙන වන්දියක් ලබා දීමේ ක්‍රමයක් සකස් කරන්න ඕනෑ. මේ අන්දමේ වන්දි විෂමතාවක් තිබීම ඉතාම හානිකරයි. යමක්කමක් ඇති කෙනෙකුගේ තුවාලයකට රු. 65,000 කුත්, නැති බැරි කෙනෙකු ජීවිතක්ෂයට පත් වූ විට රුපියල් 1,500 කුත් වන්දි වශයෙන් ගෙවීම මහා විහිළුවකට කාරණයක් වී තිබෙනවා.

ඊළඟට මා ඉල්ලා සිටින්ට කැමතියි, ලංගමයේ සේවකයින්ට නොමිළයේ වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමේ මීට වඩා පුළුල් වැඩ පිළිවෙලක් සකස් කළ යුතු බව. නොයෙක් දෙනා සේවයට බැඳෙන්නෙ කිසිම ලෙඩ රෝගාදියක් නැතිවයි. එහෙත් සේවයට බැඳීමෙන් පසුව සේවය නිසා ඇස් ආබාධ වැනි නොයෙක් ශරීරාබාධ ඇතිවෙනවා. එවැනි උදවියගේ ඇස් පරීක්ෂා කිරීම, ඔවුන්ට කණ්ණාඩි සැපයීම සහ ඔවුන්ගේ වෙනත් ආබාධයන්ට නොමිළයේ ප්‍රතිකාර ලබා දීම ලංගමය ප්‍රතිපත්තියක් කර ගත යුතු යයි මා ඉල්ලා සිටිනවා.

දැන් අවුරුදු $1\frac{1}{2}$ ක පමණ සිට—මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව යයි කියන්ට පුළුවන්—ලංගමය සේවකයන් ඉදිරිපත් කරන ආයුර්වේද වෛද්‍ය සහතික නොපිළිගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා. එම නිසා ආයුර්වේද වෛද්‍ය සහතික පිළිගැනීමේ ප්‍රතිපත්තිය නැවත තහවුරු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ඩී. බී. වෙලගෙදර (වැඩබලන ජනසතු සේවා ඇමති)

(கௌரவ டீ. பி. வெலகெதர—பதில் தேசிய மய சேவை அமைச்சர்)

(The Hon. D. B. Welagedera—Acting Minister of Nationalized Services)

දැන් භාර ගන්නවා.

විජයසුන්දර මයා.

(திரு. விஜேசுந்தர)

(Mr. Wijesundara)

ඒ ගැන ස්තුතිවන්ත වෙනවා.

ලංගම බස් රථ ධාවනය කළ හැකි මාර්ග බොහෝ ගණනක ඒ බස් රථ ධාවනය කරවන්නේ නැහැ. නොයෙකුත් බාධක තිබීම ඊට හේතුවයි. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව අනුගමනය කරන ප්‍රතිපත්තිය තමයි, ප්‍රධාන බාධාව වී තිබෙන්නේ. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ තාවකාලික හෝ ස්ථිර බලපත්‍රයක් නැතිව යම් පාරක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයසුන්දර මයා.]

බස් රථ ධාවනයක් ඇති කරන්නේ නැහැ. මෙවැනි ප්‍රශ්න සම්බන්ධයෙන් ලංගමයත් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවත් අතර මාසයකට වරක්වත් සාකච්ඡාවක් පැවැත්විය යුතුයි. ඒ සාකච්ඡා සභාවලට ඒ පාරවල් පිහිටි කොට්ඨාශ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා ගම්කාර්ය සභාපතිවරුන් සහභාගි කර ගන්නවා නම් ඒ පාරවල බස් රථ ධාවනය කරවිය හැකි තත්ත්වයක් පවතින බව ඔප්පු කරන්නට ඒ අයට පුළුවන් වෙනවා ඇති. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව විසින් "ඒ" සහ "බී" යනුවෙන් වර්ග කරනු ලබන පාරවල පමණයි, බස් රථ ධාවනය කරන්නට ඉඩ දෙන්නේ. එහෙත් මේ ශ්‍රේණිවලට ඇතුළත් කරන්නට පුළුවන් කම තිබියදී එසේ ඇතුළත් නොකරන ලද පාරවල් කීපයක්ම තිබෙනවා. එසේ හෙයින් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව ලංගම ඉංජිනේරුවන් ලවා ඒ පාරවල් පරීක්ෂා කරවා බස් රථ ධාවනය කරවන්නට ඒ පාරවල් සුදුසුදැයි දැන ගන්නට පුළුවනි. පාරවල් බස් රථ ධාවනයට සුදුසුදැයි තීරණය කිරීම ලංගමයට භාර ගත යුතු බව මා කල්පනා කරනවා. ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියා මාර්ගයක් ගන්නවා ඇතැයි බලාපොරොත්තු වෙනවා.

පුවක්පිටිය-තුම්මෝදර පාර සම්බන්ධයෙන් ජනසතු සේවා අමාත්‍යාංශයෙන් අංක ඒ. ඒ. 130/65 දරන ලිපිය මා වෙත එවා තිබෙනවා. අවිස්සාවේල්ල ඡන්ද කොට්ඨාශයත් කිරිඇල්ල ඡන්ද කොට්ඨාශයත් සම්බන්ධ කරන මෙම පාරේ දිග සැතපුම් හතරයි. ඒ පාරේ බස් රථ ධාවනය කරවීම බොහොම පහසුයි. දැනට ඒ පාරේ බස් රථ ධාවනයක් නොමැති නිසා අවිස්සාවේල්ල උසාවිය වෙත යන උදවියට තුම්මෝදර සිට කලුඅග්ගලට ගොස් නැවත එතැන සිට අවිස්සාවේල්ල දක්වා යන්නට සිදු වී තිබෙනවා. සැතපුම් හත රෙන් කර ගන්නට පුළුවන් ගමන සඳහා සැතපුම් දහඅටක් ගමන් කරන්නට ඔවුන් හට සිදු වී තිබෙනවා.

ඉඩංගොඩ-කිරිඇල්ල-හිදුරන්ගල පාරේත් මින්නාන-නාපාවල පාරේත්, ඇහැලිය ගොඩ-නැදුරණ පාරේත් දැනට වැන් රථ සේවයක් පවතිනවා. මෙම වැන් රථ වෙනුවට පොඩි බස් රථ ධාවනය කරවන්නට පුළුවනි. දැනට ඒ පොඩි බස් රථ ලංගමයට ලැබී තිබෙනවාදැයි මා දන්නේ නැහැ. අඩු ගණනේ එම පාරවල ඒ පොඩි බස් රථවත් ධාවනය කරවන ලෙස මා ඉල්ලා සිටිනවා. මේ පාරවල් හැම එකකම වැන් රථ සේවයක් පවතින හෙයින් ඒවා යෙහි මේ පුංචි බස් රථ ධාවනය කරවීම ඉතාමත්ම පහසු කාරණයක්.

ලංගම විමසීම් සේවය දැනට දුර්වල තත්ත්වයක පවතිනවා. ටෙලිෆෝනයෙන් විමසීම් කාර්යාලය සම්බන්ධ කර ගන්නට බොහෝ වේලාවක් ගත වෙනවා. මෙම අංශයෙහි ඉතාමත් ටික දෙනකු සේවයෙහි යෙදී සිටීම මීට හේතුවයි. ඒ ටික දෙනාට වැඩ කටයුතු රාශියක් තිබෙනවා. එසේ හෙයින් මෙම විමසීම් අංශය සඳහා තව වැඩිපුර නිලධාරීන් යොදවන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඊයේ නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය නාගනාතන්) ලොකු උද්ඝෝෂණයක් කරමින් ලංගමයෙහි හා ජනසතු සේවා අමාත්‍යාංශයෙහි කටයුතු දැනට වඩා දෙමළ භාෂාවෙන් කළ යුතු බව සඳහන් කළා. එහෙත් මා මෙහිදී මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. මඩකලපුවේ බස් නැවතුම්පොළේ සහ මඩකලපුව ඩිපෝවේ එකම බස් රථයකවත් සිංහල වචන යොදා නැහැ. හැබැයි, අපේ වැඩ බලන ඇමතිතුමා මේ ගැන සොයා බලා දැන්නම් මේ අඩුපාඩුව සපුරා තිබෙන බව දැන ගන්නට තිබෙනවා. ඉතින් ඔය විධියට කටයුතු සිදුව තිබියදීත් නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමා ඒ අන්දමින් කථාකිරීම කන ගාටුවට කාරණයක්. මහ ජාතියේ අයිති වාසිකම් රකිමින් තමන්ගේ අයිතිවාසිකම් ගැන කථා කරන්නට ඕනෑ. සහයෝගය අවශ්‍ය නම් ඒ විධියට ක්‍රියා කළ යුතුයි.

ලංගමයේ ජර්මානු අභ්‍යාස විද්‍යාලයෙහි පසුගියදා ලොකු කලබලයක් තිබුණා. මත භේද ඇති වී කාලයක් නිස්සේ මෙය වසා දමලත් තිබුණා. මෙහි මතභේද ඇති වන්නේ ශිෂ්‍යයන්ට තමන්ගේ වුවමනා එපා කම් ගැන නිතරම පාලක පක්ෂය සමග සාකච්ඡා කරන්නට අවස්ථාවක් නොලැබෙන නිසයි. එම නිසා ඒ ශිෂ්‍යයන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සුභසාධක සංගමයක් පිහිටුවා ගන්නට අවසර දේවිය කියා මා බලාපොරොත්තු වෙනවා. එවැනි සංගමයක් පිහිටුවා ගන්නට අවසර දුන්නොත් ජර්මානු අභ්‍යාස මධ්‍යස්ථානයේ ඒ ශිෂ්‍යයන් සමඟ මීට වඩා සහයෝගයෙන් කටයුතු කරන්නට පුළුවන් වෙනවා.

ඊළඟට, ලංකා ගමනාගමන මණ්ඩලයේ සෙවකයින් මාරු කිරීම ගැන මා වචන ස්වල්පයක් කියන්නට අදහස් කරනවා. මේ මාරු කිරීම් පිළිබඳව නොයෙක් නොයෙක් විෂමතාවයන් තිබෙනවාය කියා අපට දැනගන්නට ලැබී තිබෙනවා. ඒ විෂමතාවයන් නැති කරන්නට දැන් "පොයින්ට් ස්කීම්" නම් ක්‍රමයක් ඇති කර තිබෙනවා. නමුත් ඒ "පොයින්ට් ස්කීම්" ක්‍රමයට පිටස්තරවත් ස්ථාන මාරුවීම් කෙරෙන බව පෙනෙන්නට තිබෙනවා. "පොයින්ට් ස්කීම්" ක්‍රමය හරියාකාරව ක්‍රියාවේ යෙදවිය යුතුය කියා අධ්‍යක්ෂ මණ්ඩලය නොබෝදා තීරණය කළාය කියා අපට දැනගන්නට ලැබී තිබෙනවා. සභාපතිතුමා මේ ක්‍රමයට අකැමැති බවත් දැනගන්නට ලැබී තිබෙනවා. කිසිවකුට අසාධාරණයක් නොවන අන්දමට මේ මාරුවීම් කරන මෙන් මා ඉල්ලා සිටිනවා. ඒ "පොයින්ට් ස්කීම්" ක්‍රමය හරියාකාරව ක්‍රියාත්මක කරමින් කාටත් සාධාරණ අන්දමින් මේ මාරුවීම් පිළිබඳව කටයුතු කරන මෙන් මා නැවතත් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, අද ලංකා ගමනා ගමන මණ්ඩලයට කොන්දොස්තරවරුන් විශාල සංඛ්‍යාවක් බඳවා ගෙන තිබෙනවා. මේ කොන්දොස්තරවරුන් බඳවා ගැනීමට ප්‍රථමයෙන් ජනසතු සේවා අමාත්‍යාංශය මගින් සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුටම එවූ ලිපියක් ගැන මා වැඩ බලන ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. 1965 මැයි 27 වන දින දරණ ඒ ලිපියේ යොමුව ටීබී/සී/3 එස්. සෑම ඡන්දදායකකොට්ඨාශයකින්ම කොන්දොස්තරවරුන් 35 දෙනෙකු බැගින් තෝරා ගත්තාය කියා මේ ලිපියේ සඳහන් වෙනවා. නමුත් මේ කොන්දොස්තරවරුන් බොහෝ දෙනෙකුට තවම පත්වීම් ලැබී නැති බව මට දැනගන්නට ලැබී තිබෙනවා. මගේ කොට්ඨාශයෙන් තෝරා ගත් 35 දෙනාගෙන් 11 දෙනෙකුට තවම පත්වීම් ලැබී නැහැ. අනික් කොට්ඨාශවලින් තෝරා ගත් අයගෙනුත් බොහෝ දෙනෙකුට තවම පත්වීම් ලැබී නැහැ. එම නිසා අළුතෙන් කොන්දොස්තරවරුන් බඳවා ගැනීමට ප්‍රථමයෙන් පත්වීම් දෙනවාය කියා පොරොන්දු වූ මේ අයට පත්වීම් දෙන මෙන් මා ඉල්ලා සිටිනවා. විභාගයෙනුත් සම්මුඛ පරීක්ෂණයෙනුත් සමර්ථ වූ මේ අපේක්ෂකයන්ට පසුව පත්වීම් දෙනවාය කියා ජනසතු සේවා අමාත්‍යාංශය මන්ත්‍රීවරුන්ට ලියවිල්ලක් එවා තිබෙනවා. එම නිසා අළුතෙන්ම කොන්දොස්තරවරුන් බඳවා ගැනීමට ප්‍රථමයෙන් ඒ අයට පත්වීම් දෙන ලෙස මා නැවතත් ඉල්ලා සිටිනවා.

රත්නපුරේ ඩිපෝවේ අඩුපාඩු ගැනත් මා සඳහන් කරනවා. රත්නපුරේ ඩිපෝවෙන් කෙරෙන නොයෙකුත් වැඩ කටයුතු සම්බන්ධව පරීක්ෂණයක් කරන ලෙස ඉල්ලමින් ගිලීමලේ ගම් කායෂී සභාවේ සභාපතිතුමා රත්නපුරේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා මාගීයෙන් ලිපියක් එවා තිබෙනවා. ඒ සම්බන්ධව පරීක්ෂණයක් කළා. නමුත් ඒ පරීක්ෂණය ප්‍රමාණවත්ය කියා මා කල්පනා කරන්නේ නැහැ. රත්නපුරේ ඩිපෝවෙන් ධාවනය කරවන බස් රථ ඉතා ප්‍රමාද වෙනවා. බස් රථ ප්‍රමාදවීම නිසා නියමිත වේලාවට උසාවියට එන්නට නොහැකිවූ සමහර අයට මහෙස්ත්‍රාත්තුමා වරෙන්තු පවා නිකුත් කර තිබෙනවා. විශේෂයෙන්ම උදේ කාලයේ බස් ධාවනය ඉතාම දුර්වලයි. සාමාන්‍යයෙන් පිටගම්වලින් එන බස් රථ රත්නපුර නගරයට ළඟා වන විට උදේ 9.30, 10 වෙනවා. මෙසේ බස් රථ ප්‍රමාද වීමේ හේතුවෙන් උසාවියට, රැකීරක්ෂා, කාර්යාලයෙ සම්මුඛ පරීක්ෂණ යනාදියට බොහෝ දෙනෙකුට නියමිත වේලාවට පැමිණෙන්නට නොහැකි වෙනවා. ගිලීමලේ ගම් කායෂී සභාවේ සභාපතිතුමා ඉල්ලා සිටින පරිදි රත්නපුර ඩිපෝව ගැන සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වන මෙන් මා නැවතත් ඉල්ලා සිටිනවා.

ක්‍රීඩා අංශය ගැනත් මා කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. පසුගිය දිනවල ක්‍රීඩා පිළිබඳව විශාල උනන්දුවක් තිබුණේ වී නමුත් ඒ උනන්දුවේ තරමට වැඩ කටයුතු කෙරී නොමැති බව මා සඳහන් කරනවා. මේ වැඩ කටයුතු හරියාකාරව නොවීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයසුන්දර මයා.]

කෙරෙන්නට හේතුවක් නම් අමාත්‍යාංශ තුනකට මේ වැඩ පැවරී තිබීමයි. දැන් පළාත් පාලන අමාත්‍යාංශය මගිනුත් අධ්‍යාපන අමාත්‍යාංශය මගිනුත් ජනසතු සේවා අමාත්‍යාංශය මගිනුත් ක්‍රීඩා භූමි පිහිටුවනවා. ක්‍රීඩා පිළිබඳව හරියාකාරව වැඩක් කෙරෙන්නට නම් එළිමහන් ක්‍රීඩා භූමි පිහිටුවීමේ කාර්යය ජනසතු සේවා අමාත්‍යාංශයේ ක්‍රීඩා අංශයටම භාර කළ යුතුය කියා මා කල්පනා කරනවා. අද තිබෙන විධියට අමාත්‍යාංශ තුනකට මේ කටයුතු භාර කර තිබීමෙන් කිසිම සේවයක් නොවන බව මා මතක් කරනවා.

ක්‍රීඩා උපකරණවලත් හිඟයක් තිබෙනවා. මා නියෝජනය කරන ඡන්දදායක කොට්ඨාශයේ, එනම් කිරිඇල්ලේ ඉඩන් ගොඩට හා ඇහැලියගොඩ නගරයට ක්‍රීඩා භූමි දෙකක් මා ඉල්ලා තිබෙනවා. ඒ ඉල්ලීම කර දැන් බොහෝ කාලයක් ගතවී තිබෙනවා. ඒ ඉල්ලීම පිළිබඳව යොමු අංක එස්පීබී 176/66 දරණ ලිපියෙන් වාර්තාවක් එවන්නය කියා මට දැනුම් දී තිබෙනවා. ඒ අනුව මා වාර්තාවක් යැව්වා. කිරිඇල්ල ගම් කාර්ය සභාවත්, ඇහැලියගොඩ ගම් කාර්ය සභාවත්, පනාවල ගම් කාර්ය සභාවත් අවශ්‍ය සියලුම වාර්තා සපයා තිබෙනවා, කිරිඇල්ල සහ ඇහැලියගොඩ ක්‍රීඩා භූමි සම්බන්ධයෙන්. අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් ක්‍රීඩා භූමි විශාල කිරීමට ක්‍රීඩා අමාත්‍යාංශයට ඉඩ දීමට අධ්‍යාපන දෙපාර්තමේන්තුව කැමැත්ත පළ කර තිබෙනවා. එහෙත් තවමත් ඒ කටයුතු හරියාකාරව කෙරී නැහැ. එම නිසා ඒ කටයුතු සම්බන්ධවත් වැඩ බලන ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා.

ඒ සමඟම ලංගමය සම්බන්ධයෙන් සඳහන් කළ ප්‍රශ්න ගැනත්—විශේෂයෙන් ලංගම සේවක ප්‍රශ්න ගැන—එතුමාගේ අවධානය යොමු කරවමින්, මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

පූ. භා. 10

ඩී. ඊ. තිලකරත්න මයා.

(திரு. டி. ஈ. திலகரத்ன)

(Mr. D. E. Tillekeratne)

සභාපතිතුමනි, මට කථා කරන්නට ලැබී තිබෙන්නේ මිනිත්තු කීපයක් පමණයි. ඒ මිනිත්තු කීපය තුළවත් කරුණු කීපයක් සඳහන් කරන්නට මා බලාපොරොත්තු වෙනවා. ලංගම සේවකයන් සම්බන්ධයෙන් කිරිඇල්ලේ ගරු මන්ත්‍රීතුමා (ජී. බී. විජයසුන්දර මයා.) සඳහන් කළ සමහර කරුණුවලට මට එකඟ වන්නට පුළුවන්කමක් නැහැ. ලංගමයේ කඩාකප්පල්කාරයන් නැතැයි අපට පිළිගන්නට පුළුවන්කමක් නැහැ. 1966 ජනවාරි 8 වැනිදා සිද්ධියෙන් ඒ බව ඔප්පු වෙනවා. ලංගමයේ තරම් කඩාකප්පල්කාරයන් ලංකාවේ වෙන මොනම ආයතනයකවත් නැතැයි මා කල්පනා කරනවා. අදත් ලංගමයේ කඩාකප්පල්කාරයන් ඉන්නවා. රජයට විරුද්ධව, රජයේ වැඩ පිළිවෙළවල් කඩාකප්පල් කරන සේවකයන් රාශියක් අදත් ලංගමයේ ඉන්නා බව අප හොඳින්ම දන්නවා.

විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් විසින් ඊයේ මුළු දවස තුළම වාගේ ලංගමයේ සභාපතිතුමාටත්, එහි අධ්‍යක්ෂ මණ්ඩලයටත් චෝදනා එල්ල කළා. එම කථාවලට ඇහුම්කන් දීමේදී අපට පෙනී ගියා, සමහර චෝදනාවල කිසිම හරයක් නැති බව. ඇත්ත වශයෙන්ම ලංගමයේ සභාපතිතුමාටත්, එහි අධ්‍යක්ෂ මණ්ඩලයටත් අප ප්‍රශංසා කළ යුතුයි. අද පවතින විදේශ විනිමය හිඟය දෙස බලන විට අළුත් බස් හෝ අමතර කොටස් හෝ ගෙන්වීම ඉතාමත් අපහසු බව අප දන්නවා. විදේශ විනිමය ඒ තරම් අමාරු තත්ත්වයක පවතිද්දීත් ලංගම සේවය 1965 වඩා දියුණු තත්ත්වයක අද පවතින බව අප අමතක කරන්නට හොඳ නැහැ.

මට දැනගන්නට ලැබී තිබෙන ආරංචිවල හැටියට, 1965දී එක දවසකට ලංගමය බස් ධාවනය කළේ සැතැප්ම 4,50,000ක් පමණයි. එහෙත් 1967 අවුරුද්දේ ලංගමය එක දවසකට සැතැප්ම 6,50,000ක් බස් ධාවනය කර තිබෙනවා. ඒ ධාවන වාර්තාව අනුව බලන විට එක බස් රථයක් නම් ලෝකය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වටා 26 වාරයක් ගමන් කරන තරම් දුර ප්‍රමාණයක ලංගමය දවසකට බස් රථ ධාවනය කරවනවා. අනෙක් අංශවලින් පවා 1965 ට වඩා දියුණු තත්ත්වයක අද ලංගමය පවතින බව අපට කියන්නට පුළුවනි. ලංගමයට අළුත් බස් හා අමතර කොටස් ගෙන්වා ගන්නට පුළුවන්කම තිබෙනවා නම් පසුගිය අවුරුද්දට වඩා ලාභයක් මේ අවුරුද්දේදී ලබන්නට පුළුවන් කම තිබෙනවා.

කිරිඇල්ලේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළාක් මෙන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවත්, ලංගමයත් එකමුතු වී වැඩ කරනවා නම් මීට වඩා හොඳ බස් සේවයක් පවත්වාගෙන යන්නට පුළුවනි. ඊට උදාහරණයක් වශයෙන් එක් කාරණයක් සඳහන් කරන්නට කැමතියි. ගාල්ලේ, මහමෝදර පාළම උඩින් යකඩ වැටක් සවි කර තිබෙනවා. ඒ නිසා ඒ පාළම උඩින් තට්ටු දෙකේ බස් ධාවනය කරවන්නට බැරි තත්ත්වයක් පැන නැඟී තිබෙනවා. ලංගම තට්ටු දෙකේ බස් ධාවනය කරන්නට පුළුවන් වන ආකාරයට, එම පාළම උඩින් සවි කර තිබෙන යකඩ වැට ඉවත් කරන ලෙස, ගාල්ලේ දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභා රැස්වීමේදී රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් අප ඉල්ලා සිටියා. අපේ ඒ ඉල්ලීමට සහයෝගය දක්වනවා තබා මේවන තුරු ඒ සම්බන්ධයෙන් පිළිතුරක්වත් ලැබී නැහැ. ඒ පාළම උඩින් සවි කර ඇති ඒ යකඩ වැට ගළවනවා නම් ගාල්ල දිස්ත්‍රික්කයේ බස් සේවය මීට වඩා දියුණු කරන්නට පුළුවනි. ඒ වාගේම අපේ පළාත්වලත් තට්ටු දෙකේ බස් ධාවනය කරවන්නට ඒ නිසා පුළුවන්කම ලැබෙනවා. කිරිඇල්ලේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළාක් මෙන්, ලංගමය රජයේ වැඩ දෙපාර්තමේන්තුවත් සමග දැනට වඩා සම්බන්ධකමක් ඇති කරගෙන අළුත් පාරවල බස් ධාවනය කිරීම සම්බන්ධයෙන් ඒ දෙපාර්තමේන්තුව සමග මාසයකට වරක්වත් සාකච්ඡා පවත්වනවා නම් විශාල ප්‍රයෝජනයක් ලැබෙන බව මතක් කරන්නට කැමතියි. කුඩා පාරවල ලොකු බස් ධාවනය කරන විට එම පාරවල ගමන් කරන මගීන්ටත් හිරිහැරයි. බස් රථවලටත් අලාභ සිදු වෙනවා. පාරවලුත් ඉක්මණින්ම අබලන් වෙනවා. ඒ හේතුකොට ගෙන රජයට දෙපැත්තකින්ම පාඩු විඳින්නට සිදු වෙනවා. එක පැත්තකින් බස් කැඩෙන අතර අනික් පැත්තෙන් පාරවල් අබලන් වෙනවා. එම නිසා ලංගමයත් රජයේ වැඩ දෙපාර්තමේන්තුවත් ඉක්මණින්ම මේ පිළිබඳව වැඩ පිළිවෙළක් සකස් කර ගෙන සුදුසු පරිදි බස් ධාවනය කිරීමට කල්පනා කරනු ඇතැයි මා විශ්වාස කරනවා.

ටිකට් යන්ත්‍ර සම්බන්ධයෙන් පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) සඳහන් කළා. අද ලෝකයේ නොයෙකුත් මෝස්තරයේ ටිකට් යන්ත්‍ර තිබෙනවා. අපේ රටේ තරම් ලෝකයේ කුමන රටකවත් මෙම ටිකට් යන්ත්‍ර කැඩෙන්නේ නැති බව එක්තරා වාර්තාවකින් මා දුටුවා. ගිණිකුරකින් හෝ පුංචි යකඩ කුරකින් හෝ යම්කිසි උපක්‍රමයක් යොදා හෝ එම යන්ත්‍රය ක්‍රියාත්මක භාවයෙන් තොර කර ඊට එකතු වී තිබෙන මුදල් ප්‍රමාණයෙහි යම්කිසි අඩුවක් පෙන්වන්නට තරම් සූත්තරකාරී මොල තිබෙන බස් කොන්දොස්තර මහත්වරුන් අපේ බස් සේවාවේ සිටින බව පෙනෙනවා. ඒ උදවිය ඇතැම් විට ඉංජිනේරුවරුන්ටත් වඩා සූර උදවිය යයි කියන්නට පුළුවනි. එම නිසා එකම වර්ගයේ යන්ත්‍ර නොව හත් අට වර්ගයක යන්ත්‍ර ගෙන්වා පාවිච්චියට ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා. එසේ කළොත් එවැනි උපක්‍රම යෙදීම බොහෝ දුරට අඩු වෙනවා ඇති. ටිකට් යන්ත්‍ර මේ අන්දමට කඩන්නට නුපුළුවන් වෙනවා ඇති.

ක්‍රීඩා අංශය පිළිබඳවත් යමක් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. මගේ පළාත ක්‍රීඩා අතින් විශාල දියුණුවක් ලබා තිබෙන බව පෙනෙනවා. රත්ගම, හික්කඩුව, මාදම්පේ වැනි ගම්වල ළමයින් ක්‍රීඩා පිළිබඳ විශෙෂ වාර්තා පවා පිහිටුවා තිබෙනවා. එම ප්‍රදේශයම් යම් සැප පහසුකම්වලින් තොර දුෂ්කර ප්‍රදේශ වුවත් ක්‍රීඩා අතින් එතරම් දියුණුවක් පෙන්වා තිබෙනවා. එම නිසා එම පළාතේ ක්‍රීඩා දියුණුව සඳහා යම් අන්දමක ආධාරයක් උපකාරයක් දෙනවා නම් හොඳයි. එම ප්‍රදේශයේ පාඨශාලාවලට ක්‍රීඩා පිට්ටනි සහ ක්‍රීඩා උපකරණ යනාදිය නිසියාකාර ලබා දෙන්නට කල්පනා කරනවා නම් කොළඹ, නුවර සහ ගාල්ල වැනි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. ඊ. තිලකරත්න මයා.]

ප්‍රදේශවල ළමයින්ට වඩා දක්ෂකම් පෙන්වන්නට එම පළාතේ ශිෂ්‍යයනට හැකිවෙනවා ඇති. අප ප්‍රදේශයේ ක්‍රීඩා කටයුතු සඳහා දෙනු ලබන සහාය මදි. ඒ සඳහා වැඩිපුර මුදලක් දෙන්නට පුළුවන්කම තිබෙනවා නම් ඉතා ප්‍රයෝජනවත් වන බව මතක් කරන්නට ඕනෑ.

මගේ කථාව මීට වඩා දීර්ඝ කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මේ අමාරු අවස්ථාවේදී පවා ලංගමය දුර්වල කර ගන්නේ නැතුව වැඩ අවුල් කර ගන්නේ නැතුව ගාල්ලේ සිට යාපනය, මහනුවර සහ මඩකලපුව වැනි දුර ප්‍රදේශවලට දිවෙන විශාල බස් ධාවන මාර්ග ආරම්භ කිරීමෙන් කර තිබෙන විශාල සේවය ගැන ගරු ඇමතිතුමාටත් වැඩ බලන ගරු ඇමතිතුමාටත් සේවක මණ්ඩලයටත් ලංගම සභාපතිතුමාටත් නැවත වරක් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ගරු වෙලගෙදර
(கௌரவ வெலகெதர)
(The Hon. Welagedera)

ජනසතු සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ මෙම සාකච්ඡාවේදී අපේ මන්ත්‍රීවරුන් ඉතා සාමකාමී අන්දමින් වැදගත් අදහස් රාසක් ඉදිරිපත් කර තිබෙන බව කියන්නට ඕනෑ. ඒ පිළිබඳව එම මන්ත්‍රීතුමන්ලාට මගේ ස්තුතිය පළමුකොටම පුද කර සිටිනවා.

එතුමන්ලා ඉදිරිපත් කරන ලද කරුණු අංශ කීපයකට බෙදිය හැකියි. ඒ එක් එක් අංශය වෙන වෙනම ගෙන පිළිතුරු සපයන්නටයි මා කල්පනා කරන්නෙ. මා ප්‍රථමයෙන්ම ලංගමය පිළිබඳව කතා කරන්නට කල්පනා කරනවා. ලංගමය පිළිබඳව කරුණු කීපයක් ඉදිරිපත් වී තිබෙනවා. ගිය වර්ෂයේදී අප පිළිතුරු නොදී මග හැරියාය යන අන්දමේ අදහසක් ඉදිරිපත් වන කතාවක් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) විසින් ඉදිරිපත් කරන්නට යෙදුණා. ඒ පිළිබඳව පසුගිය වර්ෂයේ අගෝස්තු 26 වැනි දින **හැන්සාඩ්** වාර්තාවේ 1461 වැනි තීරුවේ තිබෙන්නෙ මේ විධියටයි:

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

There are no Opposition Members to speak. As there is no other Member to speak, I shall now put the Question."

අප උත්තර දීමට සූදානම් නොවුණා නොවෙයි. විවාදය ඉදිරියට ගෙන යාමට විරුද්ධ පාර්ශ්වයෙන් කවුරුත් නොසිටි නිසා එදා අපේ වැය ශීර්ෂය සම්මත වුණා.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

ඒක වැරදියි. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීතුමන්ලා කථා කරන්නට නැත් නම් ඇමතිතුමා උත්තර දෙන්නට ඕනෑ. ඊට පස්සෙයි, ඡන්දය විමසිය යුත්තේ.

ගරු වෙලගෙදර
(கௌரவ வெலகெதர)
(The Hon. Welagedera)

පානදුරේ මන්ත්‍රීතුමා මුලින්ම කථා කළේ සේවකයන් බඳවා ගැනීම සහ විභාග ගැනයි. සේවකයන් බඳවා ගන්නේ ඉදිරිපත් වන අයගේ දක්ෂතාවය අනුව බව මා කියන්නට කැමතියි. ඩ්‍රයිවර්වරුන් වශයෙන් බඳවා ගන්නට නම් ලයිෂන්ස් එක තියෙන්නට ඕනෑ; අවුරුද්දකට වඩා වැඩි කාලයක් බර රථවාහන පදවා තියෙන්නට ඕනෑ; පස් වැනි පන්තිය සමත් වී තියෙන්නට ඕනෑ. ඒ පිළිවෙළට ඩ්‍රයිවර්වරුන් බඳවා ගෙන පුහුණුවක් දෙනවා. ඒ දෙන පුහුණුව මදිය කියා ප්‍රශ්නයක් මතු වුණා. ඒ පුහුණුව මදි නම් තවත් පුහුණුවක් දීමට බලාපොරොත්තු වෙනවා. එසේ පුහුණු කරන ලද රියැදුරනුත් යම් යම් රථවාහන පදවාගෙන යන විට පරීක්ෂා කරනවා. පැදවීම දුර්වල නම් නැවතත් පුහුණු කර ලයි, ඔවුන් සේවයේ යොදවන්නේ.

මාතර සිද්ධියක් ගැන මතක් කළා. ඒ ගැන මා කණගාටු වෙනවා. ඔහු කොහෙන් ආවද කියා මා දන්නෙ නැහැ. ඒ රියැදුරා පුහුණු රියැදුරෙක්. ඔහුගේ වරදින් නොවෙයි, එය සිදු වුණේ. පාරේ ලිස්සන ගතියක් තිබුණු නිසා බස් රථය පොල් ගහක හැපී සේවක මහත්මයෙක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මැරුණා. රථවාහන පදවන කව්රුත් දන්නවා, "ස්කීඩ්" වෙනවා කියා දෙයක් සිදු වන බව. ඒ නිසා වන්නට ඇති ඒ අනතුර සිදු වී තිබෙන්නේ.

අනික් සේවකයන් බඳවා ගන්නෙත් අධ්‍යාපන තත්ත්වය අනුවයි. ලිපිකරුවන් ගන්නෙත් විභාගයක් පවත්වා එහි ප්‍රතිඵල අනුව පොරොත්තු ලේඛනයක් තබා ගෙනයි. ටයිපිස්ට්වරුන් ගන්නෙත් එහෙමයි.

ජර්මන් අභ්‍යාස විද්‍යාලය ගැනත් පානදුරේ මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් මතු කළා. ජර්මන් අභ්‍යාස විද්‍යාලයට කිසි කෙනකු බඳවා ගන්නට සභාපතිතුමාට බලයක් නැහැ. රට පුරා විභාගයක් පවත්වා එයින් සමත් වූ අය පමණයි, ඒ අභ්‍යාස විද්‍යාලයට බඳවා ගන්නේ. විභාගයට ඉදිරිපත් නොවූ අය බඳවාගෙන තිබෙනවා නම් ඒ අයගේ නම් දුන්නොත් ඒ ගැන සොයා බලන්නට පුළුවන්. එහෙම වන්නට විධියක් නැහැ.

බස් රථ ගෙන්වීමේදී කොමිස් දීම ගැනත් ප්‍රශ්නයක් මතු වුණා. අප දන්නා තරමින් බස් රථ ගැනීමේදි කොමිස් දීමක් නැහැ. ගරු මන්ත්‍රීතුමා මතක් කළ පසු මා ඒ ගැන සොයා බැලුවා. ලෝකයෙන්ම ටෙන්ඩර් කැඳවා ලැබෙන අඩුම ටෙන්ඩරය අනුවයි, බස් ගන්නේ. කොමිස් දීමක් නැහැ. කොමිස් දීමක් තිබෙනවා නම් ඒ ගැන සොයා බලන්න පුළුවන්.

ටාටා බෙන්ස් බස් 75 ක් ගෙන්වා තිබෙනවා. ඒවායේ වරදක් නැහැ. ඒවා පාවිච්චි කරගෙන යනවා. බස් අවශ්‍ය නම් ඒවා තවත් ගෙන්වීමට බලාපොරොත්තු වෙනවා.

ජනවාරි 8 වැනිදා වැඩ වර්ජනය කළ අය ගැනත් ගරු මන්ත්‍රීතුමා මතක් කළා. ඒ අය වැඩ වර්ජනය කළේ මහජනයාගේ පහසුකම් නැති වන විධියටයි. බස් සේවය අනිකුත් සේවාවන් වගේ නොවෙයි. කෝටි සංඛ්‍යාත ජනකායක් දිනපතා බස් වලින් එහාට මෙහාට යනවා. ඒ නිසා එදිනට වැඩ වර්ජනය යෝග්‍ය නැත කියා අප කිව්වා. වැඩ වර්ජනය කළ අය සේවය අත්හැර ගිය හැටියට සලකා සේවයෙන් නෙරපා දැමුවා. අසහනීය නිසා හෝ වෙනත් හේතූන් නිසා—කරුණු සහිතව —වැඩට නොපැමිණි අය විස්තර ඉදිරිපත් කළා. එවැනි අය අප වහාම නැවත සේවයට බඳවා ගත්තා. නැවතත් කරුණු ඉදිරිපත් කළ තවත් විශාල සංඛ්‍යාවක් අප සේවයට බඳවාගෙන තිබෙනවා. සේවයට බඳවා නොගත් අය තවත් පන්සිය ගණනක් පමණ සිටිනවා.

නඩුවක් ගැනත් මතක් කළා. මේ නඩුව අපට විරුද්ධව ඒ අය විසින් දමා ඇති නඩුවක්. ධර්මදාස කියන මහතා ගැනත් ගරු මන්ත්‍රීතුමා මතක් කළා. එතුමාගේ කොට්ඨාශයේ කෙනෙකු වශයෙන් එතුමා කිව්වා, ඔහු බොහෝම හොඳ කෙනෙකුය කියා. ඔව්, මා දන්නවා. ඒ මහතා මා සමුවන්නත් ආවා. නඩුව ඉල්ලා අස්කර ගන්නවාය රක්ෂාව දෙන්නය කියා ඉල්ලා සිටියා. මා කිව්වා, නඩුව පිළිබඳ ඇපැල තිබෙන තුරු කිසිවක් කරන්න බැරිය, රක්ෂාව දීම පිළිබඳව අපේ මණ්ඩලයක් තිබෙනවාය, එම නිසා ඒ පිළිබඳව තීරණය කරන්නේ ඒ මණ්ඩලය මහින්ය කියා. නඩු තීන්දුවට විරුද්ධවූ අප ඇපැල් ගත්තේ අප ගත් පියවර හරිය කියන හැඟීම උඩයි. එසේ නැතුව සේවකයන් තලා පෙළා කටයුතු කිරීමට නොවෙයි.

තමුන්නාන්සේලා කවුරුත් වාගේ දන්නා කොඩිස්වරන් නඩුවේ ඇපැල ආණ්ඩුවට වාසි වන ලෙස තීන්දු වී තිබෙනවා. නඩුව දැමූ තැනැත්තා මූලින් ජය ගත්තත් ආණ්ඩුව කල්පනා කළා ආණ්ඩුව ගත් පියවර හරි කියා. ඒ නිසා ඇපැල් ගත්තා. ඇපැලේදී ආණ්ඩුවට වාසි වන විධියට තීන්දුව ලැබුණා. ඒ අනුව අප හිතාගන්න ඕනෑ නඩු තීන්දු කියන දේවල් අපේ අතේ තිබෙන දේවල් නොවන බව. අපට තිබෙන්නේ නීත්‍යානුකූලව කටයුතු කරන එකයි. ධර්මදාස මහතා සමග කිසි තරහකින් නොවෙයි අප ඇපැල් ගත්තේ. ඒ මහතා නඩුවෙන් ජය ගත්තොත් අප ඒ මහතාට රක්ෂාව දෙනවා. එහෙම නැත් නම් ඉතින් කරන්න දෙයක් නැහැ.

ඊළඟට ලාභ අලාභ ගැන තමුන්නාන්සේ ප්‍රශ්නයක් මතු කළා. ලාභ අලාභ පිළිබඳ විස්තර මා ඉදිරිපත් කරන්න සතුටයි. 1958 දී රුපියල් 36,51,000 ක් පාඩු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු වෙලගෙදර]

යි. 1959 වර්ෂයේදී රුපියල් 1,27,46,000ක් පාඩුයි. 1960 වර්ෂයේදී රුපියල් 96,95,000 ක් පාඩුයි. 1961 වර්ෂයේදී රුපියල් 31,45,000ක් පාඩුයි. 1962 වර්ෂයේදී රුපියල් 39,94,000ක් ලාභයි. 1963 වර්ෂයේදී රුපියල් 48,43,000ක් ලාභයි. 1964 වර්ෂයේදී රුපියල් 1,35,21,000ක් ලාභයි. ජනවාරි සිට ඔක්තෝබර් දක්වා 1965 මුල් භාගයේ රුපියල් 59,74,000ක් ලාභයි. ඒ ලාභය සුඛසාධක මුදලක් වශයෙන් වෙන්කර සේවකයන්ට රු. 175.25ක බෝනස් වශයෙන් දුන් රුපියල් 55,00,000 හැරයි. 1965 අවසාන භාගයේදී රුපියල් 87,46,000ක් ලාභයි. ඔය අන්දමට ලාභ ලබාගෙන විත්, 1967 ජනවාරි මාසය වන විට රුපියල් 87,50,000ක ලාභයක් තිබෙනවා. ජූනි මාසයේ පමණක් රුපියල් 23,60,000ක් ලාභයි. මේ අනුව බලන විට ලංගමයෙන් පාඩු වන වාය කියා තමුන්නාන්සේලා නොයෙක් නොයෙක් වාර්තා අනුව පිළිගෙන ඇතත් එය සත්‍යයක් නොවෙයි.

ගු. භා. 10.15

ඇලුමිනියම් තහඩු ගැන මතක් කරන්න යෙදුණා. The following is the position regarding the purchase of aluminium extrusion.

The purchase of 50 per cent of the C.T.B's requirement of aluminium extrusion was concluded through the Crown Agents in June 1966 on their lowest quotation. The overall saving by way of foreign exchange amounted to £ 632.10s.

At the time this purchase was concluded there was an upward trend in the international price of aluminium and that was due to the shortage of copper consequent to the Rhodesian crisis. Aluminium is being substituted for copper.

86 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"86 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 84,46,918 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

86 ஆம் தலைப்பு, 2 ஆம் வக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 8,446,918 for Head 86, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.

Head 86, Vote 2, ordered to stand part of the Schedule.

3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම, රු. 7,94,510

வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 7,94,510

Vote No. 3.—Administration Charges—Capital Expenditure, Rs. 794,510

"86 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 7,94,510 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

86 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"86 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் ரூபா 7,94,510 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

"86 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Question, "That the sum of Rs. 794,510 for Head 86, Vote No. 3, be inserted in the Schedule", put, and agreed to.

Head 86, Vote 3, ordered to stand part of the Schedule.

4 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම්, රු. 15,72,000

වාක්‌කුප්පණම් ඉල. 4.—තිණෙක්කළත්තාල් අලික්කප් පටුම් සේවෙකළ්,—මීණ්ඩුවරුම් සෙලවු, රූපා 15,72,000

Vote No. 4.—Services provided by the Department—Recurrent Expenditure, Rs. 1,572,000

"86 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය සඳහා රු. 15,72,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

86 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට නිබිය යුතු යයි නියෝග කරන ලදී.

"86 ආම් තලෛප්පු, 4 ආම් වාක්‌කුප්පණම් රූපා 15,72,000 අට්ටවණෛයිර් සේර්ක්කප්පටුමාක" එනුම් විණ්ණ විටුක්කප්පට්ට ඒර්‌ත්‌රුක් කොළ්ළප්පට්ටතු.

86 ආම් තලෛප්පු, 4 ආම් වාක්‌කුප්පණම් අට්ටවණෛයිල් ඉණෛයප් පණික්කප්පට්ටතු.

Question, "That the sum of Rs. 1,572,000 for Head 86, Vote No. 4, be inserted in the Schedule", put, and agreed to.

Head 86, Vote 4, ordered to stand part of the Schedule.

5 වන සම්මතය—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම්, රු. 1,76,500

වාක්‌කුප්පණම් ඉල. 5.—තිණෙක්කළත්තාල් අලික්කප් පටුම් සේවෙකළ්,—ආක්කප්පොරුට් සෙලවු, රූපා 1,76,500

Vote No. 5.—Services provided by the Department—Capital Expenditure, Rs. 176,500

"86 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය සඳහා රු. 1,76,500 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

86 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට නිබිය යුතු යයි නියෝග කරන ලදී.

"86 ආම් තලෛප්පු, 5 ආම් වාක්‌කුප්පණම් රූපා 1,76,500 අට්ටවණෛයිර් සේර්ක්කප්පටුමාක" එනුම් විණ්ණ විටුක්කප්පට්ට ඒර්‌ත්‌රුක්කොළ්ළප්පට්ටතු.

86 ආම් තලෛප්පු, 5 ආම් වාක්‌කුප්පණම් අට්ටවණෛයිල් ඉණෛයප් පණික්කප්පට්ටතු.

6 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම්, රු. 35,83,287

වාක්‌කුප්පණම් ඉල. 6.—පොරුළාතාර අභිවිරුත්ති—මීණ්ඩුවරුම් සෙලවු, රූපා 35,83,287

Vote No. 6.—Economic Development—Recurrent Expenditure, Rs. 3,583,287

"86 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය සඳහා රු. 35,83,287 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

86 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට නිබිය යුතු යයි නියෝග කරන ලදී.

"86 ආම් තලෛප්පු, 6 ආම් වාක්‌කුප්පණම් රූපා 35,83,287 අට්ටවණෛයිර් සේර්ක්කප්පටුමාක" එනුම් විණ්ණ විටුක්කප්පට්ට ඒර්‌ත්‌රුක්කොළ්ළප්පට්ටතු.

86 ආම් තලෛප්පු, 6 ආම් වාක්‌කුප්පණම් අට්ටවණෛයිල් ඉණෛයප් පණික්කප්පට්ටතු.

Question, "That the sum of Rs. 3,583,287 for Head 86, Vote No. 6, be inserted in the Schedule", put, and agreed to.

Head 86, Vote 6, ordered to stand part of the Schedule.

7 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම්, රු. 1,91,11,425

වාක්‌කුප්පණම්, ඉල. 7.—පොරුළාතාර අභිවිරුත්ති ආක්කප්පොරුට් සෙලවු, රූපා 1,91,11,425

Vote No. 7.—Economic Development—Capital Expenditure, Rs. 19,111,425

"86 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය සඳහා රු. 1,91,11,425 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

86 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට නිබිය යුතු යයි නියෝග කරන ලදී.

"86 ආම් තලෛප්පු, 7 ආම් වාක්‌කුප්පණම් රූපා 1,91,11,425 අට්ටවණෛයිර් සේර්ක්කප්පටුමාක" එනුම් විණ්ණ විටුක්කප්පට්ට ඒර්‌ත්‌රුක්කොළ්ළප්පට්ටතු.

86 ආම් තලෛප්පු, 7 ආම් වාක්‌කුප්පණම් අට්ටවණෛයිල් ඉණෛයප් පණික්කප්පට්ටතු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Question, "That the sum of Rs. 19,111,425 for Head 86, Vote No. 7, be inserted in the Schedule", put, and agreed to.

Head 86, Vote 7, ordered to stand part of the Schedule.

87 වන ශීර්ෂය.—වෙරළබඩ පහන් සේවය

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 90,854

87 ஆம் தலைப்பு.—கரையோர வெளிச்சம்

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 90,854

HEAD 87.—COAST LIGHTS

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 90,854

"87 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 90,854 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

87 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"87 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 90,854 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

87 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 90,854 for Head 87, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.

Head 87, Vote 1, ordered to stand part of the Schedule.

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 39,900

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 39,900

Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 39,900

"87 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 39,900 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

87 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"87 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 39,900 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

87 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 39,900 for Head 87, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.

Head 87, Vote 2, ordered to stand part of the Schedule.

98 වන ශීර්ෂය.—වාණිජ හා වෙළඳ අමාත්‍යවරයා

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 3,01,235

98 ஆம் தலைப்பு.—வர்த்தக, வியாபார அமைச்சர்

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூ. 3,01,235

HEAD 98.—MINISTER OF COMMERCE AND TRADE

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 301,235

පූ. භා. 11

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

"වැය සම්මතය රුපියල් 10 කින් අඩු කළ යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, මෙම අමාත්‍යාංශය ගැන කථා කිරීමට පළමුව එක් කාරණයක් සඳහන් කරන්න ඕනෑ. විරුද්ධ පාර්ශ්වයෙ මන්ත්‍රීවරුන් වශයෙන් මෙම සභාවට අප පැමිණ සිටින්නෙ එක්තරා වගකීමක් ඇතුවයි. විරුද්ධ පක්ෂයෙන් ආණ්ඩු පක්ෂයට හෝ ආණ්ඩු පක්ෂයෙන් විරුද්ධ පක්ෂයට හෝ යම් කිසි චෝදනාවක් කරන්නා තිබෙනවා නම්, එය නොපැකිල ප්‍රකාශ කරන්න ඕනෑ. අපට නොයෙක් කාරණා සම්බන්ධයෙන් ආරංචි ලැබෙනව, අප ඒවා ගැන චෝදනා කළ විට ඒවා ගැන කේන්තියෙන් පිපිරී, හයියෙන් හඬ නගා කෑ ගැසුවාට අපේ කට වහන්න බැරි බව මතක් කර දෙන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

At the same time, may I, representing the House, inform the hon. Member that when he makes an allegation against an Hon. Minister or an hon. Member of the House, he should do so with a sense of responsibility, and when such an allegation is denied, he should accept it.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

I accept it. The point is that I made a charge.

මා කියා සිටියා, අසුවල් තනතුරේ පුරප්පාඩුව ගැන නිවේදනයක් පළ කළේ නැතැයි කියා. සම්පූර්ණ වගකීමක් ඇතුවයි ඒ ප්‍රකාශය කළේ. අපට ලැබී ඇති ආරංචි අනුව කරුණු ඉදිරිපත් කළාම තමුන්නාන්සේගේ යුතුකමක් තිබුණා, ඒවා ගැන පරීක්ෂා කර බලන්න. අපට බලයක් නැහැ, විභාග කරන්න. එමනිසා ඒ කාරණා ගැන විභාග කර බලා පිළිතුරු සැපයීම යුතුකමක් බව නැවත වරක් මතක් කරනවා.

වෙළඳ අමාත්‍යාංශය ගැනයි අප දැන් සාකච්ඡා කරන්නෙ. අපට බොහොම අමාරුයි මේ අමාත්‍යාංශය ගැන සාකච්ඡා කරන්න. මන්ද? මෙය අමාත්‍යාංශයක් නොවෙයි, නිකම් බෝඩ් ලෑල්ලක් පමණයි. වාණිජ හා වෙළඳ අමාත්‍යාංශය කියා බෝඩ් ලෑල්ලක් පමණක් තිබෙනවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Like the Board of Trade in England.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

හරියට තටු කැපූ කුරුල්ලෙක් වාගෙයි. ඉස්සර මේ අමාත්‍යාංශය යටතට ආනයන අපනයන, සතොස, ජාත්‍යන්තර සහ අභ්‍යන්තර වෙළඳාම, සැපයීම් ආදී දෙපාර්තමේන්තු රාශියක්ම තිබුණා. දැන් ඒවා නැහැ. දැන් අපරාදෙ මහජනයාට දොස් නගන්න පමණක් මේ අමාත්‍යාංශය තිබෙනවා. අනුන් කරන වැරදිවලට දොස් ලබන්නෙ මේ අමාත්‍යාංශයයි. කොටින්ම කියනවා නම් අමාත්‍යාංශය ඇටසැකිල්ලක් පමණයි. ඔලුව තිබෙන්නෙ රාජ්‍ය ඇමතිතුමා අතේ. හදවත තිබෙන්නෙ අගමැතිතුමා අතේ. මේ විධියට එහි කොටස් වෙන් වෙන් විශයෙන් තිබෙන නිසා අපට සාධාරණ විවේචනයක් පවා කිරීමට අපහසුකමක් ඇති වී තිබෙන බව සඳහන් කරන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේට මතක ඇති, පසුගිය දවස්වල විදේශීය හා දේශීය ධනපතීන් එකතුවී කුමන්ත්‍රණයක් කර මේ අමාත්‍යාංශයට තිබුණු බලතල සියල්ලක්ම අරගෙන අධිරාජ්‍යවාදීන්ගේ හුරතලා වශයෙන් පෙනී සිටින රාජ්‍ය ඇමතිතුමාට භාර දුන් බව.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

These are not my Votes, Sir.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

He is criticizing, stating that most of these powers are given over to you.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

May I reply to that, Sir.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

The hon. Member for Kolonnawa may carry on.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයට අද ඉතුරු වී ඇති දෙපාර්තමේන්තු මොනවාද? වාණිජ දෙපාර්තමේන්තුව, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාතර්මේන්තුව, වෙළෙඳ නාවික ගමනාගමන දෙපාර්තමේන්තුව, වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුව කියන දෙපාර්තමේන්තු කීපය පමණයි ඉතුරු වී තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම ආත්ම ගරුත්වය ඇති නම් මෙබඳු අමාත්‍යාංශයක් ඇති කරන එක වැරදියි. දහ අතකට බෙදා අමාත්‍යාංශයක් ඇති කර තිබෙන්නෙ, අනුන් කරන වැරදි වලට බැනුම් අස්වන්න මිස, බලලුන් ලවා කොස් ඇට බෑවීම වැනි වැඩ කරන්න මිස, පස්සෙන් ඉදගෙන නොයෙක් දේවල් කර නරක නාමය අස්සවන්න මිස වෙනත් කිසිම වැඩකට නොවෙයි.

ගරු සභාපතිතුමනි, අද අපේ වෙළඳාම ඉතාමත් නරක තත්ත්වයට පත් වී තිබෙන බව තමුන්නාන්සේ දන්නා කාරණයක්. එබඳු නරක තත්ත්වයක් ඇති වී තිබෙන බවට සාධක, අප ඉලක්කම් වලින් ගෙන හැර දක්වූවා. කොයි තරම් නරක තත්ත්වයක් ඇති වී තිබෙනවාද, අපේ විදේශීය වෙළඳාම කොයි තරම් තත්ත්වයකට වැටී තිබෙනවාද කියා 1966 අවුරුද්දේ මහ බැංකුවෙ වාර්තාවෙ 141 පිටුවෙන් බලා ගන්න පුළුවනි. එහි දැක්වෙන අන්දමට 1966 අපේ වෙළඳ අවාසිය රුපියල් දස ලක්ෂ 328 යි. අපනයනය රුපියල් දස ලක්ෂ 1700 යි. ආනයනය රුපියල් දශ ලක්ෂ 2028 යි.

1965 හේ වෙළඳ අවාසිය රුපියල් දශ ලක්ෂ 475 යි. අපනයනය රුපියල් දශ ලක්ෂ 1949 යි. ආනයනය රුපියල් දශ ලක්ෂ 1474 යි.

එන්න එන්නම බැහැගෙනයි යන්නේ.

ගරු අයි එම්. ආර්. ඒ. ඊරියගොල්ල
(අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)
(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல— கல்வி, கலாசார விவகார அமைச்சர்)
(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

අපේ තේ, රබර්, පොල් ආදියේ මිල පහත බැහැලා.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

පහත බැස තිබෙන්නේ මොනවා වෙලාද? අපිත් අහන්නේ ඒකයි. පසුගිය මාස දෙකේ තිබුණාටත් වඩා පහත බැහැලා. සංසන්දනය කර බලමු තත්ත්වය කොහොමද කියලා. මාර්තු මාසයේ පමණක් ලක්ෂ 570 ක් අලාභයි. අප්‍රේල් මාසයේ ලක්ෂ 590 යි. මාස දෙකකට එහෙම නම් අවුරුද්දකට 6000 ක් පමණ වෙනවා. ලක්ෂ තුන්දාස් දෙසිය අසූව ලක්ෂ හයදාහ දක්වා නහින්නයි එන්නේ. අපි මෙහෙම කියන්න් ඒ නිසයි. එසේ නැතිව ඇමති කම් ඇබදා ගන්නවාටවත් වෙන හේතුව කටවත් නොවෙයි. තමුන්නාන්සේලා එක් වී කරන්නට යන මේ වැඩේ තේරුම මොකක්ද? අපේ ආනයනයත් අපනයනයත් තිබෙන්නේ මෙවැනි පදනමක් උඩ නම් මේ ප්‍රශ්නය විසඳන්නේ කොහොමද? මේ අවුරුද්ද අන්තිමට වෙළඳ අවාසිය ලක්ෂ 6000 ක් පමණ වෙනවා නම් තමුන්නාන්සේලා වැඩ කරගෙන යන්නේ කොහොමද? ඒකයි මා අහන්නේ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

පුදුමයි නේද?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

පුදුමයක් නම් නැහැ. වෙන්නෙ කොහොමද කියා අපි පැහැදිලි කර දෙන්නම්. එය මේ මහ බැංකු වාර්තාවේ මුල් පිටුවෙන්ම තමුන්නාන්සේලාට පැහැදිලි කර දෙන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

ගරු සභාපතිතුමනි, 1966 වර්ෂය සඳහා නිකුත් කර ඇති ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ මෙන්න මෙහෙම කියනවා:

"අපනයන ඉපැයුම් සීඝ්‍රයෙන් පිරිහී යාම 1966 ආර්ථික ක්ෂෙත්‍රයෙහි කැපී පෙනෙන ලෙස දක්නට ලැබුන ප්‍රධානතම ලක්ෂණය විය. 1966 වර්ෂයේ ලැබුන අපනයන ඉපැයුම් 1965 ලද ඉපැයුම් වලට ද වඩා අඩු වී ගියා පමණක් නොව 1958න් මෙපිට දක්නට ලැබුනු පහළම මට්ටමට අඩු විය. අපනයන අංශයෙහි උද්ගත වූ බලාපොරොත්තු සුන් කරන සුළු මේ තත්ත්වය හේතු කොට 1966 වර්ෂයේ ආර්ථික වර්ධනය ද අඩාල වී ගියේය"

ඔන්න ඔහොමයි මේ වාර්තාවේ තිබෙන්නේ. ඉතින් මේ ප්‍රශ්නය විසඳෙන්නේ කොහොමද කියලයි මා පෙන්වා දෙන්නට හදන්නේ. මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවේ මෙන්න මෙහෙම සඳහන් කර තිබෙනවා:

"එහෙයින්, 1966 වර්ෂය තුළ දී ලංකාවේ අපනයනයන්ගෙන් මිල හා පරිමාව ද අඩුවුණු අතර ආනයනයන්ගේ මිල හා පරිමාව වැඩිවුණු බව පෙනී යනවා ඇති. 1965 හි දී සියයට 1.2 කින් වැඩි දියුණු වුණු වෙළඳ අනුපාතය, 1966 හි දී සියයට 13 ක් තරම් ප්‍රමාණයකින් තියුණු ලෙස පිරිහුණා. අපගේ වෙළඳ අනුපාතයෙහි එතරම් තියුණු වෙනස්වීමක් 1952 සිට මෙතෙක් ඇති වී නැහැ."

1952 න් පසුව මේ අන්දමට වෙළඳ අවාසියක් වුණේ නැත කියා තමුන්නාන්සේලාගේ මහ බැංකු වාර්තාවෙනුත් කියනවා.

1966 ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාවේ 140 වැනි පිටුවේ තවදුරටත් මෙන්න මෙහෙම කියනවා:

"1963 පහත් මට්ටමක සිට ශීඝ්‍රයෙන් ඉහළ යමින් පැවති අපනයන ඉපැයුම් 1966 සැලකිය යුතු ලෙස අඩුවීමක් පෙන්විය. 1966 අපනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 1700 ක් වූයේ ඉකුත් වර්ෂය හා සසඳන විට රුපියල් දශ ලක්ෂ 249 කින් හෙවත් සියයට 13 කින් අඩු විය.

ආනයන වටිනාකම 1966 වසර තුළදී තියුණු ලෙස වැඩි විය. භාණ්ඩ සහ ව්‍යාපාර ආධාර ක්‍රමයත් යටතේ වැඩි වූ ආනයනයෙන් මෙය තරමක් දුරට පැහැදිළි කෙරේ. රුපියල් දශ ලක්ෂ 2028 ක් වූ ආනයන වටිනාකම ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 55 කින් හෙවත් සියයට 38 කින් වැඩි විය."

ඉතින් මේවා කියන විට තමුන්නාන්සේලාට කේන්ති එනවා. අපි මොකක් හෝ කිව්වොත් එය සම්පූර්ණ අසත්‍යයක් ය කියා අපට ඔරවලා ගොරවලා තර්ජනය කරනවා.

ගරු ෂෙල්ටන් ජයසිංහ
(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(The Hon. Shelton Jayasinghe)

අපොයි නැහැ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ඒවා සම්පූර්ණයෙන්ම අසත්‍ය ඒවා යයි කියමින් අපට ගොරවනවා.

ගරු ෂෙල්ටන් ජයසිංහ
(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(The Hon. Shelton Jayasinghe)

අපොයි නෑ. තමුන්නාන්සේලාගේ උප දෙස් ලබාගන්නයි බලන්නේ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ගරු සභාපතිතුමනි, මේ තත්ත්වයට ප්‍රධාන වශයෙන්ම වග කිය යුත්තා අපේ අගමැතිතුමායි. මක්නිසාද, විදේශ ප්‍රතිපත්තියේ තිබෙන චපලකම නිසයි, මේ තත්ත්වයට අපට මුහුණපාන්ට සිදු වී තිබෙන්නෙ. 1956 ට පෙර අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය ගෙන යනව නම් කිසි කලෙක අපට අපේ ප්‍රශ්න විසඳ ගන්න ලැබෙන්නෙ නැහැ. ලංකාවට පමණක් නොව 1947 ට පසුව ආසියා-අප්‍රිකා රටවල් බොහොමයකට එක්තරා දේශපාලන නිදහසක් ලැබුණ. ඒ නිදහස කුමක්දැයි හඳුනා ගැනීමට පුළුවන් වූ රටවල් බොහොම තිබෙනව. එහෙත් අපට එය හඳුනා ගන්ට පුළුවන් වුණේ නැහැ. මක්නිසාද, අපි දේශපාලන කරදර විඳල නැහැ. ඒ කාලයේත් දැන් පාලන බලයේ සිටින උදවිය අතේ බල තල තිබුණු නිසා එවැනි අවස්ථාවක් අපට ලැබුණෙ නැහැ. එම නිසා දේශපාලන නිදහස හඳුනා ගත් උදවිය ආර්ථික සහ සංස්කෘතික නිදහස ආදිය භුක්ති විඳීමට, අධිරාජ්‍යවාදී ක්‍රම යෙන් පිටස්තරව යන්ට දහලනව. එහි ප්‍රතිඵලයක් වශයෙන් තමයි, විදේශ විනිමය ප්‍රශ්නය පැන නැංගෙ. විදේශ විනිමය ප්‍රශ්නය පැන නගින්ට හේතු වුණේ කලින් අධිරාජ්‍යවාදයට හවුල්ව තිබුණු ඒ රටවල් ස්වාධීන වන්ට උත්සාහ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විදේශ විනිමය නැති වුණාම සිද්ධ වෙන්නෙ අපේ නොයෙක් භාණ්ඩ විකුණාගෙන විනිමය හම්බ කරගෙන ඒවායින් අපට වුවමනා කරන බඩු මිළ දී ගන්ටයි. තමුන්නාන්සේලා හුඟක් දොස් කියන බඩු හුවමාරු ගිවිසුම් අපි ඇති කර ගත්තේ ඔන්න ඔය ප්‍රතිපත්තිය උඩයි. අපේ වුවමනාවට නොවෙයි. අපට පුළුවන් වුණා නම් අපේ ආර්ථික නිදහසත් රැක ගෙන අමෙරිකාවට, ප්‍රංශයට සහ බ්‍රිතාන්‍ය යට පමණක් බඩු විකුණල අපේ දේශ පාලන නිදහසත් රැක ගන්න, මේ විධියෙ වෙනස් කම් අපි කරන්නෙ නැහැ. එහෙත් අපට පෙනී ගියා, අපට ඔප්පු කරන්ට පුළුවන් වුණා, දේශපාලන නිදහස ලබා ගන්ට නම් ආර්ථික නිදහසත් ලබා ගත යුතුයි කියා. අපි තෙල් සමාගම් ජනසතු කළ අවස්ථාවෙදී එක පාරටම අමෙරිකාව රෙගුලාසියක් ඉදිරිපත් කළ බව තමුන්නාන්සේට මතක ඇති.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ඒක නීතිපොතේ තිබුණ. "හිකන් ලුපර්" එමෙන්ඩ්මන්ට්"

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

නැහැ. අපි තෙල් සමාගම් පවරා ගත්තට පසුවයි, "හිකන් ලුපර්" සංශෝධනය ඇති කළේ. හය මාසයක් ඇතුළත වන්දි නොගෙවීවොත් ඒගොල්ල අපට ආධාර දෙන්නෙ නැහැ කිව්ව. [බාධා කිරීමක්]

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

පොතේ තිබුණ, ක්‍රියාත්මක කළේ නැහැ.

ගරු ෂෙල්ටන් ජයසිංහ මයා.
(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(The Hon. Shelton Jayasinghe)

1952 දී ඒක ඉස්සර වෙලාම ක්‍රියාත්මක කළේ අපට විරුද්ධවයි.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

කොහොම වුණත්, රාජ්‍ය ඇමතිතුමාට ඇමෙරිකාවෙ දේවල් ගැන මට වඩා හොඳ දැනුමක් තිබෙනව. [බාධාකිරීමක්] මගේ මතකය එහෙමයි. මොකක්ද සිද්ධ වුණේ? හය මාසයකට පෙර වන්දි නොගෙවීවොත් ඇමෙරිකාව අපට දෙන ආධාර නවත්වනව කිව්ව. ඒ අවහිරකම් සියල්ලම ඇති කළේ ඇමෙරිකන් කොම්පැනි මිස අපි නොවෙයි.

ගරු ෂෙල්ටන් ජයසිංහ
(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(The Hon. Shelton Jayasinghe)

අපි තමයි, විලිස් නෝනගෙ බනිස් එපයි කිව්වෙ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

එතකොට තමුන්නාන්සෙ ආණ්ඩුවට විරුද්ධවනෙ හිටියෙ. ඒ නිසා ගහන්ට පුළුතරම් තදින් පහර ගැහැව්ව. හැබැයි අපි මොකක් හරි සාධාරණව කියන කොට බොහොම කේන්ති යනව. අගමැතිතුමාට ඔක්කොටම වඩා කේන්ති යනව.

අපි ගිවිසුම් ඇති කර ගත්තෙ මා කලින් සඳහන් කළ ප්‍රතිපත්තිය උඩයි. දැන් සිදු වී තිබෙන්නෙ මොකක්ද? 1956 ට පෙර තිබුණු විදේශ ප්‍රතිපත්තිය රැක ගන්ට ගිහිල්ලයි, මේ තත්ත්වයට මුහුණ පාන්න සිදු වෙලා තිබෙන්නෙ. අධ්‍යාපන ඇමතිතුමා ඔලුව වණනව. හුඟක් සිද්ධි තමුන්නාන්සේ දන්නේ නැහැ. තමුන්නාන්සේ ඇමෙරිකාවට ගියේ නැහැ; හොංකොං විතරයි ගියෙ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ගියා.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ගියාද? එහෙම නම් අධ්‍යාපන අංශය ගැන මිසක් මේ රහස් දැන ගන්ට ලැබිල නැහැ. අපට මේ අමාරුකම්වලට මුහුණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

පාන්ට සිදුවී තිබෙන්නෙ මේ විදේශ ප්‍රතිපත්තියේ වරද නිසයි. මිසරය අපේ තේ වලට හාල් සැපයු බව තමුන්නාන්සේලා දන්නවා. අද ඒ උදවිය අපේ තේ ගන්නෙ නැහැ.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

The hon. Member is now making a Second Reading Debate speech.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

I shall not take much more time, Sir.

මෙන්න, අද තිබෙන තත්ත්වය:

"The Journal of Commerce—International Edition, July 31, 1967."

මම හිතන හැටියට මේක සිදු වෙන්නෙ "නිව්යෝර්ක්" නගරයෙයි.

"World's Tea Output Hits Record High.

"Reversing their recent trend, inventories were higher in 1966, reflecting a shrinkage of 6 per cent. in world exports due to a significant reduction in shipments from India and Ceylon, where growers' earnings have been adversely affected by rising production costs, inflation, and increased taxation."

මෙයින් පෙනෙන්නේ අපට තේවලට අනාගතයක් නැති බවයි. ඒ අතර අපේ ඉඩම් ඇමතිතුමා නම් තේවලට තැනක් දෙන්නට වැඩ කරන බව කියනවා.

පූ. භා. 11.15

අනුගමනය කරගෙන යන වැරදි ප්‍රතිපත්තිය නිසා කොතරම් දුරට අපේ ආනයන සහ අපනයන වෙළෙඳාම පහළ බැස තිබෙනවාදැයි සංඛ්‍යා ලේඛන බැලීමෙන් පෙනී යනවා. පිටරට යවන තේ, රබර්, පොල් පිළිබඳ තත්ත්වය මහ බැංකු වාර්තාවේ 142 වන පිටුවේ සඳහන්ව තිබෙනවා. 1960 දී තේවලින් ලැබූ ආදායම රුපියල් දශ ලක්ෂ 1,096 යි. 1961 දී රුපියල් දශ ලක්ෂ 1,115 යි. 1962 දී 1,149 යි. 1964 දී, 1,142 යි. 1965 දී 1,210 යි. 1966 දී 1,027 යි. එනකොට 1966 දී ලබා තිබෙන්නේ 1960 දී ලැබූ ආදායමටත් අඩු ආදායමක්.

ඊළඟට රබර් පිළිබඳ තත්ත්වය ගැනත් මහ බැංකු වාර්තාවේ 142 වන පිටුවේ සඳහන් වෙනවා. 1960 දී රුපියල් දශ ලක්ෂ 378 ක් ලැබුවා. එහෙත් 1966 දී ලබා ඇත්තේ රුපියල් දශ ලක්ෂ 337 යි.

ප්‍රධාන පොල් නිෂ්පාදන තුන සඳහා 1960 දී රුපියල් දශ ලක්ෂ 184 ක් ලැබුවා. 1965 දී රුපියල් දශ ලක්ෂ 275 ක් ලැබුවා. එහෙත් 1966 දී ලබා ඇත්තේ රුපියල් දශ ලක්ෂ 196 යි.

අප පිටරටින් ගෙන්වන ලද බඩුවල වටිනාකම මහ බැංකු වාර්තාවේ 154 වන පිටුවේ සඳහන් වෙනවා. 1966 වන විට ගෙන්වන ලද බඩුවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 1,907 යි. මේ අඩු වැඩිකම් නැති කොට සම තත්ත්වයකට වෙළෙඳාම නොගෙනොවෙත් මේ කටයුතු මේ විධියට කර ගෙන යන්නට බැහැ.

චීන-ලංකා ගිවිසුම අලුත්වැඩියා නොකරනවාදැයි මා අහනවා. රබර්-හාල් ගිවිසුම ගැන දැන් සාකච්ඡා කරගෙන යන වාද? නොවුවමනා කථා නොයෙක් දෙනා කරන බව පෙනී ගොස් තිබෙනවා. මාවෝට චීනය පාලනය කර ගන්නට බැරි බව රාජ්‍ය ඇමතිතුමා ළඟදී ප්‍රකාශ කර තිබුණා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

චීනයෙන් භාගයක් පාලනය කර ගන්නට බැහැ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

අපට ඒවා මොකටද? අපේ වෙළෙඳ කටයුතු බලාගෙන පැත්තකට වෙලා ඉන්නවා මිස ඒ රටවල ඇතුළේ සිදු වන දේවල් ගැන අප යම් යම් ප්‍රකාශ කරන්නේ මොකටද? ඒ විධියේ දේවල් කියන විට චියැං කායිෂෙක් නැවත චීනයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බලයට පත් කිරීමේ ඇමෙරිකානු ප්‍රාර්ථනය මේ ආණ්ඩුව තුළත් තිබෙන බව මහජන චීනය කල්පනා කරනවා ඇති.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඇමෙරිකාව ගැන කියන්නෙ?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
දේශපාලන දර්ශනය ගැන කියනවා මිස ජොන්සන්ට ඇමෙරිකාව පාලනය කරන්නට බැරි බව අප කියන්නේ නැහැ. මාවෝට චීනය පාලනය කරන්නට බැරි බව තමුන්නාන්සේලා කියන විට චීනයට තරහ යන බව පුදුමයක් නොවෙයි. චීනය තරහ වෙනවා; ඇමෙරිකාව සතුටු වෙනවා. ආයෙත් වරක් යටත් විජිතයක් බවට මේ රට පත් කර ගන්න ඇමෙරිකාව බලාගෙන ඉන්නවා. හොඳයි, දැන් කොතෙක් දුරට රබර්-හාල් හිවිසුම ගැන සාකච්ඡා කර තිබෙනවාද? ඒ හිවිසුම් පථල කර ගන්නට කොතෙක් දුරට උත්සාහ කර තිබෙනවාද? දැන් රබර් මිළ බොහෝ සෙයින් පහළ ගොස් බව පේනවා. ඇමෙරිකාවට කොතරම් හොඳ හිත පෙන්වාගෙන හිටියත් අපටත් පොඩි යක් කේන්ති ගිය විට, රාජ්‍ය ඇමතිතුමාට තැනක් නොදෙන බව පෙනී ගිය විට, ඇමෙරිකාවේ තිබෙන ඔය රබර් "ස්ටොක්" එක වෙළෙඳ පොළට යවාවි.

ගරු ෂෙල්ටන් ජයසිංහ
(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(The Hon. Shelton Jayasinghe)
මේ අවුරුද්දේ ඒ රබර් වෙළෙඳ පොළට යැවීම වැඩි කරනවාලු.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
ඒ වගේම සෝයා බෝංචි තෙල් සහ ඔලිව් තෙල් වෙළෙඳ පොළට යැව්වාම ඒත් අපට පහර වදිනවා. ඉතින් අපේ මිත්‍ර රටවල් ඇතුළේ තිබෙන දේවල් ගැන අප කථා කරන්නේ මොකටදැයි මා රාජ්‍ය ඇමතිතුමාගෙන් අහනවා. ඒ විධියට කථා කර ඩඩ්ලි සේනානායක ආණ්ඩුවේ ආර්ථික තත්ත්වයට පහර වදින ලෙස ක්‍රියා නොකරන්නැයි මා රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මේ ආණ්ඩුව පවත්වාගෙන යන්නට වීර්ය කරන්නේ විදේශීය ණයවලිනුයි. විදේශීය වගකීම් පිළිබඳව මහා බැංකු වාර්තාවේ මෙසේ සඳහන් කර තිබෙනවා:

"...විදේශීය වගකීම් රුපියල් දශ ලක්ෂ 228 කින් වැඩිවූ අතර විදේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 122 කින් අඩු විය."

විදේශීය ණය දශ ලක්ෂ 228 දක්වා වැඩි කර තිබෙනවා. එහෙම ණය අරගෙන තිබුණත් විදේශීය වත්කම් දශ ලක්ෂ 122 යි. බඩු ගෙන්වනවා. ඒවා අලෙවි කරනවා. කිසිම ප්‍රයෝජනයක් නැහැ. විදේශීය විනිමය උපයා ඒවා යොදවා මේ රටට භාණ්ඩ ගෙන්වනවා මිස විදේශීය ණයවලින් පාරිභෝගික භාණ්ඩ ගෙන්වීමෙන් කවදාවත් ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. එයින් අපේ තත්ත්වය තව තවත් අන්ත වෙනවා.

ගරු ෂෙල්ටන් ජයසිංහ
(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(The Hon. Shelton Jayasinghe)
පාරිභෝගික භාණ්ඩ ගෙන්වන්නට එපාය කියලද තමුන්නාන්සෙ කියන්නෙ?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
ගෙවා ගන්නට බැරි ණයවලින් මේවා ගෙන්වන්නට එපා. ඇපල් මුද්දරප්පලම් නම් ගෙන්වූවාට කමක් නැහැ! අනවශ්‍ය ද්‍රව්‍ය ගෙන්වන්නට එපා.

ගරු සභාපතිතුමනි, අප රක්ෂණ සංස්ථාව ඇති කළේ ආණ්ඩු පක්ෂයේ අයගේ සිතට විරුද්ධවයි. අපේ විදේශීය විනිමය ආරක්ෂා කර ගැනීමටත්, අභ්‍යන්තර කටයුතුවලට මුදල් සපයා ගැනීමටත් රක්ෂණ සංස්ථාව ඇති කළා. රක්ෂණ ව්‍යාපාරය ජාතිය සතු කළා. නමුත් මට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

ලැබී තිබෙන ආරංචිවල හැටියට රක්ෂණ ව්‍යාපාරය නැවතත් පෞද්ගලික සමාගම් වලට දෙන්නට තමුන්නාන්සේලා අද හස් කරනවා. එහෙම රාවයක් තිබෙනවා.

ගරු ෂෙල්ටන් ජයසිංහ
(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(The Hon. Shelton Jayasinghe)

චෑ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

එහෙම අදහසක් නැත්නම් නැහැ කියන්න. අපි පිළිගන්නවා. චෑ කියල හරි යන්නේ නැහැ. පිළිතුර වාර්තා වෙන්නට ඕනෑ.

ගරු ෂෙල්ටන් ජයසිංහ
(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(The Hon. Shelton Jayasinghe)

කියල නොකියන කථාවක් තමුන්නාන්සෙ කරන්නෙ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

නැහැ කියා පිළිතුරු දුන්නාම තමුන්නාන්සේලා එය නොකරන බව අප දන්නවා. අපට වුවමනා කරන්නේ තමුන්නාන්සේලා ලවා නැහැ කියා කියවා ගන්නටයි. නැත්නම් අප බලයට පත් වුණාම අප වරක් කළ දේවල්ම නැවතත් කරන්නට සිද්ධ වෙනවා.

ගරු ෂෙල්ටන් ජයසිංහ
(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(The Hon. Shelton Jayasinghe)

රක්ෂණ පනතට සියයට සියයක්ම පක්ෂව අප ඡන්දය දුන්නා. ඇයි එහෙම කියන්නෙ?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ගරු සභාපතිතුමනි, යම් යම් හදිසි අනතුරු වෙනුවෙන් යම් යම් පුද්ගලයනට දුන් වන්දි පිළිබඳව වැඩ බලන ජනසත්සේවා ඇමතිතුමා සඳහන් කළ කරුණු හෙළි කිරීම ගැන අප සතුටු වෙනවා. හදිසි අනතුරු සම්බන්ධව වන්දි ගෙවීමේදී අනුගමනය කරන ස්පිර වැඩ පිළිවෙළක් නැති බව වැඩ බලන ජනසත්සේවා ඇමතිතුමාගේම කටින් හෙළි වුණා. පවුලක නඩත්තුව ගෙන ගිය එක්තරා ගැහැණු ළමයකු ජීවිතක්ෂයට පත්වී තිබෙනවා. ඇය වෙනුවෙන් ගෙවා තිබෙන්නේ රුපියල් 1,500 යි. නමුත් ඇපොති කරීස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක එරික් ලැබ්‍රොයි මහත්මයා යහතින් සිටිනවා. ඒ මහත්මයාගේ මොළය පොඩ්ඩක් හෙල්ලුනාය කියා රුපියල් 35,000 ක් ගෙවා තිබෙනවා. තවත් කෙනෙකුට රුපියල් 45,000 ක් ගෙවා තිබෙනවා. තවත් කෙනෙකුට රුපියල් 75,000 ක් ගෙවා තිබෙනවා. මළ තැනැත්තියක වෙනුවෙන් ඇයගේ මවට ගෙවා තිබෙන්නේ රුපියල් 1,500 යි. කැබිනට් කොමිටියක් වත් පත් කර මේ ගැන සොයා බලා වාර්තාවක් පිළියෙළ කර ස්පිර වැඩ පිළිවෙළක් සකස් කරන මෙන් මා ඉල්ලා සිටිනවා. මේ හැම දෙනාම මනුෂ්‍යයනුයි. ධනපති ක්‍රමය යටතේ වත් පොහොසත්කම් අනුව පිකක් එහා මෙහා කළාට වරදක් නැහැ. නමුත් ස්පිර සැලැස්මක් උඩ හදිසි අනතුරුවලදී වන්දි ගෙවන්නට වැඩ පිළිවෙළක් සකස් කළ යුතුව තිබෙනවා. ලොකු පෙරකදෝරුවරුන්, අද්වකාත්වරුන් නඩු කියන්නට තමන්ගේ සමර්ථකම පෙන්වූ පළියට ආණ්ඩුවේ ආයතන මෙල්ලවීම හරි නැහැ. ආණ්ඩුවේ ආයතනයක් නම් සෑම අවස්ථාවකදීම ස්පිර පොදු සැලැස්මක් අනුව කටයුතු කළ යුතුයි. අනතුරක් සිදු වුණාය, වරද අසවලා අතේය, අසවලාට ගමනාගමන මණ්ඩලයෙන්, රක්ෂණ සංස්ථාවෙන් නැත්නම් ඒ දෙකෙන්ම මෙපමණ මෙපමණ මුදලක් ගෙවිය යුතුය ආදී වශයෙන් ස්පිර වැඩ පිළිවෙළක් සකස් කරන්න. වන්දි ගෙවීමේ කටයුතු සම්බන්ධව ස්පිර මණ්ඩලයක් පත් කිරීම අවශ්‍යය කියා මා කල්පනා කරනවා. ඒ සම්බන්ධව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු සභාපතිතුමනි, අපට ලැබෙන ආරංචිවල හැටියට නම් රජයේ දෙපාර්තමේන්තු වලින් රක්ෂණ සංස්ථාවට ආශීර්වාදයක් ලැබෙන්නේ නැහැ. දෙපාර්තමේන්තු ප්‍රධානීන් නියම වේලාවට වාරික මුදල් වැටුප්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලේඛනවලින් අය කරගෙන රක්ෂණ සංස්ථාවට එවන්නේ නැහැ. දැන් තමුන්නාන්සේලා අයවැය පියවා ගන්නට රක්ෂණ සංස්ථාවෙනුත් තෙල් සංස්ථාවෙනුත් ලක්ෂ 750 ක් ගන්නවා. තමුන්නාන්සේලා ඒ සංස්ථාවලින් තව තවත් ණය ගන්නට බලාපොරොත්තු වෙනවාට කිසිම සැකයක් නැහැ. එසේ නම් මේ සංස්ථා තව තවත් දියුණු කළ යුතුයි. වාරික මුදල් කලට වේලාවට වැටුප් ලේඛනවලින් අය කරගෙන රක්ෂණ සංස්ථාවට එවිය යුතුය කියා ගරු මුදල් ඇමතිතුමා ලවා සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට චක්‍ර ලේඛනයක් යවන මෙන් මා ඉල්ලා සිටිනවා.

පසුගිය කාලයේ රක්ෂණ සංස්ථාවේ වැඩ වර්ජනයක් තිබුණා. එසේ වැඩ වර්ජනය කළ අයගෙන් පළි ගැනීමට වැඩ වර්ජනය නොකළ අය එක්තරා වැඩ පිළිවෙළක් අනුගමනය කරගෙන යන බව මට ආරංචියි. ඒ නිසා මූලික විභාගයක්වත් නොකර 21 දෙනකුට විරුද්ධව චෝදනා නගා තිබෙනවා. රක්ෂණ සංස්ථාවේ සේවකයන් එක්තරා සටනක් කළා. ඒ සටනෙන් පසුව විශේෂයෙන් ඒක පුද්ගල කොමිසමක් පත් කර තිබෙනවා. එම නිසා අඩු තරමින් එම ඒක පුද්ගල කොමිසමේ වාර්තාව ප්‍රකාශයට පත් වන තුරුවත්, ඒ සටන කළ හා නොකළ දෙපිරිසටම සමාන විධියට සංග්‍රහ කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

රිෆීක් මහත්මයාගේ ඉල්ලා අස් වීම සම්බන්ධයෙන් විශාල ආන්දෝලනයක් තිබුණු බව තමුන්නාන්සේට මතක ඇති.

ගරු ෂෙල්ටන් ජයසිංහ
(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(The Hon. Shelton Jayasinghe)

දිගටම ඉන්දියාවට ප්‍රතිරක්ෂණ කටයුතු කරන්නට ඉඩ හැර තිබුණේ, එයා තමයි,

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ඒ දෝෂ අප පිළිගන්නවා. ඔය කාරණය උඩම රිෆීක් මහත්මයා අස් විය යුතුව තිබුණේ මීට කලින්.

ගරු ෂෙල්ටන් ජයසිංහ
(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(The Hon. Shelton Jayasinghe)

බොහොම හරි.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

රක්ෂණ සංස්ථාව භාර ඇමති වශයෙන් මා කටයුතු කරන කාලයේ රිෆීක් මහත්මයා ඉල්ලා අස් විය යුතුව තිබුණේ, වෙනත් කරුණු උඩයි. අද තමුන්නාන්සේ කළ චෝදනාව වන රක්ෂණ කටයුතු පළල් නොකිරීම උඩයි, මා ඇමති වශයෙන් කටයුතු කරන කාලයේ උන්නැහේ ඉල්ලා අස් විය යුතුව තිබුණේ. උන්නැහේ තමුන්නාන්සේලාගේ ආශීර්වාදය ලබාගෙන දිගටම වැඩ කරගෙන යන්නට අදහස් කළා. උන්නැහේට රක්ෂණ සංස්ථාවෙන් යන්නට සිදු වීම ගැන මා බොහොම සන්තෝෂ වෙනවා. සුදුසුකම් නැතිව මහනුවර එම්. ඒ. සහිඩ් නමැත්තකුත්, ඩබ්ලිව්. එම්. ප්‍රේමරත්න නමැත්තකුත් කිසිම වග විභාගය කින් තොරව උන්නැහේ රක්ෂණ සංස්ථාවට ගත්තා. උන්නැහේ ඒ කාලයේම ගියා නම් වඩා හොඳයි. [බාධා කිරීම්]

ප්‍රති රක්ෂණය ගැනත් වචනයක් දෙකක් කියන්නට කැමතියි. මා ඒ විෂයය පිළිබඳ විශාරදයෙක් නම් නොවෙයි. මගේ ආරංචියේ හැටියට මේ රක්ෂණ කටයුතු සම්බන්ධයෙන් ආණ්ඩුව පැහී කටයුතු කරන නිසා මුදල් හුඟක් ආරක්ෂා කර ගන්නට පුළුවන්කම තිබෙනවා. ඒ නිසා ප්‍රති රක්ෂණය කිරීම ඒ තරම් අවශ්‍ය නැහැ. යම්කිසි දෙයක් රක්ෂණය කිරීම නිසා ඒ රක්ෂණයෙන් අලාභයක් ඇති වූ අවස්ථාවක විදේශ විනිමයෙනුත් පාඩුවක් වෙනවා නම්, ඒ වගේ දේවල් පමණක් විදේශීය රක්ෂණ සමාගම්වල ප්‍රති රක්ෂණය කළාට කමක් නැහැ. දැනට ප්‍රති රක්ෂණ කටයුතු සම්බන්ධයෙන් ඉන්දියාවෙන් විශාරදයෙක් ඇවිත් ඉන්නව. ඔහු කලින් අයට වඩා වෙනස් අදහස් දරන පුද්ගලයෙක්. ඒ නිසා ඒ ගැන නැවත විමසා බලා කටයුතු කරනවා නම් හොඳයි.

ගණකාධිකාරි දෙපාර්තමේන්තුවත් මේ අමාත්‍යාංශය යටතේ මයි, පවතින්නේ. මට එම දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

ලැබී තිබෙන පැමිණිල්ලක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා මා එය ඉදිරිපත් කරන්නට කැමතියි. මම එය ඉංග්‍රීසියෙන් කියවන්නම් :

Accountants in Ceylon consist of two categories, namely, (*a*) Chartered Accountants who have to be articled under practising accountants, and (*b*) those who hold the Diploma in Accountancy of the Ceylon Technical College. Those in category (b) are not financially well placed so as to be able to afford payment of heavy premia to practising accountants and therefore follow a course of study at the Ceylon Technical College. leading to the Diploma in Accountancy.

Section 14 of the Chartered Accountants Act provides for the registration of those in category (*b*) as Registered Accountants and Auditors. However, at the request of the Chartered Accountants' Association a new body called the Accountancy Advisory Board was formed under the Companies Ordinance to provide for the registration of those qualified accountants in category (*b*). It is not understood why those who hold the Diploma in Accountancy of the Ceylon Technical College and with requisite experience in accounting are not registered as expected.

The Accountancy Advisory Board insists that those in category (*b*) should have two years' working experience under a practising accountant, thereby defeating the very purpose for which Section 14 of the Chartered Accountants Act was included. The Accountancy Advisory Board is particularly partial to a section of the community. There have been instances when applications for registration made by some persons have been turned down arbitrarily for no valid reason.

I would ask the Hon. Acting Minister under what circumstances Mr. M. S. Dharmadeeran was registered as a Registered Auditor when applications from other Diploma holders for registration were turned down.

එක්තරා සුදුසුකමක් තිබෙන එක් කෙනකුට විතරක් තැනක් දී තිබෙනවා. එහෙත් සමාන සුදුසුකම් ඇති අනෙක් අයට තැනක් දී නැහැ. ඒ සම්බන්ධයෙන් විභාග කර බලන ලෙස මා ඉල්ලා සිටිනවා.

පූ. භා. 11.30

නැව් සංයුක්ත මණ්ඩලයට මොකද වී තිබෙන්නේ ? අපේ ආණ්ඩුව තිබුණු කාලයේදී ඒ පිළිබඳව පනත් කෙටුම්පතක්ද ඉදිරිපත් කළා. එහෙත් අපේ ආණ්ඩුව පරාජය වුණා. නැව් කටයුතු සඳහා අපෙන් විශාල මුදලක් ඇදී යන බව පෙනෙනවා. අමෙරිකාවෙන් පිටි ගෙන්වන විට අමෙරිකාවේම නැව් පාවිච්චි කරන්නට අපට සිදු වෙනවා. ඒ සඳහා සියයට 250ක් ගෙවන්නට ඕනෑ. [බාධා කිරීමක්] එම නිසා අපේ නැව් සංයුක්ත මණ්ඩලයක් තිබේනවා නම් එය ඉතා වැදගත් බව පෙනෙනවා. ඒ සම්බන්ධයෙන් වාර්තා කීපයක් සකස් කොට තිබෙනවා යැයි මා සිතනවා. මේ පිළිබඳව අදහස් උදහස් ප්‍රකාශ කිරීමට තමුන්නාන්සේලා කොමිසන් එකක්ද පත් කළා. නැව් සංයුක්ත මණ්ඩලයක් තිබිය යුතුය, අපේම නැව් තිබිය යුතුය, යනුවෙන් ඉල්ලීම් කර තිබුණු බව පත්‍රවලින් අප දුටුවා. එසේ කළහොත් තමුන්නාන්සේලා රටවල් කීපයකින් ලබා ගන්නා විදේශාධාරත් ප්‍රයෝජනවත් වන ආකාරයට යොදවන්නට හැකි වෙනවා ඇති. අමෙරිකාවෙ විදේශ ආධාර දෙනවා නම් කරුණාකර ඒවා නැවකට දෙන්නැයි කියන්න. එවිට සියයට 75ක් කපා ගන්නට අපට ඉඩ ලැබෙනවා. අන්න එහෙමයි, විදේශ ආධාර ලබා ගත යුත්තේ. කොන්ටිනෙන්ටල් ටයර්, ජීප් රථ යනාදිය ගෙන්වීමෙන් බැහැ, මේ වැඩේ කරන්නට. විදේශ විශෙෂඥයනුත් ඇවිත් මේ ගැන වාර්තා කර තිබෙනවා. ගරු ඇමතිතුමා දිනක් කීවා, තවත් විදේශ විශෙෂඥයන් එන්නට අදහස් කර සිටින බව. "විදේශ විශෙෂඥයන්ගෙන් අදහස් ගන්නට කමක් නැහැ ; එහෙත් ඊට ප්‍රථම තමුන්නාන්සේ අධිෂ්ඨාන කර ගත යුතුයි, මෙම කටයුත්ත කරනවාය කියා ; මෙම කාර්යය කරන්නට යාම පිළිබඳව යම් අදහසක් දෙනවා නම් එය භාර ගන්න ; මෙම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාර්යය කරන්නට එපාය කියා යම් අදහසක් දෙනවා නම් එය භාර ගන්නට එපා." යනුවෙන් මා එතුමාට කියා සිටියා. අපේම නැව් සංස්ථාවක් ඇති කරන්නට නොහැකිය යන කොන්දේසිය පිට විදේශ ධාර ලබා ගන්නවාදැයි මා තමුන්නාන්සේ ගෙන් ප්‍රශ්න කරනවා. විදේශාධාර ක්‍රමයට විශාල බඩු ප්‍රමාණයක් ගේනවා. ඇයි මේවා ආණ්ඩුව මගින්ම ගෙන්වන්නට බැරි කියා මා අහනවා. පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) කිව්වා, ලේලන්ඩ්ස්වලින් එහෙම කොමිෂන් එකක් තිබෙනවා නම් එය සංස්ථාවට දෙන ලෙස. ඇයි, තමුන්නාන්සේලා රජයේ ගබඩාව මගින් හෝ එවැනි දේ ගෙන්වන්නේ නැත්තේ? ඒවාට යම් කොමිෂන් එකක් ලැබෙනවා නම් එය රජයට පවරා ගන්නට පුළුවනි. ඒවාගේම ලබා ගත් ගණන් සහ විකුණූ ගණන්ද දැන ගෙන ඕනෑ විදියට ඒවා බෙදා දෙන්නටත් පුළුවනි. එවිට එම කටයුතු සඳහා වෙන වෙනත් ආයතන වුවමනා කරන්නේ නැහැ. එම නිසා මා ගරු ඇමතිතුමාට කියා සිටිනවා, ඇමති මණ්ඩලයට ගොස් ටිකක් කෑ කෝ ගහලාවත් මේ ගැන පෙන්වා දෙන ලෙස.

විදේශාධාර ගැනීමේදී අපට පාඩු කීපයක් සිදු වෙනවා. අවුරුදු 25ක් තුළ සියයට 6ක පොලියකුත් සමග එම ණය ගෙවන්නට ඕනෑ. සමහරවිට සියයට 20ක් පමණ වැඩියෙන් ගෙවන්නට වෙනවා. ඒ අය සියයට 20ක් වැඩියෙනුයි, අද විදේශාධාරවලදී අය කරන්නේ. ඒ මදිවාට නොයෙකුත් අන්දමේ කොමිෂන් යන්නේ පුද්ගලික ව්‍යාපාරිකයන්ටයි. ඒ කොමිෂන් එක භාණ්ඩාගාරයට දුන්නොත් නරකද? ඒවාගේම මිල පාලනය කරන්නට හැකි වුවහොත් කොතරම් සේවයක්ද සිදු වන්නේ? සී.ඩබ්ලිව්.ර්. එකෙන්ම කරන්නට යැයි මා කියන්නේ නැහැ. රජයේ භාණ්ඩාගාරය තිබෙනවා. රජයේ ගබඩාව තිබෙනවා. ඇයි, ඒවා මගින් නොකරන්නේ? මොකක් හෝ සංස්ථාවක් හරි ගස්සා ක්‍රියා කරන ලෙසයි, මා කියා සිටින්නේ. මා දන්නවා, මෙය ඉටු කරන්නට නොහැකිව තිබෙන්නේ කුමන කරුණක් නිසාද යන්න. එසේ කරන්නට ගියහොත් පුද්ගලික නෑදෑ හිතවතුන්ට උදව් කරන්නට බැරිවෙනවා. ඒකම ප්‍රශ්නයක් හැටියට සලකා ක්‍රියා කිරීම අසාධාරණයි. ජාතියක් වශයෙන් කල්පනා කර බලා මේ කියන අන්දමට සංස්ථාවක් නැතිනම් ගබඩාවක් හරිගස්සා ගන්නා හැටියට මා ඉල්ලා සිටිනවා.

අපේ මිත්‍ර රටවලින් අපි ට්‍රැක්ටර්ස් යනාදිය වැඩිය ගෙන්වන්නේ නැති බව මා මීට ප්‍රථමයෙනුත් සඳහන් කර තිබෙනවා. බල්ගේරියාවට, පෝලන්තයට සහ රුසියාවට එහෙම තේ දීලා එම දේවල් ලබාගත හැකියි. ඒ රටවල තානාපතිවරුන් මේ ගැන කියා තිබෙනවා. එම නිසා වෙළඳ ගිවිසුම් කඩන්නේ නැතුව මෙම වැඩ කටයුතු ශක්තිමත්ව කරගෙන යන හැටියට මා ඉල්ලා සිටිනවා. අපේ ගරු අගමැතිතුමිය කියාගෙන යනවා, ආසියානු වෙළඳ කලාපයක් ඇති කළ යුතුය යන කාරණය. එය බොහොම වැදගත් කාරණයක්. මා සිතන්නේ නැහැ, මෙය කරන්නට පුළුවන්කමක් ලැබේවිය කියා. සමාන නිදහස් දේශපාලනමය අදහස් තිබෙන රටවල් සමග පමණයි, මේ කියන විධියේ කලාපයක් ඇති කර ගැනීමට හැකි වන්නේ. ප්‍රංශය, බටහිර ජර්මනිය සහ බ්‍රිතාන්‍යය වැනි රටවලට European Common Market එක හදන්නට පුළුවනි, සමාන අධිරාජ්‍යවාදී අදහස් දරන නිසා. එහෙත් සියැටෝවට හා නැටෝවට යටත් වන රටවල් සමග කෙසේද අපි අත්වැල් බැඳ ගෙන යන්නේ? අපි නැටෝවට හෝ සියැටෝවට හෝ කෙළින්ම යනවාය කීවොත් අපට පුළුවන් වේවි ඒ අයත් සමග කලාපයක් ඇති කරගන්නට. එසේ වුවහොත් සිදු වන්නේ කුමක්ද? අපව ගසා කෑම තවතවත් වැඩි වෙනවා. මාද වෙළඳ ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේදී අඩු වශයෙන් පොල් ගැනවත් එක්තරා කලාපයක් ඇතිකර ගන්නට වීයදී කළා. ඒ සඳහා පිලිපීනයත් ඉන්දුනීසියාවත් සමග සාකච්ඡා කළා. එහෙත් එය කරගන්නට බැරි වුණා. ඒ ඇයි? පිලිපීනය ඒ අයගේ පොල් සම්පූර්ණයෙන්ම ඇමෙරිකාවට විකිණීමට පොරොන්දු වී තිබෙනවා. ඒ පොරොන්දුවෙන් ආපසු යාමට විශාල උද්ඝෝෂණයක් තිබුනත් දේශපාලන බලතල නිසා එයට ඉඩ ලැබෙන්නෙ නැහැ. ඒ නිසා කොයි තරම් ලක්ෂණ වචන තිබුණත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

ඒවා ලොකුවට පත්‍රයේ පළ කරවා ගන්නට පුළුවන් වුණත් එයින් ඇති වැඩක් නැහැ. ආර්ථික නිදහස ලබා ගැනීමේ චේතනාවක් ඇතොත් මිස, ඒ වගේම සමාන අදහස් ඇති රටවල් සමග මිස, ඒ විධියේ ගිවිසුමක් ඇතිකර ගන්නට බැහැ. ඒ නිසා ඇමෙරිකානු ගැත්තන් නොවී නිදහස් රටක් වශයෙන් අනික් රටවල් සමග අත්වැල් බැඳගෙන එකට සටන් කරන්නට ඕනෑ.

අවසාන වශයෙන් ගුවන් විදුලි යන්ත්‍ර කොටස් ආනයනය කිරීම සම්බන්ධව වචනයක් කියන්නට කැමතියි. උපාලි විජේවර්ධන මහත්මයාගේ ඉල්ලුම්පත්‍රය ගැන මා ප්‍රශ්නයක් මතු කළා. ඒ සම්බන්ධව මට තවත් වාර්තාවක් ලැබී තිබෙනවා. මේ වාර්තාව ඔබතුමාටත් ඇමති මණ්ඩලයටත් ප්‍රයෝජනවත් වෙයි. මේ ගැන සොයා බලා ක්‍රියා කිරීම සඳහා මේ වාර්තාව මා දැන් කියවනවා:

"There seems to be a considerable amount of confusion in the way the Ministry of Industries is setting about the development of the radio industries—"

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
How can that come into this?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
He is in charge of commerce.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
Commerce and Industry are two different things.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
Yes. But this is with regard to the importation of cars.

එස්. ඒ. පීරිස් මයා. (වාණිජ හා වෙළඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. எஸ். ஏ. பீரிஸ்—வர்த்தக, வியாபார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. S. A. Peeris—Parliamentary Secretary to the Minister of Commerce and Trade)
I am sorry, import and export is under the purview of the Ministry of State. It is not under the Commerce Ministry now.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
The Ministry of Commerce was handling this——

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
He is not handling it now.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
Then even with regard to barter agreements——

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
No. I know, the hon. Member wants to reply to certain things that have been said earlier, but it is not relevant at this moment.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
I only want a clarification of this question. I shall hand this over to the Minister so that he can go into it.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
You can hand it over to the Minister of State.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
I shall reply to it in the next Budget.—[*Interruption*].

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉලංගරත්න මයා.

(திரு. இலங்கரத்ன)

(Mr. Ilangaratne)

I do not think it is necessary to reply if you can go into the question and see whether there was any mistake with regard to my version and his version and adjust it. This is merely for clarification, in fairness to both parties. I think Mr. Upali Wijewardene would be very happy if you look into this matter.

වී. අන්නාමලෙයි මයා. (පත්කරන ලද මන්ත්‍රී)

(திரு. வீ. அண்ணுமலை—நியமன அங்கத்தவர்)

(Mr. V. Annamalay—Appointed Member)

I am happy that you have given me an opportunity to speak and I shall not be very long. I am also happy to follow the hon. Member for Kolonnawa (Mr. Ilangaratne). Since this is a very important Ministry I thought of saying a few words. It is on the successful handling by this Ministry of our export products that the livelihood of the workers of this country depends, particularly of the plantation workers. Although we have the Wages Boards Ordinance and such other legislation, and workers are entitled to a minimum wage, in the plantations today they do not get work every day. In some estates they are offering two to three days' work a week. The reason is that they are unable to get a fair price for the produce. When I speak about workers, under this Ministry, perhaps it looks rather irrelevant. But I think it is relevant. After all this is the Ministry that has to see that we are in a position to get——

සභාපති

(அக்கிராசனர்)

(The Chairman)

Why cannot you raise this under the Votes of the Ministry of Labour ?

අන්නමලෙයි මයා.

(திரு. அண்ணுமலை)

(Mr. Annamalay)

I am trying to mention this because it will be useful to the Ministry.

සභාපති

(அக்கிராசனர்)

(The Chairman)

It will be useful, but it is not relevant.

අන්නමලෙයි මයා.

(திரு. அண்ணுமலை)

(Mr. Annamalay)

Anyway I shall now come to the point. I do not want to elaborate on that. I touched on the main issue because it affects the workers at large. Therefore this Ministry has got to work out ways and means of trying to get the maximum prices for our products.

I have been complaining on a number of occasions that our primary products do not get reasonable prices even though they are sold at exorbitant prices in foreign countries. That situation is going on. We are already late in remedying that situation. We had better not be too late. We want to establish our trade contracts with foreign countries, but unless we negotiate directly we cannot do it. The Government must take upon itself the responsibility. It cannot leave it to international monopolists who are controlling the world market. I am sorry, this sad story has got to be repeated at the Committee stage of the Budget every year.

Recently I was in Tokyo where I happened to walk into a very big departmental store known as Metsui. You find all types of consumer goods displayed there. While browsing around I came across a good

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අත්නමලෙයි මයා.]

advertisement. This was on the label pasted round a tin in which tea was packed. It said :

"Lipton Tea—Restaurant blend.

A blend of selected Ceylon tea specially prepared for hotels and restaurants. 2.26 Kg. Trade Mark (L.L.) nett. Lipton Limited, Colombo, Ceylon."

It was priced at 5,000 yen. That works out to almost one pound sterling per pound. In other words, a pound of tea costs 1,000 yen or one pound sterling, which is Rs. 13. That is the full price. When I saw that I telephoned our embassy in Japan and tried to find out the reason for our not getting a fair price for our tea when it is sold at Rs. 13 a pound there. They were unable to give me any information except to say that Japan was importing 4,000 tons of black tea from all over the world ; after our Prime Minister's visit to Japan they have increased our quota and that was put down as 90 per cent of the 4,000 tons of black tea imported to Japan. In other words, our tea imports work out to 3,600 tons. Then I asked them whether there was any levy by the Japanese Government. I was told that there was a 35 per cent levy on the c.i.f. value. That is why I say that if this matter had been gone into by the Government and if there were direct negotiations we would have got more than we are getting now.

Even in regard to the export of rubber there is a big racket. Whenever there is a wage demand the newspapers say the price of rubber has tumbled down. When I was in Malaysia I found that they were trying to bring down the wages of rubber tappers there. This is a move by people who have the trade in their hands ; they are very powerful and control the world market. I repeat, unless the Government takes direct action in this matter, things will become very, very difficult for us.

Now they are saying that industries will have to close down. Then, naturally, labourers will be deprived of employment. That is why I say, do not allow this to affect the labourers as a whole. When I was in Japan I asked some housewives why they do not use our black tea when they say our tea is the best. These ladies said, "Your tea is very costly." The cost of tea is Rs. 13 a pound. The cost is high in England, in America and elsewhere, though the average price of our tea is about Re. 1.51 to Re. 1.53. It is time the Ministry moved in the matter because we are dependent entirely on our primary products, tea and rubber, to sustain our economy.

பூ. ப. 11.45

டீ. බී. සුබසිංහ මයා. (කටුගම්පොළ)
(திரு. ரீ. பி. சுபசிங்க—கட்டுகம்பொள)
(Mr. T. B. Subasinghe—Katugampola)

ගරු සභාපතිතුමනි, මට පෙර කථා කළ පත් කරන ලද මන්ත්‍රීතුමාගේ කථාව අසා ගෙන සිටි මට අවබෝධ වුණේ මෑතක සිට මේ රටේ විදේශීය වෙළඳාම ගැන කොයි තරම් අවබෝධයක් ඇති වේගෙන යනවාද යන්නයි. අයවැය ලේඛනය දෙවැනි වර කියවීම පිළිබඳ විවාදයේදී ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා විදේශීය වෙළඳාම සම්බන්ධව කී වචන මට මතකයි. අළුත් මාගීයක් ඔස්සේ යාමේ බලාපොරොත්තුවෙන් වෙළඳාම පිළිබඳව යමක් කරනවා නම් එය ඉක්මණින්ම කළ යුතු බව දෙපාර්ශවයේම හුඟක් දෙනකු අත්හදා බැලීමෙන්ම අවබෝධ කරගෙන තිබෙන බව පෙනෙනවා. අපේ අනාගතය ගැන කල්පනා කරන විට, අපේ සංවර්ධනය ගැන කල්පනා කරන විට අපේ ආර්ථික ක්‍රමය වැනි ආර්ථික ක්‍රමයක් ඇති රටක විදේශීය වෙළඳාම ඉතාම වැදගත් තැනක් ගන්නා බව අප කවුරුත් පිළිගන්නවා. ශතවර්ෂයක් පමණ කාලයක් තිස්සේ ඇති වූ සම්බන්ධතාවයන් උඩ අද අපට සිදු වී තිබෙනවා, අප නිෂ්පාදනය කරන සීමාසහිත බඩු ප්‍රමාණයක් පිටරට යවා අපට අවශ්‍ය බඩු විශාල ප්‍රමාණයක් පිටරටින් ගෙන්වා ගැනීමට. අපේ රට ගොවි කර්මාන්තය අතිනුත්, කාර්මික අතිනුත් සෑහෙන ප්‍රමාණයකට දියුණු වුණත් අපේ විදේශීය වෙළඳාමට තිබෙන තැන දෙවැනි අංශයේ තබා කල්පනා කරන්නට පුළුවන් ය කියා මා සිතන්නෙ නැහැ. අපේ විදේශීය වෙළඳාම ඒ තරම් වැදගත් තැනක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගන්න නමුත් අද මේ ආණ්ඩුව විදේශීය වෙළඳාම ගැන කල්පනා කරන පිළිවෙළ දෙස බැලුවම අපට පෙනෙනවා, අප ඉදිරි පිට තිබෙන ප්‍රශ්නවල වැදගත්කම මේ ආණ්ඩුව තවමත් තේරුම් ගෙන නැති බව. මේ ඇමති අංශයට සලකා තිබෙන ආකාරය දෙස බැලුවාම එය හොඳටම පැහැදිලියි. වෙළඳාම සම්බන්ධව ඇමති අංශයක් තිබෙනවා. මට පෙර කථා කළ කොළොන්නාවේ මන්ත්‍රීතුමත් (ඉලංගරත්න මයා.) මේ සම්බන්ධව කීවා. එතුමා කී කරුණුවලට තව කරුණු දෙක තුනක් එකතු කිරීමට මා අද හස්කරනවා.

අපේ වෙළඳ ඇමති අංශයක් තිබුණා. තමුන්නාන්සේත් මට මතකයි වෙළඳ ඇමති හැටියට අවුරුදු ගණනාවක් ක්‍රියා කළ බව. මේ රටේ වෙළඳාම, ආනයන අපනයන දෙකම වෙළඳ අංශයට භාරවයි තිබුණේ. ඒක වැදගත් අමාත්‍යාංශයක්. අද මොකක්ද සිදු වී තිබෙන්නේ? ඒක කෑලි කෑලිවලට කඩා එක එක ඇමතිවරයාට භාර දී තිබෙනවා. අද මේ වෙළඳාම පිළිබඳ ප්‍රශ්න කවුරු සමග සාකච්ඡා කරන්නද කියා අප දන්නේ නැහැ; මහජනතාව දන්නෙ නැහැ. හේතුව මොකක්ද? මෙම ඇමති අංශය අගමැතිතුමා විසින් අපේ වෛද්‍යාචාර්ය එම්. වී. පී. පීරිස් සෙනෙට් මන්ත්‍රීතුමාට භාර දුන්නා. කාලයක් යන විට ප්‍රශ්න ගොඩ ගැහෙන්න ගොඩ ගැහෙන්න, සමහර මන්ත්‍රීවරුනුත්, ඒ වාගේම සියලුම වෙළෙන්දනුත්, මේ ප්‍රශ්නය ගැන අවබෝධයක් නැති නිසාදෝ, එසේ නැත්නම් ප්‍රශ්න ගොඩගැහෙන විට බය වීමෙන්දෝ, එක පුද්ගලයකුගේ කර පිටට දොස් තබන්න පටන් ගත්තා. කාගේ කර පිටටද? වෙළඳ ඇමතිවරයාගේ කර පිටට.

මා පිළිගන්නවා, ඒ පුද්ගලයා සමහර විට වෙළඳාම ගැන පළපුරුද්දක් ඇති කෙනකු නොවන බව. මේ ප්‍රශ්න ගැන තේරුමක් ඇති කෙනෙකු නොවෙන්න පුළුවන්. එහෙත් මා ආණ්ඩුවෙන් ප්‍රශ්න කරන්නේ, හිසේ රුදුවට කොච්චේ මාරු කරන ප්‍රතිපත්තිය උඩ අර වෙළඳ ඇමති අංශයේ තිබුණ යම් යම් දෙපාර්තමේන්තු වෙන කෙනෙකුට දුන් පලියට මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්ද, කියායි. අද තමුන්නාන්සේලාට හිතවත් දේශපාලන යහළුවෙකුට තැනක් දිය යුතු නිසා වෙළඳ ඇමති වරයාය කියා කෙනෙකු ඉන්නවා මිසක්, වෙළඳ ප්‍රතිපත්තිය හැඩගැස්සීමට පුළුවන් ඇමතිවරයකු මේ රටේ නැහැ.

ඩී. එන්. කන්නන්ගර මයා. (දෙණියාය)
(திரு. சீ. என். கன்னங்கர—தெனியாய)
(Mr. C. N. Kannangara—Deniyaya)
ප්‍රතිපත්තියක් නැහැ.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)
ප්‍රතිපත්තියක් නැහැ. අර ඒ පැත්තෙනුත් කියන්නේ ප්‍රතිපත්තියක් නැත කියා. මා කියන්නෙත් ඒකයි. ඒ ප්‍රශ්නයට තමයි මාත් එන්නේ. ප්‍රතිපත්තියක් හැඩ ගස්සන්න පුළුවන්, ප්‍රතිපත්තියක් හැඩ ගැස්සීමට වගකීමක් දරණ පුද්ගලයකු ඉන්න ඕනෑ. අද කෝ? ඒ සඳහා වෙනම ඇමති අංශයක් සකස් කොට, අර්ථ ශාස්ත්‍රඥයන් යොදවා, තවත් අර්ථශාස්ත්‍රඥයන් ගෙන්වා උපදෙස් ලබාගෙන, මේ රටේ වෙළඳාමත්, සංවර්ධනයත්, ආර්ථික තත්ත්වයත්, ගොවි කර්මාන්තයත් සංවිධානය කරන්න ඕනෑ. එහෙත් මේ ආණ්ඩුව ගෙන යන වෙළඳ ප්‍රතිපත්තිය මේකය කියා පසු ගිය අවුරුදු දෙකහමාර ඇතුළත කිසිම ඇමතිවරයකු විසින් කිසිම තැනකදී පැහැදිලි කර තිබෙනවාද? මුදල් ඇමතිවරයාත් වෙළඳ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකමුත් රාජ්‍ය ඇමතිවරයාත් සෑමදාම කියන්නේ මොකක්ද? "අපට පාලනය කරගන්න බැරි කරුණු නිසා අපේ වෙළඳාම පහත බසිනවා, ඒකට අපට කරන්න දෙයක් නැහැ" කියන එකයි සෑමදාම කියන්නේ.

සභාපතිතුමනි, යම් කෙනෙකුට පාලනය කර ගන්න බැරි කරුණු නිසා රටේ වෙළඳාම පහත බසිනවා නම්, ඒ බැරිකම කියා පැත්තකට වීම වඩා හොඳයි. අප පිට රට යවන භාණ්ඩවල මිල තීරණය කරන්නේ අප නොවන බව මා පිළිගන්නවා. ඒකද හේතුව මොකක්ද? අවුරුදු ගණනාවක් තිස්සේ, මේ රටේ සිටින සපයන්නනුත් සමග විදේශීය ගැනුම්කරුවන් සංවිධානය ඇති කරගෙන තිබෙනවා. එදා අපේ වැඩ බලන ඇමතිතුමා කිව්වා වාගේ, පුළුවන් තරම් ලාභ ඒ අයට අත් වන විධියටත්, නිෂ්පාදකයාට පුළුවන් තරම් අඩුවෙන් ගෙවන විධියටත් තමයි, එය සංවිධානය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

කරගෙන තිබෙන්නේ. මේ සංවිධානය කඩන්න අප වැඩ පිළිවෙළක් යොදාගන්න ඕනෑ. එසේ නොකර අප කොපමණ කථා කළත්, රටේ වෙළඳාම දියුණු කිරීම සඳහා අපට වුවමනා කරන ප්‍රාග් ධනය ඒ මාර්ග යෙන් සපයා ගැනීමට අප කොතෙක් කල්පනා කළත්, අපට එය කරන්න බැහැ.

මේ ආණ්ඩුව කිසිම අවසථාවක සූදානම්ද අපේ වෙළඳාමට දමා තිබෙන මාංචු ගලවා දැමීමේ වැඩ පිළිවෙළක් යොදන්න, කියා මා ප්‍රශ්න කරන්න කැමතියි. අන්නමලේ පත් කරන ලද මන්ත්‍රීතුමා කිව්වා වාගේ අද මේ රටේ නිෂ්පාදකයාට ගෙවන මිල අතරත්, විදේශීය රටවල පාරිභෝගිකයා ගෙවන මිල අතරත් තිබෙන පරතරය කොපමණද කියා අප කවුරුත් දන්නවා. නැව් කුලී කොමිස් සහ සාධාරණ ලාභයක් හැර තවත් විශාල පරතරයක් තිබෙනවා. මේක කඩන්ට තිබෙන මාර්ගය මොකක්ද? මම කල්පනා කරන හැටියට නම් මේ රටේ නිෂ්පාදකයින් ආණ්ඩුවත් සමග එකතු වී විදේශීය වෙළඳාමට නො බැස මේක කඩන්ට බැරි බවයි. එහෙත් අපේ රටෙන් පිටරට යවන භාණ්ඩවලට නියම මිළක් ලබා ගැනීම සඳහා මේ රටේ නිෂ්පාදකයන් සමග මැදහත්වෙලා කටයුතු කිරීමේ ප්‍රතිපත්තිය පිළිගන්න ආණ්ඩුව සූදානම් නැති බව අපට පැහැදිලියි. ආණ්ඩුව ඒ අන්දමට මැදහත්ව ක්‍රියා කරනවා නම්, ඒ පැරණි වෙළඳ සමාගම් සමග තරඟයට බැස පාරිභෝගිකයන්ට සාධාරණ මිළකට බඩු සපයන අතරම අපේ නිෂ්පාදකයන්ටත් ඔවුන්ගේ බඩුවලට සාධාරණ මිළක් ලබා දෙන්ට පුළුවන්කමක් ලැබෙනවා. එහෙත් අපේ රටේ නිෂ්පාදනය කරන භාණ්ඩ ඒ උදවියට වුවමනා කරන පිළිවෙළට අලෙවි කරන්ට ඒජන්සි හවුසස් මගින් විදේශීය සමාගම්වලට තවමත් ඉඩ දී තිබෙනවා.

එමෙන්ම නැව් සමාගම්වලට ඉඩ දී තිබෙනවා, ඒ උදවියට ඕනෑ හැටියට නැව් ගාස්තු පාලනය කරන්ට, තීරණය කරන්ට සහ නිගමනය කරන්ට. මේ සම්බන්ධයෙන් ආණ්ඩුව කල්පනා කරන්ට පටන් ගෙන තිබෙනවද? අපි මේ ප්‍රශ්න තේරුම් ගත් නිසා තමයි පසුගිය කාලයේ කිව්වේ විදේශ වෙළඳ කටයුතු සඳහා—මේ රටට බඩු ගෙන්වීමට පමණක් නොව මේ රටෙන් බඩු පිට රට යැවීමටත්—ආණ්ඩුව මගින් සංවිධානයක් පිහිටුවා පරණ වෙළඳපොලවලත්, අළුත් වෙළඳපොලවලත් හැකි තරම් දුරට අපේ වෙළඳාම දියුණු කර ගත යුතුය කියා. ඒ නිසයි, අපි වෙළඳ සංස්ථාවක් පිහිටුවන්ට යෝජනා කළේ. මේ විධියේ වෙළඳ සංස්ථා පිහිටුවීම න්‍යායකට පමණක් පොත්වලට පමණක් සීමා වූ දෙයක් නොවෙයි. මේක කොමියුනිස්ට් ක්‍රමයක්ය, රතු ක්‍රමයක්ය කියා සමහරු කියනවා. එහෙත් අද ඉන්දියාව වැනි රටවල් මේ ක්‍රමය අත්හදා බලා පිළිගෙන තිබෙනවා. අපේ වෙළඳාමට මාංචු දමාගෙන සිටින ඒ විදේශීය කොම්පැනි සමග තරඟ කරන්ට නම් රජය මැදහත් වෙලා නිෂ්පාදකයින් සමග විදේශ වෙළඳාමට බසින්ට ඕනෑ. ඒ ක්‍රමය ඉන්දියාව වැනි රටවල් පවා පිළිගෙන අද ක්‍රියාත්මක කර තිබෙනවා. යම් යම් දේශපාලන හා වෙනත් හේතූන් නිසා මේ රටේ වෙළඳාම කෙරෙහි ඒකාධිකාරියක් පවත්වා ගෙන යන ඒ පැරණි වෙළඳ සමාගම්වල බලය කඩා දමන්ට ආණ්ඩුව භය නිසා ඒකට මැදහත් වෙන්නෙ නැහැ. ඒජන්සි හවුසස් මාර්ගයෙනුත්, නැව් කොම්පැනි මාර්ගයෙනුත්, විදේශීය සමාගම් මාර්ග යෙනුත් මේ රටේ වෙළඳාමට දමා තිබෙන ඒ දම්වැල් ආණ්ඩුව මැදහත් වෙලා ගළවා නොදමනවා නම්, කවදාවත් අපේ වෙළඳාම දියුණු කර ගන්ට ලැබෙන්නෙ නැහැ. අන්න ඒ ප්‍රශ්නයට මුහුණ දෙන්ට මේ ආණ්ඩුව සූදානම්ද කියා වෙළඳ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්වරයාගෙන් මා ප්‍රශ්න කරනවා.

ඊළඟ කාරණය, නැව් ගාස්තුයි. අපට අද මොකද වෙලා තිබෙන්නෙ? මේ නැව් කොම්පැනිවල අත්අඩංගුවට අද අපි සම්පූර්ණයෙන්ම යට වෙලා නේද ඉන්නෙ? මේ රටේ කල්පනාකාරී පුද්ගලයන් අවුරුදු ගණනාවක් තිස්සෙ මෙහි ඇති භයානක තත්ත්වය ගැන පෙන්වා දෙන්ට යෙදුණා. මට මතකයි, මා පාසැල් යන කුඩා කාලයේ එවකට විධායක මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරයකුව සිටි සර් මාකස් ප්‍රනාන්දු මහත්මයා මේ සම්බන්ධයෙන් සටනක් ගෙන ගිය බව. අපේ රටට බලපාන "කොන්ferන්ස් ලයින්ස්" සම්බන්ධයෙන් එතුමා එක්තරා ව්‍යාපාරයක් ගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගියා. අපේ රටට බලපාන "කොන්fපරන්ස් ලයින්ස්" දෙකක් තිබෙනවා. ඒවා නැව් කාරයින් සහ මේ රටින් පිටරට බඩු යවන උදවියත් සමඟ එකතු වී අපට දමා තිබෙන දඬුවම් ගැන එතුමා සටන් කරන්ට පටන් ගත්ත. එහෙත් අද වන තුරු ඒවායින් බුරුල් වෙලා ගැළවෙන්න අපට පුළුවන් වෙලා නැහැ. දැනටත් ඒ "කොන්fපරන්ස් ලයින්ස්" අපට ලැබෙන්න තිබෙන ලාභ වළක්වන බව අපි කවුරුත් පිළිගන්න කාරණයක්.

"සිලෝන් ඩේලි නිව්ස්" පත්‍රයේ 1967 ජනවාරි මස 31 වනදා පළ වී ඇති ලිපියක් කියවන්න මා බලාපොරොත්තු වෙනවා. මෙම ලිපිය පළ කර ඇත්තෙ, ශ්‍රී ලංකා මහ බැංකුවෙ අර්ථ ශාස්ත්‍රඥයකු වශයෙන් සේවය කළ ඩබ්ලිව්. දොන් මයිකල් මහත්මයයි. ඒ මහත්මය මෙන්න මේ විධියෙ අදහසක් ප්‍රකාශ කරනවා.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Order please! The Sitting is suspended until 2 P.M.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින් අ. භා. 2 ට නැවත පවත්වන ලදි.

அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, பி. ப. 2 மணிக்கு ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 2 P.M. and then resumed.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

ගරු සභාපතිතුමනි, දහවල් රැස්වීම තාවකාලික වශයෙන් නැවත්වීමට පෙර මා කථා කරමින් සිටියේ අපට විශාල අවහිරයක් වී තිබෙන කොන්fපරන්ස් සංවිධාන දෙක ගැනයි. දැනට අවුරුදු හැට-හැත්තෑව කට පමණ පෙර මෙම සංවිධාන දෙක ආරම්භ කළේ නැව් කොම්පැනි අතර ඇති තරඟය වැළැක්වීම පිණිසයි. නමුත් දැන් එම සංවිධාන දෙක අපේ වෙළඳාම සහ අපේ ජාතික ආර්ථික ක්‍රමය උඩ පටවා තිබෙන විශාල බරක් වී තිබෙනවා. මෙම සංවිධාන දෙකට පුළුවන්කමක් තිබෙනවා, තමන්ට ඕනෑ පිළිවෙළකට. ඕනෑම අවස්ථාවකදී නැව් ගාස්තු වැඩි කරන්න. කොළඹ වරායෙ සුළු වැඩ වර්ජනයක් ඇති වුණොත්, එහෙම නැතිනම් දේශගුණයෙ වෙනසක් ඇති වී නැව්වල ප්‍රමාදයක් ඇති වුණොත් එහෙම නැතිනම් වෙනත් කිසියම් සුළු බාධාවක් ඇති වුණොත් මෙම සංවිධාන දෙකට පුළුවන්කම තිබෙනවා, ඕනෑ පිළිවෙළකට නැව් ගාස්තු අඩු වැඩි කරන්න. සමහර වෙලාවලදී නැව් ගාස්තු වැඩි කරනවා පමණක් නොවෙයි, නැව් ගාස්තු වැඩි කිරීමට ඒ අය පෙන්වන හේතු සම්පූර්ණයෙන්ම ඇත්ව ගියාට පසුවත් එසේ වැඩි කල නැව් ගාස්තු කාලයක් තිස්සෙ අය කර ගෙන යනවා.

එපමණක් නොවෙයි, මෙම කොන්fපරන්ස් සංවිධාන දෙකේ මූලික පරමාර්ථය නැව්වලට බඩු පටවන අය, නැව් කොම්පැනිවලට බැඳ තබා ගැනීමයි. එම සංවිධාන දෙකින් යොදා ඇති ක්‍රමය අනුව එවැනි තත්ත්වයක් ඇති වී තිබෙනවා. එපමණක් නොවෙයි, නැව්වලට ගෙවන ගාස්තු වෙනුවෙන් කාලයක් ගත වුණාට පසුව කොමිස් එකක් ඒ නැව්වලට බඩු පටවන්නන්ට දීමට පුරුදුව සිටිනවා. මෙය කලින් "ඩිfපර්ඩ් කොමිෂන්" යනුවෙන් හැඳින් වුණා. පසුව එය "ඩිfපර්ඩ් රිබේට්" යන නාමයෙන් හඳුන්වන්න පුරුදුව තිබෙනවා. කාලයක් ගත වුණාට පස්සෙ ඒ "ඩිfපර්ඩ් රිබේට්" ආපසු දෙනවා. එපමණක් නොවෙයි, එම නැව්වලට බඩු පටවන්නන් දිගටම බඩු පටවා ගෙන යාය කියන බලාපොරොත්තුවෙන්, ඉදිරි අනාගතයටත් ඒ කොම්පැනිවලට බැඳ තබා ගැනීමේ අදහසින් ක්‍රියා කරනවා; කොමිස් පවා ආපසු ගෙවන්නෙ තවත් කාලයක් දිගටම නොකඩවා බඩු පටවා ගෙන යාවිය කියන බලාපොරොත්තුවෙන්.

මෙයින් අපට සිදුවන හානිය නම් මෙය යි. මෙසේ වැඩි කරන නැව් ගාස්තු ගෙවන්නෙ පිටරටින් බඩු ගෙන්වන උදවිය නොවෙයි. ඒ ගාස්තුව අප රටේ බඩු නිපදවීම කරන අයගෙන් ගන්නා වූ බද්දක් හැටියටයි සලකන්නෙ. කවර අවස්ථාවකදී හෝ නැව් ගාස්තු වැඩි කරනවාද අපේ නිෂ්පාදකයාට ලැබෙන මුදල එයින් අඩු වෙනවා. ගරු සභාපතිතුමනි, දහවල් මගේ කථාව නතර කිරීමට පෙර මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

සඳහන් කළේ ඒ පිළිබඳව මධ්‍යම බැංකුවේ අර්ථ ශාස්ත්‍රඥයකු වශයෙන් ක්‍රියා කළ ඩබ්ලිව්. දොන් මයිකල් මහත්මය දක්වා ඇති අදහස් ගැනයි. 1967 ජනවාරි මස 31 වනදා "ඩේලි නිව්ස්" පත්‍රයට සපයා ඇති ලිපියක, "ඩිෆර්ඩ් රිබේට්" ගැන ඒ මහත්මය මෙන්න මේ අන්දමට කියනවා:

"This consists of a percentage of freight money paid by the shipper which is refunded to him subsequently on the fulfilment of certain Draconian conditions."

ඒ කියන්නෙ, මෙම "ඩිෆර්ඩ් රිබේට් සිස්ටම්" ඇති කර තිබෙන්නෙ, නැව්වලට බඩු පටවන්නන්ට උසුලන්න බැරි තරමේ ඉතාම බලගතු කොන්දේසි උඩයි. එවැනි තත්ත්වයකට නැව්වලට බඩු පටවන්නන් භාජන කිරීමෙන් දිගටම ඔවුන් බැඳ තබා ගැනීමට අදහස් කරනවා.

එපමණක් නොවෙයි, තවදුරටත් මෙන්න මෙහෙම කියනවා:

"In Conference documents this is referred to as the 'deferred commission' but it has passed into shipping parlance as the 'deferred rebate'."

ඒ මහතා තවදුරටත් මෙහෙම කියනවා:

"As its continuance is fraught with menace to our efforts at rehabilitation of the agricultural sector and the development of export markets for our products in general, it is time that we took stock of the operation of this insidious system so that the public and the Government may realize the enormity of the restraints on our export trade imposed by these cartels at our own doorsteps and concert measures to outlaw their use of the deferred rebate as a monopoly bond of export shipment.

Under the Deferred Rebate system, the shipper who remains loyal to the Conference Lines becomes eligible, after a specified period of loyalty, to a rebate—generally 10 per cent—on the freight paid by him during the period, provided that the right to the actual payment shall accrue to him only on the completion of a further like period of continuous adherence to ship cargo by those lines."

මෙයින් පෙනෙනවා අද අපට සිදු වී තිබෙන හානිය. නැව් ගාස්තු තීරණය කිරීමේදී මේ කොන්ෆරන්ස් කාරයින් ඔවුන්ට ඕනෑ හැටියට ඒවා වෙනස් කරනවා. සමහර අවස්ථාවලදී කල්කටාවේ සිට ලන්ඩන් නගරයට ගෙනයන බඩුවලට අය කරන නැව් ගාස්තු ලංකාවේ සිට ලන්ඩන් නගරයට බඩු ගෙන යාමේදී අය කෙරෙන ගාස්තු වලට වඩා අඩුයි. කොන්ෆරන්ස් කාරයින් කළ තවත් වැඩක් මෙම ලිපියෙහි එක් තැනෙක සඳහන් කර තිබෙනවා. එක් තරා කාලයකදී, මෙහාට පිටරටින් කෘත්‍රිම පෝර ගෙන්වූ එක්තරා කොම්පැනියක් කොචින් වරායට—කේරළ දේශයට—එම පෝර සපයන්නට ලැස්ති වුණා. ඒ අවස්ථාවේදී මේ කොන්ෆරන්ස් කාරයින් යුරෝපයේ සිට කොළඹට අය කරන නැව් ගාස්තුවට වැඩි ගාස්තුවක් කොළඹ සිට කොචින් වරායට නියම කළා. මෙවැනි ක්‍රම වලින් මේ උදවිය අපේ රටේ වෙළෙඳාමට අවහිර කරනවා. කොන්ෆරන්ස් ක්‍රමය බල පාන්නේ අපේ රටට පමණක් නොවෙයි. ඕස්ට්‍රේලියාව, දකුණු අප්‍රිකාව ඇතුළු වෙනත් බොහෝ රටවලට මෙය බල පානවා. එහෙත්, නොයෙක් නීති රීති පැනවීමෙනුත් නැව් කොම්පැනි සමඟ සාකච්ඡා කිරීමෙනුත් යම් යම් සාධාරණ පිළිවෙළවල් යොදා ගන්නට ඒ රටවලට පුළුවන් වී තිබෙනවා.

මේ කොන්ෆරන්ස් සංවිධානය අපේ රටේ වෙළඳාමට නොයෙක් අතුමින් අවහිර කර තිබියදීත් තවමත් එයින් මිදෙන්නට කිසිම උනන්දුවක් අපේ රජය ගෙන නොතිබීම අපේ රටේ අවාසනාවක්. ඒජන්සි හවුසස් විසින් වෙළෙඳ ඒකාධිකාරයක් ඇති කරගෙන තිබීම නිසා අපේ රටේ වෙළෙඳාමට හානියක් සිදු වී තිබෙන බව එදා ගරු අගමැතිතුමා පවා, වැඩ බලන ගරු කර්මාන්ත ඇමතිතුමාගේ කථාවකට පිළිතුරු වශයෙන් සඳහන් කළ බව තමුන්නාන්සේට මතක ඇති. ඒවාගේම, අපේ රටේ වෙළෙඳාමට හානි වන ආකාරයට ක්‍රියා කරන්නට වෙළඳ කොම්පැනිකාරයින් සූදානම් වෙනොත් ඒවා කඩා බිඳ දමන්නට තමා ක්‍රියා කරන බවත් ගරු අගමැතිතුමා ප්‍රකාශ කළා. අද මේ රට පාලනය කරන පාලකයින් මීට පෙර කාලයකදීත් මේ රටේ පාලනය පිළිබඳ වගකීම ඉසිලුවා. කොන්ෆරන්ස් ක්‍රමයෙන් අපේ රටේ වෙළඳාමට හානියක් සිදු වන බව එදා මේ පාලක පිරිස දැනගෙන සිටියේ නැද්ද? ඒවාගේම, ඒජන්සි හවුසස් වශයෙන් එකතු වී සිටින සියල්ලක්ම අපේ බඩුවල මිල පහළ දමන්නට සෑම විටම උත්සාහ කරන බවත් මේ පාලකයින් දැනගෙන සිටියේ නැද්ද? අද බඩු පටවන්නන්—ෂිපර්ස්—බොහෝ දෙනෙක් නැව්වල ඒජන්තවරුන් හැටියට සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැව් කොම්පැනිවල ඒජන්තවරුනුත් වතු පාලනය කරන ඒජන්තවරුනුත් බඩු පට වන්නනුත් යනාදී සෑම දෙනාම එක් වී ඒ කාධිකාරයක් පිහිටුවාගෙන සිටිනතුරු ඔවුන්ට ඕනෑ පිළිවෙළට නැව් ගාස්තු තීරණය කිරීමත් අපේ භාණ්ඩවල මිල පාලනය කිරීමත් අපට නතර කරන්නට බැහැ. මා නැවත නැවතත් මේ පාර්ලිමේන්තුලේකම්තුමාගෙන් අහන්නේ මේ ආණ්ඩුව මේ සම්බන්ධව හිත් යොමු කර මේ බැම්ම කඩන්නට යම්කිසි වැඩ පිළිවෙළක් ගැන කල්පනා කර තිබෙනවාද කියලයි.

ගරු සභාපතිතුමනි, තව මිනිත්තු 5 කින් මගේ කථාව අවසාන කිරීමට මා බලා පොරොත්තු වෙනවා. මා මුලින්ම කිව්වා මේ රටින් පිටරට බඩු යැවීමේ වෙළඳාම අද ඒකාධිකාරයකට යටවී අපට ලොකු හානියකට මුහුණ පාන්නට සිදු වී තිබෙන වාය කියා. මේ ආණ්ඩුව කල්පනා කරන හැටියට නම් මේවා අපට වළක්වන්නට බැරි දේවල්. බඩු මිල පහත දැමීම සඳහා අපට වළක්වන්නට බැරි දේවලුත් එක් තරා ප්‍රමාණයකට තිබෙනවා. එමෙන්ම අපට වළක්වන්නට පුළුවන් දේවලුත් තිබෙනවා. මේවා වැළැක්වීමට ඇති එක ක්‍රමයක් නම් අපේ පිටරට වෙළඳාමට ආණ්ඩුව සහභාගී වීමයි. ආණ්ඩුව එයට සහභාගි නොවී විදේශිකයින් අතේ තිබෙන මේ වෙළඳ ඒකාධිකාරය කඩන්නට බැහැ. ආණ්ඩුව වෙළඳාමට මැදිහත් වී කොන්fපරන්ස් ලයින්ස්වල බලය බිඳීමටත්, වෙළඳ ඒකාධිකාරවල බලය බිඳීමටත් ඉදිරිපත් වන්නේ නැත්නම් අපේ වෙළඳාම දියුණු කර ගැනීමට ගෙනයන වැඩ පිළිවෙළින් ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ.

අද වෙළඳාම ගැන කථා කරන විට වෙළඳ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් තානාපති කාර්යාලවල අයටත් දොස් නඟන කෙටි කල්පනාකාරයින් සිටිනවා. රටවල් හුඟකම අපේ තානාපති කාර්යාල තිබෙනවා. එමෙන්ම වෙළඳ දෙපාර්තමේන්තුවේත් "කොමර්ෂල් ඇසිස්ටන්ට්ස්" කියා හොඳ පුහුණුවක් ලත් හොඳ කල්පනා ශක්තියක් ඇති තරුණ නිලධාරී පිරිසකුත් සිටිනවා. අපේ වෙළඳාම ලෝකයේ පතල කිරීමට උදව් දීම සඳහා ඒ අයත් සමහර තානාපති කාර්යාලවලට පත් කර යවනවා. එසින් සමහරෙක් මා අඳුණනවා. ඉතාමත්ම උද්‍යෝගිමත් දක්ෂ අය ඒ සඳහා යොදවා සිටිනවා. ඔවුන් කොතරම් දක්ෂ වුණත් කොතරම් උද්‍යෝගිමත් වුණත් යම් ආණ්ඩුවක වෙළඳ ප්‍රතිපත්තියක් කියා එකක් නැත්නම් ඒ නිලධාරීන් මොනවා කරන්නද? අපේ තානාපති කාර්යාලවලට වෙළඳ නිලධාරීන් පත් කළත් වෙළඳාම දියුණු කරන්නය කියා කොතරම් ලියුම් යැව්වත් ඒ අයට කරන්නට පුළුවන් ප්‍රමාණය සීමාසහිතයි. මේ මේ බඩු විකිණීමට තිබෙනවාය කියා ප්‍රචාරය කරන්නට ඔවුන්ට පුළුවන්. එමෙන්ම ඒවායේ සුදුසුකම් නැත්නම් හොඳ තත්ත්වය පිළිබඳවත් කියන්නට පුළුවන්. එහෙමත් නැත්නම් ඒවා මිලදී ගන්නට සූදානම් අය සොයා ගන්නටත් පුළුවන්. එහෙත් අර පැරණි ක්‍රමය අතහැරදමා ඒ ඒ බඩු ඒ ඒ රටවලට විකිණීමට මේ රජය සූදානම් නැත්නම් ඒ නිලධාරීන් මහන්සි වී වෙළඳ ආරංචි මේ රටට එවීමෙන් වැඩක් නැහැ. ඒ නිසා මේ වෙළඳ අමාත්‍යාංශය මගින් පළමුවෙන්ම ආරම්භ කළ යුතු වැඩක් තිබෙනවා. එනම්, කලින් සිටි වෙළඳ ඇමතිතුමා ආරම්භ කිරීමට කල්පනා කරමින් සිටි වෙළඳ සංවිධානය—"ට්‍රේඩිං කෝර්පරේෂන්"—පුළුවන් තරම් ඉක්මණින් ආරම්භ කිරීමයි. හැකි නම් විදේශීය රටවලට එම සංවිධානයේ නිලධාරීන් යවා ඔවුන්ගේ මාර්ගයෙන් අලුත් ගැනුම්කරුවන් සොයාගෙන ඒ ඒ රටවලට සෑහෙන ප්‍රමාණයක් බඩු සපයා නිෂ්පාදකයාටත් සෑහෙන මුදලක් දෙන්නට ඕනෑ.

පිටරටින් බඩු ගෙන්වීම ගැනත් සඳහන් කරන්නට ඕනෑ. මේ රටින් යවන බඩුවල මිල ඛහිනවාය, පිටරටින් ගෙන්වන බඩුවල මිල නගිනවාය ඒ නිසා වෙළඳ පාඩුවත් වැඩි වෙනවාය කියා ගරු මුදල් ඇමතිතුමා නම් අපට කියනවා. අපට තවම පුරුදු වී තිබෙන්නේ බ්‍රිතාන්‍යයන් මේ රට පාලනය කරන කාලයේ අපට පුරුදු කළ වෙළඳ මාර්ගයේම ගමන් කිරීමයි. අද මේ රටට ගෙන්වන බඩුවලින් වැඩි හරියක් ගෙන් වන්නේ ආණ්ඩුවෙන්. විශේෂයෙන්ම ප්‍රාග්ධන භාණ්ඩ—"කැපිටල් ගුඩ්ස්"—යන්ත්‍ර සූත්‍ර ආදිය වැඩි හරියක්ම ගෙන් වන්නේ ආණ්ඩුව මගින්. සමහර නිලධාරීන් පුරුදු වී තිබෙන්නේ යම් යම් රටවල නිෂ්පාදනය කරන භාණ්ඩ පමණක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

මේ රටට සුදුසුය කියා හිතන්නටයි. හැම විටම හිතන්නේ fපර්ගියුසන් ට්‍රැක්ටර් සහ ෙපෝඩ්සන් ට්‍රැක්ටර් ගැනමයි. ජීප් ආදිය සම්බන්ධයෙන් වුණත් හිතන්නේ ඒ විධියටමයි. ලෝකයේ වෙනත් රටවලත් මෙවැනි දේවල් නිෂ්පාදනය කරන බව ඒ අය තේරුම් ගන්නේ නැහැ. සමහර විට ඒජන්තවරුන්ට රුපියල් ලක්ෂ ගණන්, කෝටි ගණන් කොමිස් වශයෙන් ලැබෙන නිසාත්, ඒවා ඇණවුම් කිරීමේදී නිලධාරීන්ටත් යම් යම් වාසි සිදු වන නිසාත්, ඒ පරණ පිළිවෙළටම හිතනවා විය හැකියි. අපේ වෙළෙඳාමට මොන හානි සිදු වුණත් ඒ පරණ ක්‍රමය අතහැර අලුත් විධියට හිතන්නට ඒ අයට පුරුද්දක් නැහැ. මේ නිසා මුදල් වශයෙන් මාරු කළ හැකි අපේ විදේශ විනිමය—ඩොලර් සහ ස්ටර්ලිං—එන්නට එන්නටම අඩු වෙනවා. විදේශ විනිමය අඩු වන නිසා අපට නොයෙකුත් අමාරුකම්වලට මුහුණ පාන්නට සිදු වෙනවා. වෙනත් රටවලිනුත් යාන්ත්‍රික භාණ්ඩ ගන්නට පුළුවන්දැයි සොයා බැලීම නරකද? එවැනි පුරුද්දක් ඇති කර ගැනීම හොඳ නැද්ද?

අ. භා. 2.15

පසුගිය මැයි මාසය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පළ කරන ලද සඟරාවේ "ඔයිලැටරල් එග්‍රිමන්ට්" ගැන ලිපියක් පළ වී තිබුණා. මෙම "ඔයිලැටරල් එග්‍රිමන්ට්" නම් වූ ගිවිසුම්වලින් ඒ තරම් ප්‍රයෝජනයක් නැතැයි සමහරුන් කියනවා. මෙහෙන් බඩු යැවීමට හා ගෙන්වන බඩුවලට අවශ්‍ය අමතර කොටස් ආදිය ගෙන්වා ගැනීමට බැරි වීම හේතුවක් වශයෙන් ඒ අය සඳහන් කරනවා. මෙවැනි අවහිරකම් තිබෙනවා නම්, රටවල් දෙකක් අතරේ පවතින වෙළෙඳාම දියුණු කර ගැනීම සඳහා මෙවැනි අවහිරකම් තිබෙනවා නම්, ඒවා වළක්වා ගැනීම පිණිස සංවිධාන ඇති කර ගන්නට අපට පුළුවන්කමක් නැද්ද? පෝලන්තයෙන් හෝ චෙකෝස්ලෝවේකියාවෙන් ට්‍රැක්ටර් ගෙන්වනවා යයි සිතමු. අප ඒ රටවලින් ට්‍රැක්ටර් ගෙන්වනවා නම් ඒවා සඳහා වුවමනා කරන අමතර කොටස්ද ගෙන්වා ගැනීම සඳහා සංවිධාන ඇති කර ගන්නට අපට පුළුවන්කමක් නැද්ද? ඒ වාගේම ඒවා අලුත්වැඩියා කිරීම සඳහා මිනිසුන් පුහුණු කිරීම පිණිස සංවිධාන යොදන්නට අපට බැරිද? ඒ විධියට අලුතෙන් ඒ භාණ්ඩ නිෂ්පාදනය කරන රටවලින් ඒවා ගෙන්වමින් අපේ බඩු වැඩි වැඩියෙන් පිට රටට අලෙවි කර ගන්නට මාර්ග සලස්වා ගන්නට අපට බැරිද? මේවා ගැන කවුරුන් හෝ කල්පනා කර තිබෙනවාද? "අර අනෙක් ට්‍රැක්ටර් හොඳ නැහැ, වුවමනා කරන වේලාවට ඒවාට අවශ්‍ය අමතර කොටස් ගෙන්වා ගන්නට බැහැ" යනාදී වශයෙන් එදා යම් කෙනකු කියා ඇත්නම්, ගිරවුන් වාගේ දිගටම ඒකම කියන එක ඇසුණවන්තකමක් නොවෙයි. "ඒ පරණ පිළිවෙළටම වැඩ කරගෙන යමු" කියන ප්‍රතිපත්තිය දිගටම අනුගමනය කර ගෙන ගියහොත් අපේ වෙළෙඳාමට ඇති වී තිබෙන කරදරවලින් මිදෙන්නට පුළුවන්කමක් නැති බව මගේ හැඟීමයි.

අද පැරණි පිළිවෙළටම වෙළෙඳාම් කර ගෙන යෑම හරි යන්නේ නැහැ. අප එදා වගේම අදත් යම් යම් රටවලින් බඩු ගන්නවා. එහෙත් ඒ රටවල් අපෙන් බඩු ගන්නේ බොහෝ අඩුවෙනුයි. එසේ තිබිය දී අප දිගටම පුරුදු විධියටම අපේ වෙළෙඳාම කරගෙන යනවා. යන්ත්‍ර සූත්‍ර ආදී ප්‍රාග්ධන භාණ්ඩ පමණක් නොව, එදිනෙදා පරිභෝජනය සඳහා අවශ්‍ය වන රෙදි පිළි වැනි භාණ්ඩ පවා සපයන්නට පුළුවන් රටවල් ලෝකයේ තව හුඟක් තිබෙනවා. ඒ වාගේම අපේ රටත් සමඟ භාණ්ඩ හුවමාරු කර ගන්නට සූදානම් රටවල් තිබෙනවා. ඒ රටවල් සමඟ සම්බන්ධකම් ඇති කරගෙන අපේ වෙළෙඳාම දියුණු කරගන්නට අපට පුළුවන්කමක් නැද්ද? මොහොතකටවත් පරණ වෙළෙඳාම අත්හැර දමන්නට යයි මා කියන්නේ නැහැ. එහෙත් වෙළෙඳාම පුළුල් කිරීමට, රටවල් කීපයකට පමණක් අපේ වෙළෙඳාම සීමා කර නොතැබීමට අප තවම වැයම් කර නැහැ. අපේ වෙළෙඳාම ලෝකය පුරා පැතිරවීම සඳහා දරන වැයම කිසිසේත්ම ප්‍රමාණවත් වන්නේ නැහැ. ඇති වන තත්වයකට මුහුණ පෑමට බලාගෙන සිටිනවා මිස, ආණ්ඩුවක් වශයෙන් උනන්දුවක් දක්වා ක්‍රියා මාර්ගයක් ගෙන යන්නේ නැහැ. ඊට මූලික හේතු දෙකක් තිබෙනවා. එකක්, දේශපාලන හේතු උඩ මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආණ්ඩුව සමහර රටවල් අසතුටු කරන්නට අකැමැතිවීමයි. අනික් එක, පරම්පරා ගණනක් තිස්සේ මේ රටේ වෙළඳාම කරන, ලාභ රැස් කරගෙන සිටින සමහර වෙළඳුන්ගේ විරුද්ධකම් නිසා මේ ආණ්ඩුව අළුත් මාගී ඔස්සේ යන්නට බය වීමයි. මේ හේතු දෙක උඩ අපේ වෙළඳාම පරිහාණියට පත්ව තිබෙනවා. මුදල් ඇමතිතුමා කියන විධියට අපේ වෙළඳාම පහළ බැසීම පිළිබඳව නොවැළක්විය හැකි හේතු තිබෙන බව මා පිළිගන්නවා. එහෙත් නියම පිළිවෙළට ක්‍රියා මාගීයක් සකස් කරගෙන ඉදිරියට ගියොත් මේ සමහර හේතු, අද වළක්වා ගන්නට උත්සාහයක්වත් කර නැති මේ සමහර හේතු, වළක්වා ගන්නට පුළුවනි. ඒ ටිකවත් කරන්නට මේ ආණ්ඩුව කල්පනා කරන්නේ නැද්ද? වෙළඳ අමාත්‍යාංශයට ගිහින් තිබෙන කලදසාව අනුව බලන විට නම් එහෙම දෙයක්වත් කරන්නට බැහැ. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා කිවාක් මෙන්, අද වෙළඳ අමාත්‍යාංශයය කියා එකක් නැහැ. මොකක්ද මේ පාර්ලිමේන්තු ලේකම්තුමාට තිබෙන වගකීම? වෙළඳ අමාත්‍යාංශයේ වගකීම බෙදා හැර තිබෙනවා. ලංකාවේ ආර්ථික තත්ත්වයේ හැටියට විදේශීය වෙළඳාම සම්බන්ධව මේ විධියට වැඩ කරන්නට පුළුවන්ද?

රක්ෂණ සංස්ථාවේ සභාපතිවරයාට ඉල්ලා අස්වෙන්නය කියා ඇමතිවරයා කියා තිබෙනවා. ඊට පිළිතුරත් වශයෙන් සභාපතිවරයා ඇමතිවරයාට ලිපියක් යවා තිබෙනවා. ඊටපසුව සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේදී එක්තරා සෙනෙට් මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඇසුවා. ඇමතිවරයා ඒකට පිළිතුරක් දුන්නා. දෙවනුව ඒ උත්තරය සංශෝධනය කර තවත් උත්තරයක් දුන්නා. ඇමතිවරයා මේ තත්ත්වය පැහැදිලි කරන්නට කරන්නට ප්‍රශ්නය තව තවත් අවුල් වන බවයි මට නම් පෙනෙන්නෙ. රක්ෂණ සංස්ථාවේ අස්වූ සභාපතිවරයා මා පෞද්ගලිකව හඳුනන්නේ නැහැ. ඒ හිටපු සභාපතිවරයා ආරක්ෂා කරන්නට හෝ හෙළා දකින්නට හෝ නැත්නම් ඇමතිවරයා ආරක්ෂා කරන්නට හෝ හෙළා දකින්නට හෝ නොවෙයි මා මේ කථා කරන්නෙ. එදා ඉල්ලා අස් වන ලෙස ඉල්ලමින් ඇමතිවරයා යැවූ ලිපියට සභාපතිවරයා එවූ පිළිතුරු ලිපියේ, ඇමතිවරයා එවැනි ඉල්ලීමක් කර තිබෙන්නේ පත්වීම් සම්බන්ධවත්, "බ්ලැක් ලිස්ට්" කළ ගරාජ සම්බන්ධවත් තිබුණු මතභේද උඩය කියා ඔහු සඳහන් කර තිබෙනවා. එසේ නම් මා පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ප්‍රශ්නයක් අසන්නට සතුටුයි. ඇමතිවරයාගේ පිළිතුරේ ඒ පත්වීම් සම්බන්ධව යම් යම් දේවල් සඳහන් කර තිබෙන අතර රක්ෂණ සංස්ථාවේ වූ ඇතැම් දේවල් සම්බන්ධව කාලයක් තිස්සෙම නමා තුළ සතුටක් නොතිබුණාය, එම නිසා කොමිෂන් සභාවක් පත් කරන්නට බලාපොරොත්තු වෙනවාය කියා සඳහන් කර තිබෙනවා. ඇමතිවරයා තුළ එවැනි අදහසක් තිබෙන බව පළමුවන වරට දැන ගන්නට ලැබුණේ එදායි. අධ්‍යක්ෂ මණ්ඩලයක් තිබුණා. සභාපතිවරයකු සිටියා. නමුත් කිසිම දවසක රක්ෂණ සංස්ථාවේ ප්‍රතිපත්ති සම්බන්ධව, සංවිධානාත්මක ක්‍රියාමාගී සම්බන්ධව අමාත්‍යාංශය විසින් මාර්ගෝපදේශකත්වය දී තිබෙනවාද? කිසිම දවසක අමාත්‍යාංශය විසින් කිසිම කාරණයක් පිළිබඳව නියෝගයක් කර තිබෙනවාද? වාරික මුදල්වල ප්‍රමාණය අඩුය, නැත්නම් වැඩිය, වන්දි ගෙවනවා අඩුය, නැත්නම් වැඩිය ආදී වශයෙන් හෝ පරිපාලනමය කටයුතු පිළිබඳව හෝ කිසිම දවසක අමාත්‍යාංශය විසින් අනතුරු හැඟවීමක් කර තිබෙනවාද? කලින් එවැනි තත්ත්වයක් නොතිබුණා නම් මේ පළමුවන වරටයි අධ්‍යක්ෂ මණ්ඩලයත්, සභාපතිවරයාත් ඇමතිවරයාත් අතරෙහි මතභේද ඇති වී තිබෙන්නෙ. අවසානයේදී සභාපතිවරයා ඉල්ලා අස් වුණා. රක්ෂණ සංස්ථාවට ලිපිකරුවන් ගණනාවක් බඳවා ගැනීමට විභාගයක් පැවැත්වූවා. සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූවා. ඒවාට මුහුණ දුන් උදවියගෙන් 54 දෙනෙකුද කොහෙද පත්වීම් දිය යුතුය කියා තෝරා ගත්තා. 30 දෙනෙකු පමණ පැත්තකට කළා. නුසුදුසු යැයි පැත්තකට කළ අයගෙන් කොටසක් පත් කර ගත යුතු බවට, ඊට පස්සේ ඇමතිතුමා හෝ අමාත්‍යාංශයේ වෙන කෙනකු හෝ නියෝග කළාද? එවැනි තත්ත්වයක් උඩ—ලිපිකරුවන් පත් කිරීමේ ප්‍රශ්නය උඩ—නොවෙයිද, සභාපතිතුමාට නදිසියේම යන්නට සිද්ධ වුණේ? ඊට පෙර කිසිම අවස්ථාවක පරිපාලනය සම්බන්ධයෙන් හෝ වේවා, ප්‍රතිපත්ති සම්බන්ධයෙන් හෝ වේවා ඒ සංස්ථාවට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

කිසිම නියෝගයක් නොදී, මාර්ගෝපදේශ කත්වයක් නොදී, ඒ සභාපතිතුමා සමඟ හදිසියේම මේ ඝට්ටනය ඇති වුණාට පසුව දැන් ඒ සිද්ධිය වසා ගැනීමට වෙනත් වෙනත් දේවල් ඇදගන්නවා. මෙය ඉතා වැදගත් ප්‍රශ්නයක්. මේ සිද්ධියේ සම්පූර්ණ ඇත්ත තත්ත්වය අප ඉදිරියේ ප්‍රකාශ කිරීමට පාර්ලිමේන්තු ලේකම්තුමාට යුතුකමක් තිබෙනවා. ඒ වාගේම යම්කිසි දුෂණයක් සිදු වී තිබෙනවායැයි කල්පනා කරනවා නම්, ඇමතිතුමාගේ ආරක්ෂාව සඳහාත්, සභාපතිතුමාගේ ආරක්ෂාව සඳහාත් ඒ සෑම දෙයක් ගැනම පරීක්ෂණයක් කර, මේ පිළිබඳව දැනට පවතින තත්ත්වය පිරිසිදු කරන ඇටියට මා ඉල්ලා සිටිනවා.

එහෙත් මේ ආණ්ඩුවේ ඉතිහාසය දිහා බලන විට, වෙනත් සංස්ථාවන් සම්බන්ධයෙන් ක්‍රියා කර ඇති ආකාරය දිහා බලන විට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඇඟිලි ගැසීම් උඩ නුසුදුසු අයට පවා වෙනත් සංස්ථාවල පත්වීම් දීමට නිලධාරීන්ට බල කර ඇති පිළිවෙළ ගැන බලන විට, ඇමතිතුමා හෝ අමාත්‍යාංශය හෝ රක්ෂණ සංස්ථාවේ පමණක් පිරිසිදු වැඩ පිළිවෙළක් ගෙන ගියායැයි අපට විශ්වාස කරන්නට බැහැ. පටන් ගන්මේදී දේශපාලන භූමියේ සෑඩ සුළංවලට අසු නොවී, මධ්‍යස්ථව කටයුතු කරන්නට ඇමතිතුමා උත්සාහ කළ බව ඇත්තයි. එහෙත් පසුව එතුමාට සිදු වුණා, තමන්ගේ ඒ ප්‍රතිපත්තියේ එල්බ ගැනීමින් තනතුරෙන් ඉවත් වීම හෝ දේශපාලන බලපෑම්වලට යටත් වෙමින් තනතුරේම ඉඳීම යන දෙකෙන් එකක් තෝරා ගැනීමට. එවැනි තත්ත්වයක් ඇති වුණේ නැද්දැයි මා කිසිම පැකිළීමක් නැතිව පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ප්‍රශ්න කරනවා. මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ලේකම්තුමා අපට පැහැදිලි විස්තරයක් දේවියැයි අප බලාපොරොත්තු වෙනවා.

අද තිබෙන තත්ත්වයේ ඇටියට අපේ විදේශීය වෙළෙඳාම එක එක අමාත්‍යාංශයට බෙදා දීමෙන් නම් සාර්ථක අන්දමට මේ වැඩය කරන්නට පුළුවන්කමක් නැහැ. අද අප මුහුණ පා තිබෙන ආර්ථික අර්බුදයට හේතු වී ඇති ලෝක තත්ත්වය සම්පූර්ණයෙන් දමනය කරන්නට අපට බැරි වුණත්, අපේ සංවිධාන මාර්ගයෙන් පුළුවන් තරම් ඒ තත්ත්වය මැඩ පැවැත්වීමට තැත් කරන්නට ඕනෑ. එසේ කරන්නට නම් වෙළෙඳ අමාත්‍යාංශය රටේ වැදගත්ම අමාත්‍යාංශය හැටියට සලකා අපේ වෙළෙඳාම පිළිබඳ සම්පූර්ණ වගකීම ඒ අමාත්‍යාංශයට පැවරිය යුතු අතර, ඒ ඇමතිතනතුරේ කටයුතු සාර්ථක ලෙස කරන්නට පුළුවන් පුද්ගලයකු වෙළෙඳ ඇමතිධුරයට පත් කර වැඩ කටයුතු කරගෙන යා යුතු බව නැවත නැවතත් අවධාරණයෙන් මතක් කරමින් මගේ වචන සවලපය මෙයින් අවසාන කරනවා.

වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන (අම්බලංගොඩ)

(வைத்திய கலாநிதி எம். எச். சத்தாசேன —அம்பலாங்கொடை)

(Dr. M. H. Saddhasena—Ambalangoda)

සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කිරීමේ බලාපොරොත්තුවක් කලින් නොතිබුණත්, මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් යමක් කීමට මා අදහස් කරනවා. අපේ වෙළෙඳාම සම්බන්ධයෙන් කටුගම්පොළ ගරු මන්ත්‍රීතුමා (සුබසිංහ මයා.) පළ කළ අදහස් වලට මා එකඟ වෙනවා. අපේ වෙළෙඳාම ධනවාදී රටවලට හෝ සමාජවාදී රටවලට හෝ වශයෙන් එක් පක්ෂයකට සීමා නොකර, අපට වාසි වන අන්දමට ඕනෑම රටක් සමඟ වෙළඳෙළඳාම් කරන්නට ඕනෑ. අපේ විදේශ විනිමය උපයන තේ වැනි අපනයන වෙළෙඳාම් සම්බන්ධයෙන් අද බරපතළ තත්ත්වයක් උද්ගත වී තිබෙනවා. රුසියාවට හෝ චීනා අමෙරිකාවට හෝ චීනා එංගලන්තයට හෝ චීනා අපේ වෙළෙඳාම පවරා දීම නිසා ඔවුන්ගේ මනාපය පරිදි අපේ අපනයන ද්‍රව්‍යවල මිල නියම වන බව සත්‍යයක්. ඒ තත්ත්වය වෙනස් කිරීමට අප සෑම ප්‍රයත්නයක්ම දැරිය යුතුයි.

අ. භා. 2.30

නොයෙකුත් රටවල තිබෙන අපගේ තානාපති කාර්යාල මගින් ලංකාවේ නියම පිරිසිදු තේ පැකට් කර විකුණන්නට පුළුවනි. වුවමනා නම් තවත් නිලධාරීන් පත් කර ගෙන මෙම කටයුත්තෙහි යෙදෙන්නට පුළුවනි. එම තේ පැකට් ඒ ඒ රටවල වෙසෙන උදවියට නියම ලංකා තේ වශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෙන් ඉදිරිපත් කරන්නට පුළුවනි. එසේ කළහොත් තේ වෙනුවෙන් අපට අද ලැබෙන මිළට වැඩි මිළක් ලැබෙනවාට සැකයක් නැහැ.

බෞද්ධයන්ට අපහාස වන අන්දමට කෝපන්හේගන් නුවර තේ ප්‍රචාරය කරන බව පෙනෙනවා. කෝපන්හේගන් නුවර එසේ විකුණනු ලබන තේ පැකට් ටුවක් දැන් මා ළඟ තිබෙනවා. මෙම තේ වර්ගයට නම් තබා තිබෙන්නේ බුද්ධ තේ—Buddha Tea—යනුවෙනුයි. මේවා ලංකාවේ තේ නොවෙයි; කලවම් කළ තේයි. ලංකාවේ තේ වලිනුත් ටිකක් කල වම් කර මෙම තේ වැඩි මිළකට විකුණන බව පෙනෙනවා. එසේම මෙම ව්‍යාපාරය බෞද්ධ ජනතාවට කරන විශාල නිගාවක් ද වෙනවා. මෙම පැකට් එක තමුන්නාන්සේලාගේ දැන ගැනීම සඳහා මා ඉදිරිපත් කරනවා. ලෝකවාසී බෞද්ධයන්ට නිගාවක් මේක. මෙම තේ පැකට්ටුව මට ලැබුණේ කෝපන්හේගන් නුවරිනුයි. මෙය බෞද්ධ ජනතාවට කරන අපරාධයක් පමණක් නොව අපේ රටේ තේ ඉතා පහත් තත්ත්වයෙන් පාවා දීමක් ද වෙනවා. අප මෑද පෙරදිග රටවල් සමඟ මීට වඩා පුළුල් ලෙස ගනුදෙණු කරනවා නම් තත්ත්වය මීට වඩා හොඳ වන්නට පුළුවනි. අද අරාබි රටවලින් නූල් වෙනුවට කපු පුළුන් යනා දිය ලබා ගන්නට පුළුවනි. විශේෂයෙන් අපේ රටේ මෑද රට සහ පහතරට තේ විශාල ප්‍රමාණයක් ඔවුන්ට විකුණා ඔවුන් ගෙන් නොයෙකුත් උපකරණ යනාදිය—විශේෂයෙන් කපු පුළුන්—ලබා ගන්නට පුළුවන් වෙනවා ඇති.

අද අප රටේ රබර්වල තත්ත්වය ඉතා භයානකයි. පොල්වල තත්ත්වයද එසේමයි. එවැනි දසාවක් පොල්වලට ලබා තිබෙන අවස්ථාවක අප කෙසේ ක්‍රියා කළ යුතු දැයි කල්පනා කරන්නට වටිනවා. සමහර විට තමුන්නාන්සේලා මට හිනා වෙන්නට පුළුවනි, මා නිතරම පොල් ගැන කතා කරන නිසා. අගනුවර වේවා මහනුවර වේවා බණ්ඩාරවෙල වේවා හැටන් හි වේවා වෙසෙන ජනතාවට පොල් ගෙඩියක් සඳහා ශත 25ක් හෝ 30ක් වැය කරන්නට සිදු වී තිබීම විශාල අපරාධයක්. නොග වශයෙන් පොල් ගන්නේ නම් ගෙඩියක් ශත 12ට 15ට තරම ලබා ගත හැකි වෙනවා. පොල් ගෙඩිය විශේෂයෙන් ලංකාවාසීන්ගේ දෛනික ආහාරයට වුවමනා කරන දෙයක්. එම නිසා පොල් නොග වශයෙන් සතොසේ මගින් හෝ වෙනයම් මාර්ගයකින් හෝ ලබා ගෙන අනතුරුව මහජනතාව අතර ගෙඩිය ශත 12ට 15ට නොවැඩි ගණනකට බෙදා හරිනවා නම් විශාල සහනයක් සැලසෙනවා. රජයට එයින් කිසිදු පාඩුවක් සිදු වන්නේ නැහැ. එ මගින් මහජනතාවට විශාල ප්‍රයෝජනයක් අත්වන අතර ජීවන වියදම්ද ඉතා පහළට බස්සවා ගන්නට පුළුවන් වෙනවා ඇති. මෙවැනි කරුණු කල්පනාවට හත යුතුව තිබෙනවා.

අද අපේ රටේ ජනතාවට බොන්නට ලැබෙන්නේ වංගෙඩි පැකෝ කියන අහක දමන තේ බවයි පෙනෙන්නේ. එම තේ රාත්තලක් රුපියල් 2.00 ක් පමණ වෙනවා. එහෙත් යුරෝපියයන් විසින් පාලනය කරන තේ වෙළඳ පොළේ අපේ තේ විකුණනු ලබන්නේ ශත 90ට නැති නම් රුපියලටයි. එවැනි තේ තමයි, නැවතත් ලංකාවාසීන්ට වැඩි මිළට ලබා ගන්නට සිදු වී තිබෙන්නේ. විදේශීන්ට ඉතා අඩු මිළට අපේ තේ ලබා ගැනීමට මෙසේ අවස්ථාව සැලසී තිබීම ඉතාමත්ම අසාධාරණයි. මීට ප්‍රතිකර්ම යොදන්නට සමහර විට ලංකා රජයට අපහසු වන්නට පුළුවනි. අපේ රට කුඩා රටක්. කටුගම්පොල ගරු මන්ත්‍රීතුමා (සුබසිංහ මයා.) කීවාක් මෙන් අපට ඔවුන්ගේ තිරු බදු ක්‍රම වලට, කොන්fපරන්ස් නැවී සංවිධානවලට එහෙම යට වෙලා කටයුතු කරන්නට සිදු වී තිබෙනවා. එසේ යට වෙලා ඉදගෙනයි, අපේ බඩු ගෙන්වා ගනු ලබන්නේ. යටියන්නොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමතිවරයා වශයෙන් සිටියදී වෙන්නට පුළුවනි, මැණික් වලින් යම් ආදායමක් ලබා ගැනීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ බව මට මතකයි. හොර මැණික් ජාවාරම නිසා විශාල ධනස්කන්ධයක් පිටරටවලට ඇදී යන බව පෙනෙනවා. අප මේ තේ වෙළඳාම කරන්නා වාගේ මැණික් වෙළඳාමත් යම් කිසි පිළිවෙළක් අනුව ගෙනයමින් මැණික්වලින් යම්කිසි තීරු බද්දක් එහෙම අය කරන්නට කල්පනා කළහොත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය සද්ධාසේන]

අපේ රජයට විශාල ආදායමක් ලැබෙනවා ඇති. ඒ පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට මා කැමතියි.

රක්ෂණ සංස්ථාව ඇතුළු නොයෙකුත් සංස්ථාවන් පිළිබඳව නානාවිධ දෝෂාරෝපණයන් ඉදිරිපත් කරන බව දකින්නට ලැබුණා. ගරු ඇමතිතුමාත් එතුමාගේ අමාත්‍යාංශයේ සථිර ලේකම්තුමාත් ඉතා අවංක ලෙස තමන්ගේ රාජකාරි ඉටු කිරීමට මහන්සි ගන්නා බව අප දන්නවා. සමහර විට ඒ ඒ දෙපාර්තමේන්තුවල සිටින්නා වූ කඩාකප්පල්කාරී නිලධාරීන් නිසා ඔවුන් නොමඟ ගොස් සිටිනවාද කියන්නට බැහැ.

ගරු සභාපතිතුමනි, සතොසේ දෙන කරවල සම්බන්ධවත් වචනයක් කියන්නට ඕනෑ. සතොසේ ආයතනය දැන් මෙම අමාත්‍යාංශයට අයිති නැති බව මා දන්නවා. එහෙත් මේ ගැන වචනයක් කියන්නට ඕනෑ. සතොසේ ආයතනවල ලැබෙන්නේ කුණු කරවලයි. පෞද්ගලික වෙළඳුන් ළඟ නම් හොඳ කරවල ඕනෑතරම් තිබෙනවා. මේ පිළිබඳව වග කිය යුතු ඇමතිතුමෙක්, පෞද්ගලික වෙළඳුන් ළඟ හොඳ කරවල තිබෙන්නේත්, සතොසේ කුණු කරවල තිබෙන්නේත් කෙසේද කියා සොයා බලා පාරිභෝගිකයන්ට සතොසේ මගින් හොඳ කරවල සැපයීමට කටයුතු කරන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, සලාක ක්‍රමයකට මිරිස් දීමේදී පොතකට අවුන්සයක් හෝ දෙකක් දෙනවා. දැන් හොඳට මිරිස් වගා කර තිබෙන බව ආරංචියි. තිබෙන ප්‍රදේශවලින් මිරිස් ගෙන්වා සලාකයට දෙන මිරිස් ප්‍රමාණය වැඩි කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. මේ විධියේ අඩුපාඩු නිසා අද දුප්පත් මහජනතාව රජය කෙරෙහි පිළිකුලක්, අකැමැත්තක්, දක්වන බව නොරහසක්. මේ අඩුපාඩු හරිගස්සා ගැනීමට විධිමත් ක්‍රියා මාර්ගයක් සකස් කර ගැනීම රජයේ යුතුකමක්. මේ අමාත්‍යාංශයට භාර වී තිබුණු වැඩ බෙදී යාම නිසා එය කඩා කප්පල් වී ගොස් මේවා කාට අයිතිද කියා පැහැදිලි නැති තත්ත්වයක් ඇති වී තිබෙනවා. මේ කටයුතු භාර ඇමතිතුමෙක් මේවා සංවිධානය කර දුප්පත් පාරිභෝගිකයාට සහනයක් සැලසෙන අන්දමට කට යුතු කරන්නට ඕනෑ. ගරු සභාපතිතුමනි, මට මේ වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව දීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසාන කරනවා.

ලීලාරත්න විජේසිංහ මයා. (පොළොන්නරුව)

(திரு. லீலாரத்ன விஜேசிங்க—பொலன்னறுவை)

(Mr. Leelaratne Wijesinghe—Polonnaruwa)

ගරු සභාපතිතුමනි, මේ වැය ශීර්ෂයටතේ කෙරුණු කථාවලින් පැහැදිලි වුණා, මෙරටින් පිටරට යවන නිෂ්පාදනවලට නිසි මිලක් නොලැබෙන බව. එසේම මේ රටේ නිෂ්පාදනය කර මේ රට ඇතුළේම බෙදා හරින දේවලටත් නිෂ්පාදකයාට නියම මිලක් ලැබෙන්නෙ නැහැ. නිෂ්පාදකයාත් පරිභෝගිකයාත් මැද සිටින තැරැව්කාරයා දෙගොල්ලන්වම අමාරුවේ දමමින් සූරා කනවා. තේ රබර් පොල් තමයි, මේ රටින් ප්‍රධාන වශයෙන් පිටරට යවන්නේ. මේ රටේ නිෂ්පාදනය කර මේ රටේම බෙදා හරින අනිකුත් ද්‍රව්‍ය වෙළඳ දෙපාර්තමේන්තුව මගින් මිලට ගෙන නිපදවන්නාට සෑහෙන මුදලක් දී පාරිභෝගිකයාට සාධාරණ මිලකට දීමට තවම වැඩ පිළිවෙළක් යොදා නැහැ. අපේ ප්‍රදේශවල නොයෙකුත් දේ වැවෙනවා. තමුන්නාන්සේලා මිරිස් වවන්නය කියනවා; මඤ්ඤොක්කා වවන්නය කියනවා; අල බතල වවන්නය කියනවා. අප ඒවා වවනවා; එළවළු වවනවා. ඒ කිසිම දේකට නිසි මිලක් ලැබෙන්නේ නැහැ. වෙළඳ දෙපාර්තමේන්තුවෙනුත් ඒවා ගන්නේ අඩු මිලටයි. වෙළඳ දෙපාර්තමේන්තුවේ වෑන් රථවලින් මඤ්ඤොක්කා රාත්තල ශත 2 කටවත් ගන්නෙ නැහැ; කෙසෙල් ගෙඩි රාත්තල, ගෝවා රාත්තල ශත 5 කට 6කට වඩා ගන්නෙ නැහැ. එහෙත් නගරබද පාරිභෝගිකයාට ගෝවා රාත්තල ශත 30 කට 35 කට අඩුවෙන් ගන්නට බැහැ. මඤ්ඤොක්කා රාත්තල ශත 15 කට 20 කට අඩුවෙන් ගන්නට බැහැ. කෙසෙල් ගෙඩියක් ශත 10 ක් පමණ වෙනවා. මේ අන්දමට වෙළඳ දෙපාර්තමේන්තුවේ කට යුතු හරියාකාර ඉටු නොවන බවයි, කියන්නට තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සභාපතිතුමනි, වෙළඳ දෙපාර්තමේන්තුවේ ශාඛාවක් පොලොන්නරුවේ තිබෙනවා. එහෙත් වෙළඳ දෙපාර්තමේන්තුවේ වෑන් රථ ගෙන ගොස් ඒ ජන පදවල නිෂ්පාදන ද්‍රව්‍ය ගෙනෙන්නට කවදාවත් කිසිම උත්සාහයක් දරා නැහැ. ඒ නිසා ගොවීන් අධෛර්‍යයට පත් වී සිටිනවා. පතෝල කොටුවක් වැව්වොත් පතෝල රාත්තලක් ශත 5 කටවත් දෙන්නට බැහැ. අපේ වෙළඳ දෙපාර්තමේන්තුව, ගොවීන් නිෂ්පාදනය කරන එළවළු නියම මිලක් දී අරගෙන පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට සපයනවා නම්, ගොවීනුත් ධෛර්‍යමත් වී නිෂ්පාදනය වැඩි කරන්නට උත්සාහ කරනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේදී වෙළඳ අමාත්‍යාංශය යටතේ ජනතා කොමිටි පිහිටුවා තිබෙනවා. මේ ජනතා කොමිටිවලට පත් කර තිබෙන්නේ ජනතාවගේ නියම නියෝජිතයන් නොවෙයි. ජනතාව අතර ගැවසෙන, ජනතාවගේ සිතුම් පැතුම් ගැන නිසි විධියට කල්පනා කරන අය නොව, කොළඹ කුරුඳුවත්තේ ඉහළින් වැජඹෙන උදවියයි, ඒ වාගේ ඉන්නේ. පසු ගිය කාලයේ ඒ ජනතා කොමිටියක සිටි රජයේ නිලධාරියෙකු නොහොත් ශල්‍ය වෛද්‍යවරයකු කියා තිබුණා කොත්තමල්ලි පාවිච්චිය ඒ තරම් හොඳ නැත, ඒ නිසා කොත්තමල්ලි නැතුවාට ඒ තරම් හානියක් නැත කියා. ඔන්න ඔය විධියේ නිලධාරීන් තමයි තමුන්නාන්සේලාගේ වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයෙන් පත් කර තිබෙන්නේ. ඒ ශල්‍ය වෛද්‍යවරයන් අපේ වාණිජ හා වෙළඳ ඇමතිතුමා වාගේ ශල්‍ය වෛද්‍යවරයෙකු වෙන්න ඇති. එහෙත් කොත්තමල්ලි අපට සෑම නිස්සේම අවශ්‍ය වෙන දෙයක්. හෙම්බිරිස්සාවක් හැදුණොත් මුලින්ම අපට බොන්න තිබෙන්නේ කොත්තමල්ලි ටිකක් බව දන්නවා ඇති. එම නිසා ඒ විදියේ ප්‍රකාශ කිරීම ගැන අපි කනගාටු වෙනවා.

මෙම ජනතා කොමිටිවලට සමහර තැනක අඹු සැමි දෙදෙනම පත් කර තිබෙනවා. එක ගෙදරින්ම දෙදෙනකු පත් කරන්නේ මේ රටේ මේ කටයුතු ගැන දැනුමක් ඇති උදවිය තෝරා ගන්න බැරුවද? සමහර පළාත්වල නවම ජනතා කොමිටි ඇත්තේම නැහැ. පොලොන්නරුවේ ජනතා කොමිටියක් තිබෙන බවක් මා අහලත් නැහැ, දැකලත් නැහැ. කොහෙන් තෝරා ගත්තාද, කොහේ ඉන්නවාද කියා දන්නේත් නැහැ. පොලොන්නරුවේ නම් නැති බවයි මගේ හැඟීම.

තමුන්නාන්සේ දන්නවා ඇති පසුගිය යුද්ධ කාලයේ කොළඹ කුරුඳුවත්තේ ඉහළ පංතියේ උදවිය සඳහා "ප්‍රිමියර් කෝපරේටිව් ස්ටෝර්ස්" යනුවෙන් උසස් සමුපකාර ආයතනයක් තිබුණ බව. එසේ ඉහළ පංතියේ උදවියගේ ප්‍රයෝජනය සඳහා, ඔවුන්ගේ අඩු පාඩු පිරිමසා ගැනීම සඳහා පෝදා ජාතික පොළ වැනි පහසුකම් අදත් තිබෙනවා. එහෙත් ඒ විධියට ජනතාවට අවශ්‍ය බඩු මුට්ටු ලබා ගැනීම පිණිස ගම්බද ඒ විධියේ පහසුකම් නැහැ. වෙළඳ දෙපාර්තමේන්තුව මගින්වත් වෙනත් කිසිම විධියකින්වත් ඒ ගැන හිතා මතා නැහැ. ඒ අනුව ගම්බද ජනතාවට විශාල හිරිහැර කරදරවලට මුහුණපාන්නට සිද්ධ වී තිබෙනවා. දැන් තමුන්නාන්සේලා පොතකට පරිප්පු අවුන්ස 4 යි, කොත්තමල්ලි අවුන්ස 4යි. සූදුරු අවුන්ස භාගයයි ආදී වශයෙන් ඒ ඒ ආහාර ද්‍රව්‍ය බෙදා දෙනවා. කරවල ආදිය නම් කළු කඩවලින් ගන්නට ලැබුණත්, පරිප්පු සූදුරු කොත්තමල්ලි ආදී ආහාර ද්‍රව්‍ය ගම්බද ප්‍රදේශවල මොන විධියකටවත් ගන්න පුළුවන්කමක් නැහැ.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

ඒ කාරණය මේකට අදාළ නැහැ. සමුපකාර අංශයටයි.

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)
(Mr. Leelaratne Wijesinghe)

වෙළඳ අමාත්‍යාංශයෙන් බඩු බෙදා හැරීම සිදුවෙමින් ඇති වැරදි තත්ත්වයයි මා පෙන්නුම් කෙළේ. නොයෙක් විධියේ සමිති සමාගම්වලින් පැමිණ තොග ගණනේ කොළඹින් බඩු අරගෙන ඒ බඩු මෙහිදීම විකුණනවා. එහෙ බඩු නැහැ.

මිල සාලක පරීක්ෂකවරුන්ගේ සංඛ්‍යාව නම් බොහෝමත්ම මදි. එක දිස්ත්‍රික්කයකට දෙතුන් දෙනෙකු පමණ ඉන්නවා. එහෙත් මේ හොර හාවාරම් මඩින්නට ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලීලාරත්න විජේසිංහ මයා..]

ගොල්ලන්ට මොන විධියකින්වත් පුළුවන් කමක් නැහැ. ඒ නිසා මිල පාලක පරීක්ෂකවරුන් තවත් වැඩි කර හොර ජාවාරම් කරන වෙළෙන්දන් අල්ලා ගැනීම පිණිස නිසි පියවර ගතයුතුව තිබෙනවා. දැනට කොහෙන් හෝ වෙළඳ සැලක් අල්ලා ගත්තත් උසාවියෙන් දඩුවම් ලැබෙන්නේ එහි සේවකයා වැනි සුළු කෙනෙකුටයි. මහා මෝරුන් දැන යන අතර පොඩි හාල් මැස්සන් අසු වෙනවා. පසු ගිය දවසක බී. ජී. එස්. ඩේවිඩ් නඩුකාර උන්නාන්සේ කියා තිබුණා, හොර වෙළඳාම පිළිබඳව අසු වන්නේ සුළු සේවකයන් පමණයි, අයිතිකාර මුදලාලිලා අසුවන්නේ නැත කියා. ඒ නිසා වෙළඳ සැල්වල අයිතිකාර මුදලාලිලා මේ වගකීමට බැඳෙන පරිදි, ඒ අයට දඩුවම් ලැබෙන පරිදි මේ නීති රීති සංශෝධනය කරන්න ඕනෑ.

මීට වඩා කථා කිරීමට මා අදහස් කරන්නේ නැහැ. අපේ ප්‍රදේශවල බඩු මිල ගැනත් ආහාර ද්‍රව්‍ය හිඟය ගැනත් ආහාර අමාත්‍යාංශය යටතේ කරුණු ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. මෙම ශීර්ෂය යටතේ මා විශේෂයෙන් මතක් කරන්නේ අපේ ගම්බද ප්‍රදේශවල ද්‍රව්‍ය හුවමාරුව හරියාකාර කෙරෙන්නේ නැති බවයි. ඒ නිසා වෙළඳ දෙපාර්තමේන්තුව මගින් ගම්බද ප්‍රදේශවලට වැඩි උනන්දුවක් හා සැලකිල්ලක් දක්වන ලෙස මා අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 2.45

සී. එන්. කන්නන්ගර මයා.
(திரு. சீ. என். கன்னங்கர)
(Mr. C. N. Kannangara)

May I begin by saying that the time allowed for debate on the Votes of this Ministry is not sufficient? I must protest most vehemently against the lack of time in this respect. I think this is one of the most vital Ministries of the Government.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

That is a matter you will have to take up with your Chief Whip who has agreed with the Opposition Whip and given only four hours.

සී. එන්. කන්නන්ගර මයා.
(திரு. சீ. என். கன்னங்கர)
(Mr. C. N. Kannangara)

Cannot the time be extended by one hour or so?

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

No. I am sorry.

සී. එන්. කන්නන්ගර මයා.
(திரு. சீ. என். கன்னங்கர)
(Mr. C. N. Kannangara)

It is a pity.

බර්නාඩ් සොයිසා මයා. (දකුණු කොළඹ)
(திரு. பெர்னாட் சொய்ஸா—கொழும்பு தெற்கு)
(Mr. Bernard Soysa—Colombo South)

Come over here and you will get all the time you want.

සී. එන්. කන්නන්ගර මයා.
(திரு. சீ. என். கன்னங்கர)
(Mr. C. N. Kannangara)

Is that so? It might come to that stage.

I think I shall first take the question of the resignation of Mr. Rafeek from the Insurance Corporation for the simple reason that I trust that when the hon. Parliamentary Secretary is making his reply, certain letters will be tabled in Parliament.

What I particularly object to on this question of Mr. Rafeek's resignation is this. I quote from his letter of resignation:

"You indicated that the reason for your now asking for my resignation was because of complaints of Government M. P's that they were unable to get things done at the Corporation. In fact, this is a matter on which you had elaborated when you met the Members of the Board on the 21st of May this year, and the two specific matters referred to by you were that M. P's were complaining that they could not get their nominees appointed into the Insurance

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Corporation as in some other Corporations, and that they could not get certain garages which had been blacklisted for dishonesty or defrauding or trying to defraud the Corporation, restored."

Subsequently, this matter has been raised three times in the Senate, but to this date the Hon. Minister of Commerce and Trade has not made a denial of this particular section in Mr. Rafeek's letter of resignation. I wonder why? Actually I think the Hon. Minister has made blunder after blunder in the Senate in the course of his replies to questions asked by Senator Doric de Souza.

Mr. Rafeek resigned on 1st August 1967 at the request of the Hon. Minister.

The Hon. Minister of Commerce and Trade, in reply to Senator Doric de Souza's question, said:

"With regard to the question raised by Senator de Souza which alleged that there has been political interference in the matter of appointment of clerks to the Insurance Corporation, I would like, first of all, to state that there has been no political interference."—[OFFICIAL REPORT, SENATE, 22nd August 1967; Vol. 24, c. 950.]

He said that. Why did he not deny it when Mr. Rafeek raised this in his letter of resignation in the presence of his Permanent Secretary?

ගරු එම්. එච්. මොහමඩ් (කම්කරු, රැකී රක්ෂා හා නිවාස ඇමති)

(கௌரவ எம். எச். முகம்மது—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சர்)

(The Hon. M. H. Mohamed—Minister of Labour, Employment and Housing)

His own appointment is a political appointment.

සී. එන්. කන්නන්ගර මයා.

(திரு. சி. என். கன்னங்கர)

(Mr. C. N. Kannangara)

He involved all of us. I challenge the Hon. Doctor to show one letter from me asking for one single appointment from him or from the Insurance Corporation for any of my people. He muddied our names.

The second point is this. Mr. Rafeek's entire statement on political interference is based on what the Hon. Minister told him in the presence of his Permanent Secretary and on what he told the board on 21st May. There has been no official denial except the answer given to Senator Doric de Souza's question.

I shall now read at Column 763 of Volume 24 of the Senate HANSARD:

"At no time did any Member of Parliament or anybody else want any of their nominees to be so selected. I can categorically state that that is the case. Every name had been submitted by the Board."—[OFFICIAL REPORT, SENATE, 8th August 1967; Vol. 24, c. 763.]

Then again, on the 22nd August he said this, as reported at Column 950 of Volume 24 of the Senate HANSARD:

"With regard to the question raised by Senator de Souza which alleged that there has been political interference in the matter of appointment of clerks to the Insurance Corporation, I would like, first of all, to state that there has been no political interference. There was no suggestion of any names for appointment other than those that have been recommended by the Board and the recommending authorities."—[OFFICIAL REPORT, SENATE, 22nd August 1967; Vol. 24, c. 950.]

Why did the Hon. Minister of Commerce and Trade want the list in the first place? There was no reason for him to ask for the list. Here, certain clerks were going to be recruited after a test and after an interview. 87 were selected after the test and 54 after the interview.

The curious thing is that the first list of 87 candidates was sent to the Hon. Minister, I think at his request. Subsequently, his Permanent Secretary had sent a letter to the corporation saying that there was no objection to 36 people being taken in. Of the 36, 18 were in the list containing the 54 names, and 18 were not: they had failed. Now, that was a letter, not a directive.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සී. එන්. කන්නන්ගර මයා.]

Thereafter, a directive was sent that those 18 persons should be appointed, but it did not give an order of merit. A second directive was sent on 2nd August after Mr. Rafeek had left. In fact, this directive of 2nd August was the first communication opened by the new chairman of the board. This was a directive ordering the appointment of another 22 persons.

Now, the Hon. Minister has said that M.Ps did not give any names. What I want to know is why the Hon. Minister interfered at all. What was the necessity for these directives? The Hon. Minister has repeated on three occasions that no M.Ps had recommended names.

I have read certain comments made by a very strong U. N. P. supporter and a member of the board, Mr. Chandra Soysa, at a board meeting. Fortunately for the Hon. Minister, the gentlemen who comprised the board at that meeting were generous enough not to record those comments made by Mr. Chandra Soysa at that meeting.

Now, an examination was conducted and an interview was held for those candidates. The interviewing panel consisted of a working director, who acted as chairman, the general manager, and three heads of departments.

In 1965 I asked nearly 19 or 20 questions of the Hon. Minister of Commerce and Trade about Mr. Rafeek and his chairmanship of the Insurance Corporation. Up to date I have not had any reply to those questions. Now, the Hon. Minister puts the blame on us partly saying that we tried to influence the chairman of the corporation or the Minister to get our people in; he blackens our name, and then he defends himself saying that he is not to blame for anything. Finally, he forces the chairman to resign. That is very unfair.

The Hon. Minister should not be allowed to get away with this. He has got away with plenty. He has ruined the entire economy of the country. He has even destroyed this country completely. This is a Ministry run by the embassies and by foreign business crooks, and they, like an octopus, are sucking the life-blood of this country. He and his Ministry and his staff are all buffoons.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

I do not think the hon. Member should refer to a Minister as a buffoon.

සී. එන්. කන්නන්ගර මයා.
(திரு. சீ. என். கன்னங்கர)
(Mr. C. N. Kannangara)

Well, Sir, I call a spade a spade.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Maybe, but not in Parliament.

සී. එන්. කන්නන්ගර මයා.
(திரு. சீ. என். கன்னங்கர)
(Mr. C. N. Kannangara)

All right, I withdraw it. It might come to the stage when I may have

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

to call that entire Ministry and its staff fools. I wonder whether that will be in order?

Let us leave aside the question of the Insurance Corporation. There were sixteen instances quoted by Senator de Souza as to why the chairman resigned. I want all the directives which are supposed to have been given by the Hon. Minister of Commerce and Trade to the Insurance Corporation tabled here in Parliament before this Debate ends because there has not been a single directive issued other than the two directives about the appointment of clerks.

This Ministry is a vital Ministry, in that it is not one that is concerned with any particular political party. This is a Ministry that should be completely above any political leanings. I say that for this reason. Every one of us is interested in the economic welfare, the economic upliftment and the economic prosperity of this country. For instance we cannot expand our economy without having the foreign exchange for industrial growth; we cannot improve the agricultural set-up of this country without having the foreign exchange to get the necessary machinery for the purpose.

I want to know how the Hon. Min-Minister is expecting to reach that end. Politically I am not bothered how he reaches the end—the means are immaterial to me—but the only thing that I want to see is that the end must be reached in the fastest possible time. What I am interested in is the achievement of a state of prosperity somehow, so that we can give employment to the youths who are passing out in numbers every day. We have to find employment for them. To do that we must develop the industrial potential as well as increase our agricultural production. And for these reasons it is important that the Ministry of Commerce and Trade should go through a process of rejuvenation. It is sadly lacking.

ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)

(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)

(Dr. N. M. Perera—Yatiyantota)

Cannot you get Dr. Voronov?

සී. එන්. කන්නන්ගර මයා.

(திரு. சீ. என். கன்னங்கர)

(Mr. C. N. Kannangara)

Now I come to the question of freight charges. What has this Ministry done in that regard for the last two and a half years? What has it done about the Ceylon Shipping Lines? What has it done to bring down the freight charges from Colombo to Europe? I find that freight charges from Singapore and other places to Europe are much cheaper than from Colombo to Europe. Why is this so? There have been no strikes in the port for some time. We are shipping goods from three or four ports but unfortunately they are under bureaucratic autocrats who have been in government service for a time, who have been brought up to stooge for the British imperialists and who have that inclination to stooge in their

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සී. එන්. කන්නන්ගර මයා.]

blood. There are people who are doing that even today in this service. They say one thing when they are civil servants, and go completely against what they have said once they become directors of Ceylon Shipping Lines. I am referring to people like Mr. Alvapillai. There is a Burgher gentleman also.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

I suppose you are referring to Mr. Caspersz.

සී. එන්. කන්නන්ගර මයා.
(திரு. சீ. என். கன்னங்கர)
(Mr. C. N. Kannangara)

Yes, Mr. Caspersz. The most fantastic part of it is this. We invite U.N. experts to advise us on shipping, and the managing director of Aitken Spence goes to assault one of them. Thuggery plus plus! What did the Minister do about that matter? Furthermore, the British High Commission gets down their shipping expert from Singapore to influence the U.N. experts to advise us not to have a shipping line. The question is: are we free, or are we not free?

අ. භා. 3

The hon. Member for Katugampola (Mr. Subasinghe) wanted to know whether this Government has a trade policy. I can give you the assurance that as in the past 2½ years for the next 2½ years too this country will not have a trade policy—not as long as the same people are in charge of the Ministry.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

Have they got any policy at all?

සී. එන්. කන්නන්ගර මයා.
(திரு. சீ. என். கன்னங்கர)
(Mr. C. N. Kannangara)

They never had.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

I am wondering whether to count your time for the Opposition!

සී. එන්. කන්නන්ගර මයා.
(திரு. சீ. என். கன்னங்கர)
(Mr. C. N. Kannangara)

As you know, there is a shortage in milk foods. Now that subject has been handed over to the Ministry of State. But the question of supplying milk foods to babies born in a particular nursing home was raised when the Ministry of Commerce was handling the subject of milk foods. Unfortunately, in spite of our bringing that matter out into the open, the Permanent Secretary to the Ministry of State was very prompt in trying to hush up the whole thing, in that the explanation of Ceylon Nutritional Foods Limited was accepted, whereas there should have been a full-scale inquiry and their milk food quota should have been taken over by the C.W.E.

residence in Britain ? This is prescribed in order to give Europeans the cushy jobs. Every European member of the staff draws a salary of at least £ 20 per week. All European members of the executive grades draw very high salaries, often amounting to over £ 36 per week. Where Europeans have been employed in the minor staff grades, the administration takes care to see that they either do two jobs and are thus paid double or are given overtime at the rate of 1 5/6ths, which is more than double their normal wage. These people are allowed at least nine hours of overtime per week.

The only Ceylonese allowed overtime are the staff working at the stores department. The stores manager draws a salary of £ 13 a week and his assistants £12. 10s. a week. In the last six months these members of the staff have done only three hours' overtime and were paid at the rate of 7s. 6d., whereas, in the case of the European staff, the overtime rate is 1 5/6ths.

It is the normal practice to give all staff an annual increment in October every year. In October 1966 all staff on salary scales were given their increments, but those not on salary scales were not given an increment. That means that the Ceylonese did not get their increments. Only the Europeans got their increments.

For the past 15 years the members of the staff have enjoyed the privilege of obtaining a free cup of tea from the tea bar at the Tea Centre during lunch-time. This is now being withdrawn from the Ceylonese and only given to the Europeans.

That is what is happening there.

කාරකසභා නියෝජ්‍ය සභාපති
(குழுக்களின் உப அக்கிராசனர்)
(The Deputy Chairman of Committees)

It is 4 o'clock now. I think we have to adjourn for tea.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

We agreed to continue without a tea interval before the Hon. Deputy Speaker left the Chair.

කාරකසභා නියෝජ්‍ය සභාපති
(குழுக்களின் உப அக்கிராசனர்)
(The Deputy Chairman of Committees)

I think we are eating into the tea interval.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

In October, 1966, Mr. R. J. Dennis was appointed Public Relations Officer of the Ceylon Tea Centre on a salary of £ 1,600. The following staff was brought directly under him : Information Officer, Designs Officer, Education Officer, Librarian and two secretaries. This was the first time that a public relation officer's post was created. One would have expected them not to go outside to do advertising once this post of public relations officer was created. But the curious thing is they continued to employ Bensons as public relations agents on behalf of the Tea Centre and they continued to pay Bensons at the rate of £400 a month.

This post of public relations officer was never advertised in the English newspapers, nor was it advertised in the Ceylon High Commission as is the normal practice. It is worth noting that Mr. Dennis has no qualification to hold this office and, in fact, is not a member of the Institute of Public Relations. I have got the invoices also. I have all the documents necessary to prove my case, but I am not going to deal with the matter at length.

Then, about loans to members of the staff, it is the rule in the Ceylon Tea Centre that members of the staff should be granted one month's wages as a loan to be repaid in six months. This rule does not apply to the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

European members of the staff who have all purchased houses with loans granted by the Ceylon Tea Centre.

Mr. Olgrave, an administrative officer, applied for a loan to buy a car. It was refused, whereupon Mr. Olgrave approached the treasurer of the International Tea Market Expansion Board, the parent body of the Ceylon Tea Centre, who gave him £550 out of the board's funds without any authorization from the board. There is evidence that at the time the money was given the treasurer had converted the funds to his own use. I have got the photostat copy of the cheque also. I have fully authenticated facts in my hands.

Mr. S. G. de Silva, one of the Ceylonese, was appointed Designs Officer on a salary of £1,000. He is a qualified commercial artist having worked in this capacity in Ceylon for many years. During his stay in London Mr. de Silva qualified further in colour painting but he is ignored. He was appointed because they could not help appointing him. Ever since the present commissioner took office in July 1965 he has ignored Mr. de Silva and has instructed S. W. Bensons Ltd. to carry out all design work for the Ceylon Tea Centre.

ගරු ෂෙල්ටන් ජයසිංහ
(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(The Hon. Shelton Jayasinghe)

They are the advertising agents.

අ. භා. 4

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

In point of fact a good example of the mess created by Bensons can be seen in the manner in which they commissioned a continental lady to design a pictorial map of Ceylon. Here is a qualified Ceylonese but a pictorial map of Ceylon was designed by a continental lady. It was ultimately discovered, after a few months, that the design was of a very poor quality. Nevertheless, they paid her £ 300. That is how things are going on at the Tea Centre. What are we to do? Does this place belong to us or does it belong to some one else?

Then there are a lot of facts about the trade development business. I do not want to spend much time going into them. I do think that this whole place has to be cleaned up. The Hon. Minister must take an interest in this. Do not think this is the monopoly of the Europeans. We pay the money for all this. Let us at least give some employment to our people in that way. It is part of their own existence boosting up Ceylon tea. They not only work for their salaries but also do something more. They are Ceylonese who can be trained and asked to take an interest. In point of fact, they are anxious to take an interest but they are not given half a chance in that Tea Centre. That is the present position.

I agree with what has been said by hon. Members: there is no policy at all in this Ministry. I saw in yesterday's paper that the Permanent Secretary to the Ministry of Commerce and Trade he said, "What are we to do? Rubber prices are coming down. There is nothing that can be done." How can people talk like that? If they cannot do anything, let them please chuck up and go home. That is what they must do, not just keep quiet and say, "We cannot do anything." They must do something.

One of our difficulties when it comes to this Ministry is that we do not know where to begin and where to end. Import control is somebody's business; food importation is somebody else's. What have they got and what have they not got? We do not know.

I have a large amount of material about lentil imports, flour imports, and rice imports. I have got all the facts and figures here, but I do not want to say anything because I do not

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

know to what extent the hon. Parliamentary Secretary's Ministry is responsible in regard to these matters. I honestly do not know. This Ministry is compartmentalized and broken up in so many ways that I do not know where to begin and where to end.

Instead of doing nothing and saying "Rubber prices are coming down," let the Ministry of Commerce and Trade do something so that we may have some discussion somewhere. What part have they played in UNTAB? What have they done in regard to primary products? What fight have they carried on in Geneva about raising the prices of our primary products? They must do something instead of merely saying, "We know nothing. What can we do?" and that sort of thing.

It is the same with tea. What is the use of merely talking? All the smallholders in my area are going out of existence. No doubt some people might like it. But that is the only asset that these people have. The people are starving. They are not getting even ten cents for their green leaf. Something has to be done about these people.

The position is not very different with regard to rubber. In the case of the smallholders, they will hack the trees and go on; but the people with 10 and 15 acres will have to close down because it is no longer paying. They cannot employ labour if they have to sell at 50 cents. Surely something must be done by the Government. You must have some policy on this question. It is no use your just coming here and saying, "What can we do?"

Take the prices of building materials. What is happening today? Those who want to build houses are unable to get any building material. Ask any person who wants to build a house and see whether what I say is not true. The prices of building materials are sky-rocketing. It is no use your coming here and saying, "What can I do? I have no power." The whole Government must sit down and work out some policy to develop this country. We cannot go on existing like this. You are doing nothing.

There are so many matters I want to discuss but time does not permit me to go into all of them.

One other matter I would like to touch on is in regard to insurance. I do not want to take sides in this matter; I do not support Mr. Rafeek or the Hon. Minister. But I do ask the Hon. Minister, if he is going to set up a committee to inquire into these matters, to have a good, qualified committee so that it can inquire into every aspect of insurance, particularly the question of reinsurance.

I am not prepared to absolve either the previous chairman or the Hon. Minister. I think both have done wrong. I am not quite satisfied with Mr. Rafeek's conduct in running the Insurance Corporation. I think the whole question of reinsurance has to be re-examined, as mentioned by the hon. Member for Colombo South (Mr. Bernard Soysa). Need we have invested such enormous sums of money on reinsurance? It is a government corporation. I can understand it if it belong to private parties. We need not have spent millions on reinsurance.

I have got the figures of what we have paid out to various insurance companies by way of reinsurance. With all the backing of Government, need we have done that? So, I do hope the committee that is to be set up will not confine itself to the question of payments and so on. The whole working of the Insurance Corporation must be gone into.

I think we should devote a little more time to the question of commerce. It is a very important subject. It reflects badly on the Government—

ගරු ෂෙල්ටන් ජයසිංහ
(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(The Hon. Shelton Jayasinghe)

But you had an opportunity to discuss this.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I will tell you why. If you look at the Estimates of the Ministry of Commerce today you will find that the most important functions are taken out. Import control is taken out. How can you discuss import policy when import control is taken out? So, you see, our hands are also tied when you are clipping the wings of the Hon. Minister. I cannot discuss the whole question of import policy. I am pleased to see that, maybe as a result of my criticism last time, you have now got a Government to Government contract with Syria. Now follow it up so that we can export tea to those areas and get lentils. That is what I urged last time.

I do not know whether this matter comes under the Hon. Minister of Food or the Import Control Department. Were I to discuss it under the Votes of the Hon. Minister of Commerce and he says, "I am not responsible for it" then I shall have nothing more to say, and I shall have to direct my criticism at the other Minister. The attitude of the Government is also responsible for this position. Personally, when we were discussing the allocation of time we wanted to give a little more time for the discussion of this matter. We do not know now where to begin and where to end. I hope next year we shall be in a position to have a fuller discussion with regard to our policy of imports and exports.

කාරකසභා නියෝජ්‍ය සභාපති
(குழுக்களின் உப அக்கிராசனர்)
(The Deputy Chairman of Committees)

The Sitting is suspended till 4.30 P.M.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, மீண்டும் பி. ப. 4.30 மணிக்கு ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 4.30 P.M. and then resumed.

එම්. සිවසිතම්පරම් මයා. (උඩුප්පිඩ්ඩි)
(திரு. எம். சிவசிதம்பரம்—உடுப்பிட்டி)
(Mr. M. Sivasithamparam—Uduppiddi)

Mr. Deputy Chairman, since time is running out I wish to refer to only two matters. Both matters relate to foreign insurance companies in Ceylon which are trying to hit at the local policy-holders.

The first matter I refer to is in regard to the Indian Insurance Corporation which is seeking to pay Ceylonese policy-holders in devalued rupees. For instance, if a policy holder has taken a policy for Rs. 10,000, they are now seeking to pay only two-thirds the value of the policy on its maturity. I believe I took this matter up with the Hon. Minister some months ago when some amendment to the Insurance Corporation Act was being discussed. I followed it up by writing a letter to the Hon. Minister but unfortunately I have had no reply so far. I understand that His Excellency the High Commissioner for India in Ceylon also, on representations made by us, has taken up this matter with the Indian Insurance Corporation. May I also request the Hon. Minister to take this matter up with the Indian Government to see that the Ceylonese policy-holders are not played out in this way.

The second matter I wish to refer to is about the Prudential Assurance Company circularizing its policy-holders that there will be no bonus declared for the year 1966. They also say that they do not expect to declare any bonus for Ceylonese policy-holders in the future. Their excuse apparently is that the taxation that is being levied by the Inland Revenue Department is of a very high

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. සිවසිතම්පරම් මයා.]

order and therefore they are not in a position to declare any bonus. To my mind, this is the thin end of the wedge, and the foreign insurance companies are trying to hit at the local policy-holders. I think the earlier the Ministry intervenes to put an end to this type of thing the better their position would be to safeguard the interests of the local policy-holders, which is undoubtedly their duty to do.

These are the two matters I want to raise with the Hon. Minister.

Many Members on both sides of the House have urged the Hon. Minister not to accept the inevitability of the falling prices of our primary products. I am afraid the Ministry is taking up the position, "What can we do? These are factors which are beyond our control. There is nothing we can do." I think that is a thoroughly defeatist attitude to adopt towards this question. My own view is that a lot can be done if only we are prepared to tear ourselves away from some of the grooves in which we have been in the habit of moving in the past. I do not intend to take any more of the time of the House except to urge the Hon. Minister not to accept as something fatalistic these falling prices of our primary products, but to take whatever steps he must take to pull our primary products out of the mire into which they have fallen.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා (අගලවත්ත)

(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த)

(Dr. Colvin R. de Silva—Agalawatta)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මෙම සාකච්ඡාවට සහභාගි වීම සඳහා මිනිත්තු දහයක පමණ කාලයක් හෝ ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වන බව මුලින්ම මතක් කරන්නට කැමතියි. මෙම මිනිත්තු දහය ඇතුළත රබර් කර්මාන්තය ගැන අදහස් ස්වල්පයක් ප්‍රකාශ කරන්නට මා කල්පනා කරනවා.

මුලින්ම උඩුප්පිඩ්ඩිහි ගරු මන්ත්‍රීතුමා (එම්. සිවසිතම්පරම් මයා.) අවසන් කළ තැනින් පටන් ගන්නට මා කැමතියි. තේ වල ජාත්‍යන්තර මිල බැසීම ගැන තමන්ට කරන්නට දෙයක් නැති බව මෙම ආණ්ඩුව වචනයෙන් ප්‍රකාශ නොකළත් අද ඒ තත්ත්වය පිළිගෙන ක්‍රියා කරන බව මටත් පේනවා. අලුතෙන් මිල බැස ගෙන යන රබර් සම්බන්ධයෙනුත් ඒ විධියට හිතා ගෙන ක්‍රියා කළහොත් මේ රට කොතරම් දේවලින් ස්වයංපෝෂිත කරන්නට වැඩ කළත්, විශේෂයෙන් හාල්වලින් ස්වයං පෝෂිත කිරීම සඳහා වී වගා කරන මේ වේලාවේදීම අපට වුවමනා කරන යමක් පිටරටින් ගෙන්වා ගන්නට බැරි වන තැනට මේ රට පත් වන්නට පුළුවනි. අද රබර් මිල ශත හැත්තෑවටත් අඩුයි. මා මේ දවස්වල රබර් කර්මාන්තයෙන් රැකෙන ජනතාවක් සිටින පළාතක් නියෝජනය කරන බව තමුන්නාන්සේ දන්නවා ඇති. තේ කර්මාන්තය පවතින කොටසකුත් අගලවත්ත ප්‍රදේශයේ තිබෙනවා. කඳන් ඉරීමත් සුළු වශයෙන් නැතුවා නොවෙයි. වැඩි වශයෙන් තිබෙන්නේ රබර් කර්මාන්තය වුනත් අද රබර් රාත්තලක මිල ශත හැත්තෑවටත් අඩු නිසා එහි ජනතාවට මුහුණ පාන්නට සිදු වී තිබෙන්නේ ඉතා මත්ම අසතුටුදායක තත්ත්වයකටයි. ඇත්තෙන්ම දැනට අගලවත්ත වැනි පළාතක රබර් ෂීට් රාත්තලක් විකිණෙන්නේ ශත පනහත් හැටත් අතර ගණනකටයි. නොම්මර එකේ රබර් ෂීට් රාත්තලක මිල ශත හැට දෙකක්, හැට තුනක්, එසේ නැත්නම් හැට හතරක් විය හැකියි. එහෙත් අගලවත්ත ප්‍රදේශයේ නම් වැඩිම මිල ශත පණස් නවයක් යයි කීවාට වරදක් නැතැයි මා හිතනවා.

දැනට දවස් තුනකට පමණ පෙර පැලවත්ත ප්‍රදේශයෙහි රබර් වෙළෙඳාම කරන මුදලාලි කෙනකු සමඟ සාකච්ඡා කරද්දී ඔහු මට ඉතා වැදගත් කාරණයක් කීවා. ඒ කාරණයේ බැරුරුම්කම මා මෙහිදී සඳහන් කරන්නට ඕනෑ. නොම්මර එකේ ෂීට් රබර් නිෂ්පාදනය කරනවා නම් චීනයෙන් ලැබෙන ශත පහෙන් ශත දෙකක් ඒ නිෂ්පාදකයාටත් ලැබෙන බව මා මතක් කළ විට, "මේ පළාත්වල මිනිසුන්ට ඒ විධියට හොඳ රබර් ෂීට් හදා ඉන්නවි පුළුවන්කමක් නැහැ. එදිනෙදා රැකීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහා වුවමනා කරන ද්‍රව්‍ය ටික සපයා ගැනීම සඳහා යන්තම් හරි ගස්සා ගත් ෂීට් එක වේලෙන්නටත් පෙර පුළුවන් ගණනකට විකුණනවා. ඉන් ලැබෙන මුදලින් මොනවා හෝ බඩු ටිකක් ගෙදරට ගෙන යනවා. මෙහි සිටින ගැමියන්ගේ හැටි එහෙමයි" යනුවෙන් ඒ මුදලාලි මහතා මට කීවා. එසේ නම් අප මේ පිළිබඳව කල්පනා කළයුතු කාරණා කිපයක් තිබෙනවා. අද රබර් රාත්තලක් ශත හැට කට විකුණනවා යයි කියනවා නම් අද මුදලේ වටිනාකම ගැන සලකන විට අර එදා මහා වෙළෙඳ පරිහානියක් ඇති වූ කාලයේ පැවති තත්ත්වයටම අද අප වැටී සිටින බව පෙනී යනවා. අද මුදල්වල වටිනාකම එදා ඒ වෙළෙඳ පරිහානිය ඇති වූ එක් දහස් නවසිය තිහ, තිස්එක කාලයේදී තිබුණු වටිනාකමින් තුනෙන් පංගුවකටත් අඩු බව රහසක් නොවෙයි. අද රබර් රාත්තලක් ශත හැට නම් එය එදා මිළ අනුව ශත විස්සයි. ඉතින් රබර් රාත්තලක මිළ තව ශත පහක්, හයක්, අටක්, දහයක් බැස්සොත් රබර් වතුවල වැඩ කරගෙන යන්නට බැරි තත්ත්වයක් ඇති වෙනවා.

රබර් සම්බන්ධයෙන් මේ තත්ත්වය උදා වන්නට හේතු මොනවාදැයි කල්පනා කර බැලිය යුතුයි. මට ලැබී ඇති වේලාව අනුව ඒ සියලුම කරුණු ගැන සඳහන් කරන්නට පුළුවන්කමක් නැහැ. මා මතක් කරන්නේ අපට ක්‍රියා කරන්නට පුළුවන් කාරණා ගැන පමණයි. කවුරුන් කොපමණ හැංගුවත් ඇමෙරිකාව තමන් ළඟ තිබෙන රබර් තොගය ඒ ඒ කාලයට එක එක විධියෙන් පාවිච්චි කරමින් තමන්ගේ වාසිය පිණිස රබර් මිළ ගණන් එහාට මෙහාට යවනවා. ඒ ප්‍රශ්නය මෙතනදී මේ අවස්ථාවේ විස්තර කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. ඇමෙරිකාව තමන් ළඟ තිබෙන රබර් කොයි තරම් ඉක්මනින් වෙළෙඳපොළට යවනවාද යන්න කොයි තරම් කෑගැහුවත් ආර්ථික අතින් නොව දේශපාලනය අතින් තීරණය කරන බවට මා තුළ නම් කිසිම සැකයක් නැහැ. ඒ කාරණය ගැන මෙතනදී වාදයකට වැටෙන්නට මට නම් කොහෙත්ම වුවමනාවක් නැහැ.

තවත් එක් කාරණයක් මතක තබා ගත යුතුව තිබෙනවා. මේ දවස්වල යුරෝපයේ —විශේෂයෙන් එංගලන්තයේ සහ ජර්මනියේ—මෙන්ම එක්තරා ප්‍රමාණයකට ඇමෙරිකාවේත් අපේ රබර් පාවිච්චි කරන මෝටර් කර්මාන්තයේ එක්තරා වැදගත් බැස්මක් ඇති වී තිබෙනවා. එංගලන්තයේ එය කොපමණ වැටී තිබෙනවාදැයි කිය නොත්, අද එංගලන්තයේ රැකිරක්ෂාවල් නැතිව සිටින 5,58,000 ක් දෙනාගෙන් වැඩි කොටස මෝටර් කර්මාන්තයෙහි යෙදී සිට මෑතකදී ඒ රක්ෂාවලින් පිට කරනු ලැබූ අය බව කවුරුනුත් පිළිගන්නවා ඇත කියායි මා හිතන්නේ. ලෝකයේ හුඟක් රබර් පාවිච්චියට ගන්න කර්මාන්තය මෝටර් කර්මාන්තයයි. මා එය පිළිගන්නවා. එහෙත් ඒ ගැනත් අපට කරන්නට දෙයක් නැහැ. ඒ කොයි හැටි වෙතත්, එකක් පමණක් මට කියන්නට පුළුවනි. ධනේශ්වර ක්‍රමය තුළ සියලු දෙයක්ම කදිමට ලක්ෂණට කරන්නට පුළුවන්ය යන සිද්ධාන්තය පිළිබඳ ප්‍රශ්නය ගැන සාකච්ඡා කෙරෙන අවස්ථාවක ඉදිරිපත් කරන තර්කවලදී එය පාවිච්චි කරන්නට පුළුවනි.

තවත් එකක් තිබෙනවා. අපට කරන්නට පුළුවන් දේවල් ගැනයි ඒ. ඒ ගැන මතක් කරන්නට බොහොම ඕනෑකමින් හිටියා. අපේ රට රබර් නිෂ්පාදනය කරන රටක්. එසේ නිබියදී මෙතෙක් කල් රබර් වලින් කළ හැකි කර්මාන්ත අපේ රටේ පටන් නොගත්තේ මන්දැයි මගේ මුළු ජීවිතයේදීම මට නොතේරුණු බව මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි. දැන් ඉතාමත් අමාරුවෙන්, නොයෙක් පැතිවලින් විරුද්ධකම් පවතින අතර, කර්මාන්ත ඇමතිතුමාගේ අංශයෙන් අපේ රටේ ටයර් කර්මාන්තශාලාවක් පටන් අරන් තිබෙනවා. එහෙත් එකම එක කාරණයක් මතක් කරන්නට කැමතියි. පිළිතුරක් ඉල්ලනවා එහෙම නොවෙයි. මා දන්න තරමට, මේ රටේ ෂීට් රබර්—ඒ විධියට හරිගස්සන ලද රබර්—පිටරටවලට යවා එහිදී ඒවා නැවතත් පොඩි කර, කුඩු කර, දිය කර අරගෙනයි ටයර් හදන්නේ. ගහෙන් කපාගන්න රබර් කිරි පික අරගෙන එතැන කර්මාන්තශාලාවට ගෙන යන්නට කටයුතු පිළියෙළ කිරීම මගේ විශ්වාසයේ හැටියට නම් අමාරු දෙයක් නොවෙයි. කෙලින්ම රබර් කිරි වැඩට ගන්න ක්‍රම තිබෙනවාද නැද්දැයි මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

දන්නේ නැහැ. අපේ රටේ රබර් ෂීට් පිට රට යවනවා. මෙහිදීම අපේ රබර්වලින් අපට වැඩ ගන්නට පුළුවන්කමක් තිබෙන වාදැයි සෝදිසි කළ යුතුයි. පුළුවන්කමක් තිබෙනවා නම් ඒවා පාවිච්චි කළ යුතුයි. එය ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය විධිවිධාන සලස්වා ගන්නට පුළුවන් නම් ලංකාවටත් රබර්වලින් සාදන ටයර් විකිණීමේදී ලෝකයේ තරඟකාරයකු වීමට මතු කාලයේදී ඉඩ ප්‍රස්තාව ලැබෙනවා ඇතැයි මා කල්පනා කරනවා. අලුත් විධියට මේවා ගැන කල්පනා කරන්නට ඕනෑ.

තවත් පැත්තක් තිබෙනවා. මා කියන්නේ මගේ ආරංචියේ හැටියටයි. ස්ථිර වශයෙන් මුල සිට අගට කරුණු කියන්නට මා දන්නේ නැහැ. නැගෙනහිර යුරෝපයේ අලුත් සමාජවාදී රටවල් කෙලින්ම රබර් කිරි—ලේටෙක්ස්— ගැනීමට සූදානම් වෙනවා. මා දන්නා තරමින් නම්, මුළු ලංකාවේම ඒ වැඩේ කරන්නට තිබෙන්නේ එක් ආයතනයක් හෝ කොම්පැණියක් හෝ සමුපකාර සංවිධානයක් හෝ පමණයි. ඒ රටවල් සමග සාකච්ඡා මාර්ගයෙන් සෝදිසි කළොත්, වේලන්නේ නැතිව අපේ රටෙන් කෙලින්ම පිට කරන රබර් කිරි විශාල තොගවල් ඒ රටවලට යවන්නට සූදානම් කරන්නට ඉඩ තිබෙනවා. එය මගේ විශ්වාසයයි. එක පාරටම, හිටපු හැටියේ, එක දවසකින්, මෙතෙක් අපේ රබර් යැවූ වෙළෙඳපොළවලින් කෙලින්ම හරවා සමාජවාදී රටවලට යවන්නැයි මා කියන්නේ නැහැ. කවුරුන්වත් එසේ නොකියනු ඇතැයි මා කල්පනා කරනවා. එක් රටක් සහ තවත් රටක් අතර දේශපාලනය අතින් දැන් තිබෙන වෙනස්කම් පාවිච්චි නොකර අපට පුළුවන් නම් අපේ වෙළෙඳාම සකස් කර පිළියෙළ කර ගන්නට ඕනෑ. එසේ කරන්නට අපට පුළුවන් නම් දැන් තිබෙන තත්ත්වයට යම් කිසි ප්‍රතිකර්මයක් කරන්නට ඉඩක් ඇති වේයයි මා විශ්වාස කරනවා.

තවත් කාරණයක් ගැන කියන්නට කැමතියි. රබර් වෙළෙඳාමත් තේ වෙළෙඳාම වාගේ වැඩක්. ටික දවසකට ඉහත දී ගරු අගමැතිතුමා විශේෂයෙන් මේ ගරු සභාවේ දී කළාය කියන ප්‍රකාශයක් ගැන මා බොහොම සන්තෝෂ වුණා. ඒ කාරණය මතක් කළාට මට කමා කරන්න. ඉන්දියාවත් ලංකාවත් දෙක එකතු වී, තේ ගන්නාවූ රටවල් සියල්ලක්ම සමග සාකච්ඡා කළොත්—මුහුණ දෙනවා නම්—තේ මිල පිළිබඳ ප්‍රශ්නය අපට බේරා ගන්නට පුළුවන් වේවි.

මුළු ලෝකයක් හඳුන්නට අපේ රටේ ඉන්න ප්‍රධාන කථිකයකු වන යාපනයේ ගරු මන්ත්‍රීතුමා (පොන්නම්බලම් මයා.) එක්සත් ජාතීන්ගේ මණ්ඩලයට හෙට යවනවා.

අ. භා. 4.45

අග්නිදිග ආසියාවේ රබර් නිෂ්පාදනය කරන වෙනත් රටවලුත් සමග අප එකා මෙන් එකතු වී රබර් පිටරටවලට යැවීම සම්බන්ධයෙන් අපට සාධාරණයක් සිදුවන අන්දමේ වැඩ පිළිවෙළක් සකස් කර ගන්නට උත්සාහ දරතොත් නරකද යන ප්‍රශ්නය මා මේ අවස්ථාවේදී අහනවා. අපේ රබර් ලබා ගන්නාවූ යුරෝපයේ කර්මාන්ත රටවලට දැනට වඩා බලවත් අන්දමින් මූණ දීමේ පිළිවෙළක් සකස් කර ගන්නට අපට එසින් පුළුවන් වුණොත් අපේ තත්ත්වය දැනට වඩා ටිකක් හොඳ අනට හරවා ගන්නට පුළුවන් වෙනවා ඇත යන්නයි මගේ විශ්වාසය. යුරෝපයේ කාර්මික රටවල් එකතු වී සාදාගෙන තිබෙන "කොමන් මාර්කට්" හෙවත් පොදු වෙළෙඳ පොළ නමැති ආයතනය අපේ රටවල් තදින් ගසා කෑමට පිළියෙළ වුණු එකක්ය යන අදහස පොදු රාජ්‍ය මණ්ඩලයේ පනස් අවුරුදු පාර්ලිමේන්තු රැස්වීමේදී මා ඉතා තදින් ප්‍රකාශ කළ බව අපේ ගරු රාජ්‍ය ඇමතිතුමාටත් මතක ඇති. රටවල් ගෙන යායුතු අන්දම වෙනත් රටවලට උගන්වන්නට යන්නේ නැතිව, අපට සාධාරණයක් සැලසෙන අන්දමට අපේ විදේශික වැඩ පිළිවෙළවල් සකස් කර ගන්නට වැඩ කරතොත් අපේ "ඩිප්ලොමැටික් සර්විස්" එකෙන් දැනට වඩා ප්‍රයෝජනයක් ලබා ගන්නට පුළුවන් වන බව මා මතක් කරන්නට කැමතියි. විනාඩි 10 කින් මගේ කථාව ඉවර කරන්නට පොරොන්දුවක් ගරු සභාපතිතුමාට දී තිබෙන නිසා මගේ කථාව දීර්ඝ කරන්නට මා අදහස් කරන්නේ නැති වුවත් තවත් වැදගත් කරුණක් මතක් කළ යුතුව තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපේ රබර් මිල බොහොම වේගයෙන් බැසගෙන යන මේ අවස්ථාවේදී ඒ සම්බන්ධව රජයට ලැබෙන උපදෙස් අනුව තව කොපමණ කලක් ආණ්ඩුව මේ විධියට නිශ්ශබ්දව සිටින්නට අදහස් කරනවාද? මේ සම්බන්ධයෙන් වහාම නව වැඩ සැලැස්මක් ඇති කරන්නටයි දැන් අවස්ථාව පැමිණ තිබෙන්නෙ. දැන් අප රබර් නිෂ්පාදනය සඳහා දෙන ආධාරය වැඩි කර තිබෙනවාය, ඉස්සරට වඩා හොඳ බඩ් රබර් වර්ග දැන් වගා කරනවාය ආදී වශයෙන් සමහර අය කියන්නට පුළුවනි. එහෙත් ඒ අදහස් අනුව කටයුතු කරන්නට නම් අප දැනට වඩා හුඟක් දුරට කල්පනා කරන්නට ඕනෑ.

අවසාන වශයෙන්, උඩුප්පිඩිහි ගරු මන්ත්‍රීතුමා (එම්. සිවසිතම්පරම් මයා.) ප්‍රකාශ කළ අදහස්වලට මා සම්පූර්ණයෙන්ම එකඟ වන බව ප්‍රකාශ කරන්නට ඕනෑ. ජාත්‍යන්තර වෙළෙඳ පොළේ වැඩක් නිසා මේ සම්බන්ධයෙන් අපට කිසිම දෙයක් කරන්නට බැරියයි කියමින් නිකම්ම කරබාගෙන, වතුරෙහි පාවෙන පොරොප්පයක් මෙන් සිටින්නට ආණ්ඩුව අදහස් කරනවා නම් ආණ්ඩු කිරීමේ රාජකාරියන් අතහැර දමා මේ උදව්ය යා යුතුයි. එහෙම නැත්නම් මොළය පාවිච්චි කර ඉස්සරහට යන්නට උත්සාහ කළ යුතුයි. මට මේ අවස්ථාව ලබා දීම ගැන ගරු සභාපතිතුමාට එක් වරක් නොව දස වාර යක් ස්තුතියි.

ෆෙස්ටස් පෙරේරා මයා. (වෙන්නප්පුව)
(திரு. பெஸ்ற்றஸ் பெரேரா—வென்னப்புவ)
(Mr. Festus Perera—Wennappuwa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මටත් මිනිත්තු 5ක් දීම ගැන තමුන්නාන්සේට මා ස්තුතිවන්ත වෙනවා. මේ අමාත්‍යාංශය තුළ ලොකු වරදක් තිබෙන බව ඒ සම්බන්ධව අද මේ සභා ගර්භය තුළ කෙරුණු කථාවලින් අපට පෙනී ගියා. මා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු වුවත් මෙම අමාත්‍යාංශය සම්බන්ධයෙන් විවේචන වශයෙන් යම් යම් දේ කියන්නට මටත් සිදු වී තිබෙනවා. ඒ ගැන මා කණගාටු වෙනවා. මහජන මන්ත්‍රීවරයකු වශයෙන් මට ඒවා නොකියා බැහැ. වෙළෙඳ අමාත්‍යාංශය සම්බන්ධයෙන් දැනට ස්වල්ප වේලාවකට පෙර යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ප්‍රකාශ කළ අදහස්වලින් සිය යට 90ක් පමණ අනුමත කරන්නට මට සිදුවී තිබෙනවා. වෙළෙඳ අමාත්‍යාංශයේ කටයුතු එකම අවුල් ජාලයක් බවට පත් වී තිබෙන බව මට පෙනෙනවා. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මෙන්ම විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුනුත් මේ සම්බන්ධව නොයෙක් විධියේ අදහස් ප්‍රකාශ කළා. වෙළෙඳ අමාත්‍යාංශය යටතේ තිබුණු නොයෙක් දෙපාර්තමේන්තු එයින් වෙනස් කොට වෙනත් අමාත්‍යාංශවලට භාර දීම නිසා වෙළෙඳ ඇමතිතුමාට එම කටයුතු කරගෙන යන්නට බැරි වී තිබෙනවායයි සමහර ගරු මන්ත්‍රීවරුන් කියා සිටියා. මා කල්පනා කරන හැටියට මේ කරුණ සම්බන්ධයෙන් අප රවුමේ යා යුතු නැහැ. මේ ප්‍රශ්නය විසඳිය හැකි ක්‍රමය කුමක් දැයි අප කෙළින්ම විමසා බැලිය යුතුයි. මට පෙනී යන හැටියට, දෙපාර්තමේන්තු ඒකරාශි කිරීමෙන්වත් වෙන් කිරීමෙන්වත් අද වෙළෙඳාම සම්බන්ධයෙන් මතු වී තිබෙන ප්‍රශ්න විසඳන්නට පුළුවන් කමක් ලැබෙන්නේ නැහැ. මේ රටට ප්‍රයෝජන සැලසෙන විධියට වෙළෙඳ කටයුතු සකස් කිරීමේ වගකීම පැවරෙන නිළධාරීන් අමාත්‍යාංශය තුළ සිටිනවා. ඔවුන්ගෙන් ඒ වගකීම හරියාකාර ඉෂ්ට වන්නේ නැත්නම් ඒ නිළධාරීන් වෙනස් කිරීමයි කරන්නට තිබෙන්නේ. මේ සභා ගර්භය තුළත් රටේ හැම තැනමත් අද වෙළෙඳ කටයුතු සම්බන්ධයෙන් යම් යම් අදහස් මතු වී තිබෙන්නේ මෙහි යම් කිසි වරදක් තිබෙන නිසායි. එම නිසා එකී නිළධාරීන් ගේ වෙනසක් කරන්නට පෙර ඒ නිළධාරීන්ම ඒ තැන්වලින් අයින් වෙනවා නම් වඩා හොඳ බව මා ප්‍රකාශ කරනවා.

අපේ වෙළෙඳ කටයුතු භාරව පිටරටවල සිටින පුද්ගලයින්ගෙන් කිසිම වැඩක් නැති බව යටියන්තොට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ලංකාවට ලජ්ජා විය යුතු දේවල් සිදු වී තිබෙන බව පිටරටවල අප සංචාරය කළ සමහර අවස්ථාවලදී අපට පෙනී ගියා. සමහර විට වෙළෙඳාම ගැන කිසිම හැඟීමක් හෝ අවබෝධයක් නැතිව අපේ තානාපති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේපස්ටස් පෙරේරා මයා.]

වරු ක්‍රියා කර තිබෙන බව පිළිගැනීමට අපට සිදු වී තිබෙනවා. ලංකාවේ තේ හෝ රබර් හෝ පොල් හෝ පොල් කෙඳි හෝ අනිකුත් නිෂ්පාදන හෝ ගැන කිසිම හැඟීමක් හෝ අවබෝධයක් නැති රටවල් එමට තිබෙන බව අපට පෙනී ගියා. ඒ ගැන විවිත් විට අප විසින් වෙළඳ අමාත්‍යාංශයට දැනුම් දී තිබෙනවා. විශේෂයෙන්ම පොල් කෙඳි කර්මාන්තය පිළිබඳව ඇති වී තිබෙන කරදර ගැන දැනුම් දී ඒ සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස අපි ඉල්ලා සිටියා. අපගේ ඉල්ලීම් සාධාරණ ඉල්ලීම් බවට පිළිගත්තා. එහෙත් ඒවා පිළිගෙන අවුරුද්දක් පමණ ගත වී ඇතත් මේ දක්වා ඒ පිළිබඳව යම්කිසි ක්‍රියාමාර්ගයක් නොගැනීම සම්බන්ධයෙන් අප විසින් අපේ අප්‍රසාදය පළ කළ යුතුව තිබෙනවා. අවුරුද්දක් පමණ ගත වී ඇතත් ඒ පිළිබඳව නීති රීති තවමත් සකස් කර නැහැ. අද කොහු කර්මාන්තයේ යෙදී සිටින දහස් ගණනක් වැටී සිටින ප්‍රපාතය ගැන කල්පනා නොකර වෙළෙඳ දෙපාර්තමේන්තුවේ හා වෙළෙඳ අමාත්‍යාංශයේ නිලධාරීන් කටයුතු කිරීම අපි හෙළා දකිනවා. එසේ කටයුතු කිරීම බරපතළ වරදක්. අපට පෙනී යන හැටියට මේ කරුණු ගැන හැඟීමක් හෝ අවබෝධයක් හෝ නැතිව නිලධාරීන් ක්‍රියා කරන බව මතක් කරන්නට ඕනෑ. මා එසේ කියන්නේ ඔවුන්ට කරන චෝදනාවක් හැටියට නොවෙයි. මේ පිළිබඳව හැඟීමක් හෝ අවබෝධයක් නැතිව ක්‍රියා කරනවා නොවේ නම් මේ රජය කඩාකප්පල් කිරීමේ චේතනාවෙන් ක්‍රියා කරනවා විය යුතුයි. එසේත් නොවේ නම් යම්කිසි බලපෑමකට යට වී ක්‍රියා කරනවා විය යුතුයි. ඒ නිසා වෙළඳාම සම්බන්ධව මීට වඩා සවිස්තර සැලැස්මක් අනුව ක්‍රියා කිරීම සුදුසුයි කියා මා කියනවා.

මට ලැබුණු කාලය මිනිත්තු 5 කට සීමාවී තිබෙන නිසා අවසාන වශයෙන් ඉල්ලීමක් කර මගේ කථාව නතර කිරීමට මා බලාපොරොත්තු වෙනවා. කොහු කෙඳි කර්මාන්තය පිළිබඳව රජයේ සැලකිල්ල යොමු කර අවශ්‍ය නීතිරීති වහාම ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලනවා. නීති රීති ඉදිරිපත් කිරීමෙන් පමණක් සෑහීමට පත් නොවී ඒවා සම්මත කර ක්‍රියාවට නගන ලෙසත් ඉල්ලන අතරම, වෙළඳාම පිළිබඳව පිටරට තත්ත්වය ගැන සම්පූර්ණ අවබෝධයක් ලබාගෙන අපේ වෙළඳාම දියුණු තත්ත්වයකට ගෙන ඒම පිණිස යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්නවා ඇත කියා බලාපොරොත්තු වෙමින් මගේ කථාව මෙයින් නතර කරනවා.

එස්. ඒ. පීරිස් මයා.
(திரு. எஸ். ஏ. பீரிஸ்)
(Mr. S. A. Peeris)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වෙළඳ අමාත්‍යාංශය යටතේ ඇති වැය ශීර්ෂයන් පිළිබඳ සාකච්ඡාවට සහභාගී වී රජයට යම්කිසි ප්‍රයෝජනයක් ලබාගැනීමට හැකි වන අන්දමට කරුණු ඉදිරිපත් කළ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මා මගේ ස්තුතිය පළමුකොටම පුද කරනවා. ඒ අතරතුර පෞද්ගලික චෝදනාත් එකක් දෙකක් කරන්නට යෙදුණා. ඒවා ගැන පසුව කථා කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මුලදී මේ අමාත්‍යාංශයට අයත්ව තිබුණු වැඩ කටයුතු කිපයක් පසුව ගරු අගමැතිතුමා විසින් වෙනත් අමාත්‍යාංශ දෙකක් යටතට පත් කරන්නට යෙදුණා. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය යටතටත් සමුපකාර තොග වෙළඳ ආයතනය—සී. ඩබ්ලිව්. ඊ. එක—රාජ්‍ය අමාත්‍යාංශය යටතටත් පත්කරන්නට යෙදුණා. එමෙන්ම ආනයන අංශයත් රාජ්‍ය ඇමතිතුමාට භාර දුන්නා. සමහර මන්ත්‍රීවරුන් හිතන්ට පුළුවනි, අමාත්‍යාංශයේ අදක්ෂකම නිසා එසේ නැත්නම් හොර වංචා සිදු වන නිසා මෙසේ කරන්ට ඇත්තෙ කියා. මෙම වෙනස් කිරීම් නිසා වෙළඳ අමාත්‍යාංශයේ වැඩ කටයුතු කර ගෙන යන්ට බැරි තත්ත්වයක් තිබෙන බව සමහර ගරු මන්ත්‍රීවරුන් විසින් ප්‍රකාශ කරන්ට යෙදුන. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) වැනි මන්ත්‍රීවරුන් මේ සාකච්ඡාවේදී විශේෂයෙන්ම ගෙන හැර දැක්වූ කරුණක් තමයි මේක.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යම් අමාත්‍යාංශයක කටයුතු වෙනත් අමාත්‍යාංශයකට භාර දෙන්ට ගරු අගමැතිතුමාට බලය තිබෙන බව අපි කවුරුත් දන්නවා. අපට ඒ අවස්ථාවෙදි අහන්ට පුළුවන්කමක් නැහැ, මෙහෙම කරන්නෙ ඇයි කියා. අපේ යුතුකමව තිබෙන්නෙ ඇමතිවරයා හැටියට හෝ පාර්ලිමේන්තු ලේකම්වරයා හැටියට හෝ ගරු අගමැතිතුමාගේ අණට යටත්ව පුළුවන් තරම් ඒ අනුව වැඩ කිරීමයි. මෙම වෙනස් කිරීම් වලින් අපේ අමාත්‍යාංශයට ඇතිවුණු අමාරුවක් මට පෙනෙන්නෙ නැහැ. එක කරුණක් සම්බන්ධයෙන් පමණක් සුළු අමාරුවක් තිබෙනවා. එහෙත් සාකච්ඡා වලින් හා කරුණු අවබෝධ කරවීමෙන් පාලනයට අවහිර නොවන අන්දමට ඒකත් වළක්වා ගන්න පුළුවන්කම තිබෙනවා.

සමුපකාර සංවර්ධනය විශේෂයෙන්ම ඒ අංශයට භාර දුන්නෙ සමුපකාර ණය දෙන ක්‍රමය ආහාර අමාත්‍යාංශය යටතේ තිබුණු නිසයි. ණය ස්ථිර කරන්නේ ඒ අංශයයි. ණය දෙන්නෙත්, ණය එකතු කරන්නෙත් සමුපකාරය මාර්ගයෙනුයි. එම නිසා යම් යම් අවස්ථාවලදී ඇතිවන පාලන අපහසුකම් නිසා ඒ අංශය ආහාර අමාත්‍යාංශයට පවරා දුන්න. සතොසෙ වැඩ කටයුතු මට කරන්ට පුළුවන් යයි රාජ්‍ය ඇමතිතුමා කිව්ව නිසා අගමැතිතුමාගේ ඉල්ලීම උඩ ඒ අංශය රාජ්‍ය ඇමතිතුමාට භාර දුන්න. ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ අංශයත් රාජ්‍ය ඇමතිතුමාට භාර දුන්න. ඇමතිවරයාටවත්, අමාත්‍යාංශයේ වැඩ කටයුතුවලටවත් එයින් කිසිම අමාරුවක් හෝ අඩුපාඩුවක් හෝ ඇති වෙලා නැහැ.

අ. භා. 5

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක ප්‍රශ්නයක් පමණක් තිබෙනවා. වෙළඳ අමාත්‍යාංශය මගින් බඩු විකිණීමේදීත්, අපට අවශ්‍ය බඩු මිළදී ගැනීමේදීත් අපේ බඩු විකිණිය යුත්තේ කොයි රටවලටද, අපට වුවමනා බඩු මිළ දී ගත යුත්තේ කොයි රටවලින්ද, යනාදි ප්‍රශ්න අනිකුත් අමාත්‍යාංශ සමග සාකච්ඡා කර ඒ සඳහා ඒ උදවියගේ අනුමතියත් ලබා ගන්ට අපට ඕදු වී තිබෙනවා. තේ රබර් පොල් පැපොල් කිරි සහ අනිකුත් අපගේ නිෂ්පාදන විකිණීමේදී ඒවා විකිණිය යුත්තේ කොයි රටවලටද, අපි ඒ රටවලින් ඒ වෙනුවට බඩු ගන්නවාද, මොන බඩු ඒ රටවලින් ගත යුතුද, යනාදි ප්‍රශ්න ඉදිරිපත් වූ අවස්ථාවලදී අපේ යුතුකමක්ව තිබෙනව, අනිකුත් අංශවල අදහස් විමසා බලන්න. සමුපකාර තොග වෙළඳ ආයතනයට මොන මොන රටවලින් බඩු ආනයනය කරනවාද කියා තීරණ ගැනීම, මේ ගනු දෙනු සම්බන්ධව ඒ රටවල් සමග මිළ ප්‍රශ්න ගැන, ඒ බඩු ගෙනෙන ක්‍රම ගැන, සාකච්ඡා කර යම් අවබෝධයක් ලබා ගැනීම, මේ රටේ නිෂ්පාදනය කරන බඩු ඒ රටවලට විකිණීම, යනාදී කරුණු ගැන මේ අමාත්‍යාංශය කටයුතු කරනවා. අනික් අමාත්‍යාංශවලින් ඒ කටයුතු කරන්නට සහයෝගය ලැබිය යුතුයි. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට මා එකක් කිව යුතුයි. මේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ කිසිම කඹ ඇදිල්ලක් නැහැ. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරයකු කියා සිටියා කඹ ඇදිල්ලක් තිබෙනවාය කියා. නමුත් එවැනි කිසිම කඹ ඇදිල්ලක් නැහැ. අපේ අමාත්‍යාංශය පිළිබඳ කටයුතුවලදී සියලුම අමාත්‍යාංශවල සහයෝගය ලැබෙනවා. පසුගිය ආණ්ඩුව තුළ නම් කඹ ඇදිල්ලක් තිබුණා. එම නිසයි 1964 දී ඒ ආණ්ඩුව කඩා ගෙන වැටුණේ. අපේ ආණ්ඩුව තුළ නම් කවදාවත් කඹ ඇදීමක් ඇතිවෙන්නේ නැති බව මට කියන්නට පුළුවනි. අපේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු කරගෙන යාමේදී කිසිම අමාරුවකට මුහුණ පාන්නට වෙන්නේ නැහැ. පෞද්ගලික වශයෙන් වුණත් මටවත් මගේ ඇමතිතුමාටවත් කිසිම දුෂ්කරතාවක් නැහැ. කැබිනට් මණ්ඩලයේ කිසිම කඹ ඇදිල්ලක් නැහැ. කැබිනට් මණ්ඩලයේ සම්පූර්ණ සහයෝගය ඇතිව ගරු අගමැතිතුමාගේ නියෝගයන් අනුව අප වෙළඳාම දියුණු කරන්නට කටයුතු කරගෙන යනවා. ඒ සම්බන්ධව මීට වඩා යමක් කිව යුතු යයි මා අදහස් කරන්නේ නැහැ.

ඊළඟට, වෙළඳ ප්‍රතිපත්තිය ගැන මේ අමාත්‍යාංශය කවදාවත් මොකුත් කියා නැත කියා සමහර ගරු මන්ත්‍රීවරුන් කියා සිටියා. අපේ වෙළඳ ප්‍රතිපත්තිය මේකයි. අප නිෂ්පාදනය කරන බඩුවලට සෑහෙන මිළක්, වැඩිම මිළක්, ලබා ගැනී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඒ. පීරිස් මයා.]

මට කටයුතු කිරීමයි අපේ ප්‍රතිපත්තිය. වමේ රටවලට හෝ වේවා, දකුණේ රටවලට හෝ වේවා, මධ්‍යස්ථ රටවලට හෝ වේවා, බටහිර හෝ නැගෙනහිර කුමන රටවලට හෝ වේවා, වැඩිම මිළකට අපේ බඩු විකිණීමයි අපේ වෙළඳ ප්‍රතිපත්තිය. ඒ වාගේම ලංකාව භාණ්ඩ අපනය කිරීමේ දීත් උසස් භාණ්ඩ අඩුම මිළට ලබා ගැනීමයි අපේ ප්‍රතිපත්තිය. හැබැයි, තවත් සැලකිය යුතු කාරණයක් තිබෙනවා. මේ අවුරුද්දෙ අපේ තේ ටික යම් රටකට දී ඒ රටෙන් බඩු ටිකක් ගන්නට තීරණය කළාය කියමු. නමුත් ඒ රට ඊට පසුව අපේ තේ නොගත්තොත් අපේ තේ ගන්න වෙන රටවලටත් අපේ තේ විකිණීම අමාරු වෙනවා. එවැනි අවස්ථාවලදී තේ මිළ දී ගන්න වෙන රටවලුත් අපෙන් තේ ගන්නේ නැහැ. ඇත්තෙන්ම එවැනි සිද්ධීන් දෙකක් ඇති වුණා. අප එක රටකින් බඩු ගත්තා. ඒ බඩු ගැනීමේදී අපේ තේ ගන්නවාය කියා ඒ රට කිව්වා. අප ඒ රටේ නිෂ්පාදනය කරන බඩු වගයක් ගත්තා. ඒ අවුරුද්දේ තේ ගැනීම එතැනින්ම නැවතුණා. සාමාන්‍යයෙන් අපේ තේ ගන්නා රටවල් කීවා, "උඹලා බඩු ගත්තේ අසුවල් රටෙන්, ඒ නිසා උඹලගෙන් බඩු ගැනීම ගැනත් අපි කල්පනා කර බලන්නම්" කියා. වෙළෙඳ කටයුතුවලදී මෙවැනි තත්ත්වයක් මතු වන නිසා අප සැහෙන තරම් කල්පනාකාරීවයි, කටයුතු කළ යුතුව තිබෙන්නේ. අපේ බඩුවලට පුළුවන් තරම් ඉහළ මිළක් ලබා ගැනීම හා අප ගන්නා බඩු—බාල බඩු නොවෙයි, පාරිභෝගිකයන් කැමති හොඳ බඩු—පුළුවන් තරම් අඩු මිළට ගැනීමත් තමයි, අපේ වෙළෙඳ ප්‍රතිපත්තිය.

හේමචන්ද්‍ර සිරිසේන මයා. (අකුරණ පළමුවන මන්ත්‍රී)

(திரு. ஹேமச்சந்திர சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)

(Mr. Hemachandra Sirisena—First Akurana)

ඒ ප්‍රතිපත්තියෙන් සාර්ථක ප්‍රතිඵල ලැබී තිබෙනවාද?

එස්. ඒ. පීරිස් මයා.

(திரு. எஸ். ஏ. பீரிஸ்)

(Mr. S. A. Peeris)

ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න කළ නිසා මා එක් දෙයක් මතක් කරන්නට කැමතියි. වෙළෙඳ කටයුතු ගැන තරමක දැනීමක් ඇති ආණ්ඩුවක්—පසුගිය ආණ්ඩුව—කර තිබෙන වැඩ නිසා තමයි, අපේ තේ මිළ මේ තරම් පහළ බැස තිබෙන්නේ. තේ නිෂ්පාදනයත්, ඒ නිෂ්පාදනය අලෙවි කිරීමත් ගැන මීට කලින් තිබුණු ආණ්ඩු නියම විධියට කටයුතු කර නැහැ. ඔවුන් කිසිම හිතා බැලීමක් නොකර, උන් හිටි ගමන් හදිසියෙන් ගත් තීරණ අනුව කටයුතු කිරීම නිසා තමයි, අද අපේ රට මේ තත්ත්වයට වැටී තිබෙන්නේ.

තේ වතු අයිතිකාර විදේශික මහතුන් කිප දෙනකු මා සමග පෞද්ගලිකව පළ කළ අදහස් කිපයක් මම කියන්නම්. "තමුසෙලාට අප මේ රටේ තබා ගන්නට වුවමනාවක් නැහැ; අපෙන් වීසා බදු වශයෙන් අවුරුද්දකට රුපියල් 400 බැගින් ගන්නවා; ඒ හැරෙන්නට බැරි වෙලාවත් නිවාඩුවකට අපේ නෝනලා හෝ ළමයින් හෝ මේ රටට ගෙන්වා ගත්තොත් ඒ අයගෙනුත් රුපියල් 400 බැගින් ගන්නවා; කොටින්ම තමුසෙලා අප එළවන්නේ නැතිව යන්නට කියනවා; තමුසෙලාගේ හිටපු අගමැතිවරයකු අපේ රටේ ඉන්නා නමුත් ඔහුගෙන් ඒ රටේදී මෙවැනි බදු අය කරන්නේ නැහැ" කියා ඒ අය මා සමග කීවා.

පර්සි වික්‍රමසිංහ මයා. (කඹුරුපිටිය)

(திரு. பேர்சி விக்ரமசிங்ஹ—கம்புறுபிட்டிய)

(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

මොනවා කරන්නට බැරි වුණත්, පසුගිය ආණ්ඩුවේ වැරැද්ද? [බාධා කිරීම්] පීරිසි කුට්ටම—[බාධා කිරීම්]

එස්. ඒ. පීරිස් මයා.

(திரு. எஸ். ஏ. பீரிஸ்)

(Mr. S. A. Peeris)

පීරිසි කුට්ටම ගැන මම කියන්නම්. ඔවුන් තවදුරටත් මා සමග කීවා, "ඒ නිසා අප දකුණු අප්‍රිකාවට නැත්නම් නිව් ගිනියාවට යනවා, ගිහින් ඒ රටවල තේ වවනවා; අවුරුදු 4 කින් දළු නෙළන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පුළුවන් තත්ත්වයට තේ වගාව කරන්නට පුළුවන්" කියා. තව අවුරුදු 20 ක් යන්නට කලින් ඒ අය එම රටවලින් පන්නයි කියා අප බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මා ආණ්ඩුවට යෝජනා වකුත් කර තිබෙනවා. ඒ යෝජනාව අන්තිමටම කියන්නම්.

දැන් ඒ උදවිය ඒ රටවලට ගිහින් එහි තේ නිෂ්පාදනය කරනවා. අපේ තේවලට ලෝක වෙළෙඳ පොළේ ලොකු තරඟයක් ඇති වී තිබෙන්නේ ඒ නිසයි. එම නිසාම, අපේ තේවලට හොඳ මිළක් ලබා ගන්නටත් බැරි වී තිබෙනවා. ගරු මන්ත්‍රීතුමකු කීවාක් මෙන් ඒ අයට ලංකාවේ තරම් කාලයක් ඒ රටවල ඉන්නට ලැබෙන එකක් නැහැ. ඒ නිසා තවමත් අපේ තේවලට සැහෙන තත්ත්වයක් තිබෙනවා. අපේ තේ කර්මාන්තය දියුණු කිරීම සම්බන්ධයෙන් ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශයෙනුත් යම් යම් කටයුතු කර ගෙන යන බව සඳහන් කරන්නට කැමතියි.

ඇට සිටවා තේ වගා කළ ඉඩම් අක්කර යකින් දැනට සමහර විට රාත්තල් 500, 800, 1200 බැගින් ලැබෙනවා. කිනිති සිටවූ තේ වගා කළ ඉඩම් අක්කරයකින් රාත්තල් 2000 සිට 3000 දක්වා ලැබෙනවා. දකුණු පළාතේ සමහර තේ වතුවලින් අක්කරයකින් තේ දළු රාත්තල් 6,000 සිට 7,000 දක්වා ලැබෙන බව දැන ගන්නට ලැබී තිබෙනවා

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்சி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)
ඇටවලින් ?

එස්. ඒ. පීරිස් මයා.
(திரு. எஸ். ஏ. பீரிஸ்)
(Mr. S. A. Peeris)
කිනිති—වී. පී.—තේවලින්. [බාධා කිරීම්] තේ ගැන තමුන්නාන්සේ ඔයිට වඩා දන්නවා ඇතැයි මා හිතුවා. එම නිසා මෙම කිනිති තේ වැවීමෙන් අක්කරයකින් වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්නට හැකි වුවහොත් අනිකුත් රටවල් සමඟ ගනුදෙනු කිරීමේදී යම්කිසි තර්කයක් පවා ඉදිරිපත් කරන්නට පුළුවනි. ඒ හේතුවෙන් තේවලට තවම මේ රටේ තැනක් තිබෙන බව අපට පෙනී යනවා. එසේ හෙයින් තේ වගාව වැඩිදියුණු කළාට ඇති වරදක් නැහැ. අනික් රටවලට ලංකාවේ තරම් හොඳ තේ සාදා ගැනීම අමාරුයි. එක් එක් කාලවලදී ලංකාවේ එක් එක් කොටස්වලින් හොඳ තේ ලැබෙනවා. එක් කාලෙකට උඟව පළාතේ තේ හොඳය කියනවා. තවත් කාලයකට දිඹුල්ල පළාතේ තේ හොඳය කියනවා. එම තේවල මිල සමහර කාලවලදී රුපියල් අටට දහයට යනවා. එම නිසා තේවලට තවමත් තැනක් තිබෙන බව කියන්නට පුළුවනි. හැබැයි, තේ නිෂ්පාදනය වැඩි කිරීමට අප නිතරම කල්පනාව යොමු කළ යුතුව තිබෙනවා.

තේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම පිණිස දැන් කොමිසමක් පත් කර තිබෙනවා. එම කොමිසමේ සභාපතිතුමා පිළිබඳව ගරු මන්ත්‍රීවරයෙක් මතක් කරන්නට යෙදුණා. මා සිතන්නේ නැහැ, එතුමාට එවැනි චෝදනා ඉදිරිපත් කළ යුතුය කියා. කොමිෂන් සභා කිපයකම සභාපතිවරයකු හැටියට සිටි මහතකු තමයි, එහි සභාපති ධුරයට පත් කර සිටින්නේ. කාගේවත් කිමක් නොඅසා කුමන බල පෑමක්වත් නැතුව—සුදු හෝ කළු බල පෑම් නැතුව—එතුමාට මේ පිළිබඳව යම් කිසි අදහසක් දෙන්නට පුළුවන් වේය යන හැඟීමෙනුයි, එතුමාව මෙතනට පත් කර තිබෙන්නේ. එසේ හෙයින් එතුමා සම්බන්ධව චෝදනා කිරීම ගැන රජයේ කනගාටුව ප්‍රකාශ කරනවා.

තේ වෙළඳාම පිළිබඳව ඊළඟට කතා කරන්නට කැමතියි. තේ කොමිසම ඉදිරිපිට තිබෙන කරුණු අතර, කොමීස් මුදල් පිළිබඳවත් බ්‍රෝකර්වරුන් පිළිබඳවත් සඳහන් වෙනවා. කෙසේ වෙතත් අපේ තේවලට සැහෙන මිලක් ලැබෙනවාය කියා අපට සතුටු වන්නට බැහැ. තේ මිල පාලනය කරන්නේ බ්‍රෝකර්වරුන් නෙවෙයි නම් ෂිපර්ස්වරුන් විසිනුයි. මෙහි යම් යම් රහසිගත ක්‍රම තිබෙන බව අපටත් පෙනී යනවා. [බාධා කිරීමක්] කොළඹ සහ එංගලන්තයේ පමණයි, දැනට වෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඒ. පිරිස් මයා.]

දේසි තිබෙන්නේ. වෙන තැන්වලත් වෙන්දේසි ඇති කිරීමට අමාත්‍යාංශය බලය ලබාගෙන තිබෙනවා. අප කල්පනා කර ගෙන යනවා, වෙන රටවලත් තේ වෙළඳාම පිළිබඳ වෙන්දේසි ඇති කිරීමට පුළුවන්ද කියා. යම් යම් ප්‍රතිඵල ඒ මගින් ලැබෙනවාය කියා පෙනෙනවා නම් තවත් වෙන්දේසි පොළවල් කීපයක් ඇති කරන්නටයි, අපේ බලාපොරොත්තුව. ඒ හැර මේ රටේම ප්‍රයෝජනය සඳහාද තේ වෙන්දේසි පොළවල් කීපයක්ම තබන්නටය කියා මතක් කර තිබෙනවා. ඒ පිළිබඳවත් අප සොයා බලනවා.

අ. භා. 5.15

තේ පැකට් කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය මගින් යම් යම් වැඩ පිළිවෙළවල් ඇති කර තිබෙනවා. පිටරටවලට තේ පැකට් කර යැවීම සඳහා ඕනෑම කෙනෙකුට අවසර පත්‍ර දෙනවා. තේ පැකට් කිරීම සඳහා වුවමනා කරන යන්ත්‍ර —packeting machines—සහ අනිකුත් ද්‍රව්‍යයන් මේ රටට ගෙන්වීමට අවසර දෙනවා. මෙරටින් පිටරටට තේ පැකට් කර යවන අවස්ථාවලදී අය කරන තීරු බදු ආපසු දෙනවා. එවිට සමහර රටවලට ලංකාවේම තේ විකුණන්නට පුළුවන් වෙයි. ඕනෑම කෙනකුට, කරුණු සොයා බලා අවසර පත්‍ර දීමෙන් ලංකාවේ තේ ලංකාවේ තේ හැටියටම විකිණීමට අප බලාපොරොත්තු වෙනවා. මේ සම්බන්ධව තවත් කාරණයක් මතක් කළ යුතුව තිබෙනවා. තව සුළුපට දිනකින් ඉන්දියාවේ ඉන්දිරා ගාන්ධි අගමැතිණිය මේ රටට පැමිණි විට තේ කර්මාන්තය ගැනත් සාකච්ඡා කරන්නට පුළුවන් වෙයි. ලංකාවත්, ඉන්දියාවත් ලෝකයට අවශ්‍ය තේවලින් සියයට 85ක් නිෂ්පාදනය කරනවා. ඒ සාකච්ඡාවලින් යම් ප්‍රයෝජනයක් ලැබේය කියා අප බලාපොරොත්තු වෙනවා. ඒ ගැන ඊට වඩා යමක් දැන් කියන්නට බලාපොරොත්තු වන්නෙ නැහැ.

ඊළඟට කියන්නට තිබෙන්නේ රබර් සම්බන්ධවයි. ලංකාවේ නිපදවන්නේ මුළු ලෝකයේම නිපදවන රබර්වලින් සියයට 5ක් පමණයි. 1965 අවුරුද්දේදී ලංකාවේ රබර් අක්කරයකින් රබර් රාත්තල් 580ක් පමණය, නිෂ්පාදනය කළේ. මේ අවුරුද්දේ ඒ ගණන 620 ක් පමණ වී තිබෙනවා. මැලේසියාවේ රබර් අක්කරයකින් රාත්තල් 2,000 ක්, 3,000 ක් පමණ නිෂ්පාදනය කරනවා. ඒ නිසා ඒ රටවලට, වෙන කරුණු අමතක කර මිල අඩු කරන්නට පුළුවන්කම තිබෙනවා. අක්කරයකින් නිෂ්පාදනය කරන රාත්තල් ගණන වැඩි වන විට මිල අඩුකරන්නට පුළුවන්. අපේ තේ අක්කරයකින් රාත්තල් 2,000 ක්, 3,000 ක් නිෂ්පාදනය කරන විට මිල අඩු කරන්නට පුළුවන් වගේ, අක්කරයකින් නිෂ්පාදනය කරන රබර් රාත්තල් ගණනත් වැඩි වන විට මිල අඩු කරන්නට පුළුවන්. ඇමෙරිකාවේ "ස්ටොක් පයිල්" නමැති ගොඩෙන් මාස 3 න් 3 ට රබර් පිට කරන විට ගණන් බහින බව ඇත්තයි. ඒ නිසා මාස කීපයකට පෙර රබර් කර්මාන්තයේ යෙදී සිටින කම්කරුවන්ටත් වැඩ නැති වූ බව අගලවත්තේ මන්ත්‍රීතුමා (ආචාර්‍ය කොල්වින් ආර්. ද සිල්වා) මතක් කළා. ඒ විධියට වෙනත් රටවල රබර් මිල අඩු නිසා අපේ රබර් ගැනීම් අඩු වී තිබෙනවා. සින්තටික් රබර්වල මිලත් සියයට 10 ක් අඩු කර තිබෙනවා. ඒ නිසා තමයි, අපේ රබර් මිල බැස තිබෙන්නේ. මේ ගැන කිසි දෙයක් කරන්නට නැත්තෙ නැහැ, කරන්නට පුළුවන්. මේ රටේ රබර් නිෂ්පාදනය වැඩි කළොත් සමහරවිට රාත්තල ශත 45 ට 50 ට දී ලාභයක් ලබන්නටත් පුළුවන් වෙයි. අක්කරයකින් රාත්තල් හාරසිය ගණන්, පන්සිය ගණන් නිෂ්පාදනය කර මේක කරන්නට බැහැ. අක්කරයකින් රාත්තල් 2,000 කට වැඩි ගණනක් නිෂ්පාදනය කළොත් එය කරන්නට පුළුවන් වෙයි. පරණ රබර් ගස් ගළවා, වෙන රටවලින් ඇට ගෙන වුත් ඒ ඇට සිටුවීමෙන් වැඩි රාත්තල් ගණනක් ලබා ගැනීමට රජයෙන් ආධාර දෙන්නේ ඒ නිසයි. රබර් ප්‍රශ්නය ගැන කියන්නට තිබෙන්නෙ එයයි.

With regard to Mr. Rafeek, Chairman of the Insurance Corporation, the Hon. Minister has made it clear that his resignation had nothing to do with the recruitment of clerks to the corportion. Many months previous to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

that, the Hon Minister had informed Mr. Rafeek that it was necessary to have a complete investigation into the working of the Insurance Corporation, especially as the Minister had received many complaints and allegations against the chairman, both from the public and from Members of Parliament.

Hon. Members will remember that the hon. Member for Kelaniya (Mr. R. S. Perera) repeatedly raised the question of the appointment of one Mrs. Paul by the chairman. Even after a reply was given to his first question, he raised the question again and wanted the Minister to go further into the matter. The matter was probed further and the Minister was not quite satisfied with the position. I myself examined the file, and to my surprise I found that the application the chairman had received from this lady had been attended to in a jiffy, within a few days, and order had been made—supposedly by another director—in red pencil, " Approved." No date is given and no other information is found in that file.

When the hon. Member for Kelaniya raised this matter, at first it was thought that there was nothing in it. Later, however, when we went into the question further, we realized that there was something in what the hon. Member said.

I believe the hon. Member for Kolonnawa (Mr. Ilangaratne) mentioned two other cases of such appointments.

Anyway, it is true that when the term of office of the chairman expired, we extended it. Thereafter, however, we had complaints from Members of Parliament and the public. I myself made certain requests of my Minister because I found that certain charges made by the corporation were rather excessive. Once, in regard to the Minister's own car, he failed to receive notice of renewal of insurance. There were several complaints in regard to vehicles handed over to garages for repairs. There was the case where the corporation wanted to cancel the licence of a garage for not approving an estimate. I personally had to go into the question, and I found that when an officer went to check this vehicle, the person who was there never got up. The officer thought that they should be punished. I went through the connected file. Things were not quite satisfactory there. And then came the strike which could have easily been avoided. At a certain stage we thought that there was something wrong with the corporation. Surely, the Minister had a right to ask the chairman to resign if he was not satisfied.

Sir, arrangements were being processed through the Ministry of Planning for the appointment of a competent person to investigate the working of the corporation. Mr Rafeek had himself been informed of this some months ago and had been asked to fill up certain papers for the information of the Ministry of Planning. There had been recently a series of complaints against the chairman by officers and workers in the Insurance Corporation. It was alleged that he was incompetent, had adopted partisan attitudes on many occasions and taken vindictive action against certain sections of the employees of the Insurance Corporation. There were also problems in regard to reinsurance and marine insurance. I believe, the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) mentioned this and wanted the Government to look into it.

With regard to the appoinment of clerks, it was clearly stated by the Hon. Minister in the first instance that the names of persons proposed for selection or appointment were those from the list submitted by the corporation and that no names were suggested at the instance of anybody within the Government or outside. This board was appointed by the chairman himself; it was not appointed by the Hon. Minister or Ministry officials. There were certain allegations with regard to the interview and the names that were sent up. I think my hon. Friend, the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඒ. පිරිස් මයා.]

Member for Deniyaya (Mr. C. N. Kannangara), asked, "Why did you get a list? Why did you call for a list?" Surely, the Minister has a right to call for a list at least. He did not interfere with the administration of this corporation for one-and-a half years, but when allegations were made against the administration he had to do so. For one-and-a-half years without any interference, the chairman and the board were allowed to carry on as they liked.

අ. භා. 5.30

Further, Sir, there was no suggestion of any names for appointment by the Ministry at any time other than those that had been accepted as qualified by the board and the recommending authorities.—[*Interruption*]. We are doing an honest job and we have to learn these things. The original number of clerks who qualified was 89. These 89 were selected by the board and approved by the corporation, and there was a request to appoint about 30 clerks. Thirty six names were agreed upon by the Ministry out of that list of 89. There were no outsiders. All of them had got through the test. I believe, there were 4,000 applicants. Four hundred sat for the examination, and 89 were selected. No persons were suggested by Members of Parliament. But in the meantime, as the chairman pointed out that 54 had been finally selected from those 89 and that 18 out of the names approved by the Ministry did not come within the 54, the chairman was asked to approve the other 18 who had satisfied all the conditions. But at the special request of the corporation that the number should be increased to 40, in spite of the Ministry's reluctance to increase the cadre, the Ministry approved the 40 from the 54 finally selected by the board. Those are the facts. No names were given by the Minister. All the clerks who were appointed were from the batch that had been selected.

The question was raised as to whether a commission is to be appointed to go into the working of the Insurance Corporation. Yes, it has been decided to do so, and the commission will go into all aspects of the Insurance Corporation. Reinsurance marine insurance, insurance claims, payments made on claims in respect of commercial vehicles and cars, the question of selecting garages to undertake repairs to vehicles insured with the corporation—all those matters will be gone into. Also, whether the Insurance Corporation is over-staffed.

The hon. Member for Wennappuwa (Mr. Festus Perera) raised a matter about fibre. A Bill has been ready for some time and it was to have been presented during the last Session. As there was no time it could not be presented; it will be presented in Parliament as soon as possible. We lost two orders for fibre because there was a strike. Those firms had to buy synthetic fibre from some other countries because they were unable to get the goods in time from us. That is what happens to our produce when there are strikes over trivial matters. Some officer had failed to look into some question, and that was the result.

Then there was the question of payment by the Insurance Corporation to Mr. LaBrooy. I think the Hon. Acting Minister of Nationalized Services gave a reply to that. So far as the Insurance Corporation is concerned, this matter has been thoroughly gone into. No payment has been made by virtue of his being a member of the board of the corporation. He has been paid on the basis of the medical reports and his position. Then there was the question: why should not everybody be given the same amount on those claims? There is a reason. For instance, when a person dies as a result of an accident involving a vehicle insured with the corporation, that person's heirs get less than a person who is disabled. There have been several instances of that nature. The amount of compensation also depends upon the earning capacity of the individual concerned. It is the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

practice with the insurance companies also, and it is on that basis that Mr. LaBrooy got the payment from the Insurance Corporation.

With regard to the Tea Centre in London, it is true that to a great extent this centre has been manipulated and managed by non-Ceylonese. Perhaps, it is because they had dealings in regard to tea during the past so many years and they themselves have been controlling the tea centres at other places as well. But these matters are being looked into.

It is proposed to nationalize this place and send people from this country; the whole set-up will be changed. But this has to be done quietly. You cannot break through things that have taken years to come to this position. It is not that we do not want to do it. We do not want to make a mistake and get into a worse scrape. I think the Hon. Member for Colombo South (Mr. Bernard Soysa) mentioned what Sir John Kotelawala did when he was in London and how the tea prices came down as a result of what he said.—[*Interruption*].

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்சா)
(Mr. Bernard Soysa)

Tea prices are coming down in any case.

එස්. ඒ. පීරිස් මයා.
(திரு. எஸ். ஏ. பீரிஸ்)
(Mr. S. A. Peeris)

Until we are on a strong wicket and we have the set-up to break through we should prefer to let this matter rest and take our chances. When we are strong enough we will take the necessary action. If we try to do something now we may even lose the market we have in the U. K. As you know, the high-grown teas are fetching the prices they do now because the U. K. is buying those teas. Neither do we want to sell on the barter system because when we sell to a country and that country sells us something in return there will be a difference in prices and that country can cut down the price and sell the same tea to the market to which we are selling at a higher price. Even in the barter system of trade one has to look into that point of view as well. It is not like selling tea to another country and buying their stuff if they reduce the price of tea in the other market. These are the things that should be looked into.

I think I have replied to all the points raised.

කාරකසභා නියෝජ්‍ය සභාපති
(குழுக்களின் உப அக்கிராசனர்)
(The Deputy Chairman of Committees)

Is the Opposition pressing the amendment?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்சா)
(Mr. Bernard Soysa)

No, Sir.

"98 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 3,01,235 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

98 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට නිබිය යුතු යයි නියෝග කරන ලදී.

"98 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம், ரூபா 3,01,235 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

98 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 301,235 for Head 98, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.

Head 98, Vote 1, ordered to stand part of the Schedule.

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 72,980

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூ. 72,980

Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 72,980

"98 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 72,980 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

98 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"98 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 72,980 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

98 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 72,980 for Head 98, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.

Head 98, Vote 2, ordered to stand part of the Schedule.

3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම්, රු. 11,600

வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 11,600

Vote No. 3.—Administration Charges—Capital Expenditure, Rs. 11,600

"98 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 11,600 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

98 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"98 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் ரூபா 11,600 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

98 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 11,600 for Head 98, Vote No. 3, be inserted in the Schedule", put, and agreed to.

Head 98, Vote 3, ordered to stand part of the Schedule.

99 වන ශීර්ෂය.—වාණිජ දෙපාර්තමේන්තුව

1 වන සම්මතය:—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 7,47,458

99 ஆம் தலைப்பு.—வர்த்தகத் திணைக்களம்

வாக்குப்பணம், இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூ. 7,47,458

Head 99.—Department of Commerce

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 747,458

"99 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 7,47,458 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

99 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"99 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம், ரூபா 7,47,458 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

99 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 747,458 for Head 99, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.

Head 99, Vote 1 ordered to stand part of the Schedule

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 5,70,250

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவருஞ் செலவு, ரூ. 5,70,250

Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 570,250

"99 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 5,70,250 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

99 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"99 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 5,70,250 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

99 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 570,250 for Head 99, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.

Head 99, Vote 2, ordered to stand part of the Schedule.

100 වන ශීර්ෂය.—සමාගම් රෙජිස්ත්‍රාර් දෙපාර්තමේන්තුව

1 වන සම්මතය:—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 4,45,312

100 ஆம் தலைப்பு.—கொம்பனிப் பதிவாளர் திணைக்களம்

வாக்குப்பணம், இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூ. 4,45,312

Head 100.—Department of Registrar of Companies

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 445, 312

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"100 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 4,45,312 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

100 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"100 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம், ரூபா 4,45,312 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

100 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 445,312 for Head 100, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.

Head 100, Vote 1, ordered to stand part of the Schedule.

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 37,688

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவருஞ் செலவு, ரூ. 37,688

Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 37,688

"100 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 37,688 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

100 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"100 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 37,688 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

100 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 37,688 for Head 100, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.

Head 100, Vote 2, ordered to stand part of the Schedule.

101 වන ශීර්ෂය.—වෙළඳ නැව් ගමනා ගමන දෙපාර්තමේන්තුව

1 වන සම්මතය:—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 98,971

101 ஆம் தலைப்பு.—வணிகக் கப்பற்றொழில் திணைக்களம்

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூ. 98,971

HEAD 101.—DEPARTMENT OF MERCHANT SHIPPING

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 98,971

"101 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 98,971 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

101 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"101 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம், ரூ. 98,971 அட்டவணையில் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

101 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 98,971 for Head 101, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.

Head 101, Vote 1, ordered to stand part of the Schedule.

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 3,650

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூ. 3,650

Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 3,650

"101 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 3,650 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

101 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"101 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 3,650 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

101 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Question, "That the sum of Rs. 3,650 for Head 101, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.

Head 101, Vote 2, ordered to stand part of the Schedule.

102 වන ශීර්ෂය.—වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුව

1 වන සම්මතය:—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 23,156

102 ஆம் தலைப்பு.—வியாபாரப் பொருள் கொள்வனவுத் திணைக்களம்

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூ. 23,156

HEAD 102.—DEPARTMENT OF COMMODITY PURCHASE

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 23,156

"102 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 23,156 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

102 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"102 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம், ரூபா 23,156 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

102 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம், அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 23,156 for Head 102, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.

Head 102, Vote 1, ordered to stand part of the Schedule.

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 13,400

வாக்குப்பணம், இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூ. 13,400

Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 13,400

"102 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 13,400 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

102 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

—කාරක සභාව

"102 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 13,400 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

102 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 13,400 for Head 102, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.

Head 102, Vote 2, ordered to stand part of the Schedule.

3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම, රු. 43,400

வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 43,400

Vote No. 3.—Administration Charges—Capital Expenditure, Rs. 43,400

"102 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 43,400 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

102 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"102 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் ரூபா 43,400 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

102 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 43,400 for Head 102, Vote No. 3, be inserted in the Schedule", put, and agreed to.

Head 102, Vote 3, ordered to stand part of the Schedule.

145 වන ශීර්ෂය.—අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා

1 වන සම්මතය:—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 1,02,17,397

145 ஆம் தலைப்பு.—கல்வி, கலாசார விவகார அமைச்சர்

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூ. 1,02,17,397

HEAD 145.—MINISTER OF EDUCATION AND CULTURAL AFFAIRS

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 10,217,397

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

පී. බී. ජී. කළුගල්ල මයා. (කෑගල්ල)
(திரு. பீ. பி. ஜி. கலுகல்ல—கேகாலை)
(Mr. P. B. G. Kalugalla—Kegalla)

"වැය සම්මතය රුපියල් 10කින් අඩු කළ යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයට අයිති ශීර්ෂ වන 145 සිට 151 දක්වා සාකච්ඡා කරන මේ අවස්ථාවේදී අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානයට යොමු කිරීම පිණිස කරුණු රාශියක් ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අප ඉදිරිපත් කරන විමසුම් සඳහා අධ්‍යාපන ඇමතිතුමාගෙන් කෙළින් සහ ස්ථිර පිළිතුරක් අපි බලාපොරොත්තු වෙනවා.

අධ්‍යාපන කාර්යයෙහිදී අධ්‍යාපන ඇමතිතුමාට සහාය දීමට අප සන්තෝෂයි. අප ඉදිරිපත් කරන ප්‍රශ්නවලට ඇහුම්කන් දීමට අධ්‍යාපන ඇමතිතුමාගේ ස්ථිර ලේකම් එම්. ජේ. පෙරේරා මැතිතුමාත් ඒ වාගේම විද්‍යා අංශයෙන් විශාල සේවයක් කර තිබෙන අලස් මැතිතුමාත් සිටිනවා. එතරම් විශාල සේවයක් කළ, ඉදිරිපත් කරන්න යන අධ්‍යාපන පනත සකස් කළ, උපදෙස් දුන් ආචාර්ය ආනන්ද ගුරුගේ මැතිතුමා මෙහි නැති වීම ගැන මා කනගාටු වෙනවා. ඇත්ත වශයෙන්ම එය මට ප්‍රහේලිකාවක්. විශේෂයෙන්ම රටට ආදර යක්, ලැදියාවක් ඇතුව වැඩ කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් මහතා, මා දන්නා හැටියට ඇමෙරිකාවේ බ්‍රිපලෝ විශ්ව විද්‍යාලයේ තනතුරක් ලබා ගෙන තිබෙන බව අපට දැනගන්න ලැබී තිබෙනවා. එතුමාගේ පෞද්ගලික දියුණුව තකාගෙන ගියා නම් මා ඒ ගැන සන්තෝෂ වෙනවා. එසේ වුණත් එතුමාගෙ ගමන ගැන නොයෙකුත් කථා පැතිර තිබෙනවා. එතුමාම සකස් කර තිබෙන ඒ අධ්‍යාපන පනතෙන්, විශේෂයෙන්ම ආනන්ද විද්‍යා ලයේ ඉගෙන ගන්නා එතුමාගේම පුතනුවන්ට පහරක් වදින නිසා පුත්‍රයාත් කැටුව ඇමෙරිකාවට ගියාය කියන කථාවක් පැතිර යනවා. කෙසේ වුණත් මගේ කල්පනාවේ හැටියට අද අධ්‍යාපන ඇමතිතුමා ගෙන යන—

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
එතුමාම සකස් කළ පනතක්ය කිව්වෙ?

කළුගල්ල මයා.
(திரு. கலுகல்ல)
(Mr. Kalugalla)
එතුමාගෙ උපදෙස් අනුව, තමුන්නාන්සේගේ අදහස් අනුව, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ අදහස් අනුව සකස් කර ඇති පනතක්. එතුමාගේම පනතක් නොවුණත් එම නිලධාරීන්ගේ උපදෙස් අනුවයි පනතක් සකස් කරන්නෙ. එම නිලධාරීන්ම මගේ අදහස් අනුව ධවල පත්‍රිකාවක් සකස් කළා. එසේ සකස් කළ ධවල පත්‍රිකාවේ වැදගත් කොන්දේසි තමුන්නාන්සේ ඉදිරියේත්, මේ ගරු සභාව ඉදිරියේත් තබන්න මා කල්පනා කරනවා. ඒවා ගැනත් ටිකක් ඇහුම්කන් දෙන ලෙස ඉල්ලනවා. විශේෂයෙන්ම මේ රටේ දරුවන්ගේ අනාගතය සමඟ අපට සෙල්ලම් කරන්න බැහැ. ආචාර්ය ගුරුගේ මැතිතුමා, එතුමාගේ පුත්‍රයාත් සමඟ ඇමෙරිකාවට ගිහින් තිබෙන්නෙ, එම පනතින් පුතාගේ අධ්‍යාපනය සම්පූර්ණ යෙන්ම කඩාකප්පල් වේය යන හැඟීම නිසාය කියායි මගේ විශ්වාසය. නැතිනම් භාෂාවට, රටට ආදරයක් තිබෙන ඒ නිලධාරියා කිසි දවසක රටින් පිටව යන්නෙ නැහැ. අධ්‍යාපන පනත ක්‍රියාත්මක කරන තුරු, ඒ කටයුතු සියල්ල අවසන් වනතුරු ඒ නිලධාරියාට මේ රටේ සිටින්න තිබුණා. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඔය සිටින නිලධාරී මහත්වරුන්, 1963 මැයි මාසයේ සිට අපේ ආණ්ඩුව පෙරළෙන තුරු, මා ඇමති ධුරයේ වැඩ කරන තුරු සිටියා. ඒ අවදියේදී අපේ අදහස් අනුව, රජයේ අදහස් අනුව තමයි ඒ නිලධාරීන් ක්‍රියා කළේ, ධවල පත්‍රිකා ආදිය ඉදිරිපත් කළේ. එමනිසා කිසිම නිලධාරියකුට අපට දොස් කියන්න බැහැ.

අ. භා. 5.45

පාඨශාලා ප්‍රතිසංවිධානය කිරීමේ වැඩ පිළිවෙළක් ඇමතිතුමා දැන් ගෙන යනවා. ඒ අනුව 1 වන ශ්‍රේණියේ සිට 7 වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය දෙන පාඨශාලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කළුගල්ල මයා.]

කනිෂ්ඨ පාඨශාලා හැටියටත්, 8 වන ශ්‍රේණියේ සිට 12 වන ශ්‍රේණිය දක්වා—මා දන්නෙ නැහැ මොන නමක් ව්‍යවහාර කිරීමට අදහස් කරනවාද කියා—මා හිතන හැටියට මහා විද්‍යාල හැටියටත් වර්ග කර ගෙන යනවා. ඒ ගැන කථා කිරීමට පෙර, එදා අපේ ආණ්ඩුව මේ රටේ දූදරුවන් වෙනුවෙන් මොන විධියෙ සැලැස්මක් ඇති කර තිබෙනවාද, මොන විධියෙ වියදමක් දැරීමට සූදානම්ව සිටියාද කියා මා තමුන්නාන්සේට පෙන්නුම් කරන්න කැමතියි.

1964 දී මා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා ධවල පත්‍රිකාවක්. රජය විසින් ඉදිරිපත් කරන්න යන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා එම ධවල පත්‍රිකාවේ අඩංගු කර තිබුණා.

මට කලින් අධ්‍යාපන ඇමති වශයෙන් සිටි බදි-උද්-දීන් මහ්මුද් මහතා 1960 දෙසැම්බර් මාසයේදී උපකෘත පාඨශාලා ක්‍රමය අවලංගු කිරීමේ පනතක් ඉදිරිපත් කර පාඨශාලා පනස් ගණනක් හැර අනිකුත් පාඨශාලා සියල්ලම රජයේ පාලනය යටතට ගත්තා. එමෙන්ම ගරු බදි-උද්-දීන් මහ්මුද් ඇමතිතුමා විසින් 1961 දී ජාතික අධ්‍යාපන ක්‍රමයක් පිහිටුවාලීමට කොමිෂන් සභාවක්ද කාර්මික අධ්‍යාපන කොමිෂන් සභාවක්ද, විශ්ව විද්‍යාල කොමිෂන් සභාවක්ද පත් කරන්නට යෙදුණා. මා අධ්‍යාපන ඇමති වශයෙන් පත්වූවාට පසුව ඒ කොමිෂන් සභාවල වාර්තා හැම එකක්ම කියවා බලා මේ රටේ මහජනතා වගේ දරුවන්ට ප්‍රයෝජනවත් වන යෝජනා ක්‍රමයක් අඩංගු කර ධවල පත්‍රිකාවක් සකස් කරගෙන එය 1964 දී මා විසින් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. අවාසනාවකට මෙන් එය සාකච්ඡාවට භාජන කරන්නට පුළුවන් වුණේ නැහැ. කෙසේ වෙතත් එසින් යෝජනා සමහරක්වත් ගරු අධ්‍යාපන ඇමතිතුමාට මතක් කළ යුතුයි කියා මා හිතනවා.

අපට මූලික වශයෙන් වුවමනා කළේ වයස අවුරුදු 6 සිට 14 වන තුරු සෑම ශිෂ්‍යයකුටම මූලික අධ්‍යාපනයක් දීම අනිවාර්ය කිරීමයි. වයස අවුරුදු 5 ක් හෝ 6 ක් වන විට පළමුවැනි පන්තියේ ඉගෙනීමට පැමිණ, 8 වැනි පන්තියෙන් ඒ මූලික අධ්‍යාපනය නිම කළ යුතුයි. අවුරුදු 5 ක් ප්‍රාථමික අංශයේද අවුරුදු 3 ක් කණිෂ්ඨ අංශයේද ඉගෙනීම ලබා මාර්ගෝපදේශකයින්ගේත්, ගුරුවරුන් හා දෙමව්පියන්ගේත් අදහස් අනුව 8 වැනි පන්තියේදී මව්පියන්ගේ කැමැත්ත අනුව රක්ෂාවකට පුහුණුවීමට ශිෂ්‍යයාට පහසු කම් සැලසීමයි අපේ යෝජනා ක්‍රමයට අඩංගු වුණේ. ඒ අනුව කාර්මික විද්‍යාලයකට බැඳී කාර්මික අධ්‍යාපනයක් ලැබීමටද ඉඩ තිබෙනවා. එසේ නැත්නම් මහා විද්‍යාලයකට ඇතුළත් වී ඉංජිනේරු, වෛද්‍ය, කලා ආදී අංශවලින් විශ්ව විද්‍යාලය තෙක් අධ්‍යාපනය ලැබීම සඳහා මව්පියන්ගේ හා ගුරුවරුන්ගේ අනුදැනුම ඇතිව තෝරා ගැනීමටත් ඉඩ ප්‍රස්ථාව තිබෙනවා. පූර්ව ජ්‍යෙෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ පන්ති 2 ක් විශ්ව විද්‍යාල ප්‍රවේශ පන්ති දෙකක් තිබෙන පාඨශාලා අපි මහා විද්‍යාල හැටියට නම් කළා. හැම පැල්පතක සිටම යෑමට හැකිවන්නම් 5 කට ආසන්නව මහා විද්‍යාල හැකියාවන් දෙකක් ඇතුළත 8 වැනි පන්තියක් තිබිය යුතුයි. හැම පැල්පතක සිටම දක්වා මූලික අධ්‍යාපනයක් ලබාදීමට පාඨශාලාවක් තිබිය යුතුයි. ඒ විධියේ යෝජනා අපි සකස් කර තිබුණා. 1956 සිටම අපට වුවමනා කළේ දුප්පත් පොහොසත් භේදයක් නැතිව හැම කෙනෙකුටම අධ්‍යාපනය ලබාගැනීමයි. එම නිසා තමයි, 1956 සිට 1965 වන විට පාඨශාලා 8,400 ක් පමණත්, මහා විද්‍යාල 1,200 ක් පමණත් ඇති වුණේ. මේ රටට වුවමනා කරන විද්‍යාල ටික, මහා විද්‍යාල ටික හා පාඨශාලා ටික 1965 වන විට අප විසින් ඇති කරනු ලැබුවා.

සාමාන්‍ය අධ්‍යාපනය කෙළවර වන්නේ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ගන්න විභාගයෙනුයි. එම විභාගයේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් කරන වැඩවලින් වුවමනා අන්දමට සම්මාන සහිතව සමර්ථ වන අය සඳහා කිසිම අවහිරයක් නැතිව විශ්ව විද්‍යාලයේ දොර ඇරෙනවා. විශ්ව විද්‍යාලයට ඇතුළු වීමට සුදුසුකම් ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සම්බන්ධයෙන් අප කිසිම සීමාවක් ඇති කළේ නැහැ. විශ්ව විද්‍යාලයට ඇතුළු වන ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිය කියා 1963 දී වයිස් චාන්සලර්තුමා එවැනි සීමාවක් කරන්නට අදහස් කළා. ඒ අවස්ථාවේදී මුළු කැබිනට්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මණ්ඩලයම එක් වී ඒ ගැන සාකච්ඡා කොට නියම විධියට සමත් වන සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවක්ම විශ්ව විද්‍යාලයට ඇතුළත් කර ගත යුතුයයි තීරණය කළා. හැම ඇමති කෙනකුම ඊට එකඟ වුණා. ඒ සඳහා වුවමනා කරන මුදල් හා වෙනත් සැප පහසුකම් සපයා දෙන්නටත් තීරණය කළා. මා මේ තර්කය ඉදිරිපත් කළේ, උසස් අධ්‍යාපනය ලැබීමට දක්ෂකම් ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට කිසිම අවහිරයක් නොකිරීම අපේ ප්‍රතිපත්තිය වී තිබුණු බව පෙන්නුම් කිරීමටයි. අද තිබෙන තත්ත්වය මා තව ටික වේලාවකින් පෙන්වා දෙන්නම්.

ඊළඟට මා තවත් වැදගත් කරුණක් ඉදිරිපත් කරන්නට අදහස් කරනවා. ඊට ගරු අධ්‍යාපන ඇමතිතුමාත් එකඟ වෙනවා ඇති. දෙමව්පියන්ගේ තේරීම අනුව, පාසල්වලත් විශ්ව විද්‍යාලයෙන් උගැන්වීමේ මාධ්‍යය සිංහල හෝ දෙමළ හෝ විය යුතු බවයි අප තීරණය කළේ. අධ්‍යාපන ඇමතිතුමාත් සිංහල වෙනුවෙන් විශාල සටනක් කළ කෙනෙක්. ඒ අතින් එතුමා තවම වෙනස් වී නැතැයි මා විශ්වාස කරනවා. ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගැන්වීම සම්පූර්ණයෙන්ම වෙනස් කරන ලෙස අප ඉල්ලා සිටිනවා. සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම අධ්‍යාපනය ගෙන යාම රජයට විශාල වියදමක් යන වැඩක්. මේ පිළිබඳ වෙනසක් කරන්නට අධ්‍යාපන ඇමතිතුමාට බලය තිබෙනවා. අධ්‍යාපන ඇමතිතුමාගේ අදහස දැන ගන්නට අප කැමතියි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

අධ්‍යාපන යෝජනා ඉදිරිපත් වනතුරු හිටියොත් හොඳයි.

කළුගල්ල මයා.
(திரு. கலுகல்ல)
(Mr. Kalugalla)

අධ්‍යාපන ඇමතිතුමා මේ සම්බන්ධව නොයෙක් විධියේ ප්‍රකාශ කර තිබෙන බව මා පත්තර මාර්ගයෙන් දැක්කා. ජනවාරි මාසයේ සිට උගැන්වීමේ මාධ්‍යය වෙනස් කිරීමේ බලය ගරු ඇමතිතුමාට තිබෙනවා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

අධ්‍යාපන යෝජනා ළඟදී ඉදිරිපත් වෙනවා. ඊට පසුව ඔය ගැන කථා කරමු.

කළුගල්ල මයා.
(திரு. கலுகல்ல)
(Mr. Kalugalla)

එහෙම නම්, මා ඊළඟ කාරණයට එන්නම්. අප ආණ්ඩු පක්ෂයේ සිටියදී ආගමට නියම තැන දුන්නා.

ආගම අනිවාර්ය කරන්නට අපට වුවමනා කළා. කතෝලික ළමයින්ට පල්ලියේ කතෝලික පූජකවරුන් අනුමත කරන ගුරුවරුන් යටතේ කතෝලික ආගම ඉගැන්විය යුතු වූ අතර බෞද්ධ ළමයින්ටත්, මුස්ලිම් ළමයින්ටත් ඒ ඒ ආගම් ඉගැන්විය යුතුව තිබුණා. එදා මගේ යෝජනාව වූයේ ඉංගිරිසිය අනිවාර්ය නොකර දෙවැනි භාෂාවක් හැටියට උගන්වන්නටයි. සිංහල ළමයින් සිංහල මාධ්‍යයෙන් ඉගෙනීම කරන අතර ඉංගිරිසිය හෝ දෙමළ භාෂාව හෝ දෙවැනි භාෂාවක් හැටියට ඉගෙනීමටත්, දෙමළ මාධ්‍යයෙන් හදාරන දෙමළ ළමයින් සිංහලය හෝ ඉංගිරිසි භාෂාව දෙවැනි භාෂාවක් හැටියට ඉගෙනීමටත් ඒ යෝජනාවේ තිබුණා. හැම ශිෂ්‍යයාම දෙවැනි භාෂාවක් හැදෑරිය යුතු බව අප කියා සිටියා. ඒ අනුව ඒ දෙවැනි භාෂාව සිංහල, දෙමළ හෝ ඉංගිරිසි භාෂාව විය යුතුව තිබුණා.

අ. භා. 6

කාරකසභා නියෝජ්‍ය සභාපති
(குழுக்களின் உப அக்கிராசனர்)
(The Deputy Chairman of Committees)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் அக்கிராசனத்திலிருந்து நீங்கவே, உப சபாநாயகர் தலைமைதாங்கினார்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කලුගල්ල මයා.
(திரு. கலுகல்ல)
(Mr. Kalugalla)

දෙවැනි භාෂාවක් ඉගෙනීම ගැනයි මා කථා කරමින් සිටියේ. මගේ අදහස මා ප්‍රකාශ කළ යුතුයි. අධ්‍යාපන පනත සකස් කරගෙන යද්දී ගරු ඇමතිතුමාට සමහර විට එයින් ප්‍රයෝජනයක් ලැබෙන්නට පුළුවනි.

තවත් කාරණයක් දැනගැනීමට තිබෙනවා. ජ්‍යෙෂ්ඨ විභාගය දෙපාර්තමේන්තුවෙන් නොපවත්වා පාසැල්වලටම භාර දීමට යෝජනාවක් විභාග කොමසාරිස්තුමා ඉදිරිපත් කර තිබෙනවා. අගෝස්තු මාසයේදී මෙතෙක් පැවැත්වුණු ජ්‍යෙෂ්ඨ විභාගය දැනටමත් ගරු අධ්‍යාපන ඇමතිතුමා නැති කළා. දැන් ජ්‍යෙෂ්ඨ විභාගය පවත්වන්නේ අවුරුද්දකට වරක් පමණයි. එය රජයේ විභාගයක් හැටියට මින් ඉදිරියට නොපවත්වා පාසල් මගින් කරගෙන යාමට යෝජනාවක් තිබෙන නිසා ජ්‍යෙෂ්ඨ විභාගය අවලංගු කරන්නට ගරු ඇමතිතුමා බලාපොරොත්තු වෙනවාදැයි දැනගන්නට කැමතියි. ගම්බද දරුවන්ගෙන් හුඟ දෙනකුට ලබා ගන්නට පුළුවන් වන්නේ ඔය සහතිකයයි. විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන මෙම සහතිකය ගම්බද දරුවන් ඉතාමත් උසස් ලෙස රාමු කරගෙන ගෙවල්—ගම්බද දුප්පත් පැල්පත්වල පවා —එල්ලා තබා ගන්නවා. ඒ නිසා විභාග කොමසාරිස්තුමාගේ යෝජනාව අනුව එම විභාගය නැති කරන්නට යනවාදැයි දැනගන්නට අප ඉතාමත් කැමතියි.

ගරු සභාපතිතුමනි, දරුවකුගේ අධ්‍යාපනය වෙනුවෙන් රජය විශාල වියදමක් දැරිය යුතුයි. මේ ඇස්තමේන්තු දෙස බලන විට අපට පෙනී යන්නේ ශිෂ්‍ය සංඛ්‍යාව අනුව මේ රටේ ආධ්‍යාපනික කටයුතු සඳහා වෙන් කර තිබෙන මුදල ඉතාමත් මද බවයි. විශේෂ පහසුකම් සහ පහසුකම් ගාස්තු ගැන එදා මා යෝජනා කළා. හැම පාසලකම පහසුකම් අරමුදලක් ඇති කළ යුතුයි යන යෝජනාව ඉදිරිපත් කළා. මේ ආණ්ඩුවෙන් එවැන්නක් අපට බලාපොරොත්තු වන්නට බැරියයි මා කල්පනා කරනවා. ඒ පහසුකම් අරමුදලට එක් එක් ශිෂ්‍යයා වෙනුවෙන් රජය මගින් රුපියලක් දැමීමට යෝජනා කර තිබුණා. ඒ අරමුදලින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපනික දියුණුව සඳහා නොයෙක් විධියේ කටයුතු කිරීමට එය පාලනය කරන සුබ සාධක මණ්ඩලයට ඉඩ තිබෙනවා. හැම පාඨශාලාවක කම සුබ සාධක මණ්ඩලයක් පත් කිරීමට මම යෝජනා කර තිබුණා. එහි සභාපති වශයෙන් එම පාඨශාලාවේ ප්‍රධානාචාර්‍යතුමා පත් කිරීමටත්, ගුරුවරුන් දෙදෙනෙකුත්, දෙමව්පියන්ගෙන් දෙදෙනෙකුත්, ශිෂ්‍යයන්ගෙන් දෙදෙනෙකුත්, ආදි වශයෙන් 10 දෙනකු ඊට පත් කිරීමටත් අදහස් කර තිබුණා. ඒ සුබ සාධක මණ්ඩල මගින් කළයුතු වැඩ රාශියක් තිබුණා. පොත් පත් මිළදී ගන්ට අමාරු දුප්පත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සිටිනවා නම් ඔවුන්ට සුබ සාධක අරමුදලින් ඒ පොත් පත් ටික ලබා දිය යුතු යයි සවිර යෝජනාවක් තිබුණා.

ගරු සභාපතිතුමනි, හැම පාඨශාලාවකම පුස්තකාලයක් තිබිය යුතුයි. මූලික පාඨශාලාවේත්, මහා විද්‍යාලයේත් පුස්තකාලයක් තිබිය යුතු යයි යෝජනා කර තිබුණා. ඒවාට මුදල් ඕනෑ කරනවා. සමාජවාදී ආණ්ඩුවක් වශයෙන් අධ්‍යාපන කටයුතු සඳහා ඕනෑ තරම් මුදල් වෙන් කර දෙන්ට එකල මුදල් ඇමතිවරු සූදානම්ව සිටිය. පුස්තකාලය භාරව ගුරුවරයකු සිටිය යුතුයි. 8 වෙනි ප්‍රමාණය දක්වා පන්ති පවත්වාගෙන යන මූලික පාඨශාලාවල ඉගෙනීම ලබන හැම ශිෂ්‍යයකු වෙනුවෙන්ම පුස්තකාල අරමුදලට රුපියල් 3ක් ආණ්ඩුව ගෙවිය යුතු බවත්, මහා විද්‍යාලවල ඉගෙනීම ලබන හැම ශිෂ්‍යයකු වෙනුවෙන්ම පුස්තකාල අරමුදලට රජය මගින් රුපියල් 5 ක් ගෙවිය යුතු බවත් අපි යෝජනා කර තිබුණා. ඒක ඉතා වැදගත් යෝජනාවක්. විශේෂයෙන්ම ගම්බද පාසල්වල ඉගෙනීම ලබන දුප්පත් ශිෂ්‍යාවන්ට පුස්තකාල අවශ්‍යයි. මේ ආදි කටයුතු සඳහා විශාල මුදලක් වෙන් කළ යුතු යයි මගේ බලවත් ඉල්ලීමක් තිබුණා.

ගරු සභාපතිතුමනි, ගුරුවරුන්ගේ සහයෝගය නැතුව දරුවන්ගේ අධ්‍යාපනය දියුණු කරන්ට බැහැ. මම එදා යෝජනා කළා, පාඨශාලාවත් සමග ගුරුවරයා වයස් ගත විය යුතුයි, ගුරුවරුන්ගේ මාරුකිරීම් නිති කළ යුතුයි, දිස්ත්‍රික්ක සේවාවක්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ඇති කළ යුතුයි කියා. යම්කිසි පාඨශාලාව කට ගුරුවරයකු පත් කළාම ඔහු හොඳ ගුරුවරයෙකු නම් ඒ පාඨශාලාවේම සිටිය යුතු යයි මා යෝජනා කර තිබුණ. දිස්ත්‍රික්ක ගුරු සේවා ක්‍රමයක් ඇති කර, ඒ යෝජනා ක්‍රමය මම ක්‍රියාත්මක කළා. කොළඹ, ගාල්ල, මාතර, මීගමුව ආදි පෙදෙස්වලට ගුරුවරුන් ඒම නතර කරල ඒ දිස්ත්‍රික් වලින් අනික් දිස්ත්‍රික්කවලට ක්‍රම ක්‍රම යෙන් ගුරුවරුන් යැවීමට දිස්ත්‍රික් ගුරු සේවාවේ වැඩ ආරම්භ කළා. මාරු වීම් අඩු කළා. ඒ නිසා පාඨශාලාවල අර්බුද අඩු වුණා. දැන් නම් ගුරුවරුන් මාරු කරන අංශයෙහි නොයෙකුත් ඇඟිලි ගැසීම් තිබෙනවා. එහෙත් ඇමතිතුමා එසේ කරනවා යයි මා කියන්නේ නැහැ. අද නොයෙකුත් මන්ත්‍රීවරුන් එහි ගොස් අසුවල් අසුවල් පාඨශාලාවලට අසුවල් අසුවල් ගුරුවරුන් මාරු කරන්නැයි ඉල්ලමින් නිලධාරීන්ට කරදර කරනවා. ගුරුවරුන් මාරු කිරීමේ යෝග්‍ය ක්‍රමයක් සකස් කරන ලෙස නිහත මානී, පළපුරුද්දක් ඇති දක්ෂ පුද්ගලයකු වූ එම්. ජේ පෙරේරා මහතාට එදා මා නියෝග කිරීමෙන් පසුව ගුරුවරුන්ගේ නියෝජිතයන් කැඳවා සාකච්ඡා කොට ඒ සඳහා හොඳ ක්‍රමයක් සකස් කරන්නට ඒ මහතාට පුළුවන් වුණා. එදා දිස්ත්‍රික් ගුරු මාරු ක්‍රමයක් ඇති කළා. ඒ වගේම ගුරු මාරු මණ්ඩලයක් පත් කළා. ගුරුවරුන්ගේ වෘත්තීය සමිතිවල නියෝජිතයන් ඒ ගුරු මාරු මණ්ඩලයට තෝරාගෙන වුවමනා කරන ගුරු මාරු ඒ විධියට කරගෙන යන ලෙස මතක් කළා. ඒ ගුරු මාරු මණ්ඩලය ක්‍රියාත්මක වීමෙන් පසුව අපට ලොකු සහනයක් ඇති වුණා. එහෙත් වැඩිකල් ඒ ක්‍රමය පවත්වාගෙන යන්නට පුළුවන් වුණේ නැහැ. ඊට හේතුව අපේ ආණ්ඩුව බිඳ වැටීමයි.

අද නම් මෙම ඇමතිතුමාගේ වැඩ පිළිවෙළ නිසා ගුරුවරුන්ගේ සහයෝගය නැතිව ගොස් තිබෙනවා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

කාටද? මේ පැත්තටද? ඔය පැත්තට ද?

කළුගල්ල මයා.
(திரு. கலுகல்ல)
(Mr. Kalugalla)

ඔය පැත්තට. ආණ්ඩුව පැත්තට.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

අපට නම් පක්ෂයි.

කළුගල්ල මයා.
(திரு. கலுகல்ல)
(Mr. Kalugalla)

ගුරුවරුන්ගේ බෙලි කැපීම පිළිබඳව මෙම අධ්‍යාපන ඇමතිතුමා දැන් ලෝක ප්‍රසිද්ධියට පත් වී සිටිනවා. එහෙත් මෙම ඇමතිතුමා ඔය බෙලි කැපිලි කරගෙන යන්නේ තව අවුරුදු එකහමාරයි. ඊට පසුව ඔය කපන ලද බෙලි නැවත සවි කරන්නට අපට පුළුවන් වේවි. මේ රටේ ජනතාවගෙන් බලය ලබාගෙන අප නැවත වරක් ඔය බෙලි ටික පාස්සනවා. අප නම් එදා ඔය විධියේ බෙලි කැපිල්ලක යෙදුනේ නැහැ. එදා අපට විරුද්ධව රැස්වීම්වල කථා කළ මරදාන මධ්‍ය විද්‍යාලයේ ගුරුවරයකු වශයෙන් සිටි දැවමොට්ටාවේ අමර වංශ ස්වාමීන් වහන්සේ ගැන අප ක්‍රියා කෙළේ කෙසේද? උන්වහන්සේ ඒ රජයට නොයෙකුත් විධියට දෝෂාරෝපණය කළා. ඒ රජයේ නායිකාවට නොයෙකුත් දෝෂාරෝපණය කළා. ඒ ස්වාමීන් වහන්සේ ආණ්ඩුවේ ගුරුවරයකු වශයෙන් සිටගෙන ඔය විධියට ක්‍රියා කරන නිසා සේවයෙන් අස් නොකරන්නේ මන්දැයි එදා මගෙන් ප්‍රශ්න කරන්නට යෙදුණා. මා ඒ වේලාවේදී ස්පිර ලේකම්තුමා සහ ආචාර්ය ආනන්ද ගුරුගේ මහතා කැඳවා මේ ගැන පරීක්ෂා කර බලන ලෙස නියෝග කළා. ඒ දෙපොළම ඇවිත් දැවමොට්ටාවේ ස්වාමීන් වහන්සේ පරිපාලන නීතිවලට විරුද්ධව රාජ්‍ය විරෝධී ප්‍රකාශ කර තිබෙන බව මට දන්වා සිටියා. ඒ අනුව දැවමොට්ටාවේ ස්වාමීන් වහන්සේගේ වැඩ තහනම් කරන්නට පුළුවන්ය කියා මට කියා සිටියා. නමුත් මා කියා සිටියේ කුමක්ද? නැහැ, වැඩ තහනම් කරන්නට එපා; මේ ස්වාමීන් වහන්සේ වෘත්තීය සමිතියක සභාපති කෙනෙක්; වෘත්තීය සමිතිවල නිලතල උසුලන අයටත් ඒවායේ සාමාජිකයන්ටත් කථා කිරීමේ නිදහස තිබිය යුතුයි; එම නිසා මේ ස්වාමීන් වහන්සේගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කළුගල්ල මයා.]

වැඩ තහනම් කරන්නට එපාය කියා මා කියා සිටියා. නමුත් ඊට සති කිහිපයකට පසු ඒ ස්වාමීන් වහන්සේ පාඨශාලාවේ ප්‍රධානාචාර්‍ය තුමාට නොදන්වා, නිවාඩු ඉල්ලුම් නොකර පාඨශාලාවට නොපැමිණ සිටි නිසා, අධ්‍යක්ෂක තුමා විසින් ඒ ස්වාමීන් වහන්සේව සේවයෙන් අස් කරනු ලැබුවා. නමුත් දේශපාලන කටයුතු වල යෙදුණාය කියා අප උන්වහන්සේගේ වැඩ තහනම් කළේවත් අස් කළේවත් නැහැ.

අ. භා. 6.15

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකා ජාතික ගුරු සංගමය ප්‍රබල ගුරු සංගමයක්. මේ ගුරු සංගමයේ සභාපති, ලේකම්, ඇතුළු නොයෙකුත් උදවිය මටත් 1963 සිටම සෑම අවස්ථාවකදීම සෑම වේදිකාවකදීම නොයෙකුත් දේවල් කියා තිබෙනවා. මගේ වැඩ පිළිවෙළ ගැන නොයෙකුත් අයුරින් මාව දෝෂාරෝපණයට, විවේචනයට ලක් කර තිබෙනවා. නමුත් එය වෘත්තීය සමිතියක් නිසා, ඒ උදවිය ඒ උදවියගේ අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා එසේ කථා කරන නිසා ඕනෑම විවේචනයක් කළාවේ, නිශ්ශබ්දව සිටින්නය කියා මා මගේ නිලධාරීන්ට කිව්වා. ඔවුන් ඕනෑම විවේචනයක් කළාවේ, අපට කමක් නැහැ, රටේ මහජනතාවට පිළිතුරු දෙන්නට අපට පුළුවන්ය කියා එදා මා මගේ නිලධාරීන්ට කිව්වා. ශ්‍රී ලංකා ජාතික ගුරු සංගමය එදා ඒ උද්ඝෝෂණය කළේ විශේෂයෙන්ම යම් යම් අයිතිවාසිකම් ලබා ගැනීමටයි. මාරුවීම් මණ්ඩල, උසස්වීම් ඇතුළු නොයෙකුත් අයිතිවාසිකම් ලබා ගැනීමටයි. නමුත් වර්තමාන අධ්‍යාපන ඇමතිතුමා මොන විධියටද ක්‍රියා කරන්නෙ? 1965 මාර්තු 23 වැනිදා තමුන්නාන්සේ අධ්‍යාපන ඇමති ධුරය භාර ගත්තා. ඉනික්බිතිව තමුන්නාන්සේ දිගට හරහට ගුරුවරුන්ගේ වැඩ තහනම් කරන්නට පටන් ගත්තා. එය මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියක්ද කියා මා දන්නේ නැහැ. ඒ අන්දමට වැඩ තහනම් කළේ කුමන ගුරුවරුන්ගේද? ගුරුවරු අපේ පක්ෂයට පමණක් නොව සෑම පක්ෂයකටම කථා කර තිබෙන බව තමුන්නාන්සේගේ හෘදය සාක්ෂිය දන්නවා. එක්සත් ජාතික පක්ෂයටත් ෆෙඩරල් පක්ෂයට නැත්නම් දෙමළ පක්ෂයටත් කථා කළ එකම ගුරුවරයකුවත් සේවයෙන් පහ කර නැහැ. කෑගලු දිස්ත්‍රික්කයේ එක්සත් ජාතික පක්ෂයට වැඩ කළ ගුරුවරුන් ගැන පොලිස් වාර්තාවලත් සඳහන් කර තිබෙනවා. ඒ වාගේම දැදිගම අගමැතිතුමාට වැඩ කළ ගුරුවරුන්ගේත් නම් වුවමනා නම් මට තමුන්නාන්සේට දෙන්නට පුළුවනි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
දෙන්න, දෙන්න.

කළුගල්ල මයා.
(திரு. கலுகல்ல)
(Mr. Kalugalla)
ඔව්, දෙන්නම්, මා ළඟ ඒ නම් තිබෙනවා.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்சி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)
නමුත් දිල ඇති ඵලය කුමක්ද?

කළුගල්ල මයා.
(திரு. கலுகல்ல)
(Mr. Kalugalla)
තමුන්නාන්සේලාට වැඩ කළ ගුරුවරුන් අද සේවාවෙන් උසස් වී සිටිනවා. මේ අවුරුදු දෙකහමාර ඇතුළතදී තමුන්නාන්සේගේ වැඩ අපක්ෂපාතව කර නැහැ. තමුන්නාන්සේට වැඩිම වුණොත් තව අවුරුදු දෙකහමාරයි ඔය විධියට කටයුතු කරන්නට පුළුවන් වෙන්නෙ. 1969 නොවැම්බර් මාසයේදී පමණ මේ පාර්ලිමේන්තුව විසුරුවා හරින්නට සිද්ධ වෙනවා. සමහර විට ඊටත් කලින් විසුරුවා හරින්නට සිද්ධ වෙන්නට පුළුවනි. ඒදාට—

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
මොකද මේ වුණේ කියා සිතේවි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කළුගල්ල මයා.
(திரு. கலுகல்ல)
(Mr. Kalugalla)

මුළු රටේම දරුවන්ගේ මිනිවල කැපූ අප ඉදිරිපිට සිටින මේ කිසිම කෙනෙකුට මහජනතාව ඉදිරියට, දරුවන් ඉදිරියට, යන්නට අප ඉඩක් තබන්නේ නැහැ. අපට වැඩ කළාය කියා ගුරුවරුන් 150 කගේ පමණ අද වැඩ තහනම් කර තිබෙනවා. මේ සමහර ගුරුවරුන් අපට සන්දේශ රාශියක් එවා තිබෙනවා. මා ඒවා කියවන්නට අදහස් කරන්නේ නැහැ. කිසිම සාක්ෂියක් නැතිව අප නිකරුණේ සේවයෙන් පහ කර තිබෙනවාය කියා මේ සමහර සන්දේශවල සඳහන් කර තිබෙනවා. විරුද්ධ පක්ෂයේ නායිකාව නැව තත් බලයට පැමිණියොත් මේ සෑම ගුරුවරයකුම හිඟ පඩිත් ඇතිව සේවයට ගන්නවාය කියා ප්‍රකාශ කර තිබෙනවා. හිඟ වැටුප් සම්පූර්ණයෙන්ම රජයෙන්ම ගෙවනවාට මා විරුද්ධයි. නොයෙක් බලපෑම් උඩ, සිතට විරුද්ධව මේ විභාග පැවැත්වූ නිලධාරීන්ගෙන් පළමුකොටම හිඟ පඩි ලබාගෙන දී ඉතිරි හරිය පමණක් මේ ගුරුවරුන්ට රජයෙන් ගෙවිය යුතුය කියායි මා කියන්නෙ. කිසිම සාක්ෂියක් නැතිව නිරපරාදේ සේවකයන් සේවයෙන් පහ කිරීමට කටයුතු කළ නිලධාරීන් ගෙනුත්, මැති ඇමතිවරුන්ගෙනුත් ඒ සේවකයන්ට ලැබිය යුතු හිඟ මුදල් අය කර ගන්නා හැටි එදාට අපට පෙනේවි. ඔය ආකාරයට නිකරුණේ සේවයෙන් පහ කිරීම් නිසා අද දහස් ගණන් ගුරුවරුනුත්, රජයේ සේවකයන් හා සංස්ථා සේවකයනුත් ඉමහත් සිත් තැවුලෙන් පසු වන බව මතක් කරන්නට කැමතියි. එම නිසා මෙවැනි දේවල් ඉදිරියේ ඇති වන ආණ්ඩුවලින් සිදු නොවීමට අප වගබලා ගත යුතුයි.

ඊළඟට විද්‍යා අධ්‍යාපනය ගැනත් සඳහන් කරන්නට ඕනෑ. අධ්‍යාපන ඇමතිතුමාත්, නවත් බොහෝ දෙනාත්, අපේ වර්තමාන අධ්‍යාපන ක්‍රමය හොඳ නැතැයි පවසමින් ඊට දෝෂාරෝපණය කරනවා. එහෙත් අපේ අධ්‍යාපන ක්‍රමයේ කිසිම වරදක් නැහැ. අද තිබෙන අධ්‍යාපන ක්‍රමය නිසා තමයි, අද රටට වුවමනා කරන වාටත් වඩා දෙස්තරවරුත්, ඉංජිනේරුවන් හා සෙසු උපාධිධරයනුත් බිහිවී තිබෙන්නේ. ඔවුන්ට රැකියා නැති වී තිබෙන්නේ අධ්‍යාපන ක්‍රමයේ වරදක් නිසා නොව ආණ්ඩුවේ සැලැස්මේ වරද නිසායි. එම නිසා උසස් අධ්‍යාපනය අත ලොස්සකට පමණක් සීමා නොකරන හැටියට අධ්‍යාපන ඇමතිතුමාට මා විශේෂ ඉල්ලීමක් කරන්නට කැමතියි.

අද විශ්ව විද්‍යාලයේ වෛද්‍ය අංශයේ අධ්‍යාපනය ලබන සමහර ශිෂ්‍යයන් විශ්ව විද්‍යාලයෙන් අස් වී යෑමට මාන බලනවා. විශ්ව විද්‍යාලයෙන් පිට වන වෛද්‍ය වරුන් සියලු දෙනාටම සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රැකිරක්ෂා සැපයීමට නොහැකි බවට වර්තමාන සෞඛ්‍ය ඇමතිතුමා විසින් කර ඇති ප්‍රකාශයක් ඊට හේතු වී තිබෙනවා. දැනට අවුරුදුපතා වෛද්‍ය වරුන් 300 ක් පමණ විශ්ව විද්‍යාලයෙන් පිට වෙනවා. ආණ්ඩුවවත්, සෞඛ්‍ය ඇමතිතුමාවත්, ඔවුන්ගේ අනාගතය ගැන බලාපොරොත්තු ඇති කරගතහැකි කිසිම ප්‍රකාශයක් කරන්නේ නැහැ. කරතොත් කරන්නේ, ඔවුන් අධෛර්යවීමත් කරන ප්‍රකාශයන් පමණයි. අපට වෛද්‍යවරුන් වුවමනා කරනවා. 1964 දී අධ්‍යාපන ඇමතිවශයෙන් මා හමු වී එවකට පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපකුලපති වශයෙන් කටයුතු කළ ආටිගල මහතා මේ වෛද්‍ය වරුන් ගැන සාකච්ඡා කළා මට මතකයි. වෛද්‍ය අංශය සඳහා ඉදිරිපත් වන ශිෂ්‍යයන් වැඩි බව ඔහු මා සමග ප්‍රකාශ කළා. ඒ අවස්ථාවේ මා කීවේ මොකක්ද? "වෛද්‍ය ශිෂ්‍යයන් සීමා කරන්නට එපා, විශ්ව විද්‍යාලයෙන් අවුරුදුපතා වෛද්‍ය වරුන් 1,000 ක් හෝ 2,000 ක් හෝ බැගින් පිට වුණත් ඔවුන් සියලු දෙනාගේම අනාගතය ගැන කටයුතු කිරීමට ආණ්ඩුව සූදානම්" යනුවෙන් මා එදා ප්‍රකාශ කළා. ඒ වාගේම, වෛද්‍ය විද්‍යාල 2 ක් නොවෙයි 5 ක් වුණත් වුවමනා නම් ඊට අවශ්‍ය මුදල් දෙන්නටත් රජය සූදානම් බව මා එදා කීවා.

පසුගිය නොවැම්බර් මාසයේ පැවැත් වුණු විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගය සඳහා ශිෂ්‍ය-ශිෂ්‍යාවන් 40,000 ක් පමණ ඉදිරිපත් වුණා. මිගේ අදහසේ හැටියට ඔවුන්ගෙන් විශාල සංඛ්‍යාවක් ඒ විභාගයෙන් සමත් වුණා. ඔවුන් අතුරෙන් විද්‍යා අංශයට ඉදිරිපත් වූ අයගෙන් හුඟ දෙනකු ඒ විෂයයන් 4 න්ම සමත් වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කළුගල්ල මයා.]

ඇතත්, සමහරුන් විශ්ව විද්‍යාලයට ඇතුළත් කරගෙන නැහැ. ඒ පිළිබඳව මට පෙත්සම් රාශියක් ලැබී තිබෙනවා. මා කියා සිටිනවා අද මෙම රජය මුස්ලිම් ජනතාවට කර තිබෙන්නේ අපරාධයක් බව. අප එදා විශෙෂයෙන්ම මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපන කටයුතු කෙරෙහි උනන්දුවක් දක්වමින් ක්‍රියා කළා. එක්තරා මුස්ලිම් ශිෂ්‍යයකුට සිදු වී තිබෙන කරදරයක් මෙහිලා නිදර්ශනයක් වශයෙන් ඉදිරිපත් කරන්නට කැමතියි. කල්මුනේ ප්‍රදේශයේ ඒ. එල්. එම්. අබ්දුල් ගෆූර් නමැති ශිෂ්‍යයා දුප්පත් මුස්ලිම් පවුලක තරුණයෙක්. 1957 දී ලබාගත් ශිෂ්‍යත්වයක් අනුව ඉගෙනීම ලැබූ ඔහු 1960දී ජ්‍යෙෂ්ඨ විභාගයෙන් ද්‍රවිඩ මාධ්‍යයෙන් පළමුවන පන්තියේ සාමාර්ථයක් ලබා ගත්තා. ඔහු ද්‍රවිඩ මාධ්‍යයෙන් මෙන්ම 1963 දී ඉංග්‍රීසි මාධ්‍යයෙනුත් විභාගය ගත්තා. එම ශිෂ්‍යයාට වුවමනා කර තිබුණේ ඉංජිනේරු අංශයේ ඉගෙනීමක් කරන්නටයි. එම නිසා ඔහු විශ්ව විද්‍යාල ප්‍රවේශයට පෙනී සිට වැඩ හතරකින්ම සමත් වුණා. ඒ කියන්නේ, ඔහුට වුවමනා කරන විෂයයන් හතරෙන්ම සමර්ථ වුණා. එහෙත් ඔහුව ඉංජිනේරු අංශයට බඳවා ගත නොහැකි බවත්, වෙනත් අංශයකට යන ලෙසත්, විශ්ව විද්‍යාලය භාර අය කියා සිටියා. ඔවැනි මුස්ලිම් තරුණයන් සුලබයි.

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
නම මොකක්ද?

කළුගල්ල මයා.
(திரு. கலுகல்ல)
(Mr. Kalugalla)

ඒ. එල්. එම්. අබ්දුල් ගෆූර්. වැඩ හතරෙන්ම සමර්ථයි. ඔහු සම්මුඛ පරීක්ෂණයටද කැඳෙව්වා. ඉංජිනේරු අංශයේ ඉඩ නැති නිසා වෙන අංශයකට යන්නට කිව්වා. එම ශිෂ්‍යයාට ඉංජිනේරු අංශයට නියාම අධ්‍යාපනය කරගෙන යාම සඳහා ණය මුදලක් වුවත් ලබා ගන්නට පුළුවන්. ඒ හේතුකොට ගෙන අවුරුදු 3 කින් ඔහුට රක්ෂාවක්ද ලබා ගන්නට පුළුවන්. එවැනි තත්ත්වයක සිටින ශිෂ්‍යයන්ට ඔය අන්දමට සැලකීම වැරදි සහගතයි.

කල්මුනේ ප්‍රදේශය පිළිබඳව සඳහන් කළ නිසා තව එක කාරණයක් මතක් කළ යුතුයි. කල්මුනේ ප්‍රදේශයේ 50,000 ක් පමණ මුස්ලිම් ජනතාව සිටිනවා. අද ඒ උදවියට රජය විශාල අකටයුත්තක් කර තිබෙන බවයි පෙනෙන්නේ. කල්මුනේ සහිරා මහා විද්‍යාලයේ විද්‍යාලයාධිපතිව සිටි කේ. එම්. අබුබකර් මහතා එම විද්‍යාලයේ උගන්වමින් සිටිද්දීම විශ්ව විද්‍යාලයට ඇතුළත් වුණා. ඔහු නැවත ආපසු එම විද්‍යාලයටම කල්මුනේ ජනතාවගේ ඉල්ලීම අනුව පත් කළායින් පසු අපේ සමාජසේවා කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා තමාගේ කොට්ඨාශයට පත් කරගෙන තිබෙනවා. ඒ පිළිබඳව අද කල්මුනේ ජනතාව සම්පූර්ණයෙන්ම නැගී සිටිනවා. මේ ගැන ගරු ඇමතිතුමාට පෙත්සම් පවා ලැබෙනවා ඇති. එම ගුරුවරයා නැවත කල්මුනේ සහිරා මහා විද්‍යාලයටම දමන්නය කියා කල්මුනේ මුස්ලිම් ජනතාව වෙනුවෙන් මා ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්].

මට තව කරුණු සවලාසයයි ප්‍රකාශ කරන්නට තිබෙන්නේ. මා ඉක්මනින්ම කතාව අවසාන කරන්නට බලනවා. මෙම රජය මගින් කාර්මික අධ්‍යාපනය සඳහා කිසිම වැඩ පිළිවෙළක් කර නැහැ. එදා ප්‍රදේශවලට අනුව කාර්මික විද්‍යාල පිහිටුවිය යුතුය කියන අදහස උඩ ගාල්ල, යාපනය, බදුල්ල, මහනුවර සහ කෑගල්ල යන ප්‍රදේශවල කාර්මික විද්‍යාල පිහිටෙව්වා. එයින් පසු අප යෝජනා කළා, ප්‍රදේශ අනුව නොව දිස්ත්‍රික්ක අනුව කාර්මික විද්‍යාල ඇති විය යුතුය කියා. එහෙත් මට පෙනෙන්නේ නැහැ, මෙම රජය ඒ සඳහා එක ශතයක්වත් වියදම් කර තිබෙනවාය කියා. කාර්මික අධ්‍යාපනයක් දිය යුතුය කියා හැමෝම කතා කරනවා. එහෙත් රජයෙන් ඒ සඳහා කිසිම මුදලක් වෙන් කර නැහැ. ඇමතිතුමා දෙහිවල, ගාල්ල, පලාලි, කෑගල්ල, කුලියාපිටිය යන තැන්වල කණිෂ්ඨ විශ්ව විද්‍යාල ඇති කරන්නට යනවා. කෑගල්ලට දැක්වූ කරුණාව ගැන මා ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එහෙත් කෑගල්ලේ කාර්මික විද්‍යාලය වසා දමා ඒ කණිෂ්ඨ විශ්ව විද්‍යාලය ඇති කරන්නට එපාය කියා මා ඉල්ලා සිටිනවා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
කරන්නය කිව්වත් කරන්නෙ නැහැ.

කළුගල්ල මයා.
(திரு. கலுகல்ல)
(Mr. Kalugalla)
අගමැතිතුමාගේ ආඥනයත්, සමාජ සේවා ඇමතිතුමාගේ ආඥනයත් ඇතුළු ආඥන 8 කටයි, ඒ කාර්මික විද්‍යාල තිබෙන්නේ. තමුන්නාන්සේගේ පක්ෂයේ අය වුණත් කමක් නැහැ; තමුන්නාන්සේට කැමති උදවිය ඒවාට තෝරා ගන්න. එසේ තෝරාගෙන ඒ උදවියට කාර්මික අධ්‍යාපනයක් දෙන්න. එවිට කාට හෝ රක්ෂාව ලැබෙනවා.

ඊළඟට පොත් පිළිබඳවත් වචනයක් කියන්නට මා බලාපොරොත්තු වෙනවා. ඇමතිතුමා හොඳ ලේඛකයෙක්. හොඳ පොත් මොනවාද කියා තෝරා ගැනීමට ඇමතිතුමාට ශක්තියක් තිබෙනවා. අපේ කාලයේදී නරක පොත් තිබුණාය කියා ඇමතිතුමාගේ අදහස් අනුව ඒවා සකස් කර තිබෙනවා. එසේ සකස් කිරීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. අප කලේ හොඳ වැඩක් බව ඇමතිතුමා පිළිගන්නවා. නැවතත් පොත් මුද්‍රණය පෞද්ගලික අංශයට භාර දෙන්නය කියා ඇමතිතුමාට නොයෙක් විධියේ බලපෑම් තිබෙනවා. පෞද්ගලික අංශයට ලාභ ගන්නට ඉඩ නොදී පාඨශාලා ශිෂ්‍යයන්ට වුවමනා කරන පොත් රජයෙන්ම අච්චුගස්වා අඩු මිලට සැපයිය යුතුය කියා අප යෝජනා කලේ 1964 දීයි. එසේ පොත් සකස් වුණොත් පාඨශාලා සමුපකාර මාගීයෙන් ඒවා අලෙවි කරන්නට ඇමතිතුමාටම පුළුවන්. පෞද්ගලික අංශයේ පොත් වෙළෙන්දන් ඒ සඳහා වුවමනා නැහැ. පෞද්ගලික අංශය පොත්වලින් ලාභයක් ගන්නවා නම් එය මහා ලොකු අපරාධයක්. 1965 දී අප පොත් 15ක් අච්චුගස්වා දෙන්නට කටයුතු කළා. ඒ යෝජනාව අනුවම 1966 දී පොත් 61 කුත්, 1967 දී පොත් 54 කුත් වශයෙන් අච්චුගස්වා පළමුවැනි පන්තියේ සිට ජ්‍යෙෂ්ඨ පන්තිය දක්වා සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ට වුවමනා පොත් සියල්ලක්ම සපයන්නටයි, අප තීරණය කර තිබුණේ. ඒ යෝජනාව අනුව කටයුතු කිරීමෙන් රු. 3 ක් පමණ වටිනා පළමු වැනි පොත ශත 25 කට දෙන්නට අපට පුළුවන් වුණා. තමුන්නාන්සේ ඒ පොත වෙනස් කළත් ශත 25 ටම දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා. සාහිත්‍යය, රචනාව, සහ ව්‍යාකරණය කියන කොටස් තුනම අඩංගු කොල 252ක් තිබෙන, 6 වැනි පන්තියේ සිංහල පොත රු. 1.50 කට දෙන්නට අපට පුළුවන් වුණා. එය රුපියල් 10 ක් 12 ක් පමණ වටිනා පොතක්. ඔය අන්දමට අප ජනතාවගේ ජීවන අංකය අඩු කිරීමට වැඩ යොදා තිබුණා. ඇමතිතුමා පොත් සම්බන්ධව නොයෙක් ප්‍රකාශ කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් කිසිම වෙනසක් කරන්නට එපාය කියා මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, විශ්ව විද්‍යාල 4 ට ඇතුළු වන ළමයින්ට උසස් අධ්‍යාපන සභාව විශාල අපරාධයක් කරනවා. දුප්පත් ශිෂ්‍යයන්ට දෙන දීමනා අඩු කර ගෙන යනවා. ඒ වාගේම දුප්පත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් නොයෙක් විධියේ කරදර හිරිහැරවලට මුහුණ පා තිබෙනවා. අද විශ්ව විද්‍යාලවල ඉගෙන ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නැවතී සිටීමට වාසස්ථාන නැහැ. මාස දෙක තුනක් ඇතුළත තාවකාලික ගොඩනැගිලි ඉදි කර එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නැවතී සිටීමට අවස්ථාව සැලසීම ශිෂ්ට ආණ්ඩුවක යුතුකමක්. ඉගෙනීම ලබන පරපුර ඒ අතින් අද නොයෙක් විධියේ දුක් විඳින නිසා ඇමතිතුමා වහාම ඒ පිළිබඳව යම් කිසි ක්‍රියාමාර්ගයක් යොදනවා ඇත කියා අප බලාපොරොත්තු වන අතර, ඒ සඳහා ඇමතිතුමාට අපේ සම්පූර්ණ සහයෝගය දෙනවාත් හැර මුදල් ආදිය වුවමනා නම් කිසිම විවාදයක් නැතුව සම්මත කර දීමටත් අප සූදානමින් සිටින බව මතක් කරන්න කැමතියි.

මේ වර විද්‍යාලංකාර විද්‍යෝදය විශ්ව විද්‍යාල දෙකට ගරුතර ස්වාමීන් වහන්සේලා 50 ස් නමක්වත් ඇතුළත් වුණේ නැහැ. භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් වෙනම විශ්ව විද්‍යාලයක් පිහිටුවීමට ඇමතිතුමාගේ අදහස තිබෙනවා යයි මා කල්පනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කළුගල්ල මයා.]

කරනවා. ඒ කාලයේදී මාත් ඒ සඳහා යෝජනාවක් කළා. කැබිනට් මණ්ඩලය දක්වා එය ගිය නමුත්, ටිකක් අතපසු වුණා. කෙසේ වුවද, වැඩි කල් යන්නට මත්තෙන් භික්ෂු අධ්‍යාපනය සඳහා වුවමනා කරන විශ්ව විද්‍යාලය ඇමතිතුමා කැමති තැනක පිහිටුවනවා ඇතැයි මා කල්පනා කරනවා. හැකි පමණ ඉක්ම නින්ම මේ ක්‍රියාමාර්ගය ගන්නය කියා අප කියා සිටින්නේ විද්‍යෝදය විද්‍යාලංකාර විශ්ව විද්‍යාල දෙකට ගිහියන් ඇතුළු වීම හේතුකොටගෙන අද භික්ෂු අධ්‍යාපනයට ලොකුම පහරක් වැදී තිබෙන නිසයි.

So, when one speaks of the educational standards in Jaffna being very high, may I earnestly request the Hon. Minister not to look at some of the bigger colleges in Jaffna. Let us not forget that there are areas like Kilinochchi where one does not get even one maha vidyalaya. Let us not forget that there are areas like the islands where one does not have a decent college. Take even my own electorate which is not backward by any means. I have only two colleges which have G.C.E. (Advanced Level) classes. Undoubtedly it is true that there are some colleges in Jaffna which over the years have built up their institutions, their advanced level classes, and their science classes to perfection. I am not saying "No". But that was due to the industry of the teacher, the willingness of the student and of the parent to contribute their mite towards the advancement of education.

Again, I am not gainsaying that the missionaries who came to this country, finding a receptive soil, also contributed towards the advancement of education in Jaffna.

I am all for developing areas backward in the field of education, but I am only asking the Hon. Minister that it should be done by levelling up and not by levelling down. Certainly, Sir, all areas should reach a high standard. Nobody gainsays that. I am only asking the Hon. Minister whether this process should not be a process of levelling up the other areas to reach that high standard rather than a levelling down of the areas which have reached a fairly high standard of education.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. සිවසිතම්පරම් මයා.]

Sir, one is perturbed at some recent events. There was a flying squad which visited Jaffna to make a survey of the teaching staff of the colleges in Jaffna. Now, Sir, one thought that education was one field which did not have the need for a flying squad. We have heard of the Excise flying squad ; we have heard of flying squads to control vice ; but we have not heard of flying squads in the field of education.

Sir, this flying squad, having visited Jaffna, has found that there is an excess of 112 graduates in Jaffna and that they should be transferred out of Jaffna. The flying squad found this excess on the calculation that graduate teachers were not doing ten hours of work in one of the subjects which had been offered for their degree. Now, this is a new criterion which was introduced for the first time when the flying squad went to Jaffna. Up to now the circular which had been sent out to principals of schools was that a graduate should do fifteen hours of work in the G.C.E. (Ordinary Level) and G.C.E. (Advanced Level). But when the flying squad went, a new criterion was introduced, namely, that he should do ten hours of work in one of the subjects that he had offered for the degree.

Now I want to cite two instances of how the flying squad came to find out that there was an excess of teachers. One of them was an Inter Arts man who had offered Mathematics as one of the subjects for his Inter Arts. For thirty long years he had been teaching Mathematics in the G.C.E. (Ordinary Level) class. And just before retiring he thought of taking his degree. Therefore he offered three subjects, Logic, Sanskrit and Tamil, for the degree. The flying squad has found that this man is underemployed or that he does not fit in because he does not teach any one of these three subjects in the Ordinary Level class. For 30 years he has been found to be a very satisfactory Mathematics teacher and he is doing that still. He has been a very great success in teaching Mathematics in this class, but still he is said to be "over-employed" in one of these colleges and is due to be transferred.

I will give you another example. There was an Economics Honours graduate who, because there was no one else to teach History in that same college, was teaching History in the Ordinary Level and Advanced Level classes, but because his subject was Economics—he has had very good results in teaching History—he is due to be transferred.

I believe the Hon. Minister is aware that a high-powered committee consisting of very efficient officers of the Education Department had gone into this whole question of the staffing needs of our colleges for teaching Science particularly and Arts also. The recommendation of that committee is that it would be desirable for graduates to teach both in the Ordinary Level and in the Advanced Level classes and that indeed if graduates are available they could even teach in the 7th and 8th standards. I am aware that a large number of Sinhala medium schools do not have graduates to do that. Is that the reason why, if you have the necessary graduates, they should not be allowed to teach in the Ordinary Level and in the Advanced Level classes ? They themselves grant that it is desirable that if you have the graduates they should be allowed to teach not only in the Ordinary Level class but even in classes from 7th and 8th standards onwards.

I would only tell the Minister that we are even prepared to stand still, not to make any advance, till other areas catch up, but we certainly are not agreeable and are against any attempt to level down the standards that have already been attained by some of the colleges in Jaffna. It is with a great deal of sorrow that I am saying this because one is perturbed at the type of things said both on the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Floor of this House and in the Senate and elsewhere as to the standard of education in Jaffna.

One word more about the question of equipment, furniture and the supply of drugs to the laboratories throughout the Island, particularly in Jaffna. The supply of drugs particularly to our laboratories has been well restricted over the last few years. Principals of schools, unable to maintain the type of experimenting that they used to do, converted some part of the facilities fees for the purchase of drugs. I am informed now that that has been stopped or the principals have been told that facilities fees should not be utilized for the purchase of drugs. How is a laboratory to run without the necessary minimum drugs? When the principals found that the drugs were not coming from the department, they utilized facilities fees to buy these drugs. Facilities fees are fees which the students give willingly; nobody is trying to force these fees out of them. I am told that it is not correct. If that is not correct, I am sorry. This is something I was told by one of the principals. Maybe I am wrong. If that is so, I withdraw it.

I have one more matter. In the past there was a practice of maintenance grants being given to schools uniformly at a certain rate per head of the student population in that school. I do not know why we should not revert to that practice again because then the principal of a school knows exactly how much he is going to get by way of the maintenance grant, and he can budget on that and spend that money in as useful a way for the college as he thinks fit.

අ. භා. 7.45

Therefore I would ask the Hon. Minister whether he would not consider reintroducing the practice of making maintenance grants calculated on some fixed and uniform basis such as the number of children in a particular school. It could be 25 cents or 10 cents a child, but it should be on a uniform basis.

I am sorry if I have taken more time than what you, Mr. Chairman, have been good enough to give me. I would plead with the Hon. Minister in regard to our education. We have always had a fair standard of education. We have had no other avenue of advancing except through education. As everybody knows, we come from a part of the country which has been deceived by nature. We have nothing else to turn to. We rely on education. And I would earnestly appeal to the Hon. Minister to help us, and to help us sincerely and whole-heartedly to maintain that standard of education which we have built up over the last few generations.

බී. එච්. බණ්ඩාර මයා. (බදුල්ල)
(திரு. பி. எச். பண்டார—பதுளை)
(Mr. B. H. Bandara—Badulla)

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති වැය ශීර්ෂයන් ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මා විසින් මුලින්ම සඳහන් කළ යුතු කරුණක් තිබෙනවා. මේ ආණ්ඩුව බලයට පත් වී අමාත්‍යාංශ වෙන් කිරීමේදී අධ්‍යාපන ඇමති පදවියට ඊරියගොල්ල මැතිතුමා පත් වන විට එතුමා ලේඛකයෙක් නිසා අධ්‍යාපනයෙහි විශාල වෙනස්වීමක් නැත් නම් දියුණුවක් ඇතිවේය කියා අපි ලොකු බලාපොරොත්තුවකින් සිටියා; මේ රටේ අධ්‍යාපනය කෙරෙහි ලොකු බලාපොරොත්තුවක් තැබුවා. එහෙත් අපේ ඒ බලාපොරොත්තු දැන් සුන්වී තිබෙනවා. පළිගැනීම් ආදිය පිළිබඳව මම පසුව කථා කරන්නම්. කණිෂ්ඨ විශ්ව විද්‍යාල ගැන ප්‍රථමයෙන්ම කථාකිරීමට මා බලාපොරොත්තු වෙනවා.

ගරු මන්ත්‍රීවරුන් කීපදෙනෙක්ම කණිෂ්ඨ විශ්ව විද්‍යාල ගැන කථා කළා. මේ කණිෂ්ඨ විශ්ව විද්‍යාල පිහිටුවා තිබෙන්නේ කොළඹ, ගාල්ල, මහනුවර, කෑගල්ල, යාපනය හා කුලියාපිටිය යන ප්‍රදේශවලයි. හැන්ද අතේ තිබෙන නිසා කුලියාපිටියට බෙදාගැනීම ගැන අප ඊර්ෂ්‍යා කරන්නේ නැහැ. එහෙත් නොදියුණු ගම් බද ප්‍රදේශ ගැනත් සැලකිය යුතුව තිබෙනවා. උඟව ප්‍රදේශයට එකම කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක්වත් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
මීළඟට බලමු.

බී. එච්. බණ්ඩාර මයා.
(திரு. பி. எச். பண்டார)
(Mr. B. H. Bandara)
අධිරාජ්‍යවාදීන් මේ රටේ පාලනය බාර ගත්තාට පසුව මේ රටේ සාරය උරාගෙන ඔවුන්ගේ රටවලට යැවීමේ පහසු මාර්ග වශයෙන් කොළඹ, ගාල්ල, යාපනය ආදී ප්‍රදේශ තෝරා ගත්තා. ඒ අනුව ඔවුන් විසින් ඒ නගරවලට පහසුකම් දුන්නා. ඒ නිසා අදත් හැම පහසුකමක්ම ලැබෙන්නේ අන්න ඒ ප්‍රධාන නගරවලට පමණයි. ගම්බද දුප්පත් අයගේ දරුවකුට කවදාවත් උසස් තැනකට එන්නට ඉඩක් ලැබෙන්නේ නැහැ. එයට හේතුව ගම්බද ප්‍රදේශවලට අවශ්‍ය අධ්‍යාපන පහසුකම් නැතිවීමයි. අද කලා අංශයෙන් අධ්‍යාපනය ලබා විභාගවලින් සමත් වන අයට ඒ තරම් සාර්ථක අනාගතයක් ලබන්නට නොලැබෙන බව ගරු ඇමතිතුමාත් දන්නවා. කලා අංශයෙන් අධ්‍යාපනය ලැබූ අයට අද රක්ෂාවක් ලබාගන්නත් අමාරුයි. බලාපොරොත්තුවක් තබන්නට පුළුවන්කම තිබෙන්නේ විද්‍යා අංශයේ අධ්‍යාපනයක් ලබන අයට පමණයි. වෛද්‍ය වරුන්, ඉංජිනේරුවන්, කාර්මිකයින් වශයෙන් පුහුණු වී යම්කිසි දියුණු තත්ත්වයකට පත්වීමට පුළුවන්ය කියා බලාපොරොත්තු ඇති කර ගත හැකි වන්නේ විද්‍යා අංශයේ අධ්‍යාපනයක් ලබන අයට පමණයි. එහෙත් විද්‍යාව ඉගෙන ගැනීමේ පහසුකම් බෙදී තිබෙන්නේ කොහොමද කියා බලමු. ලංකාව තුළ විද්‍යා පාසැල් බෙදී තිබෙන අන්දම මම පෙන්නුම් කරන්නම්. විශ්ව විද්‍යාල ප්‍රවේශයට විද්‍යා විෂයයන් උගන්වන පාසැල් බෙදී තිබෙන්නේ මෙන්න මෙහෙමයි: කොළඹ 32 යි. මහනුවරට 12 යි. කුරුණෑගලට 5 යි. ගාල්ලට 5 යි. කළුතරට 11 යි. යාපනයට 33 යි. කෑගල්ලට 5 යි. බදුල්ලට 2 යි. රත්නපුරයට 3 යි. මාතරට 4 යි. නුවරඑළියට 2 යි. මඩකලපුවට 2 යි. අනුරාධපුරයට 1 යි. මාතලේට 3 යි. හම්බන්තොටට එකක්වත් නැහැ. හලාවතට 1 යි. විශ්ව විද්‍යාල ප්‍රවේශ පන්තියට විද්‍යා විෂයයන් උගන්වන පාසැල් බෙදී ඇත්තේ මුත්තු ඔය ආකාරයටයි. විද්‍යා විෂයයන් උගන්වන පාසැල් වැඩිම සංඛ්‍යාවක් තිබෙන්නේ යාපනයේ. වෛද්‍ය ශිෂ්‍යයින් වැඩියෙන්ම තේරෙන්නේ යාපනයෙන් යයි උඩුප්පිඩ්ඩි ගරු මන්ත්‍රීතුමා (එම්. සිවසිතම්පරම් මයා.) කිව්වා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
අනික් ප්‍රදේශවලත් හදන්න තමයි අවුරුදු 9 ක්ම දීලා තිබුණේ.

බී. එච්. බණ්ඩාර මයා.
(திரு. பி. எச். பண்டார)
(Mr. B. H. Bandara)
අද වැඩි වශයෙන්ම වෛද්‍යවරුන් බිහි වන්නේ යාපනයෙන්. හැම පහසුකමක්ම තිබෙන්නේ යාපනයටයි. අපේ ගම්බද අයට එවැනි පහසුකම් ලබා නොදෙන්නේ ඇයි? ගම්බද ප්‍රදේශවලත් දක්ෂ හොඳ මොළ තිබෙන දරුවන් සිටිනවා. ඒ අයටත් පහසුකම් ලබා දෙන්නට ඕනෑ. ගරු ඇමතිතුමා ඉංගිරිසිය අනිවාර්ය විෂයයක් කරනවා. එහෙත් ඉංගිරිසි උගන්වන්නේ නැහැ. ඉංගිරිසි උගන්වන්නේ නැත්නම් විභාගවලින් සමත් වන්නේ කොහොමද? ඉංගිරිසි අනිවාර්ය කරන්වා නම් පළමුවෙන්ම ඉගෙන ගැනීමට පහසුකම් ඇති කරන්නට ඕනෑ. බදුල්ල ප්‍රදේශයේ සිටි විද්‍යා ගුරුවරුන් ටිකක් මෙහාට ගත්තා. මහනුවරට කොළඹට යාපනයට විතරද, විද්‍යා ගුරුවරුන් ඕනෑ කරන්නේ? අනික් පළාත්වල හිටපු ගුරුවරුන් මේ පළාත්වලට ගත්තා. ඉතින් කොහොමද අපේ පළාත්වල ළමයින් ඉගෙන ගන්නෙ? අපේ පළාත්වල හොඳ දක්ෂ ශිෂ්‍යයින් ඉන්නවා. එහෙත් විද්‍යා උගන්වන්න පහසුකම් නැහැ.

ගරු සභාපතිතුමනි, මනුෂ්‍යයාගේ එදිනෙදා ජීවිතයටත් විද්‍යාව අවශ්‍යයි. ජීව විද්‍යාව ගනිමු. ජීව විද්‍යාවේ මූල ධර්ම දැන සිටීම එදිනෙදා ජීවිතයට පවා අවශ්‍යයි. නිරෝගී ජීවිතයක් ගත කරන්ට අප කාටත් ඕනෑ කරනවා. ඒ නිසා ජීව විද්‍යාවේ මූලික ධර්මතාවන් ගැන දැනුමක් අවශ්‍යයි. උදාහරණයක් හැටියට කියනව නම්, බෝවෙන රෝග ඇති වෙන්නෙ දේව කෝප,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අමනුෂ්‍ය දෝෂ නිසාය කියන හැඟීමක් නොදියුණු ප්‍රදේශවල වැසියන් තුළ පවතිනවා. එහෙත් විද්‍යාව පිළිබඳ දැනුමක් ඇති ළමයින් කවදාවත් ඒ මිථ්‍යා විශ්වාසය දරන්නෙ නැහැ. එමෙන්ම විද්‍යාව ඉගෙන ගත් ළමයින් දන්නවා, රෝගයන් ගෙන් ආරක්ෂා වෙන්නෙ කොහොමද කියා. එම නිසා මනුෂ්‍යයාගේ එදිනෙදා ජීවිතයටත් විද්‍යාව පිළිබඳ දැනුමක් අවශ්‍යයි. කරුණු මෙසේ නිසා යාපනයට පමණක් විද්‍යා පාසල් නොදී රටේ සෑම ප්‍රදේශයකම බෙදී යන අයුරු විද්‍යා පාසල් ඇති කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

තමුන්නාන්සේලාගේ කාලයේ දුන්න ඒව හැර වෙන එකක්වත් යාපනයට දීල නැහැ.

බී. එච්. බණ්ඩාර මයා.
(திரு. பி. எச். பண்டார)
(Mr. B. H. Bandara)

ආණ්ඩු වෙනස් වෙනවා. අපි වැරදි කරල තියෙනවා. කවුරු කළත් කමක් නැහැ; මේව හරි ගස්සන්න කියලයි මම කියන්නෙ. තමුන්නාන්සේ එක්ක සාකච්ඡා කරන්ට ගියොත් කාලය ගත වෙනවා.

ගරු සභාපතිතුමනි, බොහොම දෙනෙක් පිරිවෙන් සම්බන්ධයෙන් කථා නොකරන නිසා, හැම දෙනෙකුම කථා කරන ප්‍රශ්න ගැන වැඩිපුර කථා නොකර මා ඒ ගැන කරුණු දෙක—තුනක් මතක් කරන්ට බලා පොරොත්තු වෙනවා. පිරිවෙන් ඉතිහාසය ගැන ගරු ඇමතිතුමා දන්නවා. ඈත අතීතයේ මේ රටේ මහජනයාට ශාස්ත්‍රා ලෝකය ලබා දුන්න ස්ථානය තමයි, පිරිවෙන. අනුරාධපුර යුගයෙන් පසුව පොළොන්නරු දඹදෙනි යුගවල පිරිවෙන් විශාල දියුණුවකට පත් වුණා. මයුරපාද පිරිවෙන, පතිරාජ පිරිවෙන, විජයබා පිරිවෙන, පැරකුම්බා පිරිවෙන ආදි පිරිවෙන් මගින් මේ රටේ භාෂා ශාස්ත්‍රාලෝකයට පමණක් නොව ධර්ම ප්‍රචාරයටත් විශාල සේවයක් කළ බව ගරු ඇමතිතුමා දන්නවා. පිරිවෙන් මෙවැනි දියුණු තත්ත්වයක තිබෙද්දී පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ජාතිකයන් මේ රට ආක්‍රමණය කළායින් පසුව මේ රටේ පැවති ගිහි පැවිදි සම්බන්ධය කඩාකප්පල් කිරීමේ අදහසින් ඔවුන් විසින් සම්පූර්ණයෙන්ම පිරිවෙන් අධ්‍යාපනය විනාශ කර දමන්ට ක්‍රියා කළා. පිරිවෙන කියන නම පවා නැති වී යන තැනට ඔවුන් වැඩ කළා. නැවත 1863 දී තමයි, හික්කඩුවේ ශ්‍රී සුමංගල මහානායක මාහිමියන් විසින් විද්‍යෝදය පිරිවෙන ආරම්භ කරන්ට යෙදුනේ. ඒ වගේම ඊට ටික කලකට පසුව රත්මලානේ ශ්‍රී ධර්මාලෝක ස්වාමීන් වහන්සේ විසින් පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කළා. ඒ මගින් මේ රටේ අස්සක් මුල්ලක් නැර ශාඛා පිරිවෙන් ඇති වුණා. ක්‍රමයෙන් පිරිවෙන් දියුණුවට පත්වීගෙන යන අතර තමයි, 1956 බණ්ඩාරනායක රජය බලයට පත් වීමෙන් පසුව විද්‍යාලංකාර හා විද්‍යෝදය පිරිවෙන්වලට විශ්ව විද්‍යාල තත්ත්වය පිරි නැමීමෙන් මේ රටේ පිරිවෙන්වලට අලුත් ආලෝකයක් ලැබුණේ.

හිටපු අධ්‍යාපන ඇමතිතුමාගේ අධ්‍යාපන ධවල පත්‍රිකාවේ 119 වෙනි ව්‍යවස්ථාව යටතේ පිරිවෙන්වල උගන්වන ගුරුවරුන්ට නියමිත වැටුප් ක්‍රමයක් ගෙවීමේ වැඩ පිළිවෙලක් සකස් කර තිබුණා. මේ ආණ්ඩුව බලයට පත් වීමෙන් පසුව ඒ වැඩ පිළිවෙල සම්පූර්ණයෙන්ම අහෝසි වී ගියා. මේ රටේ විනය ගරුක අධ්‍යාපනයක් ලැබුණේ පිරිවෙන් මගිනුයි. එමෙන් මේ රටේ භාෂා සාහිත්‍යය පිළිබඳව නොයෙක් පොත්පත් සඟරාදිය බිහි වන්නේත් පිරිවෙන්වලිනුයි. අපි බට හිර සංස්කෘතියට අනුව හැඩ ගැසී සිටින නිසා මේ රටේ භාෂා සාහිත්‍යයට හා සංස්කෘතියට විශාල සේවයක් සිදුවන ඒ පිරිවෙන් ගැන අපේ සැලකිල්ල අඩු වී තිබෙනවා. මේ රටේ සංස්කෘතිය පිළිබඳවත්, භාෂා ශාස්ත්‍ර පිළිබඳවත් ගරු ඇමතිතුමාට දැනුමක් තිබෙන නිසා මා එතුමාගෙන් ඉල්ලා සිටින්ට කැමතියි, පිරිවෙන්වලට නියම ස්ථානය ලබා දෙන්න කියා.

කලා අංශය දෙස බලන විට පෙනී යනවා, විශාඛා විද්‍යාලය වැනි උසස් විද්‍යාලවල තත්ත්වයට පිරිවෙන්වල ප්‍රතිඵලත් උසස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

බව. පිරිවෙන්වල විද්‍යා පහසුකම් නැහැ. ගරු ඇමතිතුමා පසුගිය කාලය තුළ යවා තිබෙන චක්‍ර ලේඛනවලින් මේ පිරිවෙන් අධ්‍යාපන යට විශාල පහරක් වැදී තිබෙනවා. මට දැනගන්ට ලැබී තිබෙන අන්දමට අධ්‍යාපන ඇමතිතුමා පසුගිය කාලයේ යවා තිබෙන චක්‍ර ලේඛන 55 න් 44 ක්ම පිරිවෙන් පනතට පටහැනි ඒවායි. පිරිවෙන් පාලනය වෙන්නේ සාමාන්‍යයෙන් ආඥාර ලබන පාඨශාලාවල තත්ත්වයේයි. පිරිවෙන් සඳහා අවුරුදු පතා "ග්‍රාන්ට්" හෙවත් ආධාර මුදලක් දෙනවා. අසුවල් ගුරුවරයා සේවයට පත් කර ගන්න කියා පරිවෙනාධිපතින් වහන්සේට හෙවත් කෘත්‍යාධිකාරීට අණ කරන්ට ගරු ඇමතිතුමාට පුළුවන්කමක් නැහැ. තමාට අවශ්‍ය යයි කියන ගුරුවරයෙකු පත් කර ගැනීමේ බලය ඒ කෘත්‍යාධිකාරීට තිබෙනවා.

ගරු අධ්‍යාපන ඇමතිතුමා විසින් අස් කරන ලද ගුරුවරුන් ඇතැම් පිරිවෙන්වල සේවය කරනවා. එතුමා අලුතින් යැවූ චක්‍ර ලේඛනයකින් දන්වා තිබෙන අන්දමට ඒ අයට එවැනි ආයතනවල සේවය කිරීම තහනම් කර තිබෙනවා. ගරු ඇමතිතුමාගේ ඔය පලිගැනීමේ පිපාසය දැන්වත් සන්සිඳී නැද්දැයි අහන්නට කැමතියි. 1965 දී අපට වැඩ කළාය කියා ගුරුවරුන් විශාල සංඛ්‍යාවකගේ බෙලි කපා තිබෙනවා. මෙයින් වූ ප්‍රතිඵලය ගරු ඇමතිතුමාට පෙනෙන්නේ නැද්ද? පවුල් සිය ගණනක් අද කන්න අඳින්න තරම් ආදායමක් නැතිව දුකසේ කාලය ගත කරන බව ගරු ඇමතිතුමාට නොතේරෙන්නේ මොන කාරණයක් නිසා දැයි මට නම් තේරෙන්නේ නැහැ. මෙ වැන්නක් ගැන ගරු ඇමතිතුමාගේ පපුව පොඩ්ඩක්වත් උණු වෙන්නට ඕනෑ. ගරු ඇමතිතුමා දේශපාලන කටයුතුවල නිරත වූ හැමදෙනාටම එකසේ දඩුවම් කළා නම් ඒ ගැන අපට කියන්නට දෙයක් නැහැ. එහෙත් එක්සත් ජාතික පක්ෂයට වැඩ කළ උදවිය වරදක් නොකළවුන් හැටියට සැලකීම යුක්තියක්ද? එක්සත් ජාතික පක්ෂයේ ප්‍රචාරක වැන් රථය භාරව කට යුතු කළ ගුරුවරුන් ඉන්නවා. එක්සත් ජාතික පක්ෂයට වැඩ කළ එක් ගුරුවර යෙකුට බදුල්ලේ සිට තමන් කැමති වෙනත් ස්ථානයකට මාරුවක් ලබා ගන්නට වුවමනා කළා. වැඩි දවසක් යන්නට හැරියේ නැහැ, ඔහුට වුවමනා කළ කාරණය ඉෂ්ට වුණා. ඔහු සේවයෙන් අස් කරනු ලැබුවාද? නැහැ. ඒ නිසා දෙවිධි යකට සැලකීම අයුතුයි. වරදක් නම් කවුරුන් විසින් කරනු ලැබුවත් වරදක් මයි. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, තමුන්නාන්සේගේ දේශපාලන පක්ෂයට වාසි වන අන්දමට දේශපාලන කටයුතුවල යෙදුණත්, විරුද්ධ පාක්ෂිකයන්ට වාසි වන අන්දමට දේශපාලන කටයුතුවල යෙදුණත්, විරුද්ධ පාක්ෂිකයින්ට වාසි වල යෙදීම වරදක් කොට සලකන ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා නම් ඒ දෙගොල්ලන් අතින්ම කෙරෙන්නට ඇත්තේ වරදකැයි කල්පනා කරන්නට ඕනෑ; ඒ අනුව ක්‍රියා කරන්නට ඕනෑ. තමන්ගේ පක්ෂයට හිතවත්ව වැඩ කළ ගුරුවරුනුත් අස් කළා නම් ඒත් කමක් නැහැ. එක පැත්තකට පමණක් එසේ ක්‍රියා කිරීම ගැන අප කනගාටු වන බව පමණක් මේ අවස්ථාවේ කියන්නට කැමතියි.

ගරු අධ්‍යාපන ඇමතිතුමා විසින් අස් කරන ලද ගුරුවරුන් ටික තමයි මේ රටේ හිටපු ඉතාමත් දක්ෂ ගුරුවරුන්. මේ රටේ බාල පරම්පරාවට ඒ වාගේ දක්ෂ ගුරුවරුන්ගේ සේවය නොලැබී යාමට ඉඩ තැබීම අපරාධයක් බව ගරු ඇමතිතුමාට නොතේරීම අපේ බලාපොරොත්තු සුන් වීමට හේතුවක් බව කියන්නට ඕනෑ. ඔය තත්ත්වයේ පපුවක් තියාගෙන හැමදාම කටයුතු නොකරන්නැයි ගරු ඇමතිතුමා ගෙන් මා ඉල්ලා සිටිනවා. කරුණා කර ටිකක්වත් හදවත උණුකර ගන්න. අනුකම්පාවක් දක්වන්නට පුළුවන් තත්ත්වයට පපුව හැඩගස්වා ගන්න. තමුන්නාන්සේටත් ඔය තත්ත්වයට පරිවර්තනය වන්නට සිද්ධ වුණා නම්—ආදායමක් ලබා ගන්නට තරම් දේපොළු කුත් නැතිව, වෙනත් ආදායම් මාර්ගයකුත් නැතිව, රක්ෂාවකුත් නැතිව ඉන්න සිද්ධ වුණා නම්—තමුන්නාන්සේගේ තත්ත්වය කුමක්ද? අහිංසක ගුරුවරුන්ගේ පවුල් සිය ගණනක් කඩාකප්පල් වන්නට ඉඩ නොතබා සානුකම්පිකව, උණු වන හදවතකින් යුක්තව කටයුතු කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් මා ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 8

මා කථා කරගෙන ගියේ පිරිවෙන්වලට ගරු අධ්‍යාපන ඇමතිතුමා විසින් නොබෝදා යවන ලද චක්‍රලේඛනය ගැනයි. නොදැනුවත්වම වාගේ මා වෙනත් කරුණකට ඇදී ගියා. නැවතත් ඒ කාරණය ගැනම කථා කරන්නම්. වයස හැට සම්පූර්ණ වුණාම පරිවේණාධිපතීන් වහන්සේලා අස් විය යුතුයයි ඒ චක්‍රලේඛනයේ සඳහන් වෙනවා. ඔය අනුව ආධාර ලබන පාඨශාලා වල තත්ත්වයට පිරිවෙන් ඇවිත් තිබෙන බව මා කියනවා. රජයේ සේවකයන් හැටියට සලකා—මුදල් රෙගුලාසි මාලාව යටතේ සේවය කරන රජයේ සේවකයන් හැටියට සලකා—ක්‍රියා කිරීම සුදුසු නැහැ. ඒ අය මුදල් නීති යටතේ කරන සේවයක් නොවන නිසා මෙසේ කිරීම පහරක් බව කියන්නට ඕනෑ. ඒ තත්ත්වය ගැනත් කල්පනා කර බලන්නැයි ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

කාර්මික විද්‍යාල වෙනුවෙන් විශාල මුදලක් වැය කරන නමුත් ඒවායේ ඉගෙනීම ලබන්නන් ඉගෙනීම අවසන් වූවාම ගෙදර යනවා මිස රැකියාවන් සම්බන්ධයෙන් යම් බලාපොරොත්තුවක් ඇති කර ගන්නට පුළුවන් තත්ත්වයක් ඇත්තේ නැහැ. කාර්මික විද්‍යාලවල ගුරුවරුන්ගේ පඩි නඩි සඳහා පමණක් රුපියල් හැටදාහකටත් වැඩි ප්‍රමාණයක් වැය කරනවා. එයින් රටටත් ඒවායේ ඉගෙනීම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් යම් වැඩක් කෙරෙන්නට ඕනෑ. ඉගෙනීම අවසන් කළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අනාගත යේදී යම් රක්ෂාවක් ලබා ගැනීමටත්, ඒ මගින් රටට සේවයක් කිරීමටත් පුළුවන් වන විධියේ විධිමත් වැඩ පිළිවෙළක් සකස් කිරීම ගැන ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන මෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

අන්නාමලෙයි මයා.

(திரு. அண்ணாமலை)

(Mr. Annamalay)

Mr. Chairman, I thank you for allowing me to speak on the Votes of the Ministry of Education. I shall discuss the question of estate schools in particular on this occasion.

I would like to remind the Hon. Minister again that, although we have made representations from time to time, a final decision has not been taken by the Government on the matter of the take-over of estate schools.

On this occasion I would like to urge on the Hon. Minister the urgency of this matter because, under his new proposals for education in the country, it will be very difficult for children in estates to continue their studies in estate schools considering the facilities that are now provided in those schools.

For instance, estate schools have no proper curriculum, unlike in State schools which have a set curriculum and in which children receive a proper education. Again, as you are aware, Sir, estate schools have only five classes, and one teacher is expected to teach all the children in all the classes. But what actually happens is that students in the higher classes teach those in the lower classes. That is the type of education given in the estate schools.

There is, of course, the law compelling parents to see that children between the ages of five and fourteen attend schools on the estates. Even taking it for granted that parents do send their children to school when they are five years old, the schooling of these children will end when they reach their ninth year. Thereafter they have no schooling at all on the estates, and up to their 14th year the children simply idle, except, of course the few who get the opportunity to enter urban schools.

Even in regard to gaining admission to urban schools these estate children are in a difficulty, and that is why I say that, under the Hon. Minister's new proposals in regard to education in the country, provision must be made to take over the estate schools and to provide estate children with

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අන් නාමලෙයි මයා.]

an education in the same way that children in State schools are provided with an education.

I remember that the previous Government had finalized arrangements to take over estate schools, and one of their proposals was to levy a special sum of money from the managements of estate schools. They were to be asked to pay a sort of tax based on the acreage of the estate in order to find the money to finance the taking over of estate schools.

I think the National Government and the Hon. Minister of Education should give their minds to this aspect of the matter ; and if on the ground that the country is faced with financial difficulties this matter is to be postponed, I must say, that it will be a great injustice done to these children of poor parents.

I would also like in dealing with this question to refer to the dearth of teachers in these schools and in the schools in the urban areas which cater for the children of the plantation workers who had the opportunity of getting into them. Due to this dearth of teachers the children are prevented from getting a proper education and I urge that some arrangements be made to remedy this situation. There are only a few schools in the urban areas that cater for the children of the plantation workers and a duty is cast on us to see that every child in this country gets an equal opportunity in the matter of education.

I should like to bring to the notice of the Hon. Minister that the teachers who have been appointed to these schools from the North and the East are disinclined to teach in schools in the plantation areas. It is not that we do not want them to be sent to these schools, but they prefer to teach in schools in the North and the East. They are not interested in teaching in these schools, and this can be seen from the number of days of leave they have obtained if the Minister would only call for their leave particulars. They take the maximum leave and when they go on leave sometimes they do not return and thus the students in these schools are compelled to be without any education whatever. I think this is a matter the Hon. Minister should bear in mind.

On the question of pupil teachers, I should like to say that a number of children of the plantation workers have got through the S. S. C. and that some of them have sat the Pupil Teachers Examination. If there are any from among them who have been successful in this examination they should be given an opportunity to teach in the schools in the plantation areas. I believe the results of this examination were to be out in June and I do not know whether these results have been published because I was out of the Island for some time. I would ask the Hon. Minister to keep this question of appointing them to schools in the plantation areas in mind.

Much has been said on the question of the medium of instruction. I want to say that the medium of instruction should be the mother tongue—the Tamil children should be taught in Tamil—but at the same time I do ask the Hon. Minister to please send Sinhala teachers to the estate schools to teach Sinhala to those children as a second compulsory language. We want Sinhala ; we are not trying to run away from it. We want to learn Sinhala, to move among the Sinhalese people and to live happily with them and we are not at all opposed to Sinhala being taught to the Tamil children.

In schools in the urban areas there are both Tamil and Sinhala children. In some schools they are equal in number but in certain schools the Tamil students outnumber the Sinhala students. So some of the Sinhala headmasters in these schools have a fear lurking in their minds that if Tamil students outnumber Sinhala students they might have to give up their headmasterships, and

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

because of this fear they do not wish to admit Tamil children to these schools. We have brought this matter to the notice of the Hon. Minister and we trust that he will take action to appoint Tamil headmasters to these schools where there are a large number of Tamil students and to permit the Sinhala headmasters also to remain in these schools.

I must also thank the Hon. Minister for promoting certain teachers who had put in many years of service, but there is also the question of acting headmasters of schools. I would ask the Hon. Minister to confirm those acting headmasters in their appointments since permanent appointments have not been made to these posts. In fact, these acting headmasters have a fear that they might have to revert to their substantive posts. The Hon. Minister should kindly look into this matter.

We have very few maha vidyalayas in the plantation areas and even in them, unfortunately, we do not have science teachers and laboratories. Here again, I wish to state that these children must have equal opportunities in regard to their education. We should not discriminate or make people believe that, whatever might be their contribution, they are discriminated against. I emphasize this because we are all trying to better the lot of the common man. These parents must be made to feel happy. Those people who can afford it of course can send their children to England, America or any other country in the world, to be educated ; but the poor man, the common man, cannot do that and he can only look to the Minister of Education, not even to the Government. With regard to these matters hon. Members of the Opposition can criticize the Minister ; we cannot do that but only appeal to him. Therefore, I am bringing these matters to the notice of the Hon. Minister so that he may do whatever is possible. I know that he is confronted with financial difficulties. We know that he has a very big programme of work and that he likes to spend as much as possible in order to give the best education to the children of this country but the present financial resources of the country do not permit him to do that and we have to sympathize with him.

Anyway, we are thinking in the right direction now. The National Government has taken proper steps to save foreign exchange and very soon we should be able to make the Hon. Minister also happy so that his programme will be carried out according to his plan.

I have to bring to his notice certain matters where, again, it involves finance, particularly matters such as providing equipment and furniture, floor space in schools, building of new schools where there are no Tamil schools at all. Such areas are Gampola, Elkaduwa, Teldeniya, Upcot and several other places. I do not think the Hon. Minister can give schools to all these places at once, but anyway, I must mention them.

I do not want to worry the Hon. Minister by asking him to establish a school here and a school there. All that I would ask him is to allocate a certain percentage of what has been allowed for the rest of the community to the plantation areas as well. We, who are Tamils of Indian origin, also have the right to ask the Hon. Minister and the Government to look to the needs of the children of plantation workers and to see that they are given equal opportunities. If a small percentage is allocated for this purpose we shall be able to improve their lot.

I had occasion to go to the Ragalla Maha Vidyalaya once, and looking round this school I was surprised to see 62 children in a 10 ft. x 12 ft. room with one teacher but with little or no furniture at all. Two chairs were put on either side with a plank across on which there were about ten children seated. It was

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අත් නාමලෙයි මයා.]

the same in almost all the classes. This is the situation in a school which is supposed to be a maha vidyalaya.

I was also able to see the Sinhala maha vidyalaya which is just next to the Tamil maha vidyalaya. Well, I was very happy to see that the Sinhala maha vidyalaya is well kept and maintained. I have no grouse about it. In fact, I am very happy about it. I am only making an appeal to the Hon. Minister to see that something is done to improve the lot of the Tamil children. Of course, he cannot do all these things immediately but at least a start must be made immediately to bring all the schools to the same standard.

I want to ask the Hon. Minister to remember us when he prepares his schemes in regard to universities, technical schools, junior universities and so on. There are 10 lakhs of us in the up-country and the needs of this section of the population too should not be forgotten. When provision is made for these institutions—I agree with my hon. Friend from Badulla—these places also must be considered. These institutions should not be concentrated in Jaffna and Kuliyapitiya, or Kegalla. I do not want to be personal, and I do hope the Hon. Minister will not misunderstand me. I mention it for whatever it is worth. I say, let all the places in the Island be Kuliyapitiyas. I am sure the Hon. Minister will work in that direction. I have every confidence in him.

I would ask the Hon. Minister kindly to remember that we should be given junior universities, technical schools and training schools for teachers. We cannot go to Palaly or Jaffna or such places. We want a training school in Kandy. We are all Kandyan Tamils and we are nobody else but Kandyan Tamils. We are proud to call ourselves Kandyan Tamils. Therefore, we should be given a proper place and equal treatment here.

අ. භා. 8.15

Finally, I wish to bring to the Hon. Minister's notice once again a matter which I referred to last year. At that time I thought I saw him making a note of it on a sheet of paper but nothing has come of it. This is in regard to the midday meal given to schoolchildren. Why is this midday meal not given to the children of plantatoin workers who contribute so much towards the national wealth year by year for the last century? This is something given by CARE, and I see that the Hon. Minister has estimated Rs. 11 million when CARE gives Rs. 24 million. There is a surplus of Rs. 13 million which we can make use of. Therefore the flour and the sugar which they are prepared to give must be accepted. I do not think it will cost our Government anything. It is a thing we get free. Let these children also feel happy. I think it must be by an oversight that the Hon. Minister has left it out. I hope the officials who are assisting him will kindly bear this in mind and bring it to the notice of the Minister, so that at least this year the estate children will be able to call him "Uncle Iriyagolle", to invite him to their schools, to have the pleasure of seeing him and talking to him, and to eat the bun and be happy.

ආචාර්‍ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

Sir, I want to say a few words in English. I want to make reparations for an incident that occurred in this House between the Minister and me in your presence. On that occasion I used a word to the Minister which you asked me to withdraw, and I did so. I wish to say that I am sorry I used that word. I forgot at that time to say I was sorry.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Thank you.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්‍ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

ගරු සභාපතිතුමනි, මා මෙම සාකච්ඡාවට සහභාගි වන්නේ කරුණු දෙකක් මතු කිරීම පිණිසයි. ඉන් එක කාරණයක් බලපාන්නේ මා කලින් නියෝජනය කළ දෙහිවල-ගල්කිස්ස කොට්ඨාශයටයි. මා ඒ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා වශයෙන් සිටිද්දී එහි නගරාධිපතිවරයා වශයෙන් සිටි එල්. වී. ගුණරත්න මහතාගේ ඉල්ලීමක් අනුවයි, මා මේ ප්‍රශ්නය මෙතැන මතු කරන්නේ. මා ඒ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා වශයෙන් සිටිද්දී දෙහිවල කණිෂ්ඨ කාර්මික විද්‍යාලයක්—Junior Technical School—සෑදීමට ආණ්ඩුව තීරණයක් ගත්තා. ඒ සඳහා ඉතා පහසු තැනක් වූ වෛද්‍යා පාරේ ඉඩම් අක්කර හතරක් වෙන් කරමින් බොහොම අමාරුවෙන් වුවමනා කරන සුදුසු ගොඩනැගිලි තැනූ බව ඇමතිතුමා දන්නවා ඇති. ඇමතිතුමා ඒ ගැන නොදන්නවා නම් නිලධාරී මහතුන් දන්නවා ඇති. කණිෂ්ඨ කාර්මික විද්‍යාලයක් වෙනුවට දැන් මෙම ස්ථානයේ කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක්—Junior University—පිහිටුවීමට දැන් තීන්දුවක් ගෙන තිබෙනවාලු. දැනට දෙහිවල-ගල්කිස්ස කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීතුමා දෙහිවල නගරාධිපතිවරයා හැටියට නගර සභා රැස්වීමේ මූලාසනයෙහි සිටිද්දී එම ස්ථානයේ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයක්ම පිහිටු විය යුතු බවට ඒකමතිකව සම්මත කර ගන්නා ලද යෝජනාවක් ඇමති අංශයට එවා ඇති. මීට හේතුව කුමක්දැයි මා කියන්නට කැමතියි. මෙහි කණිෂ්ඨ කාර්මික විද්‍යාලයක් පිහිටුවීමෙන් බලාපොරොත්තු වන්නේ ඒ ප්‍රදේශයේ, ජ්‍යෙෂ්ඨ සමතුන් වන්නට බැරි තරුණයන්ට රක්ෂා ලබා ගැනීමට හැකි වන පරිද්දෙන් යම් යම් කර්මාන්ත පුහුණු කිරීමයි. පෝමන් තනතුරු ආදිය ලබා ගැනීමට හැකි වන පරිද්දෙන් ඔවුන්ට පුහුණුවක් දීමයි. මෙය කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක් කළහොත් ඒ ඒ විභාගවලින් සමත් වූ අයට පමණයි, එයට ඇතුළු වන්නට පුළුවන් වන්නේ. මුලින් ඒ ගොඩනැගිල්ල සෑදුවේ කළයුතුව ඇති කටයුත්තක් ඉටු කිරීමටයි. එහෙත් දැන් ඒ කටයුත්ත අතහැර ඒ ගොඩනැගිල්ල අලුත් කටයුත්තක් සඳහා යොදවා ගන්නට ආණ්ඩුව අදහස් කරනවා. මෙහි කණිෂ්ඨ කාර්මික විද්‍යාලයක්ම පිහිටු විය යුතු බව ඒ ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය ඒකමතිකව තීන්දු කර තිබෙනවා නම් ඒ ගැන හිතට ගෙන මෙහි කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක් ඇති කිරීමේ අදහස අතහැර දමන ලෙස ඉල්ලා සිටිනවා. කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක් වෙනුවට මෙහි කණිෂ්ඨ කාර්මික විද්‍යාලයක්ම පිහිටු වන්න. පරණ තීන්දුවම ක්‍රියාත්මක කරන්න.

ගරු සභාපතිතුමනි, දෙවන ප්‍රශ්නය ටිකක් බැරරුම් බව මුලින්ම සඳහන් කරන්නට ඕනෑ. මෑතකදී අධ්‍යාපන අංශයෙන් එම්.ඒ. 2/20 දරණ චක්‍රලේඛය පිටිවෙන්වලට ගොස් තිබෙනවා. ඒ වාට බලපාන නීතියේ වගන්ති දෙකක් අනුව ඒ වාට පත්වන ගුරුවරුන්ට ගෙවන මුදල් කොටස් දෙකකින් දෙවිධියකට ලැබෙනවා. එක පැත්තකින් "ග්‍රාන්ට්" එකකින් වැටුප් ලබන ගුරුවරුන් සිටිනවා. තවත් පැත්තකින් දෙපාර්තමේන්තුවෙන් කෙලින්ම වැටුප් ලබන ගුරුවරුන් සිටිනවා. මෑතදී යවා තිබෙන මේ චක්‍රලේඛනයෙන් දෙපාර්තමේන්තුවේ නැත්නම් ආණ්ඩුවේ පාඨශාලාවලින් අස් කළ ගුරුවරුන් මේ පිරිවෙන්වල ගුරු පදවිවලට පත් කරන්නට එපාය කියා නියම කර තිබෙනවා. එවැන්නන් පිරිවෙන් පාඨශාලාවලට ඇතුළු කර ගන්නට එපාය කියනවා. ඇත්ත වශයෙන්ම මේ චක්‍රලේඛනයෙන් ඉෂ්ට වන්නේ කුමක්ද? වරක් කළ වරදක් තවදුරටත් කරගෙන යාමයි. මේ ආණ්ඩුව බලයට පත් වූවාට පසු, මේ ආණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් යම් කිසි හේතු වගයක් ඉදිරිපත් කරමින් නොයෙකුත් ගුරුවරුන් වෘත්තියෙන් අස් කර නැත්නම් රක්ෂාවෙන් පන්නා තිබෙන බව කවුරුත් දන්නාවූ දෙයක්. ඒ කාරණය පිළිබඳව අප මෙතැන වාද විවාද කර තිබෙනවා. පුදුමයෙනුත් පුදුමය නම්, අධ්‍යාපන දෙපාර්තමේන්තුව දේශපාලන ක්‍රියාවල යෙදීම තහනම් කරන්නාවූ ඒ වගන්තිය කඩ කර තිබෙනවාය කියන්නේ, මුළු ලංකාවේම අපේ පැත්තට සහයෝගයක් දැක්වූ ගුරුවරුන් පමණයි. අධ්‍යාපන ඇමතිතුමා නොදැන සිටියත් මුළු ලංකාවම පුදුමයෙනුත් පුදුමයට පත් කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org
3046

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

තවත් කාරණයක් නම්, ඒ පසුගිය මහා මැතිවරණයේදී ආණ්ඩු පක්ෂයට පක්ෂ පාතීව වේදිකාවල සිටගෙනත් වැඩ කළ එකම ගුරුවරයකුවත් මේ නීතියට අසු වී නොමැති වීමයි.

මේ අවස්ථාවේදී මා මතු කරන්නේ ඊටත් එහාගින් තිබෙන ප්‍රශ්නයක්. මේ විධියට තම රක්ෂාවලින් පන්නනු ලැබූ, අස් කරනු ලැබූ ගුරුවරුන්ට පිරිවෙන් පාඨශාලාවල රක්ෂාව ලබා ගැනීමත් තහ නම් කරන ආකාරයේ මෙවැනි චක්‍ර ලේඛ නයක් පිට කිරීමෙන් පෙනෙන්නේ, ඒ අස් කරනු ලැබූ ගුරුවරුන් පසුපස දෙපාර්තමේන්තුව තව දුරටත් එළවාගෙන යන බව නේද? රජයේ යම් නීතිරීති තිබෙනවා නම්, යම් පිරිසක් ඒ නීතිරීති කඩ කළාය කියා අස් කළ එක අපි එතැනින් නවත්වමු. ඒ ක්‍රියාව සාධාරණද, යුක්ති සහගතද, නැද්ද, යන ප්‍රශ්නය පැත්තකට දමමු. රජයේ නීති නැත්නම් නියෝග කඩ කිරීම හේතුකොටගෙන රජයේ රක්ෂාවෙන් අස් කළ අයට රජයෙන් පිට ගෙන යන්නාවූ පාඨශාලාවලත්—ඒවාට රජයේ ආධාරය ලැබීම හේතුවක් කර ගනිමින්—රක්ෂාවක් ලබා ගැනීමට ඉඩ නොදෙන නියෝගයක් පිට කිරීම ගැන ඇත්ත වශයෙන්ම සාධාරණව පාවිච්චි කළ යුතු වචන මේ ගරු සභාව තුළ කියන්නට මට ශක්තියක් නැහැ. එම නිසා මා පුංචි වචන දෙකක් කියනවා. එවැනි චක්‍ර ලේඛනයක් නිකුත් කිරීම අසාධාරණ, අයුක්ති සහගත ක්‍රියාවක්.

මෙතැන තවත් දෙයක් තිබෙනවා. මෙතෙක් කල් ආධාර ලත් පාඨශාලා ක්‍රමය මේ රටේ තිබෙද්දී ආධාර පාඨශාලාවල ගුරුවරුන්ට දේශපාලනයේ යෙදීමට සම්පූර්ණ අයිතිය තිබුණ බව අප හොඳින්ම දන්නවා. අදත් ඒ අයිතිය තිබෙනවා. යම් කිසි ආධාර ලත් පාඨශාලාවක් රජයට ගැනීමෙන් පමණයි ඒ අයිතිය නැති වන්නේ, ඒ ගුරුවරුන් රජයේ සේවකයන් වීමෙන්. ඒ කාලයේ ආධාර ලත් පාසලක ගුරුවරයකු යම්කිසි නීතියක් කඩ කරන වාය කියන ප්‍රශ්නයක් මතු වන්නට ඉඩක් තිබුණේ නැහැ. ඒ නිසා ආණ්ඩුවේ ආධාර දීම හේතුකොටගෙන ආණ්ඩුවට ඇති වන බලයක්, ඒ ගුරුවරුන්ට විරුද්ධව පාවිච්චි කිරීමට කිසිම විධියක් තිබුණේ නැහැ. රජයේ රක්ෂාවල යෙදී සිටිද්දී රජයේ නීතියක් කඩ කරමින් තම රක්ෂාවලින් පිට වුණු කෙනෙකුට, තමන්ට භාර වන නීතිවලින් පිටස්තරව රජය දෙන ආධාරයෙන් ඇති වන බලය පාවිච්චි කර එතැන රක්ෂාව කරන්නට ඉඩ නොදීම ඉතාමත් විශාල අපරාධයක් බව මා කියනවා.

එකල්හි වේලාව අ. භා. 8.30 වූයෙන්, මන්ත්‍රී මණ්ඩලයට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපති තුමා මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස් වීම 1967 සැප්තැම්බර් 1 වන සිකුරාදා.

நேரம் பி. ப. 8.30 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி சபைக்கு அறிவிக்கும் பொருட்டு அக்கிராசனர், அக்கிராசனத்திலிருந்து நீங்கினார்.

குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது : வெள்ளிக்கிழமை, 1 செப்டம்பர் 1967.

It being 8.30 P.M., the Chairman left the Chair to report Progress.

Committee report Progress; to sit again on Friday 1st September 1967.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

එකල්හි වේලාව අ. භා. 8.30 පසුකර තුබූයෙන් නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.31 ට 1967 අගෝස්තු 24 වන දින සභා සම්මතිය අනුව 1967 සැප්තැම්බර් 1 වන සිකුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்போது நேரம் பி. ப. 8.30 மணிக்குப் பிந்திவிட்டமையால் உப சபாநாயகர் அவர்கள் விஞ்ஞாபித்து சபையை ஒத்திவைத்தார்கள்.

இதன்படி பி. ப. 8.31 க்கு சபை அதனது 1967 ஒகஸ்ட் 24 ஆம் தேதிய தீர்மானத்திற் கிணங்க, 1967 செப்டம்பர் 1, வெள்ளிக்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

And it being past 8.30 P.M., MR. DEPUTY SPEAKER adjourned the House without Question put.

Adjourned accordingly at 8.31 P.M. until 9.30 A.M. on Friday, 1st September 1967, pursuant to the Resolution of the House of 24th August 1967.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6 කට හාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ හාවු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் ; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 .(uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org